# ප්‍රඥා

## නිර්වාණය

### චිත්ත සන්තතියේ නිමාව - 01

පූජ්‍ය ගාල්ලේ චන්ද්‍රප්‍රදීප හිමි
ගාල්ල.

(බුදු දහම මගින් හෙළිවන විශ්ව ලෝකගත විද්‍යා ධර්මතාවය)


## බුදු දහමෙහි විද්‍යාත්මක පදනම

# ප්‍රඥා

## නිර්වාණය

### චිත්ත සන්තතියේ නිමාව - 01

පූජ්‍ය ගාල්ලේ චන්ද්‍රප්‍රදීප හිමි
ගාල්ල.



- **WISDOM - "NIBBHANA" - LIBERATION OF THE MIND - 01** නමින් පූජ්‍ය ගාල්ලේ චන්ද්‍රප්‍රදීප හිමියන් විසින් ලියා මුද්‍රණය කර පල කරන ලද ඉංග්‍රීසි මාධ්‍ය ධර්ම ග්‍රන්ථයෙහි සිංහල මාධ්‍යයට පරිවර්තනය කරන ලද මෙම ධර්ම ග්‍රන්ථයෙහි

- දෙවන මුද්‍රණය - වර්ෂ 2020

- වෙබ්සයිට් - **www.revchandrapradeepathero-wisdom.com**

- ඊ මේල් - chandrapradeepathero@gmail.com

- **ISBN978-955-38921-1-9**

- මෙම ධර්ම ග්‍රන්ථයෙහි සියලුම පූර්ණ හිමිකම් කර්තෘ හිමියන් සතුය.

- මෙම ධර්ම ග්‍රන්ථයෙහි කිසිම කොටසක විකෘති කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ උපුටා ගැනීමක් හෝ අළුතින් කරුණු එකතු කිරීමක් හෝ කිසියම් ඡේදයකින් කරුණු ඉවත් කිරීමක් හෝ කිසිම ලෙසකින් නොකල යුතු බවත්, එසේ කිරීමෙන් නැවත මුද්‍රණය කිරීම, මුද්‍රණය කර විකිනීම හෝ එවැනි මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික, විද්‍යුත් මාධ්‍යයකින් හෝ වෙනයම් ආකාරයකින් හෝ ප්‍රසිද්ධ කිරීම සඳහා ලේඛණගත කිරීම හෝ ඡායා පිටපත් කර ගැනීම හෝ පටිගත කරගැනීම කිසිසේත් නොකල යුතුය.

- මෙම ධර්ම ග්‍රන්ථය පිලිබඳ කිසියම් අයුරකින් සිදුකරන ඕනෑම කාර්යයක් අනිවාර්යයෙන්ම කර්තෘ හිමියන්ගේ අවසරය මත පමණක් සිදු කල යුතුව ඇත.

- ආශ්‍රිත ග්‍රන්ථය

  අති පූජ්‍ය කිරින්දේ ශ්‍රී ධම්මානන්ද හිමියන් විසින් ලියා මුද්‍රණය කරන ලද **"BUDDHISM in the Eyes of Intellectuals"** නම් ඉංග්‍රීසි ධර්ම ග්‍රන්ථයෙහි අන්තර්ගත ලෝකයෙහි විවිධ රටවල විද්වතුන්, උගතුන් හා විද්‍යාඥයින් විසින් බුදුදහම ගැන දක්වා ඇති ශ්‍රේෂ්ඨ අදහස් කිහිපයක් උපුටාගෙන ඇත.

- ධර්ම දානයක් ලෙස නොමිලයේ බෙදාදීම සඳහා පමණි.

## බුද්ධත්වය -

අවිද්‍යාවත් කාමයත් ද්වේශයත් මුලිනුපුටා දැමිය යුතු බැවින් බමුණ මම එසේ කළෙමි.

ප්‍රඥාව, සීල සංවරය, සමාධිය සම්පූර්ණයෙන්ම අවබෝධ කරගත යුතු බැවින් බමුණ මම එසේ කළෙමි.

මම සියලු කාම ආශාවන් මුලිනුපුටා දැමුවෙමි.

එබැවින් මම දෙවියකුද ගාන්ධර්වයෙකුද යක්ෂයකුද නොවෙමි.

මම දෙවියකු හෝ ගාන්ධර්වයකු හෝ යක්ෂයකු හෝ වූවා නම් මට කාම ආශා තිබිය යුතුය.

පරම සත්‍යය අවබෝධ කර ගත් බැවින් බමුණ මම නිර්වාණාවබෝධයට පත් වූයෙමි.

එනිසා මම ලෝකයට නොඇලුනෙමි. එලෙසම මම ලෝකය හා නොගැටෙන්නෙමි.

මම මනුෂ්‍යය වර්ගයාගේ පවතින දුර්වලතා විනාශ කර දැමූ ශ්‍රේෂ්ඨ මිනිසෙකු වෙමි.

එබැවින් බමුණ මා හඳුන්වාදිය හැකි හොඳම සහ කෙටිම ක්‍රමය '' බුද්ධ '' නම් වේ.

ගෞතම බුදුරජාණන් වහන්සේ
(බුදුන් වහන්සේ ද්‍රෝණ බමුණා සමග කරන ලද සංවාදයකි.)

**මේ ශ්‍රේෂ්ඨතම වෑයම** ****

**මිත්‍යාවේ අඳුරු සෙවනැලි ඉවත් කරමින්** ******

**අවිද්‍යාවෙන් අඳුරු වූ** ******

**නුඹට නුඹ කවුරුදැයි** ******

**ඇති සැටියෙන් දැකීමටත්** *****

**ලෝකයේ මිත්‍යාවෙන් ගැලවීමටත්** ****

******************************

# පෙරවදන

නිවන් මාර්ගය වරදවා වටහාගත් අශ්‍රද්ධාන වූ මනුෂ්‍යයින් එහි විද්‍යාත්මකවූද අධ්‍යාත්මිකවූද ධර්මතාවයන්ගේ ඇති සැටියෙහි නොදැනීමේ අවිද්‍යා දැලේ පැටලීමෙන් නැවත උපදින කර්ම ධර්මයට ගොදුරු වී ඇත.

මේ සම්බන්ධයෙහිදී ලෝක ස්වභාවය තුල සංස්කරණයවී ඇති ස්ථිතික විද්‍යුත්මයවූත් විද්‍යාත්මකවූත් අධ්‍යාත්මිකවූත් සත්ත්ව සන්තතික ධර්මතාවයන්හි යථාවබෝධය සඳහා මිත්‍යා විශ්වාසයන්ගෙන් ඉවත්වීමෙන්ද ප්‍රශ්‍රද්ධාව ලෙසින් තථාගත බුදුවරයාණන් වහන්සේ විසින් පෘතග්ජන ලෝකයේ මනුෂ්‍යයන්ට පැහැදිලි ලෙස දේශනාකර වදාල විශ්ව ලෝකගත සත්ත්ව සන්තතික විද්‍යා ක්‍රියාවලියෙහි අන්තර්ගතයෙහි අවබෝධය අත්පත් කර ගැනීමෙන්ද ලෝකය සහ තමතමන් ගැන ඇති සැටියෙහි විද්‍යාත්මක පදනම එලෙසින්ම අවබෝධ කරගැනීම සඳහා ප්‍රශ්‍රද්ධාවන්තයින්ට ඇති හැකියාව ගැන විශ්වාසය තැබිය හැක.

පූජ්‍ය. ගාල්ලේ චන්ද්‍රප්‍රදීප හිමි (ආරණ්‍යයික, වනවාසී)
ගාල්ල (2019-10-13)

# පටුන


**ප්‍රශ්නා 01**

1.1 හැඳින්වීම 01

1.2 සන්තතික කර්මජ සිතින් නිදහස්වීම අරමුණු කර ගන්නේ කෙසේද? 16

1.3 නිර්වාණයට පත්වීමට ඔබ සුදුසුද? 22

1.4 නිර්වාණ මාර්ගය අනුගමනය කරන්නේ කෙසේද? 30

1.5 චිත්ත සන්තතික ක්‍රියාවලියෙන් නිදහස්වීමට අවශ්‍ය ඇයි? 34

1.6 සිතින් නිදහස්විමේ නිර්වාණ මාර්ගය තුල ඔබේ සිත ක්‍රියාත්මකද? 42

1.7 නිර්වාණයට පත්වූවකු හා නොවූවකු අතර වෙනස දැකීමට හැකිද? 48

**ප්‍රශ්නා 02**

2.1 ප්‍රධාන ත්‍රිවිධ ක්ලේෂ ධර්ම 62

2.2 සක්කාය දිට්ඨිය (පුද්ගල මානසිකත්වය පිළිබඳ අවිද්‍යාව) 69
(ලෝභය - තෘෂ්ණාව - කාමරාගය - කාමච්ඡන්ද - කාම රතිය)

2.3 ආත්ම දෘෂ්ඨිය - (නිත්‍ය ස්වර්ග - මෝක්ෂ මානසිකත්වය පාදක ආත්ම අවිද්‍යාව) (වෛරය - හිංසනය - ද්වේෂය) 75

2.4 මිත්‍යා දෘෂ්ඨිය - (කාම තෘෂ්ණාව පිනවීමේ මානසිකත්වය පාදක අවිද්‍යාව) (තෘෂ්ණාව . කාමරාගය - කාම රතිය - ලෝභය + ද්වේෂය - වෛරය - හිංසනය) 85

## ප්‍රඥා 03


3.1 සම්මා දිට්ඨි - නිවැරදි දැක්ම 93

3.1.1 කල්‍යාණ මිත්‍ර සේවනය 99

3.1.2 චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත නිර්වාණ ධර්මය ශ්‍රවණය කිරීම 104

3.1.3 යෝනිසෝමනසිකාරය (එළඹසිටි සිහිය පිළිබඳ දැඩි අවධානය) 106

3.1.4 ශීල සංවරය සඳහා වූ ආර්ය ප්‍රතිපදාව 121

3.1.5 ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ශීල ප්‍රතිපත්තීන් 136

3.2 චතුරාර්ය සත්‍යය 144

3.2.1 මනුෂ්‍ය, තිරිසන් සත්ත්වයින් කෙරෙහි සන්තතික වන ප්‍රධාන සත්‍යය ධර්මතාවය (දුක්ඛ සත්‍යය) 148

3.2.2 මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයින් කෙරෙහි ක්‍රියාත්මක වන දුක්ඛ සත්‍යය ධර්මයන් සඳහා හේතුව වන විද්‍යාත්මක ධර්මතාවය (සමුදය සත්‍යය) 156

3.2.3 සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලියෙන් නිදහස්වීම (නිරෝධ සත්‍යය) 162

3.2.4 සන්තතික දුක්ඛ කර්ම ධර්මයෙන් නිදහස්වීමේ අධ්‍යාත්මික නිර්වාණ මාර්ගය (මාර්ග සත්‍යය) 165

3.3 කර්මජ සිතින් නිදහස් වීමේ නිර්වාණ ක්‍රියාවලිය 184

3.4 කර්මජ සිතින් නිදහස්වීමේ නිර්වාණ පියවර 193

සමාප්තිය 204

# ප්‍රඥා - 01

## 1.1 හැඳින්වීම

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් ලෝකයේ ක්‍රියාකාරීව පවතින සන්තතික සත්‍යය ධර්මතාවය වශයෙන් පෘතග්ජන මනුෂ්‍යයන්ට දේශනා කර ඇත්තේ විශ්ව ලෝකගත විද්‍යා ක්‍රියාවලියෙහි විෂය පථයෙහි අන්තර්ගතය වන ප්‍රඥා ධර්මයයි. එනම් මෙම ප්‍රඥා ශක්තිය යනු සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ගේ මානසික හැඟීම් දැනීම් පරාසය ඉක්මවූ අති විශිෂ්ඨ වූ අධ්‍යාත්මිකවූ මානසික බලයකි. අතිශයින්ම ගැඹුරුවූද පෘතග්ජන අවබෝධ සීමාවට විෂය නොවන්නාවූද එම විද්‍යාත්මක ක්‍රියාවලියෙහි අන්තර්ගතයෙහි පැවැත්ම යනු ජීවී සත්ත්වයන්ගේ පැවැත්ම ස්වභාවධර්මයේ හේතු ඵල විද්‍යාත්මක නීතීන්ට අනුකූලව කෙසේ ඇරඹුනේද සහ කෙසේ පවතින්නේද යන වගත්ය. ප්‍රඥාව යනු ලෝක විශ්වගත ක්‍රියාකාරි ස්වභාව ධර්මයෙහි විද්‍යා විෂයයි. මේ සම්බන්ධයෙන් ජීව විද්‍යාත්මක සත්ත්ව සන්තතියෙහි විද්‍යාත්මක ධර්මතාවයෙහි ප්‍රඥා ධර්මය යනු සන්තතික කර්ම ධර්මයන්ගෙන් නිදහස් වීමට බලාපොරොත්තු වන ප්‍රඥාවන්තයින්ට පමණක් වන විශිෂ්ඨ සම්පතකි.

මිනිසුන් සතුන් සහ ගස්වැල් ලෙසින් වන සියළු සංස්කාරක වස්තූන් ලෝක ස්වභාවය තුල ක්‍රියාත්මක විද්‍යාත්මක හේතු ඵල නීතියට යටත්ව සන්තතිය වනු ඇත. සමස්ත මනුෂ්‍යය හා තිරිසන් සත්ත්වයින්ගේ බිහිවීමේ ඵලය සඳහා හේතුව වන්නේ ස්තිථික විද්‍යුත් ශක්තිය සමග සංයෝජනයවූ පදාර්ථගත මූලද්‍රව්‍යයන්ගේ විද්‍යාත්මක සම්බන්ධීකරණ වන අතර ඒ සඳහා මැදිහත්වූ කිසිදු දෙවියකු හෝ බ්‍රහ්මයකු හෝ අදෘශ්‍යමාන මැවුම්කරුවකු හෝ නොමැත.

මේ විද්‍යාත්මක සංසිද්ධියෙහි අන්තර්ගතය විශ්වගත චිත්ත ශක්තිය සහ පදාර්ථගත මූලධර්මයන්හි එකිනෙක අතර සිදුවූ ප්‍රබල සම්බන්ධීකරණය මගින් ලොවෙහි ක්‍රියාකාරීව පවතින මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ ජීව විද්‍යාත්මක සත්ත්ව ලෝකයෙහි නිර්මාණකරණය සඳහා ප්‍රබල යොමුවීමෙහි දායකත්වය වනු ඇත.

මනුෂ්‍යත්වයෙහි ක්‍රියාකාරිවන ධර්මතාවයන් අතරින් ප්‍රබලතම හා ශ්‍රේෂ්ඨතම ධර්මතාවය වන්නේත් සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ගේ දැනීමේ හා දැකීමේ අවබෝධසීමාව ඉක්මවායන ප්‍රබලවූ අධ්‍යාත්මික හැකියාවට පත්වීම සඳහා හේතුව වන එමෙන්ම සර්වඥද්ඥතාඥාණය අත්පත් කරගත හැකි ලොවෙහි ඇති ප්‍රබලතම හා ශ්‍රේෂ්ඨතම පදවිය බුද්ධත්වයයි. වත්මන් ලෝකයෙහි ක්‍රියාත්මක වන තාක්ෂණික උපක්‍රම මගින් හෝ කිසිදු අදෘශ්‍යමාන දෙවියෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ අන් ලෙසකින් බලසම්පන්න මනුෂ්‍යයෙකුට හෝ ශ්‍රේෂ්ඨවූ බුදුවරයාණන් වහන්සේලාගේ ප්‍රබලත්වය කිසිලෙසකින්වත් මැඩලීම හෝ විනාශ කිරිම හෝ කළ නොහැක.

යම් ප්‍රඥාවන්තයෙකුට උත්සාහයෙන් හා නොපසුබට වීර්යයෙන් මාර්ගඵල අවබෝධය ඵලය වශයෙන් අත්පත් කරගත හැකි වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය සසරෙහි දිගු කලක් ශීල සමාධි ප්‍රඥා වශයෙන් දියුණු කලේනම් ඉහතින් සඳහන් කල ලොවෙහි ඇති සෙසු පදවි අභිබවා පවතින ශ්‍රේෂ්ඨතම පදවිය වන බුද්ධත්වයට පත් විය හැක.

බුද්ධත්වයට පත්වීම මූලික වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු ලෝකයෙහි ක්‍රියාත්මකව පවතින එකම

අධ්‍යාත්මික විද්‍යා අවබෝධය ප්‍රඥාව වන අතර එය විශ්ව ලෝකගත ක්‍රියාකරී විද්‍යා සැලැස්මේ එකම අන්තර්ගතයෙහි විද්‍යා විෂය වනු ඇත. එය බුද්ධත්වය ලඟා කර ගැනීමේ අවසාන ඵලය වන සර්වඥද්ඥතා ඥාණයටද පාදක වන අතර ලෝකයේ සහ විශ්වයේ පවතින එකම අධ්‍යාත්මික වූ විද්‍යාත්මක විෂය වේ. බුදුරජාණන් වහන්සේගේ අධ්‍යාත්මික අත්දැකීම යනු අධි ප්‍රඥාවයි. එය සන්තතික විද්‍යාත්මක හේතුඵල ධර්මයන්ගේ සුවිශිෂ්ඨ අවබෝධයයි. දුක්ඛ ධර්ම පාදක පංචේන්ද්‍රිය සීමාවෙන් ඉවත්ව ශ්‍රේෂ්ඨවූ බුදුරදුන් විසින් ලොවට දේශනාකර ඇති විශ්ව ලෝකගත ක්‍රියාකාරී විද්‍යාත්මක ධර්මයන්හි අන්තර්ගතයෙහි ඇති සැටිය ඇති ලෙසින් දේශනාකර ඇති ඉතා ගැඹුරුවූද අතිශය ශුක්ෂ්මවූද තථාගත දේශනා ධර්මය කිසිලෙසකින්වත් කිසිවකුට විනාශ කිරිම හෝ විකෘර්ති කිරීම කල නොහැක.

යමෙකුට ලෝකයේ සහ විශ්වයේ පවතින විද්‍යාත්මක ක්‍රියාවලිය පිලිබඳ අවබෝධයක් ලැබීමට අවශ්‍ය නම් සියලුම පෘතග්ජනවූ ද්‍රව්‍යාත්මක පදනමක ක්‍රියාත්මක ධර්මතාවයන්ගේ සුභ සාධනයෙන් ඉවත් විය යුතුය. එලෙසින්ම අධ්‍යාත්මික බලයේ අකුසල් විපාක පාර්ශවය වන අකුසල පාදක ක්ලේෂයන් ගෙන් යුක්ත කාමරාගය - තරහව - වෛරය - අවිද්‍යාව - ආත්මදෘෂ්ඨි ය - ආත්මාර්ථකාමීත්වය - ආත්මවාදය - අහංකාරකම - වෛරාගය - දුශ්ශීල බව - අන්තගාමී බව - අනාචාරය - මිත්‍යා දෘෂ්ඨිය - ප්‍රචන්ඩත්වය (විහිංසාව සැහැසිබව) - ඊර්ෂ්‍යාව - මොහඳුර - මානය - මිත්‍යා විශ්වාස - විරුද්ධත්වය - අවිද්‍යා දැක්ම - අවිශ්වාසය - මුලාව - යනාදී අවිද්‍යා පාදක ක්ලේෂ ධර්මයන්ගෙන් මුළුමනින්ම ඉවත් විය යුතුය.

ඉහත සඳහන් ක්ලේෂ ධර්මයන් ප්‍රබල ලෙස වඩමින් සිටින ලෞකික පෘතග්ජන මිනිසුන් එම ක්ලේෂ ධර්මයන් අනුගමනය නොකල යුතු අතර ලොවෙහි ඇති එකම පිරිසිදු ශිෂ්ඨ සම්පන්න අධ්‍යාත්මික මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලින් මනුෂ්‍යය වර්ගයේ ක්‍රියාත්මක කලයුතුව ඇති ශ්‍රේෂ්ඨ සහ ශිෂ්ඨ සම්පන්න ධර්මතාවයන් වර්ධනය කර ගත යුතුය. මනුෂ්‍යයන් කෙරෙන් ක්‍රියාත්මක කලහැකි සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ප්‍රබල කුසල් ධර්මයන් වශයෙන් පවතින ත්‍යාගශීලී බව - ශාන්ත බව - සාමකාමී බව - නිදහස - ඉවසීම - දයාව - සතුට - මෛත්‍රිය - සානුකම්පිතබව - කාරුණිකබව - උපේක්ෂාව - අධිශීල සංවරය - අධි චිත්ත සංවරය - විදර්ශනාවබෝධය - ප්‍රඥාව - මානසික ඒකාග්‍රතාවය යනාදිය මනුෂ්‍යත්වයේ ක්‍රියාත්මක කලහැකි සහ කලයුතුව ඇති ශ්‍රේෂ්ඨතම අධ්‍යාත්මික ගුණධර්මයන් වශයෙන් පෙන්වා දිය හැකිය.

සාමාන්‍ය පෘතග්ජන මානසික සංවේදී පරාසය ඉක්මවන අසාමාන්‍ය මානසික සංවේදීභාවය වන සර්වඥතා ඥාණය ලබා ගැනීම සඳහා යමෙකු උත්සාහ කරයි නම් ප්‍රඥාව පාදක වන උසස් අධ්‍යාත්මික විදර්ශනාත්මක විද්‍යා අවබෝධය ලබාගැනීම සඳහා ඉහතින් සඳහන්කල උත්තරීතර මානුෂික ගුණධර්ම පිලිපැදීමට හා අනුගමනය කිරීමට එකඟවිය යුතුව ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීම තුලින් එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් ශ්‍රේෂ්ඨ ධර්මතාවයන් මනුෂ්‍යයෙකුට පමණක් ප්‍රගුණ කල හැකි වන විශිෂ්ඨ මානුෂික ධර්මයන් වන අතර ප්‍රඥාවන්තයෙකුට ඒ තුලින් ලොවෙහි ක්‍රියාකාරී සත්‍යය වූ විද්‍යාත්මක ධර්මයන්හි පූර්ණ අවබෝධය වන ප්‍රඥාව අත්පත් කරගත හැක.

අවිචාරවත්වූද ශිෂ්ඨ සම්පන්න නොවූද පහත්වූද තිරිසන් සත්ත්වයන්ට විෂයවන ක්ලේෂ ධර්ම වැඩෙන අවිද්‍යා මාර්ගය අනුගමනය කරණ අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ යම් ලෙසකින් ශ්‍රේෂ්ඨවූ බුදුවරයාණන් වහන්සේද උන්වහන්සේ විසින් පෘතග්ජන මනුෂ්‍යයන්ට දේශනා කරන ලද ලොවෙහි ක්‍රියාත්මක විද්‍යා ධර්මයන්හි ඇතිසැටිය ඇති ලෙසින් වන ප්‍රඥා ධර්මයද මැඩලීමට හෝ යටත් කිරීමට හෝ විනාශ කිරීමට හෝ යම් ලෙසකින් උත්සාහ කරන්නේ නම් එය එවැනි මනුෂ්‍යයන් තම තමන් යනු ලොවෙහි ජීවත්වන ප්‍රබලතම අඥාන නූගත් මනුෂ්‍ය සමාජයක් බව ඔප්පු කිරීමට ගන්නා උත්සාහයකි. ලොවෙහි ක්‍රියාත්මක විවිධ විද්‍යාත්මක විෂයයන්හි පරිනතවූ විද්‍යාඥයකු ලෙසින්ද උගතෙකු ලෙසින්ද දාර්ශනිකයෙකු ලෙසින්ද හෝ විද්වතෙකු ලෙසින්ද ලබාගන්නා පරිනත බව යනු කිසිවිටෙක එය ඔවුන්ගේ අධ්‍යාත්මික අභිවෘද්ධියක් නොවන අතර එමෙන්ම එය විශ්ව ලෝකගත ක්‍රියාකාරී විද්‍යා ක්‍රියාවලිය පිලිබඳ පූර්ණ හා නිවැරදි අවබෝධයක් සඳහාද නොවනු ඇත. සමස්ත සංස්කාරක වස්තූන් සහ මුළුමහත් විශ්වලෝක පරිශ්‍රයත් පිලියෙල වීමෙන් පාලනය වන්නේ ස්වභාවයෙහි ක්‍රියාත්මක වන ක්‍රියාකාරි විද්‍යුත් ශක්තිය වන ස්ථිති විද්‍යුතය මගිනි.

ශ්‍රේෂ්ඨවූ බුදුවරයාණන් වහන්සේ විසින් අවබෝධකරගත් මනුෂ්‍ය තිරිසන් සත්ත්වයන් කෙරෙහි සන්තතිකව පවත්නා අධ්‍යාත්මික අධි ප්‍රඥා සම්ප්‍රයුක්ත විද්‍යා අවබෝධයෙහි උන්වහන්සේගේ පෞද්ගලික අත්දැකීමේ සර්වඥතා ඥාණ 73 (හැත්තෑ තුන) කින් සමන්විත වනු ඇත.

ඉන් කිහිපයක් පහත දැක්වේ.

1. ලෝකෝත්තර ඥාණය - සන්තතිකව පවත්නා ලෝභය සහ ද්වේෂ නම්වන ක්ලේෂ ධර්මයන් සහ එම ක්ලේෂ ධර්මයන්ගේ සම්භවය සහ පැවැත්ම හඳුනා ගැනීමට නොහැකිවීමේ ස්වභාවය වන අවිද්‍යාව විදර්ශනාත්මක විද්‍යාත්මක අවබෝධය තුලින් මැඩලන්නේ කෙසේද යන්න පිලිබඳ පවතින ඥාණය. (අර්ථ)

2. කාම සංවේදී ස්පර්ශයන් පිලිබඳ කායික හා මානසික ක්‍රියාවලියෙහි සම්බන්ධීකරණ ධර්මයන්හි විශ්ලේෂණය කිරීමේ ඥාණය. (ධම්ම)

3. ලෝකයෙහි ක්‍රියාත්මක විද්‍යාත්මක සන්තතික මූලධර්මය වන හේතු ඵල ධර්මය පිලිබඳ අන්තර්ගතය විශ්ලේෂණය කිරීමේ ඥාණය. (නිරුක්ති)

4. ඉහත කරුණු දෙකටම අදාලව සත්ත්වයින්ගේ සන්තතික කර්මධර්මය විශ්ලේශණය කිරීමේ ඥානය. (පටිභාන)

5. දිබ්බ සෝ්‍රත ඥාණය . සාමාන්‍ය පෘතග්ජන ශ්‍රවණ පරාසයෙන් පිට ක්‍රියාකාරීව පවතින විවිධාකාර ශබ්ද සංඥාවන්හි අධි මානසික ශබ්ද සංවේදනය පිලිබඳ හැකියාව.

6. දිබ්බ චක්ඛු - සාමාන්‍ය පෘතග්ජන දෘශ්‍ය පරාසයෙන් පිට ක්‍රියාකාරීව පවතින විවිධාකාර දෘශ්‍ය වර්ණ සංඥාවන්හි අධිමානසික දෘශ්‍ය සංවේදනය පිලිබඳ හැකියාව.

මනුෂ්‍යයෙකු සතු සිය චිත්ත සන්තතික කර්ම ක්‍රියාවලිය මගින් ක්‍රියාකාරිවන දුක්ඛ ධර්මතාවයෙහි ක්‍රියාකාරීත්වයෙහි නිරෝධය එනම් නිමාව නිර්වාණය ලෙසින් හඳුන්වනු ලැබේ. මේ සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ප්‍රතිපත්ති පූර්ණයෙන් ලැබෙන ඵලය වන්නේ චිත්ත ශක්තියෙහි සම්ප්‍රයුක්ත චිත්තානු පරිවර්තී ශක්තිය වන මානසික ශක්තියෙහි සංඥා ස්පර්ශ සංවේදී ගුණය අකර්මන්‍ය කිරීමයි. බුදුවරයාණන් වහන්සේලා විසින් ලෝකයට දේශනා කරන ලද චතුරාර්ය සත්‍යය යනු විශ්ව ලෝක පරිශ්‍රයෙහි පදනම් අන්තර්ගත ක්‍රියාකාරී විද්‍යුත් ශක්තිය වන ස්ථිතික විද්‍යුත් ශක්තිය මගින් නිර්මාණය වී ඇති තිස් එක්තල ගත (31) සත්ත්ව වාසයන්ගේ ලෝක ධාතූන්හි සන්තතික අධ්‍යාත්මික විද්‍යාවේ අන්තර්ගතයෙහි විද්‍යා අවබෝධය වන ප්‍රඥාවයි. සන්තතික අධ්‍යාත්මික ක්‍රියාවලියෙන් නිර්මාණය වී ඇති මනුෂ්‍ය හා තිරිසන්ගත සත්ත්වයින්ගේ සන්තතික අධ්‍යාත්මික මානසික සංස්කරණය ඔවුන්ගේ ද්‍රව්‍යාත්මක කාය සංස්කරණය හා ප්‍රතිබද්ධව පවතින නමුත් සෙසු භවයන්හි සන්තතිකව ජීවත්වන සත්ත්වයින්ගේ පැවැත්ම භෞතික කාය සංස්කරණයකින් තොරව අධ්‍යාත්මික මානසික සංස්කරණයට පමණක් ක්‍රියාත්මක වීමට සීමා වී ඇත. මෙම අධ්‍යාත්මික මානසික සංස්කරණගත සත්ත්වයෝ හය වැදෑරුම් දේව ලෝක වාසීන් ලෙසද විසි වැදෑරුම් බ්‍රහ්මලෝක වාසීන් ලෙසද දස වැදෑරුම් ප්‍රේත ලෝකගත වාසීන් ලෙසද පංචවිධ අසුර ලෝකගත වාසීන් ලෙසද එකසිය තිස් හය වැදෑරුම් නිරය ලෝකගත සත්ත්වවාසීන් ලෙසද ක්‍රියාකාරීව ජීවත්වන අතර එම ලෝකගත ජීවීන්ගේ තොරතුරු මනුෂ්‍යයින්ගේ භෞතික කායික ඉන්ද්‍රියන්ට සංවේදී වීමට විෂය නොවනු ඇත. සමස්ථ තිස් එක් තල ගත සත්ත්ව වාසයන් වනුයේ,

1. දිව්‍ය තල හයයි. 06 (සුගති භූමිය)
2. බ්‍රහ්ම තල විස්සයි. 20 (සුගති භූමිය)
3. මනුෂ්‍ය ලෝකය එක් තලයයි. 01 (සුගති භූමිය)
4. ප්‍රේත ලෝකය (අමනුෂ්‍ය) එක් තලයකි. 01 (කලාප 10 කි) (දුගති භූමියකි)
5. තිරිසන් සත්ත්ව ලෝකය. එක් තලයකි. 01 (දුගති තල)
6. අසුර ලෝකය එක් තලයකි 01. (කලාප 5 කි) (දුගති තල)
7. නරකය එක් තලයකි 01. (කලාප 136) (දුගති තල)

තථාගත බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම වන ප්‍රඥාව සමස්ත විද්‍යාත්මක වූ ජීව විද්‍යා ක්‍රියාවලියේ විද්‍යාත්මක ස්වභාවයේ අන්තර්ගතයයි. උන්වහන්සේගේ මෙම ශ්‍රේෂ්ඨ ඉගැන්වීම වන තථාගත සද්ධර්මයට පාදක වන ප්‍රඥාව මගින් සමස්ත තිස් එක් තල ගත භව සන්තතියෙහි ක්‍රියාකාරි මූලධර්මත් ඒවායේ මූලික සම්බන්ධීකරණයේ විද්‍යාත්මක ධර්මතාවයන්ගේ ක්‍රියාවලියේ හේතුඵල ධර්මයාගේ පැවැත්මට අනුව ධර්ම ස්වභාවයන් කෙසේ පිළියෙළ වී ඇතිදැයි යන බවත් දේශනා කර ඇති දේශනා ධර්මයයි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීව විද්‍යා ලෝකයෙහි එනම් ජීවී සම්භවයේ ආරම්භක අවධියේදී ජීවත්වූ ක්ෂුද්‍ර ජීවීන් ලෙසින් හඳුන්වනු ලබන පැරමීසියම් ඇමීබා බැක්ටීරියා වෛරස් ආදී ඒක සෛලික ජීවීන්ගේ සන්තතික ක්‍රියාවලිය කායික ස්පර්ශ ක්‍රියාවලිය මගින් සිදුවුනි. එහෙත් ඔවුනට ඒවන විට විකසනය වූ ඇස කන නාස ආදී වූ භෞතික ඉන්ද්‍රියයන් නොතිබුනි.

අවුරුදු මිලියන ගණනකට පෙර ප්‍රාරම්භක ඒක ශෛලික ජීවීන් ගේ ස්වභාවයේ මූලික විද්‍යාත්මක ක්‍රියාවලිය

බහු ශෛලික ජීවීන් දක්වා වර්ධනය වී ඔවුන් පංචවිධ බහු සංඥා සහිත ජීවීන් බවටද අවසානයේදී මනුෂ්‍ය සත්ත්වයා දක්වාද විද්‍යාත්මකව පරිණාමයට පත් විය. සියලුම මනුෂ්‍ය සත්ත්වයින් එම පරිණාම ක්‍රියාවලිය තුල අඛණ්ඩව නැවත නැවත ඉපදීමේ ක්‍රියාවලියට අනුගතව එහෙත් එම ක්‍රියාවලිය ගැන විද්‍යාත්මක අවබෝධයෙන් තොරව මේ දක්වා පරිණාමයට ලක්වූවත් එම පරිණාමික විද්‍යාත්මක ක්‍රියාවලිය ගැන මේ වනතුරුත් පැහැදිලි අවබෝධයක් නොමැති මනුෂ්‍යයින් බවට පත් වී ඇත.

එම පරිණාමික ඒක ශෛලික ජීවී ක්‍රියාවලිය කායික සංස්කරණය ලෙසත් ඒ හා සමගාමීව චිත්ත ශක්තින් සතු සංවේදී සම්ප්‍රයුක්ත ඵලය වන මානසික සංස්කරණ ක්‍රියාවලියද ඒහා සමගාමීව ක්‍රියාත්මක වීම හේතුව වීමෙන් බහු ශෛලික සත්ත්වයින් වන පනුවන් කෘමීන් ලෙසද උරගයින් සිව්පා සතුන් ලෙසද අවසාන ඵලය වශයෙන් පරිණාත වූ මනුෂ්‍යය සත්ත්වයින් ලෙසද පරිණාමය විය. මෙම දිගු ප්‍රාග් ඓතිහාසික කාල සීමාව වසර මිලියන ගණනක සිට ක්‍රියාකාරීව අඛණ්ඩව පැවතීමෙන් එම විද්‍යාත්මක පරිණාම ක්‍රියාවලිය නිසා සත්ත්වයන් සතු කායික සංස්කරණයත් ඒ හා ප්‍රතිබද්ධව ක්‍රියාත්මක වූ චිත්ත ශක්තීන්ගේ සන්තතික ඵලය වන චිත්ත සංස්කරණයද ප්‍රශස්ත තත්ත්වයට පත් වීමෙන් පරිණාමයේ අවසාන ඵලය ලෙස මනුෂ්‍යය සත්ත්වයින් බිහි විය.

බුදුරජාණන් වහන්සේ විසින් උන්වහන්සේලා සතු පුද්ගලික අත්දැකීම් වන ප්‍රඥාව මගින් සමස්ත 31 ක් තලගත ජීවී සන්තතියෙහි කායික ක්‍රියාවලියෙහි සහ මානසික ක්‍රියාවලියෙහි ඔවුන්ගේ නිර්මාණාත්මක සන්තතික ධර්ම ස්වභාවයන් ගැන දේශනා කර ඇත. යමෙකුට එම සන්තතික

ස්වභාවයේ විද්‍යාත්මක නීතීන්ගේ විෂය වන ප්‍රඥාව අධ්‍යයනය කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සන්තතික දුක්ඛ ධර්මයේ නිරෝධය සඳහා හේතුව වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය එනම් මධ්‍යම ප්‍රතිපදාව පහත සඳහන් පියවර වලට අනුව අධ්‍යයනය කල යුතුව ඇත.

1. සම්මා දිට්ඨි
2. සම්මා සංකප්ප
3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීව
6. සම්මා වායාම
7. සම්මා සති
8. සම්මා සමාධි

යමෙක් මෙම මාර්ගය තුලින් එහි ඵල අවබෝධය ලැබුවේ නම් ඔහු බුද්ධ නමින් හඳුන්වනු ලැබේ. මෙලොවෙහි ක්‍රියාත්මකව ඇති මෙම ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු අධ්‍යාත්මික අවබෝධයට ලඟා වීමට ප්‍රඥාවන්තයෙකුට ඇති එකම අධ්‍යාත්මික සංස්කරණ මාවත වනු ඇත. ඉන් ලබන අවසාන ඵලය රහත් පදවිය බවට පත් වීමෙන් සන්තතික චිත්ත කර්ම සන්තතියෙහි නිරෝධය උදාවෙයි. මෙම අධ්‍යාත්මික නිර්වාණ මාර්ගයට විකල්ප වන අන් කිසිදු මාර්ගයක් මෙලොවෙහි නොමැති අතර යමෙකුට මෙම භව පැවැත්මෙහි අධ්‍යාත්මික ක්‍රියාවලියෙන් නිදහස් වීමටත් විශ්ව හා ලෝක ධර්මතාවයන්ගේ විද්‍යාත්මක සන්තතික ස්වභාවයන් අවබෝධකර ගැනීමටත් මෙම මාර්ගය තුලින් ප්‍රඥාවන්තයින්ට පමණක් හැකියාව ලැබී ඇත.

තථාගත ධර්මය යනුවෙන් හඳුන්වනු ලබන බුද්ධ දේශනාව යනු විද්‍යාත්මක ලෝක ස්වභාවයේ ධර්ම නීතීන්ට අනුව සැලසුම් සහගත වීමෙන් ක්‍රියාත්මකව පවතින ජීවී සම්භවයෙහි අන්තර්ගතය වන අතර පරිණාම ක්‍රියාවලියෙහි

විද්‍යාත්මකව සිදුවූ සත්ත්ව ජීවී ලෝකයෙහි ක්‍රියාකාරි මූලධර්ම කෙසේ සම්භවය වූයේද යන වගත් සහ කෙසේ සන්තතිය වන්නේද යන වගත් පැහැදිලිකර ඇති දේශනාවකි. ජීවී සත්ත්වයින්ගේ ලෝක ස්වභාවය එම සත්ත්වයින්ගේ උපත හා විපත එනම් ඇතිවීම හා නැතිවීමේ ක්‍රියාවලියකට සීමාවී ඇත. ජීවී සත්ත්වයින්ගේ සන්තතික ධර්මතාවයන් (31) තිස් එක් තලගත භවයන් අතර විවිධ භව පැවතීම් වශයෙන් ඔවුනොවුන්ගේ චිත්ත සංස්කරණයන්ගේ විවිධත්වයට අනුව විවිධ ජීවින් බවට පත් වේ.

බුද්ධ දේශනාව තුලින් පැහැදිලි වී ඇති ලෝක ස්වභාවයේ දුක්ඛ ධර්මයෙහි නිත්‍ය සත්‍යය වනුයේ ස්ථිතික විද්‍යුත් මාධ්‍යය කේන්ද්‍ර කරගත් විද්‍යාත්මක සැලසුමකි. ඒ හැර මෙම විද්‍යාත්මක ක්‍රියාවලිය සඳහා මැදිහත්කරුවෙකු හෝ නිර්මාණකරුවකු හෝ අදෘශ්‍ය දෙවියකු හෝ කිසි විටෙක මැදිහත් වී නැත. එහෙත් පහත සඳහන් පදාර්ථයන්ගේ පරමාණුක මූලද්‍රව්‍ය සහ ස්ථිතික විද්‍යුත් ශක්තීන් මගින් පවතින එකම විද්‍යුත් බලය වන සූර්යා හා චන්ද්‍රයා කේන්ද්‍ර කරගෙන ලෝකයෙහි පවතින සත්ත්ව හා ශාක ලෙසින් වන සියළුම සංස්කාරක වස්තූන් නිර්මාණය වී ඇත. එම මූලද්‍රව්‍ය වශයෙන් සංස්කරණ ක්‍රියාවලියට භාජනය වී ඇති ද්‍රව්‍යයන් ලෙස ඝන, ද්‍රව, වායු වන අතර ස්ථිතික විද්‍යුත් ශක්තිය ක්‍රියාකාරී ශක්තිය ලෙස සංයෝග වී ඇත. මෙම ශක්ති සහ පදාර්ථයන් මගින් සිදුවූ භෞතික හා රසායනික විද්‍යාත්මක සංයෝජනයන්හි දිගු කාලීනව සිදුවූ පරිණාමික ක්‍රියාවලිය තුලින් විශ්ව සහ ලෝකගත විද්‍යාත්මක ස්වභාව නීතීන්ට අදාලව ජීවීන්ගේ නිර්මාණ ක්‍රියාවලිය විකසනයවී ඇත. මෙම විද්‍යාත්මක පරිණාම ක්‍රියාවලියට මූලික වූ චන්ද්‍ර හා සූර්ය ශක්තීන්ට අමතරව විශ්වයේ අනෙක් ග්‍රහලෝකවල විද්‍යුත්

චුම්භක ආකර්ෂණයද සමස්ත සත්ත්ව ලෝකයෙහි කායික හා මානසික ධර්මතාවයෙහි සන්තතික ජීවි පැවැත්ම තහවුරු කර ඇත. මෙම ක්‍රියාවලිය ප්‍රබල හා ස්ථාවර ලෙස රඳා පවතින්නේ ජීව විද්‍යා ලෝකයේ විද්‍යාත්මක පදනමට මූලික හේතුව වන ප්‍රබලම ශක්තිය වන ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගෙන් වන බව ප්‍රඥාව හැදෑරීමෙන් අවබෝධ කර ගත හැක.

ප්‍රඥාව ලෙසින් වන බුද්ධ දේශනාව තුල අන්තර්ගතවී ඇති ප්‍රධාන අන්තර්ගතය වන්නේ ජීවීන්ගේ උපතට හා විපතට හේතුව වන විද්‍යාත්මක ක්‍රියාවලියෙහි මූලධර්මයන්හි යථාර්තය හඳුනා ගැනීමත් එම ක්‍රියාවලියෙන් ඉවත්වීම සඳහාත් ගතයුතු පියවර පිලිබඳ අවබෝධයත්ය. යමෙක් සිය උප්පත්ති ශක්තිය තුලින් මෙලොවට පැමිනීමට හේතුව වූ සිය චිත්ත සංස්කරණය අවිද්‍යාව තුලින් පිලියෙල කර ගැනීම පෙර භවයෙහිදී සිදුකර ගැනීම හේතුව වීමෙන් නැවත ඉපදීමේ ක්‍රියාවලියට අනුව වර්තමාන භව ජීවිතයක් ලැබීම ඵලයක් වනු ඇත. සත්ත්වයන්ගේ හැම මානසික දත්තයන්හිම මානසික කර්ම ක්‍රියාවලිය අවිද්‍යාවත් තෘෂ්ණාවත් හේතුව වීමෙන් එහි ඵලය නැවත උපත බවට පත් වේ. උපත සහ මරණය අතර කර්ම ක්‍රියාවලියෙහි සම්පූර්ණයෙන් අන්තර්ගතවී ඇත්තේ මානසික තත්ත්වයේ විද්‍යාත්මක සංසිද්ධීන්ගේ ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගෙන් වන අතර එය විශේෂයෙන් සකස් වූ අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත ස්ථිතික විද්‍යුත් බලයක් වන කායික සංස්කරණය මගින් පරිසරයෙන් ලබාගන්නා ස්ථිතික විද්‍යුත්මය රූප, ශබ්ධ, ඝන්ධ, රස, ස්පර්ශ ආදී වන ආරෝපිත ශක්තීන්ගේ ස්ථිති විද්‍යුත් බලයකි.

චිත්ත සංස්කරණය සත්ත්වයාගේ මනස තුල මතකයන් වශයෙන් ක්‍රියාත්මක වෙයි. එය කායික සංස්කරණය පාලනය කිරීමටද හේතුව වෙයි. චිත්ත සංස්කරණයේ

මතකයන් කර්ම ශක්තිය වශයෙන් ගබඩා වී ඇති අතර එම අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් ශක්තිය කර්ම ශක්තිය ලෙස සත්ත්වයාට නැවත උපතක් ඇතිකරලීමට හේතුව වෙයි. අවිද්‍යාව හා තෘෂ්ණාවට පාදකවූ චිත්තජ සංයෝජිත විද්‍යුත් ශක්තීන්ගේ සමානවූද ප්‍රතිවිරුද්ධවූද විද්‍යාත්මක ක්‍රියාවලියෙහි ප්‍රතිඵලය විපාකය ලෙසින් වන කර්ම ඵලය සඳහා වෙනත් භවයක නැවත උපතකට සෑම සත්ත්වයකුටම ප්‍රතිසංධි විය යුතුව ඇත. මෙම චිත්ත සංස්කරණගත කර්මජ ස්ථිතික විද්‍යුත් ශක්තිය ලෝක විශ්ව පරිශ්‍රය තුල ක්‍රියාත්මක සෙසු විද්‍යුත් ශක්තීන් වන චුම්භක ශක්තිය, ස්ථිතික විද්‍යුත් ශක්තිය, තාප ශක්තිය, ගුරුත්වජ ශක්තිය ආදී ලෙසින් වන ප්‍රබල ලෙස ක්‍රියාකාරි විද්‍යුත් ශක්තීන් මෙන් ක්‍රියාකාරීව පවතින අතර මනුෂ්‍යයින්ගේ භෞතික කාය ඉන්ද්‍රියයන්ට හා විද්‍යුත් උපාංග හා විද්‍යුත් උපකරණ වලට සංවේදී නොවනු ඇත.

අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුතය ලෙස සත්ත්වයින්ගේ කර්ම ශක්තීන් පිළියෙළවීමේ චිත්තජ සම්ප්‍රයුක්ත විද්‍යුත් බලය චිත්ත ශක්තීන් මගින් නිර්මාණය වන ආකාරය සිදු වන්නේ කෙසේදැයි බුදුරජාණන් වහන්සේලා විසින් සිය අධ්‍යාත්මික පර්යේෂණ ක්‍රියාවලිය වන ප්‍රඥාව තුලින් විශ්ලේෂණය කරනු ලැබ ඇත. එලෙසම චිත්ත සංස්කරණයේ සැකැස්මට අනුව ජීවියකුගේ නැවත ඉපදීම සඳහා කායික සැලැස්ම පිලියෙලවන ආකාරය පූර්ව භවයේදී සිදුවන ආකාරයත් එම අධ්‍යාත්මික ස්ථිති විද්‍යුත් ශක්තීන්ගේ අන්තර්ගත සංයෝජන ශක්තීන් විශ්වය තුල අඛණ්ඩව ඔවුන්ගේ හැම මරණයකින්ම අනතුරුව තවත් භවයකට මාරුවීම සඳහා ක්‍රියාත්මක වන ආකාරයත් පැහැදිලි කර ඇත. විවිධ තලයන්ගේ චිත්ත සංස්කරණයන් නිර්මාණය වී ඇත්තේ මනුෂ්‍යයින් හා තිරිසන් සත්ත්වයින් විසින් අවිද්‍යාවෙන් හා තෘෂ්ණාවෙන් නිර්මාණය

කරනු ලබන කුසල් අකුසල් මත වන අතර එය 31 තල ගත විශ්ව භව සන්තතියෙහි පැවැත්මට හේතුව වනු ඇත.

නිර්වාණය අවබෝධ කර ගත යුතු පුද්ගලයා ඔවුන්ගේ ගෘහස්ත ජීවන ක්‍රියාවලියෙන් හා ජීවන වෘත්තීන්ගෙන් මුලුමනින්ම වෙන්වීමෙන්ද ආහාර ලබා ගැනීම සඳහා ගෙයින් ගෙට පිඩුසිඟා යෙදෙමින්ද පාංශුකූලික සිවුරු හැඳ පොරවා ආරණ්‍යයිකව ශූන්‍යාගාරගතව අධි චිත්ත අධි ශීල සංවරයට පැමිණීමෙන්ද අතහරින ලද උදෑසන හා රාත්‍රී ආහාර වේල් දෙක වෙනුවට ඖෂධීය ගිලන්පස පානයන් පමණක් ගනිමින්ද ගමෙන් ඈත්වූ වනගත ආරාමයක වෙසෙමින් උපසම්පදා ශීලයට අදාලව හා තාප ශ්‍රමණ යෝගාවචර ධූතාංග ශීලයන්ට අනුව ජීවිකාව ගෙන යා යුතුය.

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරගත් ලොවෙහි ක්‍රියාත්මක විද්‍යාත්මක ධර්මයන්හි පරම සත්‍යය වන්නේ චතුරාර්ය සත්‍යයයි. උන්වහන්සේ විසින් ලෞකික මනුෂ්‍යයන්ට සංස්කාරක ද්‍රව්‍යයන්ගේ සුභසාධනය මගින් ලැබෙන්නා වූ කාම තෘෂ්ණාව කෙරෙන් ඉවත් වීමෙන් කිසිවෙකුගේ කිසිම උදව්වකින් තොරව නිර්වාණ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කල යුතු බවට අනුශාසනා කරන සේක. යමෙකු ද්‍රව්‍යාත්මක ලෝකයේ කාම ස්පර්ශයෙන් නිදහස් වීමට උත්සාහ දරයි නම් ඔවුන් ප්‍රථමයෙන් ප්‍රඥාව ලෙසින් වන විද්‍යාත්මක හා අධ්‍යාත්මික ක්‍රියාවලිය අවබෝධ කරගත යුතු අතර විදර්ශණා ප්‍රඥාව අත්පත් කර ගැනීමෙන් ලබන ඵලය වන්නේ මාර්ග අවබෝධයත් එහි ඵල අවබෝධයත්ය. යමෙකුගේ නිර්වාණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ තථාගත බුදුරදුන් පිළිබඳ ශ්‍රද්ධාවත් දේශනා කරනු ලැබූ චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත වූ

ප්‍රඥාවත් එලෙසම අධිශීල අධි චිත්ත අධි ප්‍රඥා සම්ප්‍රයුක්ත උපසම්පදා ශීලයට පත් විනයධර භික්ෂු සමාජය පිළිබඳ ශ්‍රද්ධාවත් හා එම ත්‍රිවිධ අංශය ගැන මනා අවබෝධයත් මතයි.

## - බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය -

*ප්‍රඥාව සහ ශීලය සම්බන්ධයෙන් මිනිසුන් ඉතිහාසයේ පවසන ආකාරයට ක්‍රිස්තුස්වහන්සේ ප්‍රබලයි කියා මට පැවසීමට නොහැකිය. මම සිතන ආකාරයට බුදුරදුන් ක්‍රිස්තුස් වහන්සේට වඩා ඉදිරියෙන් සිටිය යුතුය.*

*ඉතිහාසයේ පවතින ශ්‍රේෂ්ඨ ආගම් වලට අනුව මම බුදුදහමට වඩාත් කැමැත්තක් දක්වමි. විශේෂයෙන්ම මුල් බුදුසමය පිළිබඳ වඩාත් කැමැත්තක් පවතී. මන්දයත් එහි නිකායික ඝට්ටනයක් හෝ සුළුම හෝ වෛරී සහගත සිදුවීමක් හෝ ක්‍රියාත්මක නොවන බැවිනි.*

**- බර්ට්‍රන්ඩ් රසල් -**

**("මම ක්‍රිස්තු භක්තිකයෙකු නොවූයේ ඇයි"' නමැති ග්‍රන්ථයෙනි)**

## 1.2 සන්තතික කර්මජ සිතින් නිදහස්වීම අරමුණු කර ගන්නේ කෙසේද?

ලෞකික ද්‍රව්‍යාත්මක ලෝකයෙහි දියුණුව අතහැරීමෙන් යමෙකු විසින් තමාගේ චිත්ත ශක්තීන්ගේ සන්තතික කර්ම පැවැත්මේ ක්‍රියාවලියෙන් නිදහස් වීමෙන් අත්පත් කර ගන්නා අවසාන ඵලය අරහත් භාවයට පත්වීම වනු ඇත. මේ සම්බන්ධයෙන් ඇති සීල සංවරයත් චිත්ත ඒකාග්‍රතාවය වන සම්මා සමාධියත් සහ ප්‍රඥාවත් වැඩි දියුණු කර ගැනීම සඳහා ප්‍රායෝගිකව දැඩි වෙහෙසකටත් ඒ සඳහා පවතින විශාල බාධාවන්ටත් මුහුණ දිය යුතුව ඇත. එහෙත් දැඩි වීර්යය හා දැඩි කැපවීම තුලින් බුදුන්වහන්සේ විසින් අනුමත කලාවූ ආර්ය මාර්ගය තුලින් අවබෝධය සඳහා ගතයුතු පියවර අනුගමනය කිරීමෙන් නිර්වාණ මාර්ගයට අවශ්‍ය සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැක. කෙසේ වෙතත් අවසාන ප්‍රතිඵලය රඳා පවතින්නේ චිත්ත සන්තතියෙහි පූර්ණ භවයන්හිදී යමෙකු විසින් වැඩි දියුණු කල කුසල් කර්මයන්ගේ දාන, සීල, භාවනා වන ත්‍රිවිධ පූණ්‍ය ක්‍රියාවන්ගේ කුසල් කර්ම අත්දැකීම් මතය.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුව ප්‍රායෝගිකව වැඩි දියුණු කරගත යුතුව ඇති ඉහත සඳහන් කුසල් ධර්මයන් නිර්වාණ මාර්ගය වැඩීම සඳහා අවශ්‍යවන ප්‍රධාන මූලධර්ම වශයෙන් වන ශ්‍රේෂ්ඨ වූ අධ්‍යාත්මික මානුෂික ධර්මතාවයන්ය. ස්වභාවයේ පවතින විද්‍යාත්මක ක්‍රියාවලිය වන හේතුඵල ධර්ම නීතියට යටත්ව සමස්ත ජීවී වර්ගයාටම ඉතා කෙටි ජීවිත කාලයක් ජීවත් වීමට සිදුව ඇත. මෙම සත්ත්ව ධර්මතාවයන්ගේ නීතිරීති ස්වභාවයේ ක්‍රියාත්මක වන විද්‍යාත්මක ව්‍යවස්ථාවන් වන අතර නොපෙනෙන දේව හෝ බ්‍රහ්ම හෝ වෙන අන් නිර්මාණකරුවකු විසින් මෙහෙය වන්නක් නොවනු ඇත. යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයෝ නිර්මාණාත්මක සංස්කාරක වස්තූන් තමාගේ වශයෙනුත් මගේ වශයෙනුත් හා

මම වශයෙනුත් අවිද්‍යාත්මකව මානසික ග්‍රහණයට ලක්ව තෘෂ්ණාවත් ද්වේශයත් ක්‍රියාත්මක වන දුක්ඛ වේදනා පාදක සන්තතික කර්ම ක්‍රියාවලිය තහවුරු කර ගනු ඇත.

විද්‍යාත්මකව සැලසුම්ගත වූ සත්ත්ව ජීවී ලෝකයේ විද්‍යාත්මක ධර්මතාවයන්ගේ සන්තතික විද්‍යාත්මක නීතීන් ඒවායේ ක්‍රියාත්මක වන ඇතිසැටිය තථාගතයන් වහන්සේ විසින් තමන් වහන්සේ බුද්ධත්වයට පත් වීමෙන් අනතුරුව සද්ධර්මය ලෙස දේශනා කරනු ලැබ ඇත. මෙහිදී තමන් වහන්සේගේ අධ්‍යාත්මික වූද පෞද්ගලික වූද අධ්‍යාත්මික අත්දැකීම් ප්‍රඥාව වශයෙන් විශ්ව ලෝක ධර්මයාගේ විද්‍යාත්මක ස්වභාවයන්ගේ ඇති සැටිය දේශනා කරනු ලැබ ඇත. එලෙසම සිත සහ එහි සම්ප්‍රයුක්ත බලය වන මනස පිළිබඳව විශ්ව ලෝක ධර්මයන්හි පවත්නා සන්තතික ශක්තිය වන ස්ථිතික විද්‍යුත් ශක්තීන් මගින් සැලසුම් සහගත වී ඇති අයුරුත් එම ස්ථිතික විද්‍යුත් සම්භවය සහිත මානසික ශක්තිය පාරිසරික විද්‍යුත් සංඥාවන්ට අනුව ස්පර්ශ වීමේ ක්‍රියාව මගින් සම්බන්ධීකරණය පවත්වාගෙන යන්නේ කෙසේද යන බවත් එහි ඵලයක් වශයෙන් සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික බලය ජීවීන්ගේ පැවැත්මේ අඛණ්ඩව පවතින නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියෙහි සැලැස්ම පිලිබඳවත්ය. සත්ත්වයින්ගේ අන්තර්ගත චිත්ත ශක්තිය යනු කාය සංස්කරණය සඳහා මූලික හේතුව වීමටද නැවත නැවත ඉපදීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය සඳහා හේතුව වීමටද මූලික වන ශූක්ෂ්ම හා ප්‍රබල පොදුවූ ශක්තියයි. විද්‍යාත්මකව සන්තතික වන මානසික සංස්කරණ කර්ම ශක්තීන් එනම් මනෝ විඥාණය සත්ත්වයින්ගේ කායික සහ මානසික විද්‍යාත්මක සම්බන්ධතාවය සඳහා ස්ථිතික විද්‍යුත් ප්‍රභවගත අධ්‍යාත්මික ක්‍රියාවලියක් නිර්මාණය වීම සඳහා ස්වභාවික විද්‍යාත්මක නීතිය වන හේතුඵල ධර්මතාවයන්ට අදාලව සිදු වේ.

ලෝක විශ්වගත සන්තතික පැවැත්මෙහි විවිධත්වය රඳා පවතින්නේ 31 ක් තලයක වූ මානසික ස්වභාවයන්ගේ සංස්කරණයන්ගේ විවිධ මානසිකත්වයන් හේතු කොට ගැනීමෙන් වන අතර එම තලයන් සුගති හා දුගති වශයෙන් ද්විත්වයක් වේ. මෙම 31 ක් තලගත භවයන්ගේ විවිධත්වය සඳහා හේතු වූ විවිධාකාර මානසික තත්ත්වයන් අවිද්‍යාවත් තෘෂ්ණාවත් හරහා සැලසුම් කරගත් මානසික තත්ත්වයකි. සමස්ත ජීවීන්ගේ නැවත ඉපදීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමට හේතුව වන එනම් කායික සංස්කරණයක් ලැබීමට මූලික වන අධ්‍යාත්මික හේතුව වන්නේ පංච උපාදානස්කන්ධය ලෙස ගබඩා කරගනු ලබන පංචවිධ ස්ථිතික විද්‍යුත්මය රූප සංඥාවන්ගේ මානසික විද්‍යුත් ක්‍රියාවලිය ලෙසින් වන චේතනාව ඵලය වීමෙනි.

මානසිකව සැලසුම් සහගතව පිලියෙල කරගනු ලබන අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලිය අවිද්‍යාව හා තෘෂ්ණාව හේතූන් වීමෙන් කාම ස්පර්ශයන්හි ප්‍රියමනාප සැප වේදනාව මත පදනම්ව සත්ත්වයින්ගේ සන්තතික මානසික කර්ම ක්‍රියාවලිය පිලියෙල වනු ඇත. නිර්මාණාත්මක හා මායාකාරී වන එමෙන්ම මානසිකවූ සත්ත්වයින්ගේ කර්ම ක්‍රියාවලිය පෘතග්ජන සන්තතික විද්‍යා ක්‍රියාවලියක් වන අතර ලෝභී ධර්ම හා ද්වේෂී ධර්ම මත පදනම් වී ඇත. පෘතග්ජන මනුෂ්‍යයන් විසින් මෙහෙය වනු ලබන ද්වේෂී ධර්ම එහි අනිත් අන්තය වන ලෝභී ධර්මයන්ගේ ස්වභාවගත විද්‍යාත්මක පැවැත්මේ යාන්ත්‍රණයයි. ස්වභාවික හේතුඵල නීතීන්ට යටත්ව සන්තතිකව නැවත ඉපදීමේ ධර්මතාවය සඳහා සත්‍ය ලෙසින්ම සත්ත්වයින්ට නැවත ඉපදීමේ මානසික දුක්ඛ ස්වභාවයන්ට පමණක් නොව එයට සහජාතකව ක්‍රියාත්මක වන ජාති, ජරා, ව්‍යාධි, මරණ නම් වන ඉතා ප්‍රබල දුක්ඛ සංවේදී බලවත් වූ අප්‍රසන්න ධර්මතාවයන්ටද මුහුණ දීමට සිදු වේ. මෙම ක්‍රියාකාරී විද්‍යාත්මක ධර්මතාවයෙහි ඇති තතු චතුරාර්ය

සත්‍යය ලෙස බුදුරජාණන් වහන්සේ විසින් ලෝකයට දේශනා කර ඇත.

සත්ත්වයකුගේ ජීවිතය හා සහජාතකව ක්‍රියාත්මක වන මමත්වය සඳහා හේතුව වන අධ්‍යාත්මික සම්බන්ධීකරණය පිලිබඳව වන අධ්‍යාත්මික නිදහස් වීම සොයන්නා වූ අධ්‍යාත්මික පර්යේෂකයෙකු තමා විසින් දැඩි අවධානය කායික හා මානසික ශීල සංවරය සඳහා විධිමත්ව අධි ශික්ෂණයට පැමිනීමෙන් සම්මා සමාධියට පත්වීමේ සප්තවිධ ලෙසින් වන චිත්ත විශුද්ධිය අත්පත් කර ගැනීම සඳහා ක්‍රියාකල යුතුව ඇත. ඉහත කුසල් ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස ඕනෑම ප්‍රඥාවන්තයෙකුට නිර්වාණයට පත්වීමේ අවසන් ඵලය වන සම්මා සමාධිය විදර්ශනා භාවනා ක්‍රියාවලිය තුලින් අත්පත් කරගත හැකිය. මාර්ගාවබෝධය හා මාර්ගඵලය ලබා ගැනීමට යමෙකු වීර්යය ගන්නේ නම් තමා විසින් අනුගමනය කරනු ලබන සීල සංවර ප්‍රතිපත්තියට හානි නොවීමටද වගබලා ගත යුතුය. ඒ සඳහා උත්සාහයත් අධිෂ්ඨානයත් මත දැඩි කැපවීමත් අවසානයේදී අත්පත් කරගත හැකි අධිශිල සංවරයට පැමිණීම දක්වා සිදු කරගත යුතුය. යමෙකු ආර්ය අෂ්ඨාංගික මාර්ගය හැදෑරීමට උත්සාහ කරන්නෙකු නම් ඔහු විශ්ව ලෝකගත ප්‍රඥාවෙහි අවබෝධයට ලඟාවීම පිණිස එනම් පවත්නා ලෝක ව්‍යවස්ථාවෙහි නීතීන්ගේ ඇතිසැටිය නිවැරදිව අවබෝධකර ගැනීමෙන් විමුක්තිය සඳහා උත්සාහ ගත යුතුව ඇත.

නිර්වාණ අවබෝධය ලැබීම සඳහා යමෙකු විසින් දැඩි කැපවීමකින් යුතුව තථාගත වූ ප්‍රඥාපාදකවූ සීල සංවරයත් ප්‍රඥාවත් ප්‍රගුණ කල යුතුව ඇත. ප්‍රඥාව අරමුණුව පවත්නා ශ්‍රේෂ්ඨ වූ සීල සංවරය මගින් යමෙකුට චතුරාර්ය සත්‍යය පිලිබඳ අවබෝධය ලබා ගෙන ශ්‍රමණ භික්ෂුවක් බවට පත් විය හැක. ඒ සඳහා හේතුව වන අධ්‍යාත්මික ක්‍රියාවලිය වන්නේ

ශ්‍රද්ධා - (තෙරුවන් පිලිබඳ ප්‍රසාදය)
ශීල - (මධ්‍යම ප්‍රතිපදාගත ශීල ප්‍රතිපත්තීන්හි යෙදීම)
ශ්‍රැත - (චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත සද්ධර්ම ශ්‍රවණය)
චාග - (සංස්කාරක වස්තූන්ගේ කායික හා මානසික ඇලීමෙන් නිදහස් වීම, අතහැරීම)
ප්‍රඥා - (ලෝකයෙහි පවතින සත්ත්ව හා ශාක ලෙසින් වන මුලුමහත් සංස්කාරක වස්තූන්ගේ නිර්මාණාත්මක ක්‍රියාවලියට පදනම්වූ මුලද්‍රව්‍යය හා සංයෝජනය වී ඇති ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ විද්‍යාත්මක සම්බන්ධීකරණය පිලිබඳ වන විද්‍යාත්මක සන්තතික ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය)

යමෙකු විසින් ඉහත සඳහන් අධ්‍යාත්මික ක්‍රියාවලියට යොමුවීමෙන් අධි චිත්ත ශක්තීන්ගේ අධ්‍යාත්මික ක්‍රියාවලියට යොමු වන අතර එය නිර්වාණ මාර්ගයට පදනම වනු ඇත.

යමෙකු විසින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය සාර්ථකව අනුගමනය කිරිමෙන් ලැබෙන ඵලය වන්නේ සාමාන්‍ය පෘතග්ජන මානසික සංවේදන මට්ටම ඉක්මවන ලෝකෝත්තරවූ විශ්ව අවබෝධය වන එනම් ප්‍රඥාව නම්වන අධ්‍යාත්මික විද්‍යාවෙහි විද්‍යාත්මක ධර්මතාවයන්ගේ චිත්ත ශක්තියේ යථා ස්වභාවයේ අවබෝධය වන අතර එය ප්‍රඥාවන්තයෙකුට සාර්ථකව නිර්වාණ අවබෝධය ලැබීම සදහා පෘතග්ජන වූ ද්‍රව්‍යාත්මක ලෝකයෙන් පහසුවෙන් නිදහස් වීමට හේතුව වනු ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨවූ බුදුරදුන් පිළිබඳ ඇති ශ්‍රද්ධාවත්, උන්වහන්සේ විසින් දේශිත විශිෂ්ඨ ඉගැන්වීම වන චතුරාර්ය සත්‍යයත් මූලික හේතුව වෙයි. සමස්ත සත්ත්ව ලෝකය තුල ක්‍රියාත්මක ජාති, ජරා, ව්‍යාධි, මරණ ලෙසින් වන සමස්ත සත්ත්ව ලෝකයටම ප්‍රිය නොවන දුක්ඛ ධර්ම ක්‍රියාවලිය තුලින් නිදහස් වීමට ද ඉන්

හැකියාව ලැබේ. ප්‍රඥාවන්තයින්හට නිවන සඳහා බාධක ව පවතින පෘතග්ජන අකුසල ක්‍රියාවන්ගෙන් නිදහස් වීම සඳහා, එනම් නිර්වාණයට පත්වීම සඳහා චතුරාර්ය සත්‍යය ධර්මයට අදාල ආර්ය අෂ්ඨාංගික ධර්ම මාර්ගය අනුගමනය කල යුතුව ඇත. මානසික සංස්කරණ ශක්තීන්ට අනුව එනම් මනෝ විඥාණයට අනුව පූර්ව භවයන්හිදී සංවිධානය කරගත් හා පිලියෙල කරගත් ප්‍රධාන කුසල් හා අකුසල් කර්ම ශක්තීන් යමෙකුගේ නැවත ඉපදීමේ ධර්මතාවය සඳහා හේතුව වන අතර එයට සහජාතකව ක්‍රියාත්මක වන ජාති ජරා ව්‍යාධි මරණ නම් වන ඉතා ප්‍රබල දුක්ඛ සංවේදී එමෙන්ම බලවත්වූ අප්‍රසන්න ධර්මතාවයන්ට ද මුහුණ දීමට සිදුවනු ඇත. මෙම ධර්මතාවයේ ඇති තතු චතුරාර්ය සත්‍යය ලෙස බුදුරජාණන්වහන්සේ ලෝකයට දේශනා කර ඇත.

යමෙකුට ප්‍රඥාවේ අවබෝධය වර්ධනය කර ගැනීමට අවශ්‍ය නම් ප්‍රථම කොට ආර්ය අෂ්ඨාංගික මාර්ගය දාන සිල භාවනා වැනි ක්‍රියාකාරකම් තුලින් ප්‍රායෝගිකව හැදෑරීමට යොමු විය යුතුය. එහි ඵලය ඉතා ඉහල තත්ත්වයක් වශයෙන් ලැබිය යුතුවන අධ්‍යාත්මික අභිවෘද්ධිය වන ප්‍රඥාව සඳහා මාර්ගය වනු ඇත. බොහෝ ප්‍රඥාවන්තයින් තමාගේ දැඩි කැපවීම තුලින් අධිශීල ශික්ෂණයට පැමිණීමෙන් ප්‍රබල ලෙස කුසල ක්‍රියාවන්හි නිරත වීමෙන් සිය ජීවිත කාලය තුලදී ප්‍රඥාවබෝධය සඳහා යොමු වනු ඇත.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය සිල සමාධි ප්‍රඥා ලෙසින් දියුනු කර ගැනීම තුලින් සහ එම මාර්ගයේ නීතිරීති වලට අනුගත වීම තුලින් අත්පත් කරගත හැකිවන අධ්‍යාත්මික බලය යමෙකු විසින් පූර්ව භවයේදී එම මාර්ගයේ යෙදීමෙන් ලැබූ කුසල් අත්දැකීම් මත රඳා පවතී. සත්ත්වයින්ගේ ඉපදීමේ කර්ම සන්තතිය රඳා පවතින්නේ කායික සහ මානසික අධ්‍යාත්මික ශක්ති සංස්කරණය වන මානසිකව පිලියෙල කරගත් මානසික කර්ම සැලැස්මක් මගිනි.

# බුදුරදුන් සියලු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙනි

*බුදුරදුන් යනු බෞද්ධයින්ට පමණක් අයිතිවාසිකම්*
*කිවහැකි දායාදයක් නොවේ.*
*උන්වහන්සේ සියලුම මනුෂ්‍යය වර්ගයාගේ පොදු දායාදයකි.*
*උන්වහන්සේගේ ඉගැන්වීම හැමට පොදු දහමකි.*
*බුදුරදුන්ගෙන් පසුව පැවත එන සියලුම ආගම් බුදුරදුන්ගෙන්*
*ගත් බොහොමයක් ශ්‍රේෂ්ඨ අදහස් මත ගොඩනගා ගෙන ඇත.*

**- මුස්ලිම් විද්වතෙකු -**

## 1.3 නිර්වාණයට පත්වීමට ඔබ සුදුසු ද?

තමන් සතු කායික සංස්කරණයත් මානසික සංස්කරණයත් එකතුවීමෙන් නිර්මාණය වන සම්ප්‍රයුක්ත වේදනා සංවේදී ධර්මතාවය එනම් මම වශයෙන් සිතීමට පාදක වන ජීවී ධර්මතාවයන්ගේ විද්‍යාත්මක සැලැස්ම තමන් විසින්ම තනි තනිව අධ්‍යයනය කළ යුතුව ඇත. කායික නිර්මාණය සඳහා හේතුව වන විද්‍යාත්මක ක්‍රියාවලිය මානසික සංස්කරණ ක්‍රියාවලිය ප්‍රධාන මූලධර්මය ලෙස හේතුව වීමෙන් ඉපදීම හා මියදීම වශයෙන් වන සත්ත්වයින්ගේ විද්‍යාත්මක සන්තතික ක්‍රියාවලියට පදනම වනු ඇත. මේ සම්බන්ධයෙන් තථාගත ධර්ම අවබෝධය නොමැති යමෙකුට තමාගේ අධ්‍යාත්මික ධර්මතාවයන්හි විද්‍යාත්මක සැලැස්ම තම තමන්ගේ මානසික හා කායික දුක් වේදනා සහිතව සැලසුම් සහගත වී ඇති අයුරු පහසුවෙන් අවබෝධ කරගත නොහැක.

නිර්වාණය පාදක වන අධ්‍යාත්මික අභිවෘද්ධිය උදෙසා ප්‍රඥාවන්තයින් විසින් එම අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි අවබෝධයත් ඉන් ලබන ඵලය වන ඒකාග්‍රතා සම්ප්‍රයුක්ත සම්මා සමාධිය කායික වේදනා සංවේදී ක්‍රියාවලිය හා බැඳෙන මානසික සංවේදී ක්‍රියාවලියත් කෙසේ සම්මා සමාධියට පාදක වන්නේ දැයි අධි ශීල අධි චිත්ත විදර්ශනා අවබෝධය තුලින් ලබාගත යුතුය. මෙම අධ්‍යාත්මික ක්‍රියාවලිය මුළුමනින්ම නිර්වාණයට පත්වීමේ අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි අවසාන ඵලය වන සම්මා සතියට පත්වීමේ මුලධර්ය වනු ඇත. තථාගතයන් වහන්සේ විසින් පෘතග්ජන ලෝකයාට දේශනා කරනු ලැබූ හේතුඵල දහම යනු සම්ප්‍රයුක්ත විද්‍යාත්මක හා අධ්‍යාත්මික ධර්මයන්හි සැලසුමෙහි ක්‍රියාත්මක සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන්ගේ නැවත ඉපදීමේ හා මියදීමේ කර්ම ධර්මය පැහැදිලි කිරිමේ ප්‍රඥා ධර්මය වනු ඇත.

ආර්ය අෂ්ඨාංගික මාර්ගගත සම්මා සතිය එනම් සතිපට්ඨානය අවබෝධ කරගැනීමෙන් තොරව යමෙකුට පවත්නා සන්තතික කර්ම ධර්මයාගෙන් නිදහස් වීමට හෝ තමන් යනුවෙන් සිතනු ලබන පුද්ගල ස්වභාවයේ නිර්මාණයට හේතුව වන විද්‍යාත්මක ස්වභාවයෙහි ඇතිසැටිය අවබෝධකර ගැනීම කිසි විටෙක පහසු නොවනු ඇත. මේ සම්බන්ධයේදී යමෙකු විසින් ප්‍රායෝගික විය යුතු නිර්වාණ මාර්ගය ගැන අධ්‍යයනය කළ යුතුව ඇති ආනාපාන සති ක්‍රියාවලිය එනම් හුස්ම ඉහළ ගැනීම හා පහළ ගැනීමේ ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලිය පාදක කරගනිමින් සිතෙහි ඒකාග්‍රතාවය ප්‍රගුණ කිරීමේ ප්‍රායෝගික මුලික අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි මුලධර්මය වන සිහිය පිහිටුවීම එනම් සතිපට්ඨානය කෙරෙහි යොමු කරගත යුතුව ඇත.

හුස්ම ඉහළ පහළ ගැනීමේ ක්‍රියාවලියෙහි අවධානය යමෙකුට ප්‍රගුණ කරගත හැකිනම්, එනම් කායික ශරීරයත් ඒ

නිසා ඉපදෙන මමත්වය නැමැති දැක්මත් සම්බන්ධීකරණය වී ඇති ධර්මතාවයන්ගේ ඇති සැටියත් ඉන් ඉවත් වීමෙන් පිහිටුවා ගතයුතු ඵලය වශයෙන් සිතෙහි එකඟ බව තහවුරු කරගත හැක. එවිට අධ්‍යාත්මික ධර්මතාවයන්ගේ සම්ප්‍රයුක්ත හේතුන් විසින් කර්ම ශක්තීන් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පහසුවෙන් හඳුනාගත හැකිව ඇත. මෙම ආශ්වාස, ප්‍රාශ්වාස ක්‍රියාවලියට අනුව යමෙකුට සිහියට පත්වීමෙන් මෙම මාර්ගය අනුගමනය කිරීමට මුලික පියවර ගතහැකි වන අතර කායික ඉන්ද්‍රියන් පිනවීමේ කාම තෘෂ්ණාවන් මධ්‍යස්ථ ප්‍රමාණයකට සීමා කර ගැනීමට හැකියාවත් ඒ තුලින් මානසික හා කායික සංවරය ස්ථාවර කරගැනීමට හැකිවනු ඇත. යමෙකුට ත්‍යාගශීලීවීමේ නොහැකියාව ඔවුන්ගේ කායික මානසික පැවැත්ම තුල ප්‍රබල ලෙසින් කාම රාගය ප්‍රගුණ වීම සඳහා හේතුව වන අතර එයට ප්‍රතිපක්ෂවූ ප්‍රබල ක්ලේෂ ධර්මය වන වෛරයට පදනම ගොඩනැගෙනු ඇත. මෙය සාමාන්‍ය අඥාන මනුෂ්‍යයකු සතු ක්‍රියාකාරි සන්තතික කර්ම ධර්මතාවයෙහි සැලැස්ම වනු ඇත. සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ගේ ක්‍රියාකාරි ජීවන සැලැස්ම තුලින් ඔවුනගේ කාම තෘෂ්ණාවේ ඵලයක් වශයෙන් හිමිවන අඥානකම නිසා ලොවෙහි ක්‍රියාත්මක විද්‍යාත්මක ධර්මතාවයන්ට ඔවුන් පිටුපා ක්‍රියා කරනු ඇත. මේ නිසා ඔවුන්ට විද්‍යාත්මක ක්‍රියාකාරි ලෝකය පිළිබඳව වැරදි අවබෝධය වන මිත්‍යා දැකීම් සහිත දේව මැවීම් පිලිබඳ විශ්වාස ගොඩනැගෙන අතර, දෙවියන් වැඳීම දේව යාඥා කිරීම එමෙන්ම බ්‍රහ්ම යාග, හෝම පැවැත්වීම කෙරෙහි දැඩි ලෙස යොමුවී ඇත. මෙවැනි අඥාන පෘතග්ජන මනුෂ්‍යයින් ලොවෙහි ක්‍රියාත්මකවන විද්‍යාත්මක ධර්ම රටාවෙහි විද්‍යා අවබෝධයෙන් ඉවත්වුණු එනම් ප්‍රඥාව රහිත වූ ලොවෙහි චතුරාර්ය සත්‍යය ධර්මය ඇති ලෙසින් විශ්ලේෂණය කළ නොහැකි වූ එමෙන්ම මරණයෙන් පසු තමන්ට සිදුවන්නේ කුමක්දැයි ස්ථිරව නොදන්නාකම

හේතුවෙන් ඒහා කැටුව යන දුක්ඛ දෝමනස්සයන්ගෙන් නිදහස් වීමටද නොහැකි අවාසනාවන්ත අශ්‍රද්ධාන මනුෂ්‍යයින් වනු ඇත. ප්‍රඥාව සඳහා වන අධ්‍යාත්මික ක්‍රියාවලිය යනු පෘතග්ජන කායික සහ මානසික කර්ම ක්‍රියාවලියෙහි අවබෝධයෙන් යමෙකු ලබන විද්‍යාත්මක අවබෝධය වනු ඇත. අධිශීලයෙහි ඵලයක් වශයෙන් ලැබෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගගත මාර්ගාවබෝධය හා මාර්ග ඵලයට අදාලව විද්‍යාත්මක අවබෝධතා ඵලය වන ප්‍රඥාව අනිවාර්යෙන්ම රදා පවතිනුයේ ශ්‍රද්ධාව දියුණු කරගැනීමේ වීර්යය සම්ප්‍රයුක්ත සම්මා සති පාදක සම්මා සමාධිය තුලින් ලබන ප්‍රඥාව මගිනි. ඉහත අධ්‍යාත්මික ක්‍රියාවලියේ ඵලයක් වශයෙන් යමෙකු ලබන අධ්‍යාත්මික උසස් අවබෝධය ප්‍රඥාව වන අතර එවැනි උතුමන් **රහතන්වහන්සේ** ලෙසින් හඳුන්වනු ඇත.

ශ්‍රේෂ්ඨවූ ප්‍රඥා අවබෝධය මගින් හෙලිවන හේතුඵල ධර්මතාවයන්ගේ විශ්ව නීතිගත විද්‍යා ධර්මතාවයන් යමෙකුගේ අධ්‍යාත්මික අවබෝධය වන නිවන සඳහා රඳා පවතී. සමස්ත සංස්කාරක ධර්මයන්ගේ නිර්මාණාත්මක වස්තූන් ඒවා සතුව පවතින ලාක්ෂණික ස්වභාවයේ අසාර්ථක බව හා දුර්වල ස්වභාවය පහත ලෙසින් ත්‍රිවිධාකාරව පවතී.

* අනිත්‍යතාවය - වෙනස්වන ගති ස්වභාවයන් සහිත ක්‍රියාවලියකට භාජනය වීමෙන් නිර්මාණය වන ලෝකයෙහි නිර්මාණාත්මක සංස්කාරක වස්තූන්ගේ වෙනස්වන ස්වභාවයයි. එනම් ඇතිවීම හා නැතිවීමේ ක්‍රියාවලියට බඳුන් වන සංස්කාරක වස්තූන් වන සත්ත්ව හා ශාක ප්‍රජාව

* දුක්ඛ ස්වභාවය - සත්ත්වයන්ගේ කායික ශරීරයන්හි පවත්නා අස්ථාවර ස්වභාවය පාදක වීමෙන් ඇතිවන

(උත්පාද වය ස්වභාවය) කායික හා මානසික දුක සහ වේදනාව, විශාදය, අසතුට, කණස්සල්ල, සෝතැවුල, මානසික ආතතිය, මානසික අවපීඩනය, වෛරය, තරහව, සාංකාව, මරණය, දිරීම ආදී කායික සහ මානසික ස්වභාවික ධර්මතාවයන්හි සමස්ත ජීවි ප්‍රජාවට දරාගත යුතුව පවතින සම්ප්‍රයුක්ත දුක් සංවේදී ධර්මතාවය.

* අනාත්ම - ද්‍රව්‍යාත්මක නොවන / අධ්‍යාත්මිකව නොපවතින (ශූන්‍ය ස්වභාවය) සමස්ත ජීවින් කෙරෙහි පවත්නා සත්‍යය ස්වභාවය වන සංස්කාරක ද්‍රව්‍යයන්ගේ නිත්‍ය වශයෙන් අත්පත් කරගත නොහැකි ස්පර්ශයන්හි සැප වශයෙන් ස්ථිරව නොපැවතීමේ ස්වභාවය නිසා පවතින ආත්මයකට උචිත නොවන ස්වභාවය

ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පිට ජීවත්වන පෘතග්ජන අශ්‍රැතවත් මනුෂ්‍යයෝ ඉහත සඳහන් කළ ස්වභාවික සංස්කාරයන්ගේ දුර්වල හා අසාර ලාක්ෂණික ගුණයන්ට යටත්වනු ඇත. ප්‍රඥාවන්තයෙකු එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රගුණ කරන ලද සත්පුරුෂයන් විසින් ඉහත සඳහන් දුර්වල හා දුක්ඛ සහගත සංස්කාරක වස්තූන්ගේ ලාක්ෂණික ස්වභාවයන්ගෙන් නිදහස් වූ එනම් නැවත උපතට හේතුව වන අධ්‍යාත්මික මානසික කර්ම ක්‍රියාවලියෙන් නිදහස්වූවකු වනු ඇත.

යමෙකු ශ්‍රේෂ්ඨ වූ ලෝක ධර්ම ස්වභාවයේ අවබෝධයට පත්වීම සඳහා විද්‍යාත්මකවූ ප්‍රඥා අවබෝධතාවයෙන් යුක්ත වන්නේ නම් ඒ මගින් තමා සතු ජීවි ක්‍රියාවලියෙහි විද්‍යාත්මකව ඇති සැටිය ගැන ප්‍රගුණ කිරීම සඳහා පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

* චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත සද්ධර්ම ශ්‍රවණය (අධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ප්‍රගුණ කිරීම)
* ස්වභාවගත පරම සත්‍යය ධර්ම මනසිකාරය ප්‍රගුණ කිරීම (ධර්මයේ යථා ස්වභාවය අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙසින්, ඇති සැටිය විමර්ශණය කිරීම)
* මානසික ඒකාග්‍රතාවය පාදකව භාවනා ක්‍රියාවලිය. (මනස ශූන්‍යතාවයට පත්කිරීම / මානසික සැලැස්ම අක්‍රිය කිරීම / සිතේ ශූන්‍යතාවය පිළිබඳ සිහියට පත්වීම/ ප්‍රඥාපාදක විදර්ශණා භාවනා ක්‍රියාවලිය)

ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ප්‍රඥාව අත්පත් කරගත් ශ්‍රද්ධා සම්පන්න ප්‍රාඥාවන්තයින් හට සන්තතික සත්ත්ව ධර්මතාවයන්හි අප්‍රසන්න ධර්මතා වන අවිද්‍යා පාදකව සංස්කරණය වන කායික හා මානසික දුක්, වේදනා සහිත ජාති, ජරා, ව්‍යාධි, වැලපීම්, සෝතැවුල්, ලෙඩවීම් මරණ ආදී වන සම්ප්‍රයුක්ත මානසික හා කායික පීඩනයන්ගෙන් සංතෘප්ත වූ චිත්ත ශක්ති ධර්මතාවයන්ගෙන් පහසුවෙන් නිදහස්විය හැකිය.

නිර්වාණ මාර්ගය සඳහා පදනම් මූලධර්මය රදා පවතින්නේ පංචශීලය පාදක අධ්‍යාත්මික ශික්ෂණය මතයි. ප්‍රඥාවන්තයකු විසින් ඉන් අනතුරුව එකඟවිය යුතු අනුගමනය කළයුතු හා හැදැරිය යුතු ගිහි හා පැවිදි දසශීල ශික්ෂණයත් දහතුන් (13) වැදැරුම් තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ශීලයත් භික්ෂුත්වයට පැමිණීමෙන් ප්‍රගුණ කරගත යුතුව ඇත.

සන්තතික චිත්ත ධර්මතාවයන්ගෙන් යමෙකුට නිදහස්වීම සඳහා අනුගමනය කලයුතු ප්‍රධාන මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශීල සංවරය පාදකව ක්‍රියාත්මක

වන අතර ශ්‍රද්ධාව සහ ඒකාග්‍රතාවය පාදක වන සිහියට පත්වීම සඳහා එය පදනම වනු ඇත. මෙම සිහියට පත්වීමේ ක්‍රියාවලිය තහවුරු කරගැනීම සඳහා පදනම් ක්‍රියාවලිය වන්නේ ''සතිපට්ඨානය'' වන සම්මා සතියයි. සිහියට පත්වීමේ ක්‍රියාවලිය වන සම්මා සමාධිය සඳහා එකම මාර්ගය සතිපට්ඨානය වන අතර ඒ මගින් වැරදි දෘෂ්ඨීන්ගෙන් මිදීමෙන් සම්මා දිට්ඨියට පත්වීම සිදුවන අතර සත්වයින්ගේ කායික හා මානසික දුක්ඛ දෝමනස්සයන්ගේ ප්‍රහාණය වීම සිදුවනු ඇත. අධ්‍යාත්මගත නිර්වාණ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ඇතුලත්වීම තුලින් අත්පත් කරගත යුතු පදනම් මුලධර්මයන්ගේ චිත්ත විශුද්ධිය සඳහා කායික ශරීරයෙහි නිර්මාණයට පාදක වූ ධර්මයන්ගේ ඒ ඒ කොටස් වල ඇති සැටිය ඒ ලෙසින්ම මෙනෙහි කිරීමේ කායානුපස්සනාවද එම කායික ශරීරය ඇසුරෙන් සහජාතකව ක්‍රියාත්මකවන මානසික හා කායික ස්පර්ශ පාදක වේදනාවන් ගැනද එම වේදනාවන් සඳහා සංවේදී ගුණ සහිත චිත්ත ශක්තින් ගැන සහ එම චිත්ත ශක්තින්ට විෂය වන ස්පර්ශයන්ගේ විෂය වස්තුන් ගැනද ඒ ඒ ලෙසින් ඇති සැටියෙන් අධ්‍යයනය කල යුතුව ඇති අධ්‍යාත්මික විශ්ලේෂණ ක්‍රියාවලිය වන විදර්ශනාමය භාවනාවට යොමු කිරීම නිර්වාණාවබෝධයට ඇති එකම මාර්ගයයි.

කායික ස්පර්ශ වේදනාව මානසික ස්පර්ශ වේදනා ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වීමේ ලෞකික පෘතග්ජන සත්ත්වයින්ගේ කර්මජ ජීවී ක්‍රියාවලිය යනු විද්‍යාත්මක අවබෝධයකින් තොරව ක්‍රියාත්මක වන අධ්‍යාත්මික අවබෝධය රහිත මාර්ගයකි. ශ්‍රේෂ්ඨ වූ බුද්ධ දේශනාවට අනුව ආර්ය මාර්ගගත නිර්වාණ මාර්ගය අනුගමන නොකරන කිසිවකුට ශ්‍රේෂ්ඨ වූ ප්‍රඥා අවබෝධය නොලැබෙනු ඇත. මාර්ග අවබෝධය මුළුමනින්ම රදාපවතින්නේ ශ්‍රද්ධාව, අධ්‍යාත්මික ශීල සංවරය සහ චතුරාර්ය සත්‍යය පිළිබඳ ගැඹුරු අවබෝධය මතයි. අධිශීල සංවරය සම්මා සතිය පාදක

**සතිපට්ඨාන** ගත නිර්වාණ ක්‍රියාවලියෙහි ප්‍රඥාව සඳහා මාර්ගයට යොමුකර ගැනීමට නම් සම්පූර්ණයෙන්ම කාම තෘෂ්ණාව අතහැරීමෙන් එනම් ගිහිපැවැත්ම අතහැරීමෙන් පසු ආර්ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රගුණ කිරීම කල යුතුව ඇත.

## ශීලයේ ප්‍රතිමූර්තිය

*බුදුන්වහන්සේ, උන්වහන්සේ විසින් දේශනා කරන ලද*
*සියළුම සුචරිත ශීලයන්හි ශ්‍රේෂ්ඨ ආදර්ශය විය.*
*උන්වහන්සේගේ අවුරුදු 45 ක සාර්ථක හා විවිධ වැදගත් සිද්ධීන්*
*ඇතුලත් වූ ජීවිත කාලය තුල උන්වහන්සේ දේශනා කරන ලද*
*සමස්ත ධර්මය ක්‍රියාවට පරිවර්තනය කරන ලදී.*
*සාමාන්‍ය මනුෂ්‍යයකු තුලින් දැකිය යුතු වන කිසිම*
*දුර්වලතාවයක් කිසිම අවස්ථාවක උන්වහන්සේ තුලින් දක්නට*
*නොලැබුන අතර එලෙසම දුර්වල සත්ත්ව ලක්ෂණ වන ක්ලේෂයන්*
*පවා උන්වහන්සේ තුලින් පිළිබිඹු නොවුනි.*
*මේ තාක්කල් ලෝකයට දැනගන්නට ලැබුණු*
*ශීල ප්‍රතිපත්ති අතර ප්‍රභල හා පූර්ණ*
*ශීල ප්‍රතිපත්තිය වනුයේ බුදුන්වහන්සේගේ ශීල ප්‍රතිපත්තියයි.*

ජර්මන් විද්වතෙකු වන ''මහාචාර්ය මැක් මුලර්''

## 1.4 නිර්වාණ මාර්ගය අනුගමනය කරන්නේ කෙසේ ද?

ලෝකයේ ක්‍රියාත්මක විද්‍යාත්මක මූලධර්ම මත පදනම් වූ ශ්‍රේෂ්ඨතම ආගම වන බුදුදහමේ පැවැත්ම මූලිකව රඳා පවතින්නේ, බුදුවරයාණන් වහන්සේලා විසින් අනුදැන වදාල ශීල සංවර පාදක විනය නීතිරීති වලට අදාලව කටයුතු කරන ආර්ය අෂ්ඨාංගික මාර්ගගත අධිශීල අධි චිත්ත සංවරයට පත් විනයගරුක ප්‍රඥාවන්ත සංඝරත්නය මතය.

ලෝකය පුරා පැතිරී සිටින එම ප්‍රඥාවන්ත සංඝ ශාසනයට අනුව විද්‍යාත්මකවූ ප්‍රඥා අවබෝධය ලබාගැනීමට යමෙකු අදහස් කරන්නේ නම් ඔවුන් සියළු දෙනාම ලෝකයේ ක්‍රියාකාරී සන්තතික විද්‍යාත්මක ධර්මතාවයේ ඉගැන්වීම වන තථාගත බුදුරදුන් දේශිත ප්‍රඥා ධර්මය අනුගමනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් පවත්නා සන්තතික විද්‍යාත්මක ප්‍රඥා ධර්මය තුලින් නිර්වාණය පාදක වූ චතුරාර්ය සත්‍යය ධර්මය වසර දහසකට වැඩි කාලයක් ඉදිරියට අඛණ්ඩව නොනැසී ජීවත් කරවන්නට හා ආලෝකමත් කරවන්නට සමස්ත ලෝවැසි ප්‍රඥාවන්තයින්ට ඒ සඳහා වගකීමේ හැකියාව පවතිනු ඇත.

අති බහුතරයක්වූ ලෝකයෙහි ජීවත්වන ලෞකික පෘතග්ජන අඥාන මනුෂ්‍යයන් විසින් ප්‍රබල ලෙස හා බහුල ලෙස අනුගමනය කරනු ලබන සංසාරික දුක්ඛ ධර්ම ක්‍රියාවලියෙන් බැහැරව අධිශීල, අධි චිත්ත සංඛ්‍යාත කුසල් ධර්මයන් මගින් අත්පත් කරගතයුතු වන අධ්‍යාත්මික සුභ සිද්ධිය සඳහා වන මාර්ගය යමෙකු විසින් ප්‍රාර්ථනා කරයි නම් තථාගත ශ්‍රේෂ්ඨ වූ බුද්ධ දේශනාවට අනුව තමන්ගේ අධ්‍යාත්මික නිදහස සඳහා වන නිර්වාණ ක්‍රියාවලිය කෙරෙහි සූක්ෂම වූ විද්‍යාත්මක සම්බන්ධතාවයන් පිළිබඳව අවබෝධය

ලබා ගත යුතුය. ඒ තුලින් ලෞකික මනුෂ්‍යයන්ට අඥාන මනුෂ්‍යයින්ගේ කර්ම මාර්ගයෙන් නිදහස් වීමට මග හෙලිවනු ඇත. ස්වභාවික විද්‍යාත්මක නීතියෙහි ඇති සැටිය ඇති ලෙසින්ම වන විද්‍යාත්මක ක්‍රමවේදය විශ්ලේෂණය කර ගැනීමෙන් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගැනීමට නොහැකි වීම මනුෂ්‍යයන්ගේ අඥානකම පාදක වන මානසික දුර්වලතාවයට ප්‍රධාන හේතුව වනු ඇත.

නිර්වාණය සඳහා වන ප්‍රාථමික උත්සාහය රඳා පවතිනුයේ තථාගත බුදුරජාණන් වහන්සේ ගැනත් උන්වහන්සේ විසින් දේශනා කරනු ලැබූ චතුරාර්ය සත්‍යය ධර්මය ගැනත් සහ උන්වහන්සේගේ ධර්මය පිළිගනිමින් ශීල ප්‍රතිපදාව අනුගමනය කරනු ලබන ගිහි හා පැවිදි බුද්ධ ශ්‍රාවකයන්ගේ පැහැදීමත් මතය. කායික සංවරයත් චිත්ත සංවරයත් ප්‍රඥා පාදකව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමෙන් අධිශීල පාදක මානසික ඒකාග්‍රතාවය වන සම්මා සතියට පැමිණිය හැක. සාමාන්‍ය අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ ලෝකය මෙලොව පිහිටි දිව්‍ය ලෝකයක් ලෙසත් එහි නිර්මාණාත්මක සැලැස්ම මැවුම්කාර දෙවි කෙනෙකු සතු ලෙසත් එය ක්‍රියාත්මක කරවීමේ හැකියාව තමා සතු ලෙසත් ඔවුනොවුන්ගේ නූගත්කම නිසා විශ්වාස කිරීමටත් පිළිගැනීමටත් පත්ව ඇත. මෙලෙස සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන්ගේ විද්‍යාත්මක ස්වභාවය පිළිබඳ අනවබෝධයත් වැරදි විශ්වාසයන් මුළුමනින්ම අත්හරින තෙක් ලොවෙහි පරම සත්‍යය ධර්මතාවය කිසිවිටක ඔවුනට හඳුනා ගැනීමෙන් අවබෝධ කර ගත නොහැකි වනු ඇත. සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ගේ කායික ස්පර්ශ සීමාවට විෂය වන විද්‍යාත්මක සන්තතික කර්ම ධර්මතාවයෙන් ඔවුන්ට නිදහස් වීමට තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ නොවීම හේතුව වන අතර

එනිසා පෘතග්ජන මනුෂ්‍යයන් අසීමාන්තිකවත් නැවත නැවතත් බහුල ලෙස අනුගමනය කරනු ලබන කාම තෘෂ්ණාවට යොමුවනු ඇත. තම තමන්ට හැකි පමණ උපරිමව කායික ශරීරය තෘප්තිමත් කිරීමට ඒ සඳහා ලෝකය යනු වටිනා ස්ථානයක් බවත් අධික සැප විහරණය මගින් මානසිකත්වය සතුටට පත්කල යුතු බව සිතීමට හා පිලිගැනීට යොමුවනු ඇත. එහෙත් ඔවුන් සිදුකර ගන්නේ ඉන් අනතුරුව විඳීමට හේතුව වන අධික දුක්ඛ භවයන්හි නැවත ඉපදීමේ ක්‍රියාවලිය ගැන මරණින් අනතුරුව ඇති දරුණු අනතුර ගැන කිසිවක් නොදැනීමෙනි.

ස්වභාවයේ ක්‍රියාකාරී විද්‍යාත්මක නීතින්ට අනුව ලෝකයෙහි ක්‍රියාකාරි සන්තතික විද්‍යාත්මක මුලධර්මයන්ගේ පැවැත්ම ද්‍රව්‍යාත්මක මූල ධාතුන් සහ ස්ථිතික විද්‍යුත් ශක්තින්ගේ සම්බන්ධීකරණය මගින් සැලසුම් සහගතව ඇත. සත්ත්ව සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලියට පදනම වන එනම් නැවත ඉපදීම හා මියදීමේ ක්‍රියාවලිය සඳහා සත්ත්වයින්ගේ සම්ප්‍රයුක්ත ශක්තිය ලෙස ස්ථිතික විද්‍යුත් අධ්‍යාත්මික මානසික බලය කර්ම ශක්තිය ලෙස ක්‍රියාත්මක වන අතර එය සමස්ත සත්ත්වයින්ගේ ශක්ති හා පදාර්ථ ඇසුරෙන් ස්වභාවිකව ජනනය වන සහ චිත්තානු පරිවර්තිත ස්ථිතික විද්‍යුත්මය ද්විතියික ඵලයකි. සමස්ත සත්ත්ව ලෝකයෙහි පොදු ව්‍යවහාරයෙහි ප්‍රකටව හඳුන්වනු ලබන “මනස” යනු සත්ත්වයින්ගේ කායික හා චිත්තජ හේතුන්ගේ සම්ප්‍රයුක්ත ශක්තිය වන සංස්කාරක ද්‍රව්‍යයන්ගේ ස්ථිතික විද්‍යුත් සංඥාවන්ගෙන් පිළියෙල වූ මානසික සංස්කරණය වන මනෝ විඥාණය ලෙස හඳුන්වනු ලබන අතර සත්ත්වයින්ගේ දුක්ඛ කර්ම ධර්ම සන්තතික ක්‍රියාවලියෙහි මූලික ප්‍රභවයද එය වනු ඇත.

ඉහතින් සඳහන් කරනු ලැබූ විද්‍යාත්මක සන්තතික ස්වභාවය ගැන අවබෝධ කරගැනීමට අපොහොසත් යමෙකුට එනම් අවිද්‍යාවට පත් යමෙකුට මුළුමනින්ම තෘෂ්ණාව පාදකවන දෝෂ දැකීම එනම් ද්වේෂය වෛරාගය ලෙසින් වන අවිද්‍යාව සඳහා ඇති පදනම් සම්බන්ධතාව ගොඩනැගෙනු ඇත. මනුෂ්‍ය තිරිසන් සත්ත්වයින්ට මේ හේතුවෙන් ක්‍රියාත්මක ස්වභාවගත කර්ම විපාක පාදක නීති පද්ධතියට අනුව සත්ත්වයන් කෙරෙහි පවත්නා දුක්ඛ ධර්මයන්ට නැවත නැවත මුහුණ දීමට සතර දුගති භූමින්හි ඉපදීමට හිමිකම් ලබනු ඇත.

ඉහත සඳහන් කර ඇති ලොවෙහි ක්‍රියාත්මකව පවතින විද්‍යාත්මක ස්වභාවයෙහි නීතින්හි ඇති සැටිය ඇති ලෙසින් අවබෝධ කරගැනීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස සියළුම අඥාන මනුෂ්‍යයන් පවත්නා ලෝකයේ විද්‍යාත්මක ධර්මතා පිළිබඳවත් එමෙන්ම තමා කෙරෙහි පවත්නා විද්‍යාත්මක ක්‍රියාවලිය ගැන නොදැනීමෙන් විවිධ දර්ශන මතිමතාන්තර විශ්වාසයන්ට යොමු වීමෙන්, තර්ක විතර්ක කිරීමට යොමු වනු ඇත. මෙවැනි අති බහුතරයක් වන ලෝකවාසී අඥාන මනුෂ්‍යයෝ මේ නිසා මැවුම්කාර දෙවියකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ හෝ බලපෑම මගින් තමා හා මෙම ලෝකය මැවීමකින් නිර්මාණය කරනු ලැබ ඇතැයි සිතමින් මැවුම්කාර දේව විශ්වාසයන්ට යොමු වීමෙන් හා පිලිගැනීමෙන් එවැනි මැවුම්කාර දෙවියකු විසින් පාලනය කරනු ඇතැයි සිතන දිව්‍ය ලෝකයකට තමාගේ මරණින් පසු යාමට එවැනි මැවුම්කාර දෙවියකුට වැඳීම් පිදීම් යැදීම් කරමින් දේව යාඥාවන්ට වහල් වී ඇත. බහුතර අඥාන මනුෂ්‍ය ප්‍රජාවක් මෙවැනි වැරදි මාර්ගෝපදේශයන්ට යොමු වීමෙන් මිත්‍යා විශ්වාසයන්ට ගොදුරු වන්නේ ඔවුන්ගේ නූගත්කම වන ලොවෙහි විද්‍යාත්මක ධර්මතාවය ගැන නොදැනීමේ අවිද්‍යාව නිසාය. බහුතරයක් ලෞකික අඥාන මනුෂ්‍යයන් විසින්

ලොවෙහි විද්‍යාත්මක කර්ම හා විපාක ධර්මතාවයන්හි නොදැනීමේ අවිද්‍යාවට පත්ව මිත්‍යා විශ්වාස හා මිත්‍යා ප්‍රබන්ධ අනුගමනය කළත් ලොවෙහි බහුතරයක් ප්‍රඥාවන්තයින් විසින් එම අඥාන විශ්වාසයන්ගෙන් ඉවත්ව ශ්‍රේෂ්ඨ වූ ප්‍රඥා ධර්මයාගේ සත්‍යතාවය තුලින් ශ්‍රේෂ්ඨ වූ තථාගත විද්‍යා ධර්මය චතුරාර්ය සත්‍යය ලෙස පිළිගෙන ඇත.

# බුද්ධ ක්‍රමය

***කිසියම් ප්‍රශ්ණයක් සැලකිල්ලට භාජනය කළ යුතුව ඇත්නම්***

***බුදුරදුන් ඉගැන්වූ මාර්ගයට අනුව සාමකාමීව හා***

***ප්‍රජාතන්ත්‍රවාදීව එය සැලකිල්ලට ගත යුතුව ඇත.***

**- ශ්‍රී ජවහල්ලාර් නේරු -**

**(භාරතයේ හිටපු අග්‍රාමාත්‍යතුමන්)**

## 1.5 චිත්ත සන්තතික ක්‍රියාවලියෙන් නිදහස් වීමට අවශ්‍ය ඇයි?

අධ්‍යාත්මික අභිවෘද්ධියට පත් ප්‍රඥාවන්ත බහුශ්‍රැත සත්පුරුෂයෙකු යනු ප්‍රඥාවන්තයින්ට පමණක් විෂය වන විදර්ශණා භාවනාමය අවබෝධයට පත්වූ ශ්‍රේෂ්ඨ පුරුෂයකු වනු ඇත. විද්‍යාත්මක වූ ස්වභාව ධර්මතාවයෙහි විද්‍යා අවබෝධයට පත්වීමෙන් අත්පත් කරගත හැකි ප්‍රඥාව බුදුවරයන් වහන්සේලා විසින් අවබෝධ කරගත් ශ්‍රේෂ්ඨ අධ්‍යාත්මික අවබෝධයේ ඵලයයි. සිද්ධාර්ථ කුමරුන් හට තමන්ට බුද්ධත්වයට පත්වීම සඳහා අප්‍රමාණ වූ බාධාවන් මැඩ පවත්වා ගැනීමට සිදුවිය. අවුරුදු 6 ක ඉතා දුක් සහිත වනගත ජීවිත අත්දැකීමේ ප්‍රතිඵලය ලෙස සමස්ත සත්ත්ව ලෝකයේ හැම මෙහොතක් පාසාම මනුෂ්‍ය තිරිසන් සත්ත්වයෝ විඳිමින්

පවත්වනු ලබන අනිත්‍ය වූ දුක් වේදනාවන් සහිත මම යන හැඟීමකට වසඟ කරගත නොහැකි සංස්කාරක ද්‍රව්‍යයයන්ගේ යථා ස්වභාවය ඇති සැටිය ඇති ලෙසින් අවබෝධ කර ගැනීමට හැකිවිය. අවසාන වශයෙන් විශ්ව විද්‍යාත්මක අවබෝධය වන විදර්ශනා ප්‍රඥාව අත්පත් කරගනිමින් ලෝක ධර්මතාවයේ ක්‍රියාත්මක ඇති සැටිය හඳුනා ගැනීමේ සර්වඥතාවයට පත්වීමෙන් උන්වහන්සේ මේතාක් ලොවෙහි ජීවත් වූ මිනිසුන් අතරින් ''ලොවෙහි ශ්‍රේෂ්ඨතම මිනිසා'' බවට පත්විය.

බුදුන්වහන්සේගේ විද්‍යාත්මක ඉගැන්වීම උන්වහන්සේ එය පැහැදිලි කරන ආකාරයට. **''යමෙක් ධර්මය දකීනම් ඔහු මා දකී, යමෙක් මා දකීනම් ඔහු ධර්මය දකී'' (සෝ ධම්මං පස්සති යෝ මං පස්සති, යෝ මං පස්සති සෝ ධම්මං පස්සති)** සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ට පරම සත්‍යය අන්තර්ගත සද්ධර්මය අවබෝධ කරගැනීමට නොහැකි වනවා මෙන්ම බුදුන්වහන්සේ යනු කව්දැයි හඳුනා ගැනීමටද නොහැකි වනු ඇත. එබැවින් සියළු බුදුවරුන් දැකීමට නම් ආර්ය සත්‍යය තුලින් විග්‍රහවන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සංස්කාරයන්ගේ අසාර හා අසුභ ධර්මතාවයෙහි අවබෝධය ලැබීමට හැකිවිය යුතුය. යමෙකු විසින් විදර්ශණා බලය තුලින් ලොවෙහි ඇති තතු ඇති ලෙසින් නොදකින්නේ නම් ඔවුනට බුදුන්වහන්සේ මුණ නොගැසෙනු ඇත. යමෙකු ධර්ම පොත්පත් කොපමණ කියවුයේ නමුත් එයද බුදුරදුන් දැකීමට ප්‍රමාණවත් නොවනු ඇත. යමෙකු ධර්ම ශ්‍රවණය බහුලව කළේ නමුත් එයද බුදුරදුන් හඳුනාගැනීමට එපමනටම ප්‍රයෝජනවත් නොවනු ඇත. තමා විසින් චතුරාර්ය සත්‍යය විදර්ශණා භාවනා ක්‍රියාවලිය ආර්ය අෂ්ඨාංගික මාර්ගගතව ප්‍රගුණ කළයුතුව ඇත. එසේ වන්නේ නම් පමණක් බුදුන් වහන්සේ යනු කව්රුන්ද යන වගත් ලොවෙහි සත්‍යය කුමක් ද යන වගත් පැහැදිලිව හා නිරවුල්ව තමාගේ ප්‍රඥාවට හඳුනාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

තථාගත බුදුරජාණන් වහන්සේ යනු හුදෙක් ශ්‍රේෂ්ඨ වූ මනුෂ්‍යයකු වනවා පමණක් නොවන අතර විශ්ව ලෝකගත ධර්මතාවයන්ගේ පූර්ණ අවබෝධයට පත් සහ එම දුක්ඛ කර්ම ධර්ම ස්වභාවයෙන් ඉවත් වූවා මෙන්ම සෙසු අවිද්‍යාවට පත් මනුෂ්‍යයින්ටද විමුක්තිය සඳහා මාර්ගය කියාදුන් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයකුද වනු ඇත.

යම්තාක් අශ්‍රද්ධාන මනුෂ්‍යයෝ බොහෝ කාලයක සිට විවිධ මිත්‍යා දෘෂ්ඨීන්ට ගොදුරුව වන්දනාමාන කරන්නේ ද විවිධාකාර වූ දේව යාශ්‍රද්ධා කරන්නේ ද ඔවුන්ට කිසිදිනක සසරදුකින් නිදහස් විය නොහැක. එහෙත් ප්‍රශ්‍රද්ධාවන්ත වූ සත්පුරුෂයින් ප්‍රශ්‍රද්ධාවන්තයින් සඳහාම ක්‍රියාත්මකවන ශීල සංවරයත් විදර්ශනා ප්‍රශ්‍රද්ධාවත් අනුගමනය කිරීමෙන් අධිශීල, අධිචිත්ත ආත්ම සංවරය තුලින් ආර්ය මාර්ගගත එකම ප්‍රශ්‍රද්ධා මාර්ගය තුලින් සසර දුකින් ඔවුනට නිදහස් වීමට හැකියාව ලබාගනු ඇත. ශ්‍රේෂ්ඨ වූ බුදුරදුන් දේශිත ආර්ය අෂ්ඨාංග මාර්ගගත ප්‍රතිපත්තීන් හැදෑරීමෙන් හා අවබෝධ කර ගැනීමෙන් ප්‍රගුණ කල යුතුව ඇති සප්ත විශුද්ධීන්ට අදාලව නිර්වාණාවබෝධයට පැමිණිය යුතු අතර එවැනි ප්‍රශ්‍රද්ධාවන්ත සත්පුරුෂයින් පමණක් තථාගත බුදුවරයාණන් වහන්සේලාට සත්‍යය ලෙසින්ම ගරු කිරීමත් වන්දනා කිරීමත් කරනු ලැබ ඇත.

ලෝකයෙහි ක්‍රියාකාරි ස්වභාවගත ජීව විද්‍යාත්මක නීතීන්හි මූල ධර්මයන්ට අනුව සංස්කරණයවූ මනුෂ්‍යය තිරිසන් හා ශාක වස්තූන්ගේ නිර්මාණයන් අඛණ්ඩව දීර්ඝ කාලයක් පුරා පැවත එන්නේ පරිනාමයේ මුල් අවධියේ සිට ලෝකයේ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරිත්වයේ පදනම ප්‍රබලවූ ස්තිථික විද්‍යුත් ශක්තිය පදනම් ශක්තිය බවට ක්‍රියාකාරී වූ බැවිනි. සියළුම සංස්කාරක වස්තූන්ගේ නිර්මාණයන්ට හේතුව ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ විවිධ වූ ආරෝපිත ශක්තීන්ගේ ස්ථිතික විද්‍යුත්

සංස්කරණ ශක්තීන් වනු ඇත. මෙම ශක්තීන් සන්තතික ජීව විද්‍යාත්මක ලෝකයෙහි හේතු ප්‍රභවගත නියාම ධර්මතා වන අතර එම නියාම ධර්ම හේතූන්ට අනුගතව පිලියෙල වන පදාර්ථගත මනුෂ්‍ය-තිරිසන්-සත්ත්ව හා ශාක ලෙසින් වන සංස්කාරක වස්තූන් සන්තතික වන ඵලයන් වනු ඇත. මේ සම්බන්ධයේදී අසීමාන්තිකවූද විවිධාකාර වූද විශ්ව ලෝකගතව ක්‍රියාකාරීවන විවිධ ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ විවිධ ආරෝපිත ශක්ති සංස්කරණයන් සන්තතික වන ලෝක නියාම ධර්මයන් ලෙසින් විවිධාකාරවූ මනුෂ්‍ය - තිරිසන්-සත්ත්ව හා ශාක ලෙසින් වන සන්තතික වස්තූන් නිර්මාණය වීමට හේතුව වනු ඇත. මෙහිදී විශ්ව ලෝකගතව ක්‍රියාකාරීවන සන්තතික විද්‍යා නියාම ධර්මයන් පදනම් හේතූන් වීමෙන් ස්ථිතික විද්‍යුත්මය සම්ප්‍රයුක්ත ශක්තීන්ගේ ඵලයන් ජීවී සත්ත්ව ලෝකයෙහි සනත්තික පැවැත්ම නිර්මාණය කර ඇත.

මේ සම්බන්ධයේ දී සංස්කාර වස්තූන් වන මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයින්ගේ විද්‍යාත්මක ස්වභාවය සඳහා අදෘශ්‍යව ක්‍රියාත්මක වන අධ්‍යාත්මික වූ ස්ථිති විද්‍යුත් සම්ප්‍රයුක්තගත සන්තතික ශක්තීන් හේතුව වනු ඇත. ඉහත සඳහන් විද්‍යාත්මක වූ සංස්කරණයන්හි විද්‍යාත්මක ක්‍රියාවලියට අනුව සියළුම ජීවී සංස්කාරක ද්‍රව්‍යයන් මනුෂ්‍ය . තිරිසන් සත්ත්ව හා ශාක වශයෙන් අඛණ්ඩව අසීමාන්තික කාලයක් තුල ජීවයේ සම්භවය සිදුවූ පරිණාමයේ ප්‍රාරම්භක අවධියේ සිට සන්තතික ධර්ම ක්‍රියාවලියෙහි ක්‍රියාකරුවන් වී ඇත. ඉහත සඳහන් කළ සන්තතික ධර්මයාගේ ස්වභාවගත විද්‍යාත්මක ක්‍රියාවලියෙහි විද්‍යාත්මක මුලධර්මයන්හි විද්‍යා අවබෝධයෙන් තොරවූ කිසිවෙකුට නිර්වාණ ක්‍රියාවලිය අවබෝධ කරගත නොහැක. සන්තතික අධ්‍යාත්මික ධර්මතාවයන්ගේ මුලධර්ම ලෝක ධර්මතාවයන්හි විද්‍යා සැකැස්මට අනුගතව ක්‍රියාත්මක වීමේ ස්වභාවය නොදන්නා පෘතග්ජන මනුෂ්‍යයන්ට එය අවිද්‍යාව බවට පත්වීමෙන් සන්තතික මානසික කර්ම ධර්ම ක්‍රියාවලියෙහි

නිර්මාණයෙහි පදනම සඳහා තෘෂ්ණාව සහ ද්වේෂය මූලිකව ක්‍රියාත්මක වන ආකාරය හඳුනාගත නොහැකි වනු ඇත. බහුශ්‍රැත සහ විද්‍යා මූලධර්මයන්ගෙන් පරිණත වූ ප්‍රඥාවන්තයින්හට පමනක් ස්වභාවයේ ක්‍රියාත්මක විද්‍යා මූල ධර්මයන්ගේ ඇති සැටිය පැහැදිලි ලෙසම විවෘත කර බැලිය හැකි අතර අඥානයින්ට අවිද්‍යාව නිසා එලෙස පාරිසරිකව ක්‍රියාත්මකවන විද්‍යා මූලධර්ම අවබෝධකර ගැනීමට නොහැකිව ඇත. නිවැරදි දෘෂ්ඨියට අනුව ප්‍රඥාවන්තයින්ට විශ්ව ලෝකගත සත්ත්වයින්ගේ කායික මානසික ධර්ම ස්වභාවයෙහි විද්‍යා අවබෝධය වන ප්‍රඥාව තහවුරු කරගත හැක. එමඟින් විවිධ මිත්‍යා දෘෂ්ඨීන්ට වහල් වීමෙන් දුක්ඛ කර්ම චක්‍රය තුල අතරමංවී සිටින අඥාන පෘතග්ජනයින් මෙන් සන්තතික ධර්මයාගේ අනවබෝධයට ගොදුරු නොවීමෙන් ප්‍රඥාවන්තයින්ට සසර දුකින් නිදහස්වීමේ හැකියාව ඇත. ප්‍රඥාවබෝධයට පත් ප්‍රඥාවන්තයෙකු යනු ලොවෙහි ශ්‍රේෂ්ඨ ජීවිතයක් ලද අයෙකු වනු ඇත. එම ප්‍රඥාවන්තයින් අඥාන සෙසු මනුෂ්‍යයන්ට වඩා ඉතා ශ්‍රේෂ්ඨ වන්නේ යම්සේද ඉතා ඉහළ පූජනීයත්වයට පත්වූවකුද වනු ඇත. සමස්ත ලෝකගත පෘතග්ජන මනුෂ්‍යය වර්ගයා හා සැසඳීමේ දී මේතාක් කල් ජීවත්ව සිටි මනුෂ්‍යයන් අතර තථාගත බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම හා විශිෂ්ඨතම මනුෂ්‍යයා බවට පත්විය.

චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත සද්ධර්ම ශ්‍රවණය මගින් ප්‍රඥා අවබෝධය දියුණු කරගත හැකිය. ධර්ම මනසිකාරය ප්‍රගුණ කිරීම විදර්ශණා භාවනා මාර්ගය තුලින් දියුණු කරගත හැකිය. සම්මා දිට්ඨියට පත්වීමත් ආශ්වාස ප්‍රශ්වාස භාවනා ක්‍රියාවලිය ප්‍රගුණ කිරීමත්, අතීත, වර්තමාන අනාගත මානසික ධර්මතා බැහැර කිරීමෙන් මනසේ ශුන්‍යතාවය තහවුරු කිරීමෙන් වර්තමාන මානසික දැනුවත්භාවය මේ මොහොත පිළිබඳව දැඩි අවධානයට යොමු කිරීමෙන් සම්මා සතියට පත්වීමත්, ප්‍රඥාවබෝධයේ අභිවෘද්ධියට සන්තතික

විද්‍යාත්මක ධර්ම ස්වභාවයේ යථා තත්ත්වය අවබෝධ කරගැනීම පිණිස වනු ඇත. ඉහත සඳහන් පියවරවල් නිවැරදිව අරමුණු කරගන්නා විට තමා කෙරෙහි හා සන්තතික විද්‍යාධර්මතා කෙරෙහි අත්පත් කරගතයුතු වන ප්‍රඥාව මගින් ඔවුනගේ සන්තතික කර්ම ධර්මතාවයෙන් ඉවත්වීම කෙරෙහි එනම් නිවනට පත්වීම කෙරෙහි යොමුකරගත හැකිය. විදර්ශණා භාවනා ක්‍රියාවලියෙහි සාර්ථකත්වය සඳහා අධිශීල සංඛ්‍යාත ශීල සංවරයට පැමිණිය යුතුව ඇත. ශීල සංවරය විදර්ශණා භාවනා ක්‍රියාවලිය මතදී පමණක් සාර්ථකව ක්‍රියාත්මක වනු ඇත. විදර්ශණා භාවනා ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මකවීමට අධිශීල සංඛ්‍යාත ශීලයන්හි ප්‍රගුණ වීම තිබිය යුතුය. මෙලෙසින් ශීල සංවරය මත විදර්ශණා භාවනාවත්, විදර්ශණා භාවනා ක්‍රියාවලිය මත ශීල සංවරයත් අන්‍යෝන්‍යව ක්‍රියාත්මක වීමෙන් සහජාතක ඵලය වශයෙන් ප්‍රඥාවබෝධය අධ්‍යාත්මික අවබෝධය වනු ඇත. මෙය නිවන සඳහා ඇති සාර්ථකම මාර්ගයයි. කායික ශරීරයෙහි ඉන්ද්‍රිය ස්පර්ශයන්හි ඉන්ද්‍රිය පරිහරණය සීමා කිරීම මඟින් ශීල සංවරය ප්‍රධාන වශයෙන් නිර්වාණයට අවශ්‍යවන විනය සංවර ප්‍රතිපත්තියට යොමු කරනු ඇත. සත්ත්වයින්ගේ මානසික ස්පර්ශය ප්‍රියජනක සංවේදනයන්ට අනුගතවීමට චිත්ත ශක්ති ක්‍රියාත්මක වන අතර ශීල සංවරය මගින් පංච ඉන්ද්‍රියන් මඟින් සිදුකරනු ලබන කායික ස්පර්ශ ක්‍රියාවලිය අවම මට්ටමකට යොමු කරනු ඇත. මෙලෙස ශීල සංවරය මූලික වීමෙන් , මානසික හා කායික සංවේදන ක්‍රියාවලිය සංවරයට හා දමනයට පත්වීමෙන් මානසික කායික ස්පර්ශයන්හි විරාගයට පත්වීම තුලින් පුද්ගලයාගේ මානසික තත්ත්වයෙහි ක්‍රියාකාරීත්වය මධ්‍යම ප්‍රතිපදාවට අනුගතවනු ඇත.

මෙම ක්‍රියාවෙහි ප්‍රතිඵලය අනුව නිර්වාණ මාර්ගයේ අවසාන ඵලය වන විදර්ශණා ප්‍රඥාවබෝධය ලැබෙනු ඇත. මෙලෙස යමෙකුගේ අධ්‍යාත්මික අවධානය අඛණ්ඩව හා

ඒකාග්‍රව දිගුකලක් ක්‍රියාත්මක වන්නේ නම් එය යම් දිනකදී ප්‍රශස්ථ තත්ත්වයට පත්වීමෙන් සන්තතික ධර්මතාවයන්ගේ කර්ම චක්‍ර ක්‍රියාවලියෙහි විද්‍යාත්මක ඇති සැටිය හඳුනාගැනීමට අවශ්‍ය ප්‍රඥාව ලැබෙනු ඇත. එයින් පසු නිර්වාණය සඳහා වන අවසාන අරමුණ කරා යොමුවීමේ ක්‍රියාවලිය සාර්ථක වනු ඇත.

මනුෂ්‍ය, බ්‍රහ්ම, දේව, තිරිසන්, ප්‍රේත, අසුර ආදී ජීවින්ගේ පැවැත්ම ක්‍රියාත්මක වන දෘශ්‍යගත තිස් එක් තලයක් සූර්යයාගේ හා චන්ද්‍රයාගේ පූර්ණ ආරෝපිත ශක්තින්ට අනුගතව ක්‍රියාත්මක වනු ඇත. යමෙකු ලොවෙහි පරම සත්‍යය ධර්මතාවයන් විදර්ශණා ප්‍රඥාවබෝධය තුලින් දැන හඳුනාගත්තේ නම් අසීමාන්තික වූ උප්පත්ති මරණ සන්තතික කර්ම ධර්ම චක්‍රයට කොටු නොවනු ඇත. මෙම දුක්ඛ ධර්ම සන්තතික ක්‍රියාවලියෙන් එනම් උත්පත්ති මරණ කර්ම චක්‍රයෙන් පහසුවෙන් ගැලවිය නොහැකි වන්නේ තථාගත බුදුරජාණන් වහන්සේලා විසින් දේශිත ප්‍රඥා සම්ප්‍රයුක්ත චතුරාර්ය සත්‍යය ධර්මය පිළිනොගැනීම නිසාය.

යම් මනුෂ්‍යයෙකු නිර්වාණ මාර්ගයෙන් පිට ජීවත් වන්නේ නම් ඔවුනට විශ්ව ලෝක සන්තතික විද්‍යා ධර්මයන් හඳුනාගත නොහැක. මනුෂ්‍ය - තිරිසන් - සත්ත්ව හා ශාක නම්වන සන්තතික සංස්කාරකයන්ගේ නිර්මාණයෙහි විද්‍යාත්මක ක්‍රියාවලිය ගැන ප්‍රඥාවබෝධයට පැමිණීම ඉතා දුෂ්කර වන්නේ එම සංස්කාර ක්‍රියාවලිය සඳහා පදනම් වී ඇති ඉතාමත් ශූක්ෂ්ම විද්‍යා ක්‍රමවේදය ස්ථිතික විද්‍යුත් ශක්ති ක්‍රියාවලිය මූලිකව පදනම වී ඇති බැවිනි. මෙම ස්ථිතික විද්‍යුත් ශක්තින්ගේ විද්‍යුත් බලපෑමට යටත්ව හේතුඵල ධර්ම නීතියට අනුගතවීමෙන් සන්තතික කර්ම ශක්තිය සත්ත්වයන්ට ජාති, ජරා ව්‍යාධි මරණ නම්වන දුක් සමූහයේ සන්තතික කර්ම ක්‍රියාවලියට යොමුකර ඇත. මේ නිසා සනාතන සත්‍යය

ධර්මතාවයන්ගේ විද්‍යාත්මක ස්වභාවය කිසිවෙකුට පහසුවෙන් අවබෝධ කරගත නොහැකි වනු ඇත.

විද්‍යාත්මක සිද්ධාන්ත අන්තර්ගත විද්‍යාත්මක සන්තතික තථාගත සද්ධර්මය ලෙස ශ්‍රේෂ්ඨ වූ බුදුරදුන් විසින් දේශනා කරනු ලැබූ ප්‍රඥාව යනු ලෝකයෙහි ප්‍රඥාවන්තයින් පමණක් අනුගමනය කරනු ලබන හා අධ්‍යයනය කරනු ලබන ලොවෙහි මුළුමහත් සියළුම විද්‍යා විෂයයන් අභිබවනය කරන ලද ලොවෙහි ඇති එකම විද්‍යාත්මක විෂය වනු ඇත. එම ප්‍රඥා විෂය මුළුමනින්ම ජීවි සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලියෙහි හේතුඵල ධර්මතාවයෙහි ක්‍රියාවලිය ලෙස තථාගත බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රේෂ්ඨ වූ අධ්‍යාත්මික අත්දැකීම වන සර්වඥතා ඥානය තුලින් ලෝකයට දේශනා කර ඇත.

## බුදුන් කෙරෙහි පවත්නා පූජනීයත්වය

*මනුෂ්‍යය වර්ගයාගේ වන්දනීයත්වයට ලක්වූ එකම ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා ලෙසද, අප්‍රමාණ පුද පූජාවලට ලක්වුවකු ලෙසද, බුදුන් වහන්සේ ඉතා පැහැදිලිව හඳුනාගත හැකිය.*

- මහාචාර්ය සෝන්දරස් -
(සාහිත්‍යධර)
වයි.එම්.සී.ඒ. ඉන්දියාව, බුරුමය, ශ්‍රී ලංකාව

## 1.6 සිතින් නිදහස්වීමේ නිර්වාණ මාර්ගය තුල ඔබේ සිත ක්‍රියාත්මක ද?

ලොවෙහි ක්‍රියාත්මක විශ්ව ලෝක විද්‍යාත්මක ධර්මතාවයන්හි අවබෝධය වන ප්‍රඥාව පහසුවෙන් අවබෝධ කරගත නොහැකි වන්නේ ඉන්ද්‍රිය ස්පර්ශ පාදක මානසික සැප ස්පර්ශ ක්‍රියාවලිය වීර්යයෙන් හා අධිෂ්ඨානයෙන් පාලනය කිරීමට මධ්‍යම ප්‍රතිපදාගත ආර්ය ශීලයන් නොරැකීම නිසාවෙනි. මේ සම්බන්ධයෙන් යමෙකු නිශ්චල හා නිසල පරිසරයක එනම් මිනිසුන්ගෙන් දුරස්ථ වූ වනගත පරිසරයක ජීවත්විය යුතුය. අවසාන වශයෙන් සමස්ත මනුෂ්‍ය හා තිරිසන් සත්ත්ව ලෝකයටම බැඳීම් විරහිත මෛත්‍රී කරුණාව දියුණු කරගැනීම සඳහා සියලු සතුන් කෙරෙහි අසීමාන්තික මෛත්‍රී මානසිකත්වය ප්‍රගුණ කල යුතුය. විශේෂයෙන් මනුෂ්‍යයන්ගේ රස තෘෂ්ණාව උදෙසා මරණයට නියමවන තිරිසන් සත්ත්වයින් කෙරෙහිද මෛත්‍රිය යොමු කිරීම පිණිස නිර්මාංශී විය යුතුව ඇත.

සත්ත්ව හිංසනයට සහ සම්බන්ධ නොවීමෙන් මෛත්‍රී සහගත වන සත්පුරුෂයකු ඝාතනයට ලක් වූ සත්ත්වයකුගේ මෘත ශරීර අනුභවයට නොගැනීම නිසා තිරිසන් සතුන්ගේ අකල් මරණයන්ට වග නොකීමෙන්ද ඝාතකයින් එම සත්ත්ව ඝාතනයෙන් වලක්වා ගැනීමෙන්ද සත්ත්ව හිංසනයෙන් ඔවුන්ට ඉවත්වීමට හැකියාවද ලැබෙනු ඇත. යමෙකු සැබවින්ම තමන් කෙරෙහි මෛත්‍රී කරුණාව දක්වන්නේ නම් ඔවුන් අන් සත්ත්වයන් කෙරෙහිද එසේම වනු ඇත. යමෙක් අන් සත්ත්වයන්ට මෛත්‍රී සහගත නම් තම තමන්ට ද එසේම වන්නේය. එසේම යම් පුද්ගලයෙකු අනෙක් සත්ත්වයින්ට මෛත්‍රිය නොදක්වන්නේ ද ඔහු තමන්ටද මෛත්‍රී නොකරන්නෙක් වෙයි. යමෙකු අන් සත්ත්වයන් කෙරෙහි

හිංසාකාරී වන්නේ ද ඔහු සැබැවින්ම තමන් කෙරෙහි පවා මෛත්‍රී සහගත නොවනු ඇත. යමෙකුට තමන් කෙරෙහි මෛත්‍රී සහගත වියයුතු වන්නේ නම් අන් සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය ප්‍රකට කරමින් සියළු සත්ත්වයන් කෙරෙහි පළමුවෙන්ම මෛත්‍රීය කරුණාව දැක්විය යුතුය. ලොවෙහි ජීවත්වන අශ්‍රැාන පෘතග්ජනයින්ගේ නූගත්කම මත ගොඩනැගෙන විවිධාකාර වූ අදහස් තීරණ මතිමතාන්තර, විවේචන තර්ක විතර්ක එදා සිට අද දක්වා ලොවෙහි ක්‍රියාත්මකව පවතී. බුදුරදුන් ජීවමාන අවදියේදීත් විවිධ මිත්‍යා දෘෂ්ඨික දර්ශන සහිත ආගම් ලෝකය පාලනය කරනු ලැබ ඇත.

අධ්‍යාත්මික නිර්වාණ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ප්‍රතිපත්ති පූරණයෙන් ලැබෙන ඵලය ලෙස අත්පත් වන යථාවබෝධය වන ප්‍රඥාව කිසිවිටක යාඥා කිරීමකින් හෝ ප්‍රාර්ථනා කිරීමකින් හෝ ආමිස පරිෂ්කාර පූජා කිරීමකින් හෝ වන්දනා කිරීමකින් හෝ සජ්ජායනා කිරීම ආදීන්ගෙන් පමණක්ම හෝ අත්පත් කරගත නොහැක. නමුත් විද්‍යාත්මක වූද අධ්‍යාත්මික වූද අභිවෘද්ධිය ක්‍රියාත්මක වීම මුළුමනින්ම රඳාපවතින්නේ අධ්‍යාත්මික ආර්ය මාර්ගගත තථාගත බුද්ධ දේශනාවට අනුගත වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රයෝගිකව ප්‍රගුණ කිරීම තුලිනි. මේ සඳහා ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ විසින් සමස්ත මානව වර්ගයා කෙරෙහි බලපාන ලද මිත්‍යා අන්ධකාරයත් මිත්‍යා විශ්වාසයත් මිත්‍යා ප්‍රබන්දත් මුළුමනින්ම ඉවත් කරන ලද අතර එම මිත්‍යා ආගම්වල මතිමතාන්තර ඇසුවත් තමාගේ ප්‍රඥාවට ගලපා ගැනීමෙන් අනතුරුව පිළිගැනීම හෝ නොගැනීම කල යුතු බව අනුදැන වදාළ සේක.

බුදුන්වහන්සේ විසින් උන්වහන්සේගේ අනුගාමිකයන්ට අවවාද කළේ මා දේශනා කරන ලද ධර්මය සිහි නුවණින්

හැදෑරිය නොහැකි නම් ඒවා අනුගමනය හෝ පිළිගැනීම හෝ නොකළ යුතු බවයි. උන්වහන්සේ විසින් සිය අනුගාමිකයන්ට දැඩි ලෙසින් අනුදැන වදළේ මිත්‍යා දේව සංකල්ප වලට වහල් නොවිය යුතු බවත් එලෙසම තමන්ටද තමන් වහල් නොවිය යුතු බවත් ය. උන්වහන්සේ විසින් අවධාරණයෙන් දේශනා කලේ ලෝකයත් විශ්වයත් ප්‍රඥාවබෝධය මගින් විශ්ලේෂණය කරගත යුතු අතර ඒ තුලින් තමන් යනු සත්‍යය වශයෙන් කව්දැයි අවබෝධ කරගත යුතු බවයි. බහුතරයක් පෘතග්ජන මනුෂ්‍යයෝ විද්‍යාත්මක ධර්මතාවයන්ගේ විදර්ශනා අවබෝධයෙන් තොරව එනම් ලෝක සන්තතික විද්‍යාත්මක ධර්මයාගේ අවබෝධය නොමැතිව ලොවෙහි ක්‍රියාත්මක වන සන්තතික ධර්මතාවයන් දෙවියකුගේ නිර්මාණයක් ලෙස දැකීමටත් එලෙසම එම දෙවියන් කෙරෙහි ගැතියන් බවට පත්වීමෙන් එම දෙවියන්ගේ සාමයත් සසරින් ගැලවීමත් පිණිස හා අවසානයේ දී ස්වර්ග මෝක්ෂ සම්පත්තින් ප්‍රාර්ථනා කිරීමේ බලාපොරොත්තුවෙන් අන්ධ භක්තිකයන් බවට පත්වී ඇත. කිසිදු හානියකින් හා අඩුපාඩුවකින් තොරව අවුරුදු දෙදහසකට පෙරසිට මේ දක්වා බුදුරජාණන් වහන්සේ විසින් ලොවට දේශනා කරන ලද තථාගත සද්ධර්මය මේවන විටත් ජීවමානව පැහැදිලිව හඳුනාගත හැකිය. තථාගත බුද්ධ දේශනාවට අනුව යමෙකුට නිර්වාණයට පත්වීමේ මාර්ගය අනුගමනය කිරීමට අවශ්‍ය නම් අනුගමනය කල යුතු හා හැදෑරිය යුතු ධර්ම විනය මේ වන විටත් ලොවෙහි ක්‍රියාකාරීව ඇත. නිර්වාණ ක්‍රියාවලිය යනු මුළුමනින්ම ඉතා ගැඹුරු කැපවීමකින් ප්‍රගුණ කළයුතු ශීල සංවරයත් විද්‍යාත්මක ධර්ම විශ්ලේෂණය කිරීමේ විදර්ශණා අවබෝධයත් සහිත බ්‍රහ්මචාරී ජීවිතයක් තුලදී පමණක් ක්‍රියාත්මක කලයුතුව ඇති ලොවෙහි ක්‍රියාත්මක එකම අධ්‍යාත්මික නිර්වාණ මාර්ගය වනු ඇත.

අති බහුතරයක් ලෞකික පෘතග්ජන මනුෂ්‍යයෝ කාම තෘෂ්ණාවෙන් කායික ශරීරය අධික ලෙස තෘප්තියට පත්කිරීමේ ව්‍යෑයමකට තම තමන්ට හැකි උපරිමයකට උත්සාහ කිරීම සඳහා අධික රසවත් ආහාර අනුභවය කෙරෙහිද මුළුමනින්ම කාම ක්‍රියාවන් පිළිබඳ හැඟීම් සහිත කාමුක සංගීතය පිනවීමෙන් ද කාමුක නර්තන හා මත්වීමට ඉවහල්වන මත්ද්‍රව්‍ය මත්පැන් අධිකව පානය කිරීමෙන් ද සංසාරික දුක්ඛ ක්‍රියාවට ගැඹුරින් යොමුවීමෙන් ප්‍රබල කාම ක්‍රියාවන්ට යොමු වෙමින් දුගති භූමින්හි දුක්විඳින ප්‍රේත, තිරිසන් සත්ත්වයින් වීමට මාර්ගය පාදා ගෙන ඇත. නිර්වාණයට පත්වීමේ විද්‍යාත්මක හා අධ්‍යාත්මික ක්‍රියාවලිය මුළුමනින්ම රඳා පවතින්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ග ගත ශීල සංවරය මතත් බ්‍රහ්මචාරී ජීවන රටාව මතත්, කායික මානසික සිතුවිලි වල සංවරය මතත්, ස්ත්‍රී පුරුෂ, ලිංගික ක්‍රියාවන්හි අවිචාර නොවීමත් මතය. අධ්‍යාත්මික මාර්ගය වන මධ්‍යම ප්‍රතිපදාව පාදක වන ආරම්භක ධර්මතාවය වන්නේ ආන්තික ධර්මතා යුගලයන්ගෙන් ඉවත්වීමට උත්සාහ ගැනීමයි. එනම් පෘතග්ජන මනුෂ්‍යය ජීවිතය යමෙකු විසින් අධික සැප විහරණ මගින් ප්‍රශස්ථ කාම සුඛ විහරණයෙන් යුතුව ජීවත්වීම කාමසුකල්ලිකානුයෝගය වන අතර අත්හල යුතු එක් අන්තයක් වශයෙන් එම යෝගය මුළුමනින්ම අත්හැරීමෙන් මධ්‍යම ප්‍රතිපදාවට පැමිණිය යුතු බවත් අනෙක් අත්හල යුතු අන්තය වන ආත්මගත වදහිංසා සහිත අත්ථකිලමතානුයෝගය වන ශරීරයට දැඩි දුක් දීමේ අන්තය යන අන්ත දෙකම අතහැරීමෙන් සන්තතික දුක්ඛ ධර්මයෙන් නිදහස් වීමේ මධ්‍යම ප්‍රතිපදාවට පැමිණිය යුතුය.

කිසිම මනුෂ්‍යයකුට සිතිය නොහැකි මෙන්ම දැනගැනීමටද නොහැකි වන ඔවුනොවුන්ට යාමට නියමිතව ඇති මරණයෙන් පසු ලෝකයකදී විඳීමට ඇති දුක්

වේදනාවන්ගෙන් නිදහස් වීමට නම් ඒ ගැන සියළුම අශ්‍රද්ධානවන්තයින් ඔවුනොවුන්ගේ සීල සංවරය පිළිබඳ සැලකිලිමත් නොවන්නේ නම් එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගගත පංච සහ දස ශීලයන් නොරකින්නේ නම් නියත ලෙසම ඔවුන්ට නැවත ඉපදීමේ හා මරණායට පත්වීමේ කර්ම චක්‍රයෙන් ඉවත්වීමට නොහැකි වනු ඇත. අධ්‍යාත්මික ශික්ෂණාය පිළිබඳ මූලධර්ම එනම් මිත්‍යා දැකීම් කෙරෙන් ඉවත් වීමෙන් පිරිසිදු සම්මා දිට්ඨියට පත්වීම එනම් මිත්‍යා විශ්වාසයන්ගෙන් ඉවත්වීමට දෛනිකව මධ්‍යම ප්‍රතිපදාගත ආර්ය ශීලයන් රැකීමට සිදුවනු ඇත. යම්තාක් මනුෂ්‍යයන් පංච හා දසශීලයන් රැකීමට අපොහොසත් වන්නේ නම් සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලියෙන් ගැලවීමට නොහැකිවනවා මෙන්ම පෘතග්ජන අශ්‍රද්ධාන මනුෂ්‍යයන් සාමාන්‍යයෙන් පිළිනොගන්නා හා අනුගමනය නොකරනු ලබන නිර්වාණා ක්‍රියාවලියට යොමු නොවීමෙන් නිසැකවම ඔවුනට දැඩි කායික හා මානසික දුක්ඛ වේදනාවන් විඳීමට සතර අපායේ තිරිසන් ප්‍රේත බවට පත්වනු ඇත. යම් ප්‍රශ්‍රද්ධාවන්තයෙකු විසින් ශ්‍රේෂ්ඨ වූ බුදුරදුන් පිළිබඳ ශ්‍රද්ධාව දියුණු කරමින් හා උන්වහන්සේ විසින් දේශිත චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන්ද ප්‍රශ්‍රද්ධා සම්පන්න විනයධර ආර්ය සංඝරත්නය කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත වීමෙන්ද නිසැකවම යමෙකුට දුක්ඛ වේදනා පාදක උපත හා විපත සංගෘහිත කර්ම චක්‍රයෙන් පහසුවෙන් ඉවත් වීමට අවශ්‍ය පියවර ගත හැකිය.

# - විශ්ව දහම -

*අනාගතයේදී ලෝකයෙහි ක්‍රියාත්මක වන්නාවූ ධර්මය විශ්ව ධර්මයකි. එම දහම පෞද්ගලිකවූ දෙවියෙකු පිලිබඳව ඇති විශ්වාසයෙන් ඉවත්විය යුතුවාක් මෙන්ම මිත්‍යා විශ්වාසයන්ගෙන් සහ දේව මැවීම් පිලිබඳ මිත්‍යා සංකල්පයන්ගෙන්ද ඉවත්විය යුතුව ඇත. ස්වභාව ධර්මයත් අධ්‍යාත්මික ධර්මයත් යන දෙකෙහි සම්බන්ධීකරණය සඳහා ක්‍රියාත්මක වන ඇති තතු ඇතිලෙසින්මත් ඉන් සියළුම වස්තූන් කෙරෙහි පවතින ප්‍රායෝගික අත්දැකීම් මගින් ආගමික සංවේදනය පදනම් වීමෙන් ස්වභාව ධර්මතාවය සහ අධ්‍යාත්ම ධර්මතාවය අතර එකිනෙකට පරස්පර විරෝධී නොවන සම්බන්ධීකරණයක අර්ථවත් බව පැහැදිලි විය යුතුව ඇත. බුදු දහම මෙයට පිලිතුරු සපයයි. කිසියම් ආගමක් ක්‍රියාකාරීව පවතින්නේ නම් එය නවීන විද්‍යාත්මක අවශ්‍යතාවයන් සඳහා ද පැහැදිලි එකඟ වීමක් තිබිය යුතුව ඇත. එය බුදු දහම වනු ඇත.*

- ඇල්බට් අයින්ස්ටයින් -

## 1.7 නිර්වාණයට පත්වුවකු හා නොවුවකු අතර වෙනස දැකීමට හැකි ද?

සමස්ත ජීවී වර්ගයාගේ සන්තතික ධර්මතාවයෙහි ප්‍රධාන වගකීම විද්‍යාත්මක සැලැස්මකට අනුගත වූ චිත්ත ශක්තියත් එම චිත්ත ශක්තියේ සම්ප්‍රයුක්ත චිත්තානු පරිවර්තිත අධ්‍යාත්මික ශක්තිය වන මනසත් මත රදා පවතී. අති ශූක්ෂ්ම වූ චිත්ත ශක්ති ධර්මතාව ස්ථිතික විද්‍යුත් ශක්ති ප්‍රභවයක් වන අතර භෞතික ශරීරය සමග ප්‍රතිබද්ධ වීමෙන් බාහිර පරිසරයෙහි ස්ථිතික විද්‍යුත් සංඥාවන්ගේ ස්පර්ශ ක්‍රියාවලියට යොමු වීමට එයින් සම්ප්‍රයුක්ත වන මානසික ශක්තිය තුලින් සත්ත්වයින්ගේ මානසික කර්ම සංස්කරණ ක්‍රියාවලිය සිදුවේ. මෙහිදී කායික ස්පර්ශය තුලින් ග්‍රහණය කරගන්නා ස්ථිතික විද්‍යුත් ශක්තීන් වන වර්ණ ආලෝක සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා හා කායික ස්පර්ශ සංඥා පදාර්ථමය වස්තූන් කෙරෙන් නිකුත්වන ස්ථිතික විද්‍යුත් ශක්තීන්ය. මෙම ස්ථිතික විද්‍යුත් සංඥාවන් මානසික ස්ථිතික විද්‍යුත් ශක්තීන් සමග ස්ථිතික විද්‍යුත් සංයෝජනයන් ලෙස මතකය, කැමැත්ත, යනුවෙන් ශක්ති කලාපයන් ජනනය වෙයි. මෙම ශක්ති කලාපයන් විඥානය වශයෙන් හඳුන්වන අතර නැවත ඉපදීමට සුදුසකම් ලබන සත්ත්වයාගේ පහළ වීමට උචිත හා නියමිත පංච ඉන්ද්‍රියන්ගේ විකසනයට මූලික සම්භවය වනු ඇත. චිත්ත ශක්තියෙන් තොරව සත්ත්වයෙකුගේ පැවැත්ම හා කායික ශරීරයේ කායික ක්‍රියා පැවැත්වීමද කළ නොහැකි අතර මතු බිහිවිය යුතු වන මින් අනතුරු භවයේ අදාල සත්ත්වයා සඳහා අවශ්‍ය මානසික කර්ම ශක්තීන්ගේ ප්‍රතිසන්ධි ක්‍රියාවට ද මූලික හේතුව වනු ඇත. මේ සම්බන්ධතාවයෙහිදී චිත්ත ශක්තියත් කායික ශක්තියත් අතර ඇති අන්තර් සම්බන්ධතාවයෙහි විද්‍යාත්මක වූද ස්ථිතික විද්‍යුත්මය වූද ධර්මතාවය නිසා කිසිම මනුෂ්‍යයෙකුට සංසාර කර්ම චක්‍රයෙන් ගැලවීමට නොහැකිවනවා මෙන්ම සත්ත්වයින්ට ලෞකික ජීවන චක්‍රය පවත්වා ගැනීම සඳහා

ඉතා දැඩි කායික හා මානසික දුක්ඛ වේදනාවන්ට නොනවත්වා මුහුණ දීමටද සිදුවනු ඇත.

සියළුම ජීවින්ගේ කායික සංස්කරණයෙහි යථා ස්වභාවය තිරිසන් මනුෂ්‍ය වශයෙන් භේදයකින් තොරව සමානතාවයක් දක්වන අතර සම්ප්‍රයුක්ත චිත්ත ශක්තීන්හී පාරිසරික සංඥා සංස්කරණගත අධ්‍යාත්මික මානසික කර්ම සැලැස්ම එකිනෙකා අතර පැහැදිලි සමානතාවයක් නොදක්වයි. චිත්ත ශක්තින් තුල සත්ත්වයාගේ මානසික සංස්කරණ දත්තයන් මතකය ලෙසින් හඳුන්වන මනෝ විඥ්ඥාණය වන අතර මෙම මානසික දත්තයන්ගේ විෂමතාවයන් මනුෂ්‍යයන්ගේ පැවැත්ම තුලදී විවිධ චරිත සඳහා ද විවිධාකාර තර්ක විතර්ක හා මතිමතාන්තර දැරීම සඳහා ද පදනම් වී ඇති අයුරු පැහැදිලිව හඳුනා ගත හැකිව ඇත.

යමෙකු විසින් සැලසුම් කරගනු ලබන ස්වභාවික ක්‍රියාකාරීත්වයට අදාලවූ මානසික ධර්මතාවයන් අනෙකකුගේ මානසික ධර්මතාවයට කිසිවිටෙක සමාන නොවන අතර එකිනෙකා අතර ඇති මානසික හැඟීම් විවිධාකාර වනු ඇත. ස්වභාවගත හේතුඵල ධර්ම නියාමයට අනුව සංස්කරණයවී නිර්මාණය වන සම්ප්‍රයුක්ත මානසික ධර්මතාවයෙහි විවිධත්වයන් එම ඒ ඒ අදාල සත්ත්වයාගේ භෞතික කයෙහි කායික ක්‍රියාවන්ගේ ක්‍රියාකාරී ප්‍රභවය වනු ඇත. මෙලෙස එකිනෙකට සමාන රූපීය නොවන මානසික සංස්කාර නිසා ඒ ඒ අදාල මානසික සැලැස්මට අනුගත වූ විවිධාකාර සිරිත් විරිත් මතිමතාන්තර තර්ක විතර්ක දරන ඉතා විශාල සංකීර්ණ මනුෂ්‍ය හා තිරිසන් සත්ත්ව ලෝකය විද්‍යාත්මක නියාම ධර්මයන්ට අනුව ක්‍රියාත්මක වේ. මෙම විද්‍යාත්මක සිද්ධාන්තය තුලින් ජනනය වන මනුෂ්‍යය - තිරිසන් සත්ත්වයන් තුලින් සන්තතික ධර්මතාවයේ විද්‍යාත්මක පරිණාමයෙහි විවිධත්වය ප්‍රකටව හා පැහැදිලිව ක්‍රියාකාරිව පවතී.

නිර්වාණය පාදක තථාගත සද්ධර්මය යනු චතුරාර්ය සත්‍යය ලෙසින් දේශනා කරන ලද හේතුඵල ධර්මතාවයේ විද්‍යාත්මක සැකැස්ම සත්ත්වයන්ගේ උපත, විපත, කෙරෙහි බලපාන අයුරුත් එම විද්‍යා මූලධර්ම පදනම් වූ සම්ප්‍රයුක්ත මානසික ස්වභාවයෙහි අධ්‍යාත්මික ක්‍රියාවලියත් පැහැදිලිව දේශණා කර ඇති විශ්ව ලෝකගත සන්තතික විද්‍යා ක්‍රියාවලියයි. සන්තතික ගත කර්ම ධර්මයන්ට ගොදුරුව ජීවත්වන සමස්ත සත්ත්වයන් කෙරෙහි ක්‍රියාත්මක වනු ලබන අධ්‍යාත්මිකවූ සන්තතික විද්‍යාත්මක කර්ම සැකැස්මේ ප්‍රභවය හා එහි විකාශනය ගැන හා එම ක්‍රියාවලිය කෙසේ විශ්ලේෂණය කල හැකි ද යන්නත් චිත්තානු පරිවර්තිත මානසික ශක්තින් බාහිර පරිසරයෙහි ස්ථිතික විද්‍යුත් ප්‍රභවගත රූප, ශබ්ද, ගන්ධ ආදී විද්‍යුත් සංඥාවන් කෙරෙහි කෙසේ ප්‍රතික්‍රියා කරන්නේ ද යන්නත්, එම මානසික විද්‍යුත් ශක්තින් කායික ශරීරය කෙරෙහි කෙසේ ප්‍රතික්‍රියා කරන්නේ ද යන්නත්, එම මානසික විද්‍යුත් ශක්තින් කායික ශරීරය ඇසුරෙන් පිළිවෙල වී අධ්‍යාත්මික විද්‍යුත් ක්‍රියාවලියකට බඳුන් වීමෙන් සත්ත්වයාගේ නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියෙහි හේතුව සඳහා පූර්ව භවයෙහි ජීවත්වූ සත්වයාගේ මානසික සංස්කරණ ක්‍රියාවලිය සත්ත්වයාගේ සන්තතියෙහි ධර්ම නීතියට යටත්ව විද්‍යාත්මක කර්ම චක්‍රයට යොමු වීම සිදුවන අයුරුත් බුද්ධ දේශනාව තුලින් ගැඹුරින් දේශනා වී ඇත. තවදුරටත් තථාගත බුදුරජාණන් වහන්සේ විසින් අඥාන පෘතග්ජන ලෝකයේ මනුෂ්‍යයන්ට කෙසේ චිත්ත ශක්තින් හා චිත්තානු පරිවර්තී මානසික ශක්තින්ගේ කුසල් ක්‍රියා හා අකුසල් ක්‍රියා මගින් නැවත උපත සිදුවන අලුත් සත්ත්වයාගේ බිහිවීමේ ක්‍රියාවලිය එම කුසල් අකුසල් ක්‍රියාවන්ට යටත්ව නැවත ඉපදීම පිළියෙල වන ආකාරයත් දේශනා කර ඇත. ලොවෙහි මේවන තුරුත් බුදුන් වහන්සේ හැර අන්කිසිම ශාස්තෲවරයෙකු සිතෙහි හා මානසික චිත්ත ශක්තින්හි විද්‍යාත්මක ධර්මතාවන්

හා එම විද්‍යාත්මක ධර්මතාවයෙන් සත්ත්වයන්ගේ නැවත ඉපදීමේ කර්ම ධර්මතාව පිළිබඳ විද්‍යාත්මක දේශනාවක් කිසිවිටක දේශනා කර නැත. මේ වනතාක් ලෝකයේ බිහිව සිටින ශාස්තෘවරයන් අතරින් තථාගත බුදුරදුන් ශ්‍රේෂ්ඨතම ආගමික ශාස්තෘවරයා වන අතර උන්වහන්සේගේ ප්‍රඥාවබෝධයෙන් දේශිත සන්තතික විද්‍යාත්මක ධර්මතාවයේ අධ්‍යාත්මික පර්යේෂණයන්හි විද්‍යාත්මක අවබෝධයට අනුව චිත්ත ශක්තින්ගේ චිත්තානු පරිවර්තී මානසික පරිවර්තනයන්ගේ සම්භවයත් එහි පැවැත්මත් ඒවායේ ඇති සැටිය ඇති ලෙසින් අවබෝධ කරගත්තේ විද්‍යුත් උපකරණ උපාංග කිසිවක් භාවිතයෙන් තොරවය. එහෙත් උන්වහන්සේගේ පෞද්ගලික අධ්‍යාත්මික අත්දැකීම තුලින් ආර්ය මාර්ගය ගතව අත්පත් වූ බුද්ධ ප්‍රඥාවෙහි සර්වඥතා අවබෝධය තුලින් සමස්ත විශ්ව ලෝක ධර්මයාගේ විද්‍යාත්මක හා විද්‍යුත්මය එමෙන්ම අධ්‍යාත්මික ශක්තින්ගේ මෙන්ම පදාර්ථයාගේ සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන්ද අවබෝධ කරගන්නා ලදී. යමෙකු තමාගේ චිත්ත ශක්ති ධර්මතාවයන් අධ්‍යයනය කිරීමට හෝ පර්යේෂණ කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, තම තමන් විසින් අධ්‍යාත්මික නිර්වාණ මාර්ග පාදක ශීල සංවරයත් සම්මා සමාධියත් ප්‍රඥා අවබෝධයත් අධ්‍යයනය කළ යුතුව ඇත.

අධ්‍යාත්මික වූ ද විද්‍යාත්මක වූ ද ලෝකයේ ක්‍රියාකාරී ධර්මයාගේ සත්‍යතාව බුදුරදුන්ගේ ප්‍රඥාවබෝධය තුලින් අවබෝධ කර ගැනීමෙන් අනතුරුව එම සන්තතික ධර්මතාවයන්ගේ විද්‍යාත්මක සිද්ධාන්ත ඇසුරෙන් මනුෂ්‍යයන්ට නිර්වාණයට අවශ්‍ය විද්‍යාත්මක හා අධ්‍යාත්මික සැලැස්ම චතුරාර්ය සත්‍යය වශයෙන් දේශනා කර ඇත. සන්තතික ධර්මතාවයන්ගේ විද්‍යාත්මක සැකැස්ම සමස්ත මනුෂ්‍යයන්ගේ අවිද්‍යාවට පාදක වී ඇත්තේ සමස්ත සත්ත්ව ලෝකයෙහිම

සත්ත්වයන්ට අධික කායික මානසික දුක් වේදනා දැනීමේ ක්‍රියාවලියක් හරහා වන අතර ශ්‍රේෂ්ඨ වූ බුදුන්වහන්සේ මේ ධර්ම ස්වභාවය කෙරෙහි ක්‍රියාත්මක වන ප්‍රබල අනතුරුදායක බව අවබෝධ කරගත් අතර, ''මම නුඹට දුක්ඛ ධර්මය ගැන උගන්වමි. එමෙන්ම නුඹට දුකින් නිදහස් වීමටද මග හෙළිකරමි'' යනුවෙන් ලෝකයා දැනුවත් කරන ලදී.

අශ්‍රද්ධාන වූ පෘතග්න මනුෂ්‍යයින් විද්‍යාත්මක ලෝක ස්වභාවයේ ක්‍රියාත්මක ධර්මයන්හි ඇති සැටිය ඇති ලෙසින් නොදැන අවිද්‍යාවට ලක්වීමෙන් කායිකව සහ මානසිකව සතර අපාගත උප්පතින්ට සුදුසු වූ අකුසල ධර්මතාවන්හි යෙදෙන අතර නැවත ඉපදීමේ ක්‍රියාවලියට යොමුවීමෙන් එම භවයන්හි ජන්මලාභය ලබනු ඇත. එහෙත් ප්‍රශ්‍රද්ධාවන්ත සත්පුරුෂයින් තථාගත ධර්මය මගින් පැහැදිලි කරන සසරින් මිදීමට අවශ්‍ය චතුරාර්ය සත්‍යය අවබෝධකර ගැනීමෙන් මානසික හා කායික ධර්මයන්ට අවශ්‍ය කුසල ධර්ම ප්‍රගුණ කර සතර අපාගත ප්‍රතිසන්ධියට යොමු නොවෙමින් දේව බ්‍රහ්ම මනුෂ්‍ය, ලෝකයන්හි ඉපදීමට සුදුසු වන කුසල් රැස් කරමින් අවසානයේ දී නිර්වාණය අවබෝධ කරගනු ඇත. චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීමෙන් අත්පත් වන අවිද්‍යාව ලෝකයේ ඇති සැටියෙහි වන විද්‍යා ධර්මය නොදැකීමට හේතුවන අතර තම තමන් කවුදැයි හඳුනා ගැනීමේ අවස්ථාවද ඒ තුලින් ඔවුනට නොලැබෙනු ඇත. එහෙත් ප්‍රශ්‍රද්ධාව නම් වන විදර්ශනා විද්‍යාත්මක අවබෝධය ලොවෙහි පරම සත්‍යය දුක බව හඳුනා ගැනීම පිණිසත් ඒ සඳහා ක්‍රියාත්මකවන විද්‍යාත්මක ධර්මතාවෙහි හේතුඵල ධර්මතාවන් ඇතිසැටියෙන් ප්‍රශ්‍රද්ධා ලෝකය ලෙසින් එම ධර්මතාවයන්ගේ සංස්කරණ මුලධර්මයන්හි විද්‍යාත්මක ඇති සැටිය එලෙසින්ම හඳුනාගැනීමේ හැකියාවත් ලබා ගනු ඇත.

ලොවෙහි විද්‍යාත්මක සැලැස්ම ගැන නොදන්නා එනම් අවිද්‍යාවෙන් මුලාවූ යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයෝ මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍ය ජීවිතකාලය අවසන් වූ පසු තිරිසන් ප්‍රේතගත සතර අපායේ උත්පත්තියට ලක්වනු ඇත. නමුත් ප්‍රඥාවන්ත සත්පුරුෂයින් ප්‍රඥාලෝකය තුලින් ලොවෙහි ඇතිසැටිය ඇති ලෙසින් දකිමින් සන්තතිකව පවත්නා කර්ම ධර්මතාවය දුක ලෙසින් හදුනාගෙන ද්‍රව්‍යාත්මක ලෝකයෙන් නිදහස්වීමට හැකියාව ලබා ගනු ඇත.

ලෞකික පෘතග්ජන මනුෂ්‍යයන් යනු තමා හා තමාගේ පැවැත්ම කෙරෙහි බලපවත්වන විද්‍යාත්මක ධර්මතාවන් නොදැක ලොවෙහි ඇති සැටිය නොදකින මනුෂ්‍ය ප්‍රජාවකි. ඔවුන් විසින් වටිනාකමකට තහවුරු කරගත් සංස්කාරක මනුෂ්‍යය තිරිසන් ලෙසින් වන ද්‍රව්‍යාත්මක වස්තූන් ස්ථාවර හා වටිනාකමක් සහිත දේපල ලෙස සිතනු ඇත. මෙලෙස සිතීමට ලක්වූ මනුෂ්‍යයන් සංස්කාරක ද්‍රව්‍යයන්ගේ පදනම් ධර්මතාවයන්ගේ අනිත්‍යතාව විද්‍යාත්මකව නොදැනීමෙන් මෝහාන්ධකාරයට පත්ව අවිද්‍යාවත් තෘෂ්ණාවත් සහජාතක ද්වේශයත් අනුගමනය කරනු ඇත. සියළුම ද්‍රව්‍යාත්මක වස්තූන් සූර්යාලෝකය තුලින් හඳුනාගත හැකි වන අතර අඳුරේදී ඒවා හඳුනාගත නොහැකිවන්නාක් මෙනි. මෙවැනි සමාන ස්වභාවයකට පත්වන අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ සන්තතික විද්‍යා ධර්මතාවයේ ඇති සැටිය හඳුනා ගැනීමේ ප්‍රඥා ආලෝකය නොමැතිව එනම් අවිද්‍යා අන්ධකාරය තුලින් ලෝකයෙහි නිර්මාණය වූ සංස්කාරක සත්ත්ව හා ශාක සංස්කරණ වස්තූන් කෙරෙහි ද්වේශය සහජාතක වූ ලෝභී ධර්මයෝ ප්‍රගුණ කරනු ඇත. එනිසා අවිද්‍යාව යනු අඳුරක් ලෙසත් ඒ නිසාම මානසික කායික පැවැත්මට සහජාතක ලෝභය තුලින් ප්‍රභල වූ ද්වේෂ පාදක කර්ම ධර්ම ප්‍රගුණ කරනු ඇත. මේ නිසාම එවැනි මනුෂ්‍යයන්ගේ මානසික ලෝභ සිතුවිලි හා ද්වේෂ සිතුවිලි කෙසේ ජනනය වීම හා පැවතීම සිදුවන්නේ

දැයි සහ එම ක්‍රියාවලිය සසර දුකට නැවත ප්‍රතිසන්ධිය වන්නේ කෙසේදැයි නොදැනීමට පත්වනු ඇත. මේ නිසාම සමස්ත අති බහුතරයක් වූ අඥාන පෘතග්ජන මනුෂ්‍යය ප්‍රජාව ලොවෙහි පවත්නා දුක්ඛ කර්ම ධර්මතාවයේ ඇති සැටිය නොදන්නවා සේම එම ධර්මතාවයේ ධර්ම ස්වභාවය නොතකන හා පිළිනොගන්නා පිරිසකි. මේ නිසාම සංස්කාරගත ද්‍රව්‍යයෝ තමන් සතු ලෝකයේ වටිනා වස්තු ලෙස දැකීමට එනම් එම වස්තුන්ගේ හිමිකම අහිමිවීම තුලින් මෙලොව හැර යාමෙන් පරලොව දුක්ඛ ප්‍රතිසන්ධියකට යා යුතු බව නොදැනීමෙන් දුක් වේදනා වැලපීම් ජරා මරණ සංඛ්‍යාත සංස්කාරක ද්‍රව්‍යයන්ගේ ඇති සැටිය එසේ නොදැක එම ද්‍රව්‍යයන් වටිනා ලෙසින් සැප පහසු ලෙසින් අගය කළ හැකි දේ වශයෙන් හා ප්‍රයෝජනවත් ලෙසින් දැකීමට ලක්වනු ඇත. මේ තුලින් අඥාන මනුෂ්‍යයින් විසින් බලාපොරොත්තු වන අධික සැප විහරණය ඔවුනට නොලැබෙන නමුත් සසර දුකට හේතුව වන තෘෂ්ණාවට හා ද්වේෂයට ලක්වීමෙන් තිරිසන් - ප්‍රේත ලෝකයන්හි උප්පත්තීන්ට යොමුවනු ඇත. මේ මානසික ධර්මතාවයන්ගේ ඇලීමේ තෘෂ්ණාවේ ස්වභාවය අන්‍ය සංස්කාරක වස්තූන් කෙරෙහිද ලෝභය වශයෙනුත් ද්වේශය වශයෙනුත් ක්‍රියාත්මකව පවතිනු ඇත. සතර භූත ධාතූන්ගෙන් ව්‍යුත්පන්න වන සංස්කාරක වස්තූන් පෘතග්ජනයින් වටිනා වස්තු ලෙස සැලකුවත් ඒවායින් අත්වන අවසන් ඵලය වන තෘෂ්ණාව, ආත්මාර්ථකාමීත්වය, වෛරය ආදි ලෙසින් සසර දුක්ඛයන්ට විෂය වන අකුසල කර්ම විපාක නිර්මාණය කරගැනීම සඳහා සන්තතික කර්ම චක්‍රයට ඔවුන් කොටු වනු ඇත.

චතුරාර්ය සත්‍යය නොදත් පෘතග්ජන මනුෂ්‍යයන් එසේ අවිද්‍යාවට ලක්වීමෙන් තමන්ගේ ඉපදීමට හේතු වූ සන්තතික විද්‍යාත්මක හේතුඵල ධර්මයෙහි අනවබෝධයට පත්ව ඇත. මේ නිසා පෘතග්ජන අවිද්‍යා ක්‍රියාවලිය තුලින් සංස්කාරගත ද්‍රව්‍යාත්මක වස්තූන් කෙරෙහි ඇලීම ප්‍රගුණ කර ගැනීමෙන්

එකිනෙකා අතර වෛරයත් සතුරුකමත් ඇති කරගැනීම හේතුවෙන් විවිධාකාර ආරවුල් යුධ කෝලාහල සංස්කාරක ද්‍රව්‍යයන් කෙරෙහි අවිද්‍යාවෙන් දැකිමට යොමුවීම තුලින් ඒවා කෙරෙහි තෘෂ්ණා ස්පර්ශය ප්‍රගුණ කිරීම නිසා දුක්ඛ ධර්ම ක්‍රියාවලිය නිර්මාණය කර ගෙන ඇත.

කායික ශරීරයෙහි ස්පර්ශ සංවේදනයන්ට දැඩිව හා නැවත නැවත යොමුවීම නිසා පෘතග්ජන මනුෂ්‍යයෝ බහුල ලෙස අවිද්‍යාවට ලක්වනු ඇත. මෙම ක්‍රියාවලිය සාමාන්‍ය සන්තතික ධර්මතාවය වන සත්ත්වයන්ට නැවත ඉපදීම සඳහා හේතුව වී ඇති අතර ඒ තුලින් මෙලොව ජීවිතය තුලදීද ඔවුන්ට මුහුණදිය යුතුව පවතින දුක්ඛ ධර්මයන්ට අනිවාර්යයෙන් මුහුණදිය යුතුව ඇත.

ශූක්ෂ්ම වු ස්ථිතික විද්‍යුත් ශක්ති ප්‍රභවයක් වන චිත්ත ශක්තීන් යනු සන්තතික සත්ත්ව ධර්මතාවයෙහි පැවැත්ම සඳහා මූලිකව පිළියෙල වූ ශක්ති ඒකකයකි. මෙම ශක්ති ඒකකය සන්තතික විය යුතුව ඇති සත්ත්වයාගේ සම්ප්‍රයුක්ත මානසික සැලැස්මෙහි ආරෝපණය මගින් ප්‍රතිසන්ධි ක්‍රියාවට විද්‍යාත්මකව යොමු වේ. සන්තතික සත්ත්වයින්ගේ කර්ම ධර්මතාවයෙහි ප්‍රධාන වගකීමට අනුව සම්ප්‍රයුක්ත ඵලය වන මානසික ශක්තිය සත්ත්වයාගේ අධ්‍යාත්මික මානසික කර්ම සංස්කරණයට හේතුව වනු ඇත. මෙම සම්ප්‍රයුක්ත මානසික ශක්තීන් සංස්කාරක ද්‍රව්‍යයන්ගේ සන්තතික සංඥා සඳහා දැඩි සංවේදනයකට යොමුවීමෙන් සත්ත්වයා සතුවිය යුතු වන දුක්ඛ කර්ම ක්‍රියාවලියට පසුබිම පිළියෙල වනු ඇත. මේ විද්‍යාත්මක සිද්ධාන්තය මානසික සංස්කරණ ක්‍රියාවලියට හේතුව වන චිත්ත ශක්තියත් ඉන් ප්‍රතිවර්තිත මානසික ශක්තියත් සංඥාවන්ගේ විද්‍යුත් සංවේදනයට සක්‍රිය වීමේ ඵලය ලෙස නැවත ඉපදීමේ සන්තතික කර්ම චක්‍රය නිර්මාණය වනු ඇත. මෙම විද්‍යාත්මක වූද අධ්‍යාත්මික වූද සන්තතික කර්ම ධර්මය

සත්ත්වයින්ට නැවත ඉපදීමට කර්ම චක්‍රයක් වන ආකාරය කිසිවකුට පහසුවෙන් අවබෝධ කරගත නොහැකි වන්නේ ශ්‍රේෂ්ඨ වූ බුදුරදුන් විසින් චතුරාර්ය සත්‍යය වශයෙන් දේශනා කරන ලද ශ්‍රේෂ්ඨ වූ තථාගත ඉගැන්වීම පිළිනොගැනීම නිසාවෙනි. මෙම විද්‍යාත්මක සිද්ධාන්තයට පෘතග්ජනයන් ගොදුරුවන්නේ ඔවුන් සතු අවිද්‍යාව නිසා වන අතර තෘෂ්ණාවත් සහජාතක වෛරයත් ඒ සඳහා හේතුව වනු ඇත. අවිද්‍යාවට ලක් වූ මනුෂ්‍යයින් චතුරාර්ය සත්‍යය ධර්මයට අදාලව ප්‍රගුණ කලයුතු කුසල ක්‍රියාවන් අකුසල ක්‍රියාවන් ලෙස පිළිගන්නා අතර සසර දුකට හේතුවන අකුසල ධර්මයන් කුසල ක්‍රියාවන් වශයෙන් පිළිගෙන ඒ අනුව ක්‍රියා කරනු ඇත.

මෙවැනි අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ කුසල ක්‍රියාවන් කුසල් වශයෙන් පිළිනොගන්නවුන් වනු ඇත. අකුසල් ක්‍රියාවන් කුසල් වශයෙන් පිලිගන්නවුන් වනු ඇත. අසත්‍ය දේ සත්‍යය වශයෙනුත් සත්‍යය දේ අසත්‍ය වශයෙනුත් පිළිගැනීමට ඔවුන් තර්ක කරනු ඇත. මෙය අඥාන මිනිසුන් විසින් ඔවුනොවුන් කෙරෙහි පවත්නාවූ විද්‍යාත්මක ධර්ම ස්වභාවයට මුළුමනින්ම විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ගයක් වනු ඇත. මෙවැනි මනුෂ්‍යයෝ අඳුරෙහි ජීවත්වන අන්ධ පෘතග්ජනයන් වනු ඇත. මෙම අවිද්‍යා අඳුරෙන් නිදහස් වී ලොවෙහි සත්‍යය ධර්මතාවය දැකීම සඳහා වන සම්මා දිට්ඨියට පත්වීම ඔවුන් සඳහා ඇති එකම මාර්ගයයි. ලොවෙහි පවතින ආගම් අතර සන්තතික විද්‍යා ධර්මතාවයකින් විද්‍යා අවබෝධයට පත්වීමේ ආර්ය අෂ්ඨාංගික මාර්ගගත නිර්වාණයට පත්වීමට අවශ්‍ය සත්‍යය මාර්ගය පැහැදිලිව ලෝකයට දේශනාකර ඇති එකම ආගම බුදුදහම පමණි. ලොවෙහි වෙනත් කිසිම ආගමක් විද්‍යාත්මක සන්තතික ධර්මතාවයෙහි ඇතිවන සැටිත් පවතින සැටිත් එයින් නැවත සත්ත්වයා මරණින් මතු ඉපදෙන සැටිත් ඉන් ඉවත් වීම සඳහා අවශ්‍ය විමුක්ති මාර්ගයක් හෝ පියවරක් ගැනවත් විස්තර කිරීමක් හෝ පැහැදිලි කිරීමක් හෝ කර

නැත.

මිත්‍යා දෘෂ්ඨීන්ගෙන් බැහැරව පිරිසිදු වූ නිවැරදි දැක්මට එනම් සම්මා දිට්ඨියට පත් නොවූ පෘතග්ජන මනුෂ්‍යයන් ක්ලේෂ ධර්මයන්ගෙන් සැදුම්ලත් ලෞකික පෘතග්ජන කර්ම චක්‍රයතුල එකිනෙකා කෙරෙහි වෛරී ධර්මයන් වඩමින් සමාජගත විනාශකාරී හා හිංසාකාරී ක්‍රියාවන් වන දූෂණය, සොරකම් කිරීම්, මත්ද්‍රව්‍ය භාවිතය, ලිංගික අපචාර ආදී වූ, පහත් පාප ක්‍රියාවන්ගෙන් මනුෂ්‍යය ලෝකය තුල දූෂිත පරිසරයක් ලෝකය තුළ දිනෙන් දින නිර්මාණය කරමින් ඇත. පෘතග්ජන මනුෂ්‍යයන් චතුරාර්ය සත්‍යය ධර්මතාවයේ අවබෝධයෙන් දුරස්ව ලොවෙහි ධර්මතා කෙරෙහිත් තමන් කෙරෙහිත් වැරදි දැක්මකට එනම් අවිද්‍යාවට ලක්වීමටත් තමා කෙරෙහි පවත්නා ධර්මතාවයෙහි නොදන්නාකම හේතුවෙන් සක්කාය දිට්ඨියට පත්වීමත් සත්ත්ව සන්තතික ධර්මතාවය ආත්මය ලෙසින් දැකීමේ ආත්ම දෘෂ්ඨියට පත්වීමත් එම දෘෂ්ඨී දෙකටම ගොදුරු වීමෙන් මිත්‍යා දෘෂ්ඨියට පත්වීමත් යන ලෙසින් ත්‍රිවිධ දෘෂ්ඨීගතව ලොවෙහි ක්‍රියාත්මක කර්ම ධර්ම චක්‍රය වෙත අවිද්‍යාවෙන් බැඳී ඇත. යමෙකුට ප්‍රඥාවබෝධය තුලින් ලොවෙහි විද්‍යාත්මකවූ යථාර්තය අවබෝධය කරගැනීමට නම් ඔවුන් විසින් ඉහත ත්‍රිවිධ දෘෂ්ඨීන්ගෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතුව ඇත. එහෙත් ප්‍රඥාවන්තයෙකු චතුරාර්ය සත්‍යය ධර්මයට අදාල විද්‍යාත්මක අවබෝධය තුලින් සිය මරණයෙන් පසු යා යුතුව ඇති අවදානම් ජීවිතයෙන් නිදහස් වීමට අවශ්‍ය පියවර ගැනීමට පසුබට නොවනු ඇත.

සියළුම ලෝකවාසී මනුෂ්‍යයන් තමාගේ මරණ මංචකය ලංවන තුරුම ඔවුන් තමාගේ මරණින් පසු තමන්ට කුමක් සිදුවිය හැකිදැයි නොදන්නා පිරිසකි. ජීවත්වන සත්ත්වයින්ගේ ජීවිතය ලැබීමට හේතු වූ ධර්මතාවයන් කිසිවිටක මරණයත්

සමග අවසන් නොවේ. චිත්ත ශක්තින් සතු අධ්‍යාත්මික කර්ම ධර්මතාවයන් මරණයෙන් පසු අලුත් සත්ත්වයෙකුට උපත ලබාදීම සඳහා මානසික සංස්කරණයට අනුව නියමිතව ඇති අතර ඒ සඳහා නොදන්නාවූ විශ්වයේ අවිනිශ්චිත භවයකට යොමුවනු ඇත. අවිද්‍යාවත් කාම තෘෂ්ණාවත් තුලින් පිළියෙල වූ චිත්ත ශක්ති සැලැස්ම මානසික විද්‍යුත් සැලැස්මක් වන අතර මතක දේ වශයෙන්, එනම් මානසික සංස්කරණය වශයෙන් එම අධ්‍යාත්මික තොරතුරු ව්‍යාධි, ජරා, මරණ ලෙසින් සන්තතික වන සත්ත්ව කර්ම ක්‍රියාවලියෙහි කායික මානසික දුක් ධර්මයට නැවත මුහුණ දීමට නැවත ඉපදීම වනු ඇත. පෘතග්ජන ලෝකයේ කිසිවෙකුට උත්පත්ති මරණ කර්ම ක්‍රියාවලිය පැරද වීමට හෝ ඉන් ඉවත් වීමට ලෙහෙසි නොවන අතර මක්නිසාද යත් ඔවුන් සියල්ලෝම මරණයට යටත්ව ජීවත්වන බැවිනි.ලෝකයෙහි ක්‍රියාත්මක වන සියළුම ආගම් හා දර්ශන මිනිසුන්ට උගන්වන්නේ සහ උපදෙස් දෙන්නේ ලෝකය තුල මනුෂ්‍යයන්ට සාමයෙන් ජීවත් වීම සඳහා සියළු සතුන් වෙත මෛත්‍රියත් කරුණාවත් මනුෂ්‍යය ආචාර්ය ධර්ම ගරු කිරීමත් අවිහිංසාවත් ධර්මිෂ්ඨභාවයත් සමානාත්මතාවයත් අපක්ෂපාතිභාවයත් හා ත්‍යාගශීලිබවත් යන ශිෂ්ඨ සම්පන්න මානුෂික ගුණධර්මයන් තුලින් ජීවත් වීමටය.

අති බහුතර පෘතග්ජන මනුෂ්‍යයෝ මෙම ආගමික ප්‍රතිපත්තීන් නොසලකා හරිමින් අකුසල් හා දුසිරිත් සහිත හිංසාකාරී මාර්ගයන්ට අනුව සමාජයේ ජීවත් වනු ඇත. සමස්ත මනුෂ්‍යය වර්ගයාම පෘතග්ජන සන්තතික කර්ම ධර්මයට අනුව අට වැදෑරුම් ලෝක ධර්මයට යටත් විය යුතු නමුත් ඔවුන් එම විශ්ව හා ලෝක ධර්ම සංගෘහිත ස්වභාව න්‍යාය ධර්මයන් නොසලකා හැරීම නිසා ලොවෙහි ක්‍රියාත්මක සත්‍යය පැවැත්මේ ධර්මතාවය නොදැනීමෙන් නූගතුන් බවට පත්ව කායික හා මානසික පීඩාවන්ට ගොදුරුව විවිධ කරදර

බාධක නිර්මාණය කර ගනිමින් ජීවත් වනු ඇත.

යම්තාක් මනුෂ්‍යයින් අට වැදෑරුම් ලෝක ධර්මයට විරුද්ධව කටයුතු කරයිනම් අඥාන මනුෂ්‍යයින් වන ඔවුන් බුද්ධ දේශනාවට පිටුපා ජීවත් වන පිරිසකි. ජීවී හා ද්‍රව්‍යාත්මක සංස්කාරක වස්තූන්ගේ සන්තතික ධර්මතාවයන් මුළුමනින්ම වෙනස් වීමට බඳුන්වන ස්ථිති විද්‍යුත් බලය මත ක්‍රියාත්මකව පවතී. එනිසා සියළුම ද්‍රව්‍යාත්මක වස්තූන් ස්ථිර ජීවත් වීමකට හෝ සැප පහසු ස්වභාවයකට හෝ විෂය නොවනු ඇත. ලොවෙහි නිර්මාණය වී ඇති සත්ත්ව ශාක ඇතුළු සෙසු ද්‍රව්‍යාත්මක වස්තූන් වෙනස් වීමකට දිරීමකට ක්ෂය වීමකට වයසට යෑමට කල් ඉකුත් වීමට හා මරණයට නියමිත වී ඇත. සමස්ත විශ්ව ලෝක ධර්මතාවන්ගේ මැදිහත් වීමෙන් නිර්මාණය වූ සියළුම ද්‍රව්‍යාත්මක සත්ත්ව හා ශාක සංස්කාරක වස්තූන් ඉහත ලෙසින් වන දුර්වල හා අසාර ක්‍රමවේදයකට යොමුව පවතී. යමෙකු යාඥා කරන්නේ නම් හෝ ප්‍රාර්ථනා කරන්නේ නම් තමන් කෙරෙහිත් අන් වස්තූන් කෙරෙහිත් නිත්‍යතාවයක් තිබිය යුතු බවත් නොදිරන ස්වභාවයක් පැවතිය යුතු බවත් වයසට යන ස්වභාවයක් නොපැවතිය යුතු බවත් කල් ඉකුත් නොවිය යුතු බවත් එමෙන්ම මරණයට පත් නොවිය යුතු බවත් නම් ඒ කිසිවක් කිසිවිටෙක සිදු නොවනු ඇත. එය ස්වභාවයේ ක්‍රියාත්මක සන්තතික නීතිය වනු ඇත. යමෙකු මේ ධර්ම ස්වභාවය නොසලකා හරින්නේ නම් හෝ අවබෝධ නොකරන්නේ නම් හෝ මෙලොව ජීවිතයත් අනතුරුව ඉපදෙන මතු ජීවිතයත් යන දෙලොවෙහිම දැඩි දුක් පීඩාවන්ට මුහුණදිය යුතුව ඇත.

ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රසංසා, සැප, දුක් යනු සමස්ත මනුෂ්‍ය හා තිරිසන් සත්ත්ව සන්තතියට අනිවාර්යෙන්ම මුහුණදිය යුතුව ඇති සන්තතික අෂ්ඨ ලෝක ධර්මතාවයන් වනු ඇත. ලාභය යනු නිරතුරුව අලාභය පදනම්

වීමෙන් ක්‍රියාත්මක වන ධර්මතාවයකි. යසස යනු අයස මත යැපෙන ලෝක ධර්මතාවයකි. නින්දාව නිරතුරුව ප්‍රසංශාවට ප්‍රති පක්ෂ ධර්මයකි. සැප යනු, දුක් නිසා පවතින ධර්මයකි. ලාභය නිරතුරුව අලාභය කෙරෙහි ප්‍රතිවිරුද්ධ ලෙස විචලනය වන ලෝක ධර්මතාවයකි. සමස්ත අෂ්ඨ ලෝක ධර්මතාවය අඥාන පෘතග්ජන මනුෂ්‍යයන් නොසලකා හැරීම තුලින් තම තමන් විසින් අවිද්‍යාවෙන් ක්‍රියාත්මක කරනු ලබන දුක්ඛ කර්ම චක්‍රය කෙරෙහි ප්‍රධාන පසුබිම නිර්මාණය කරගෙන ඇත.

ඉහත සඳහන් ආන්තික ධර්මතාවයන් මගින් පෘතග්ජන අඥාන මනුෂ්‍යයන් අවිද්‍යා පාදක ලෝභ, ද්වේෂ, මෝහ කර්ම චක්‍රයට මග පාදාගෙන ඇත. යම්තාක් හෝ පෘතග්ජන අඥාන මනුෂ්‍යයන්ට ඉහත අෂ්ඨ ලෝක ධර්මයන්ට මුහුණ දිය නොහැක්කේ යම් සේද ඔවුන් නියත වශයෙන්ම අවිද්‍යාවට පත්වූ, ලෝක ධර්මයට පිටුපාමින් ලෝභ, ද්වේශ, මෝහ ක්‍රියාවලිය තුලින් උපත් විපත් කර්ම චක්‍රයට දායක වීම මගින් සියලු දුක්ඛිත භවයන්හි නියත ලෙසින් නැවත ඉපදීමට හිමිකම් ලබනු ඇත. සතර අගතියට යොමු වීමට නියමිත ඉහත සඳහන් අෂ්ඨ ලෝක ධර්මයන් කෙරෙහි ලෞකික ගෘහස්ත මනුෂ්‍යයින් දැඩි අවදානමකින් සිටිය යුතුව ඇත. විශ්ව ලෝක ධර්මයන්හි පරිණත වූ ප්‍රඥාවන්තයින් ඉහත සඳහන් අෂ්ඨ ලෝක ධර්මයන්ගෙන් නිදහස් වීමෙන් දුක්ඛ සංඛ්‍යාත කර්ම ධර්මතාවයන්ගෙන් නිදහස් වනු ඇත. මක්නිසාද යත් එවැනි ප්‍රඥාවන්තයින් යනු අෂ්ඨ ලෝක ධර්මතාවයන් ක්‍රියාත්මක නොවන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලින් නිර්වාණයට පත්වන බැවිනි. ඒ නිසා එවැනි ප්‍රඥාවන්ත සත්පුරුෂයකු යනු සමස්ත මානව වර්ගයාට මුහුණාදිය යුතුව ඇති යම්තාක් වූ පෘතග්ජන ලෝකයේ පොදු මනුෂ්‍යය අරගලයන්ගෙන් නිදහස් වූ සත්පුරුෂ ප්‍රඥාවන්තයෙකු වනු ඇත.

# ප්‍රඥාව උසස් මාර්ගයට යතුරයි.

*කාමරාගයෙන් තොර වූ ජීවිතයකට පැවතිය හැකි ද ?*
*අමරණීයත්වය පිළිබඳ විශ්වාසයෙන් තොරව මනුෂ්‍යයකුට*
*ශික්ෂණයට පත්විය හැකි ද ?*

*දෙවියකුට වන්දනා කිරීමෙන් තොරව මනුෂ්‍යයෙකුට*
*ධර්මිෂ්ඨභාවයක් සඳහා උසස් විය හැකි ද? එසේ විය*
*හැකි බව බුදුන් වහන්සේගේ පිළිතුරයි.*

*නමුත් ඉහත අදහස් වල යථාර්තය හා අවසාන*
*පිලිතුර ප්‍රඥාවෙන් තහවුරු කරගත යුතුව ඇත.*
*ප්‍රඥාව විශිෂ්ඨ මාර්ගයක් සඳහාම වන යතුරයි.*

*මෙය යමෙකුට සිය ජීවිතයේ උදාවී ඇති වටිනාම*
*යොමු වීමයි. එනම් ඉන් නිශ්චලභාවයත් නොගැටෙන*
*සුළු බවත් සාමකාමී බවත් මනුෂ්‍යයකුට හිමිකර දෙන්නේ*
*සංකීර්ණ වූ ලෝක ධර්මතාවයට සාර්ථකව*
*මුහුණදීමේ හැකියාවයි.*

- මහාචාර්ය කාල් පර්සන් -

# ප්‍රඥා - 02

## 2.1 ප්‍රධාන ත්‍රිවිධ ක්ලේෂ මූල (ක්ලේෂ ධර්ම)

ඕනෑම මනුෂ්‍යයකුට ආර්ය අශ්ඨාංගික මාර්ගය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමෙන් බෞද්ධයකු විය හැකිය. ප්‍රඥාව වශයෙන් ප්‍රඥාවන්තයකුට අත්පත් කරගත හැකි වන එම මාර්ගයෙහි මාර්ගාවබෝධය සහ මාර්ග ඵලය යනු ස්වාභාවයේ ඇති සැටියෙහි විද්‍යාත්මක වූ ශ්‍රේෂ්ඨ වූ ක්‍රියාකාරී සත්‍යය ධර්මයෙහි විද්‍යාත්මක අවබෝධය වන අතර එය දුක්ඛ සංඛ්‍යාත සන්තතික කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීමට යොමුව ඇති එකම නිර්වාණ මාර්ගය ද වනු ඇත. වෙනත් වූ අන්‍යතර අධ්‍යාත්මික මාර්ගයක් ලොවෙහි සත්‍යය අවබෝධ කර ගැනීමටත් අධ්‍යාත්මික විසඳුමකට යොමුවීම සඳහාත් නොපවතිනු ඇත.

සම්මා දිට්ඨියට පත්වීමට අවශ්‍ය යමෙකුට ඒ සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලින් ගතයුතු අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමු විය හැක. ප්‍රාථමික වශයෙන් ගෘහස්ථ මනුෂ්‍යයන් අධ්‍යාත්මික ශික්ෂණයකට යොමු විය යුතු අතර ඒ සඳහා අත්හල යුතු ගිහි කාය කර්මයන්ගෙන් ඉවත්වීමටත් පවත්නා සංවරය පිණිසත් පංච සහ දස ශික්ෂණයන්ට යොමු විය යුතුය. මෙහිදී අධ්‍යාත්මික සංවරය මූලික වශයෙන් ප්‍රගුණ කළ යුතු අතර ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අදාල වන ආර්ය ශීල ප්‍රතිපත්ති පූර්ණය කිරීම සඳහා භික්ෂුත්වයට පැමිණිය යුතුය.

කිසිම මනුෂ්‍යයකු උපතින් කිසිදු ආගමකට අයිති නොවනු ඇත. සියලුම මනුෂ්‍යයන් තම තමන් දාව ඉපදුනු මව් දෙමවුපියන් විසින් පිලිගත් හා අනුගමනය කල සහ විශ්වාස කල මිත්‍යා දෘෂ්ඨික ආගම් වලට හිමිකම් කිවයුතුව ඇත. මේ සම්බන්ධයෙන් සියළුම මනුෂ්‍යයන්ට තම තමන්ගේ උපතින් පසු

පිලිගැනීමට සිදුවන මිත්‍යා ආගම් සඳහා එම ආගමික බැඳීම් සහ එම නීතිරීති වලට යටත් වීමට සිදුවනු ඇත. මේ හේතුවෙන් කිසිම මනුෂ්‍යයකුට තම තමන් ඉපදීමට හේතුව වූ විද්‍යාත්මක ධර්මතාවයන්ගේ ස්වභාවයන් ගැනද තමාට ඉපදීමට හේතුව වූ හේතූන්ගේ ධර්මතාවයන්ගෙන් තමාට නැවත ඉපදීමකට යාමට ඇති හැකියාව පිලිබඳව වන විද්‍යාත්මක ධර්මයන් ගැන දැන ගැනීමට මෙන්ම සසරින් නිදහස් වීමට අවශ්‍ය පියවර ගැනීමටද ඔවුනට නොහැකි වනු ඇත. චතුරාර්ය සත්‍යය වශයෙන් ලොවෙහි ක්‍රියාත්මක වන පරම සත්‍යය ධර්මයන් ලෝකයට පැහැදිලි කර දීම මගින් ලොවෙහි අශ්‍රද්ධානයන් විසින් පිලිගත් සහ අනුගමනය කල මිත්‍යා ආගම් සහ මිත්‍යා විශ්වාස බැහැර කරලීමට බුදුවරයන් වහන්සේලා විසින් ගත් උත්සාහය නිසා මනුෂ්‍යයන් අතර මේතාක් කල් ලොවෙහි ජීවත් වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා බවට උන්වහන්සේ පත්විය. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීමට අනුව ලොවෙහි ඇති ක්‍රියාකාරී එකම සත්‍යය ආගම වශයෙන් විද්‍යාත්මක ධර්මතාවයන්ගේ ඇති සැටිය අවබෝධ කර ගැනීමට සහ ඒ තුලින් නිර්වාණයට පත් වීමට අවශ්‍ය මග තම තමන්ට ස්වාධීනව අවබෝධ කර ගැනීමට කිසිම දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ හෝ වෙන අන්‍යවූ සර්ව බලධාරියකුගේ හෝ අනුග්‍රහයකින් තොරව සිදුකර ගත හැකි මාර්ගයක් වන බව ලෝකවාසි ප්‍රඥාවන්ත මනුෂ්‍යයින්ට දේශනා කර ඇති අතර ලෝකවාසි එම ප්‍රඥාවන්තයින්ට ලොවෙහි යථාර්තය ඇති සැටියෙන් දැකීමට සහ ස්වාධීනව අවබෝධකර ගැනීමට ඒ සඳහා අනුගමනය කල යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගය පැහැදිලි කර ඇත.

කර්ම පාදක වන කෙලෙස් ධර්ම ප්‍රගුණ කරනු ලබන සාමාන්‍ය මනුෂ්‍යයන් සන්තතිකව පවත්නා දුක්ඛ ධර්මය මූලය වූ එමෙන්ම සතර අපායන්හි ඉපදීමට හේතුව වන දැඩි කාම රාගය වඩන මනුෂ්‍යය පිරිසකි. ඔවුන් මෙම ලෞකික පෘතග්ජන

ක්ලේෂ මාර්ගය අනුගමනය කිරීම නිසා දැඩි කාම තෘෂ්ණාවටත් දැඩි වෛරයටත් ජාති, ජරා, ව්‍යාධි, මරණ ලෙසින් පිළියෙලවී ඇති දුක්ඛ ධර්මතාවයන්ගේ පැවැත්ම හඳුනා ගැනීමට හෝ අවබෝධ කර ගැනීමට නොහැකියාව වන අවිද්‍යාවට පත් වීමෙන් කායිකව සහ මානසිකව අකුසල ධර්මයන් වැඩීමට යොමුව ඇත. සාමාන්‍ය පෘතග්ජනයින් අනුගමනය කරනු ලබන හා විශ්වාස කරනු ලබන ත්‍රිවිධ කර්ම ඉන්ද්‍රියයන් මගින් පිලියෙල කරගනු ලබන ක්ලේෂ ධර්මයන් ප්‍රධාන ලෙස ත්‍රිවිධ ක්ලේෂ මුල පාදක වු ප්‍රධාන ත්‍රිවිධ දෘෂ්ඨීන්ට යොමු වී ඇත. මෙම ප්‍රධාන ත්‍රිවිධ දෘෂ්ඨීන් යනු අකුසල් ධර්ම පාදක වු පෘතග්ජන මනුෂ්‍යයන් කායිකව සහ මානසිකව සිදු කරන කාම ක්‍රියාවන් වනු ඇත. යම්තාක් පෘතග්ජනයින් තම තමන්ට මරණයෙන් පසුව යා යුතුව පවතින නොදන්නා භවය ගැන නොදැනීම නිසා එම අවිද්‍යාවට ගොදුරු වීමෙන් සියලු සත්ත්වයන්ට පොදු වු සංසාරික දුක්ඛ කර්ම ක්‍රියාවලියට හේතුව වන කාම තෘෂ්ණාව සහ කාම රාගය ඔවුනොවුන්ට හැකි උපරිමයෙන්ම භුක්ති විඳිනු ඇත. මෙම අවිද්‍යා ක්‍රියාවලියට අනුව එනම් ලෞකික ක්ලේෂ මාර්ගය හේතුවෙන් සමස්ත පෘතග්ජනයින් නිර්මාණාත්මක හා මැවුම් පාදක දෘෂ්ඨීන්ට ගොදුරු වීමත් දේව විශ්වාස හා මිත්‍යා විශ්වාස ඇදහීමටත් යොමු වී ඇත. සාමාන්‍ය පෘතග්ජනයින් ලෞකික ක්ලේෂ මාර්ගය පිලිබඳව අනවබෝධයෙන් යුතුව ඉන් ඔවුන් සතර අපාගත උප්පත්තින්ට යොමු වීමට ඇති හේතුව ගැන නොදන්නා කමින් එයින් වැලකීමට ගත යුතු වන අවශ්‍ය පියවර ගැන නොදැනීම සමස්ත පෘතග්ජනයින්ගේ පොදු අවාසනාව වනු ඇත.

ලොවෙහි පවතින පරම සත්‍යය සහ එය ක්‍රියාත්මක වන විද්‍යාත්මක පැවැත්මෙහි කිසිදු අවබෝධයක් නැති

සමස්ත ලෝක ජනගහනයෙන් හරි අඩකටත් වඩා වන අශ්‍රද්ධාන මනුෂ්‍යයන් දැඩි ලෙස කාම රාගයට ඇබ්බැහි වීමෙන් හා ඉන් බිහිවන දැඩි වෛරී මානසිකත්වයකට යොමු වී ඇත. තමන් කෙරෙහි පවත්නා ගෞරව කීර්ති නාමයන්ට හානි වීමෙන් සිදුවන නින්දාවන් මගින් අත්පත් වන දුක්ඛ වේදනාවන්ට ගොදුරු වීමෙන්ද තමන් සතුව පැවති යම්තාක් කාම වස්තූන් අහිමි වීමෙන් විඳීමට සිදුවන කායික මානසික දුක්ඛ වේදනාවන්ටද ඔවුන් ගොදුරු වනු ඇත. මෙම අෂ්ඨ ලෝක ධර්මතාවයන්ගෙන් ආරක්ෂා වීමට ගත යුතු ප්‍රතිකර්මයන් පිලිබඳ නොදැනීමෙන් ලොවෙහි පරම සත්‍යය වන දුක්ඛ ධර්මය කෙරෙහි අවිද්‍යාවෙන් බැඳීඇත. මෙම පෘතග්ජනයින් සත්‍යය වශයෙන් තම තමන් ක්‍රියාත්මක කරන්නා වූ අවාසනාවන්ත වු දිවි පැවැත්මට ගොදුරු වීමට මුලික හේතුව වී ඇත්තේ ලොවෙහි දුක්ඛ ධර්මය ක්‍රියාත්මක වීමට පසුබිම්වී ඇති අෂ්ඨ ලෝක ධර්මයන් කෙරෙහි අශ්‍රද්ධානව යොමු වී ඇති නිසාය. එහෙත් යම්තාක් මනුෂ්‍යය පිරිසක් ප්‍රශ්‍රද්ධාවන්තව ශ්‍රේෂ්ඨ වු තථාගත ඉගැන්වීමට අනුව ජීවත් වීමෙන් මෙලොව සහ පරලොව සුභ සිද්ධිය සඳහා අවශ්‍ය පියවර සාර්ථකව අත්පත් කර ගනු ඇත.

විද්‍යාත්මක හා අධ්‍යාත්මිකවු මානසික කර්ම ක්‍රියාවලියෙහි නිරතවීමෙන් ජිවත් වන පෘතග්ජන මනුෂ්‍යයන්ට එම විද්‍යාත්මක කර්ම ක්‍රියාවලිය ගැන අනවබෝධය සහිත අවිද්‍යා මාර්ගයෙන් නිදහස් නොවීමට චතුරාර්ය සත්‍යය නොදැනීම හේතුව වී ඇත. විද්‍යාත්මක වු සහ අධ්‍යාත්මික වු විශ්ව ලෝක ස්භාවය තුල ක්‍රියාත්මක ලෝක ධර්මතාවයන්ගේ නිතීන් ලෙස සත්ත්වයින්ගේ පැවැත්මට හේතුව වන හේතුඵල ධර්මතාවය විද්‍යාත්මක දේශනා ධර්මය ලෙසින් තථාගත ධර්මය තුල පැහැදිලි වී ඇත.

මේ සම්බන්ධයෙන් ලෝක ස්වභාවයෙහි ක්‍රියාත්මක වන සන්තතික නීති පද්ධතිය ප්‍රධාන ලෙසම අධ්‍යාත්මික ශක්තීන්ගේ ස්ථිතික විද්‍යුත් පැවැත්මක් වනු ඇත. සත්ත්වයින්ගේ දුක්ඛ ධර්ම පාදක ජාති, ජරා, ව්‍යාධි - මරණ ක්‍රියාවලියට හේතුව වන විඤ්ඤාණය නම් වන මානසික සංස්කරණය මූලික වශයෙන්ම පිළියෙල වීම සිදු වන්නේ ලොවෙහි පවතින සංස්කාර ද්‍රව්‍යයන්ගෙන් සත්ත්වයන් විසින් කායිකව සහ මානසික ස්පර්ශයන්ගෙන් ග්‍රහණය කර ගන්නා පංචවිධ සංඥාවන් මගිනි. මෙම මානසික සංස්කරණ ක්‍රියාවලිය අධ්‍යාත්මික බලයක් වන අතර නැවත ඉපදීමේ විද්‍යාත්මක ක්‍රියාවලියට හේතුවද වනු ඇත. පවත්නා ජීවී පැවැත්ම සතු මූලික අධ්‍යාත්මික මූලධර්ම ගැන නොදැනීම සියළුම පෘතග්ජන සත්ත්වයින්ට පවත්නා දුක්ඛ ධර්ම පාදක කර්ම ධර්ම මාර්ගයෙහි නිත්‍ය හිමිකරුවන් බවට පත් වීමට අවිද්‍යා පාදක ත්‍රිවිධ දෘෂ්ඨීන්ගේ හේතු ඵල ධර්ම න්‍යායන්ට අනුගතවීමෙන් සියලුම මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයන් සංසාරික පැවැත්මකට යොමු කර ඇත.

පහත සදහන් ප්‍රධාන අවිද්‍යා පාදක ත්‍රිවිධ දෘෂ්ඨීන්ට අනුගතව පෘතග්ජන මනුෂ්‍යයන් සසරට බැඳී පවතී.

## 1. මිත්‍යා දෘෂ්ඨිය

යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයෝ තමා කෙරෙහි පවත්නා දුක්ඛ ධර්මයක පසුබිම චතුරාර්ය සත්‍යය ලෙස නොදැක පංච ඉන්ද්‍රියයන් පිනවීම තමන්ගේ පොදු අවශ්‍යතාවය ලෙස දැකීමෙන් කායිකව සහ මානසිකව තෘෂ්ණාවට ලක් වීමට හේතුව වන මානසික දැක්ම.

## 2 සක්කාය දෘෂ්ඨිය

යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයින් චතුරාර්ය සත්‍යය ගැන නොදැනීමෙන් තමන් යනු කායික ඉන්ද්‍රියන් පිනවීමේ හිමිකම ලැබූ පුද්ගලිකත්වයක් ලෙස පිලි ගැනීමේ මානසික දැක්ම.

## 3 ආත්ම දෘෂ්ඨිය

යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයෝ චතුරාර්ය සත්‍යය පිලි නොගැනීමෙන් තමන් යනු මතුවටත් පවතින නිත්‍ය ආත්මීය ධර්මයක් ලෙසත් එහි අවසානය ස්වර්ග සම්පත්තියකට යෑමට නියමිත නිත්‍ය ආත්මයක් මතුවට ඇතැයි විශ්වාස කිරීමේ මැවුම්කාර දේව සංකල්පය පාදක මානසිකත්වයට හිමි දැක්ම.

ලෝකවාසී අඥාන පෘතග්ජන මනුෂ්‍යයින් ඉහත සදහන් ත්‍රිවිධ දෘෂ්ඨීන්ට ගොදුරු වුයේ නම් ඔවුන් නිත්‍ය වශයෙන්ම ලොවෙහි ක්‍රියාත්මක වන විද්‍යාත්මක සහ අධ්‍යාත්මික හේතුඵල ධර්ම නිතිය ගැන කිසිදු අවබෝධයක් නැති පිරිසකි. ඔවුනට කිසිදිනක ලොවෙහි ක්‍රියාත්මක වන සත්‍යය ධර්මතාවයන්ගේ පැවැත්ම එනම් ප්‍රඥාව අවබෝධ කර ගැනිමටත් ඒ තුලින් තමා සතු කායික මානසික දුක්ඛ දෝමනස්ස ක්‍රියාවලියෙන් නිදහස් වීමට හැකියාවත් නොලැබෙනු ඇත. ඉහත සදහන් ත්‍රිවිධ දෘෂ්ඨීන්ට ගොදුරු වන යම්තාක් අඥාන මනුෂ්‍යයන්ට තමා සතු උපත් සහ විපත් කර්ම චක්‍රයෙන් නිදහස් වීමටවත් ඉපදිමට නියමිතව ඇති සතර අපායන්ගෙන් නිදහස් වීමටවත් නොහැකි වනු ඇත. මනුෂ්‍යය ලෝකයේ ජීවත්වන පෘතග්ජන මනුෂ්‍යයන් යනු ලොවෙහි ක්‍රියාත්මක වන චතුරාර්ය සත්‍යය ධර්මයන් හොදින් දැකීමට හා අවබෝධ කර ගැනීමට අවශ්‍ය පසුබිම ලබා ගැනීමට වාසනාවන්ත වු පිරිසකි. එනම් ලෝකයෙහි ක්‍රියාත්මක වන

හේතුවල ධර්මයන්ගේ මුලය වන දුක්ඛ ධර්මතාවය ඉතා පැහැදිලි ලෙස ජාති ජරා ව්‍යාධි මරණ ලෙස ප්‍රකටව හා පැහැදිලිව ඇති බැවිනි. යමෙකු උපතින් ප්‍රඥාවන්ත වන්නේද එලෙසම පවතින ධර්මතාවයන්ගේ ඇති සැටි විනිවිද දැකීමට සුදුසුකම් ඇත්තේද ඔවුන් විසින් ඉතා නිරවුල්ව සහ පැහැදිලිව දුක්ඛ ජීවිතයකට පාදක වු අසාර වු ධර්ම ස්වභාවය අවබෝධ කර ගැනීමටත් එම ධර්ම ස්වභාවයන් මනුෂ්‍යයන්ට කොපමණ දුරට දුක්ඛ වේදනා පාදක සන්තතික ධර්මයකට යොමු කර ඇති ආකාරයත් හොඳින් අවබෝධකර ගනු ඇත.

## "උන්වහන්සේ පාපය ගැන කථා නොකරයි"

*බුදුන් වහන්සේ යනු සමස්ත සාන්තුවරයන් කෙරෙන්*
*පිලිබිඹු වන සහ ඉතාමත් ප්‍රීතිමත්ව සිටින ශාන්තවූද*
*අධ්‍යාත්මිකවූද සමස්ත සත්ත්ව වර්ගයා කෙරෙහි*
*කාරුණික වූද ශ්‍රේෂ්ඨවූද මනුෂ්‍යයෙකි. උන්වහන්සේ*
*කිසි විටෙක පාපය ගැන හෝ ශාපය ගැන හෝ*
*කතා නොකල නමුත් අවිද්‍යාව සහ අඥානකම*
*ගැන පැහැදිලි කල අතර ඒ සඳහා ප්‍රතිකර්මය*
*ප්‍රඥාවබෝධය සහ මෛත්‍රිය බව ලොවට*
*හෙලි කරන ලදී.*

**- ආචාර්ය එස් රාධක්‍රිෂ්නන් -**

**"ගෞතම බුදුන්" නමැති කෘතියෙනි.**

## 2.2 සක්කාය දිට්ඨිය (පුද්ගල මානසිකත්වය පිළිබඳව අවිද්‍යාව)

**(ලෝභය : තෘෂ්ණාව : කාමරාගය : කාමච්ඡන්ද : කාම රතිය)**

සතර අපාගත උප්පත්තින්ට අඥානයින්ට මග යොමු වී ඇති ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන්ගේ ප්‍රධාන මුලධර්මය අවිද්‍යා පාදක තෘෂ්ණාව වනු ඇත. කායික ශරීරය සමග ප්‍රතිබද්ධව ක්‍රියාත්මක වන දැඩි කාම තෘෂ්ණාව වන අවිද්‍යා පුද්ගලත්වය එනම් සක්කාය දිට්ඨිය සඳහා පදනම වනු ඇත. චතුරාර්ය සත්‍යය ලෙස ඉතා ගැඹුරු සහ ඉතා සියුම් වු බුද්ධ දේශනාව තුලින් තෘෂ්ණාව රාගය හා කාම රතිය සන්තතික කර්ම චක්‍රයෙන් ඉවත් කිරිම තුලින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය නිර්මාණය කර ඇත. යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයන්ට තමා යන මානසික හැඟීමට පාදක වු අවිද්‍යා මමත්වය හඳුනා ගැනීමට නොහැකි වීම ලොවෙහි සමස්ත මනුෂ්‍යය තිරිසන් සත්ත්වයන්ගේ නැවත ඉපදිමට හේතුව වනු ඇත. චතුරාර්ය සත්‍ය ධර්මය හඳුනා නොගැනිම හේතුවෙන් පුද්ගල ධර්මතාවයක් තමා කෙරෙහි පවතින්නේ යැයි සිතිමෙන් හා දැකීමෙන් සක්කාය දිට්ඨියට යොමුව ඇත. මානසික ශක්තීන්ගේ ස්පර්ශපාදක ක්‍රියාවලියෙහි විද්‍යාත්මක ඇති සැටිය නොදැනීම නිසා හේතුඵල ධර්මයන්ට අදාලව පිලියෙල වු කර්මානු රූප සිත සහ කර්මානු රූප කය තමන්ගේ වශයෙන් දැක්මට යොමු වීමෙන් අවිද්‍යා පුද්ගලිකත්වයට ගොදුරු වී ඇත. මේ නිසා භෞතික කයෙහි ස්පර්ශ ක්‍රියාවලියට අවනත වීමෙන් ස්පර්ශපාදක තෘෂ්ණාවට අදාලව සම්ප්‍රයුක්ත මානසික ක්‍රියාවලිය තමාගේ වශයෙන් දැකීමට යොමු වී ඇත. මේ හේතුවෙන් භෞතික කයෙහි සංවේදී විද්‍යාත්මක ස්වභාවයෙහි ඇති සැටිය නොදැනීමෙන් පුද්ගල හැඟීමකට මනුෂ්‍යයා ගොදුරු වී ඇත. මෙම කායික සංස්කරණය සහ මානසික සංස්කරණය යනු අධ්‍යාත්මික හා බාහිර සත්ත්ව සන්තතික ධර්මතාවයන්ගේ පැවැත්ම වන අතර එය අවබෝධ නොවීම

අශ්‍රැතවත් පෘථග්ජන මනුෂ්‍යයන් කෙරෙහි ක්‍රියාත්මකව පවත්නා අවිද්‍යාව බවට පත්වනු ඇත.

සම්ප්‍රයුක්ත මානසික ස්පර්ශ ක්‍රියාවලිය භෞතික කයෙහි පංච ඉන්ද්‍රියන්හි ස්පර්ශ ක්‍රියාවලිය හා අඛණ්ඩව බැඳී ඇත. භෞතික කයෙහි කායික ස්පර්ශයන් සිදුවන විට මානසික ශක්ති ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට යොමු වීම සත්ත්ව ලෝකයේ පැවැත්මේ පොදු ක්‍රියාවලිය වීමෙන් ඒ පිළිබඳ අවිද්‍යා පාදක මානසික ග්‍රහණයෙන් පුද්ගල හැඟීම නිර්මාණය වේ. සම්ප්‍රයුක්ත මානසික ඵලය වන තමා යනුවෙන් දැකීමේ මානසිකත්වය සඳහා පාදක වන ප්‍රධාන සන්තතික ධර්මයන් වන්නේ අවිද්‍යාව හා සහජාතක වන කාම තෘෂ්ණාවයි. සක්කාය දෘෂ්ඨිය නම් වන මානසික සංවේදී ධර්මතාවය සඳහා අවිද්‍යාව හා තෘෂ්ණාව හේතුව වන අතර එහි ඵලය වශයෙන් සම්ප්‍රයුක්ත මානසිකත්වය වන්නේ තමා පුද්ගලයෙක්ය යනුවෙන් සිතන අවිද්‍යා හැඟීමෙහි සම්භවයයි. මෙලෙසින් අධ්‍යාත්මික සත්ත්ව ධර්මතාවයන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලිය ගැන නොදැනීම එනම් අවිද්‍යාව හේතුව වීමෙන් පෘතග්ජන මනුෂ්‍යයන් තම තමන් යනු පුද්ගලයකු යැයි සිතීමේ අවිද්‍යාවට ගොදුරු වී ඇත. මෙලෙස මානසිකව නිර්මාණය වන අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි අනවබෝධයෙහි හේතුවට අනුව ජීවත්වන පෘතග්ජන මනුෂ්‍යයෝ සංස්කාරක ධර්මයන්ගේ පංච විධ සංඥා රූපයන්ගේ පරිහරණයට යොමු වීමෙන් කර්ම ධර්ම නිර්මාණයට හේතුව වන මානසික සංස්කරණ ක්‍රියාවලිය එනම් මනෝ විඥාණගත අධ්‍යාත්මික ඵලයට යොමු වීමෙන් නැවත ඉපදීමේ ධර්ම ක්‍රියාවලියේ කර්ම පදනමට යොමු වී ඇත.

ලෞකික පෘතග්ජන මනුෂ්‍යයන් තමා යනු පුද්ගලිකත්වයක් වශයෙන් දැකීමට යොමු වීමෙන් එම කායික

ශරීරයට සැප සම්පත් ලබා දීමටත් හැකි උපරිමයෙන් ඉන්ද්‍රියන් පිනවීමට යාමෙන් දැඩි තෘෂ්ණා සංවේදී කාම ක්‍රියාවන්ට ප්‍රබල ලෙස ඇබ්බැහි වී ඇත.

යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයෝ සක්කාය දිට්ඨිය තුලින් ලෝකයෙහි ක්‍රියාත්මක විද්‍යාත්මක සන්තතික ධර්මතාවයට අනුව නිර්මාණය වූ සංස්කාරක වස්තූන් වන මිල මුදල්, යාන, වාහන, ඉඩකඩම්, ඇඳුම්, පැලඳුම්, ස්වාමිපුරුෂ, භාර්යා, කාන්තා, පිරිමි, දූ, පුතුන්, මවු, පිය ලෙසින්ද සංගීත, නැටුම්, ගැයුම්, වැයුම්, කාමුක චිත්‍රපටි හා ටෙලිනාට්‍ය, සුවඳ විලවුන් භාවිතා කිරීම ආදී ලෞකික අවිද්‍යා ක්‍රියාවන්ට අනුගත වීමෙන් දැඩි කාම තෘෂ්ණාවට ඇබ්බැහි වීමත් ඒ අනුව පුද්ගල දැක්මට අනුව කය පරිහරණය කිරීමටත් යොමුව ඇත. මෙලෙස කායික සැප ස්පර්ශයට හිමිකම් දරන අඥාන පෘතග්ජනයින් තමා යනුවෙන් දැකීමේ අවිද්‍යා දැක්මට ගොදුරුව ඉහත සඳහන් සංස්කාරක ලෝකය තුල අවිද්‍යාවෙන් ජීවත් වනු ඇත. හේතුඵල ධර්මයන්ට අනුගතව නිර්මාණය වන සත්ත්වයින්ගේ සන්තතියට හේතුව වන අවිද්‍යා සහගත මානසිකත්වය අඥාන මනුෂ්‍යයින්ට භෞතික කය පුද්ගල දැක්මට ගොදුරු කර ගනිමින් සක්කාය දෘෂ්ඨිය නිර්මාණය කර ගෙන ඇත. සම්ප්‍රයුක්ත සක්කාය දිට්ඨිගත පුද්ගලත්වය පිලිබඳ අවිද්‍යාව සාමාන්‍ය පැවැත්ම තුල මනුෂ්‍යය සත්ත්වයින්ගේ අධ්‍යාත්මික පැවැත්මට මූලය වීමෙන් එම සත්ත්වයින්ගේ මරණින් පසු එම අධ්‍යාත්මික කර්ම ශක්තිය සතර අපායන්හි ඉපදීමට නියමිතවන සත්ත්වයින්ගේ ඉපදිමට අවශ්‍ය කර්ම ශක්තිය වනු ඇත.

තමා යනුවෙන් දැකීමේ අවිද්‍යා ක්‍රියාවලිය සඳහා හේතුව වශයෙන් ක්‍රියාත්මක වන විද්‍යාත්මක වුද අධ්‍යාත්මික වුද ක්‍රියාවලියෙහි සම්ප්‍රයුක්ත ඵලය වන සක්කාය දිට්ඨිය නම් වන ''මම'' යනුවෙන් සිතන ස්වභායට හේතුව එහි ඇති සැටිය

මානසික ක්‍රියාවලියක් වශයෙන් ක්‍රියාත්මක වන බව නොදැනීමය. තමා යනුවෙන් සිතීමේ අවිද්‍යාවට යොමු වීම තුලින් සතර අපායන්ට නියමිත කර්ම විපාක ක්‍රියාවලිය සඳහා මනුෂ්‍යයින්ට යොමු වීමට සිදුවීම ලෝකයෙහි පැවතෙන සත්ත්ව සන්තතික ක්‍රියාවලියෙහි පසුබිම වනු ඇත. මම යනුවෙන් දැකීමට හේතුව වන අවිද්‍යාව සතර අපාගත උප්පත්තීන්ට යොමු වීමට සිදු වීමෙන් අවිද්‍යාවෙන් අව සිහියෙන් යුතුව දැඩි කාම තෘෂ්ණාවට පෘතග්ජන අඥාන මනුෂ්‍යයන් යොමු වී ඇත. සමස්ත බහුතර අඥාන පෘතග්ජන මනුෂ්‍යයන් දැඩි ලෙස ඇබ්බැහිවූ කාම තෘෂ්ණාව යනු මනුෂ්‍යයන් තව තවත් අවිද්‍යාවට දැඩිව යොමු කරවන විශ්වගත ලෝක ධර්මතාවය වන හේතුඵල ධර්මයන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලියෙහි ප්‍රබලවූ විද්‍යාත්මක බලපෑමෙහි හේතුව වනු ඇත.

ඒ නිසා සක්කාය දිට්ඨිය ප්‍රභවගත සම්ප්‍රයුක්ත මානසික ක්‍රියාවලිය එනම් මනෝ විඥානය අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත මානසික ශක්තීන්ගේ බලයක් වන බැවින් එම ශක්තීන්ගේ විද්‍යාත්මක ධර්මතාවය පෘතග්ජන මනුෂ්‍යයකුගේ කායික මානසික ක්‍රියාවලිය තමන් තුලින් හඳුනා ගැනීමට නොහැකිවීම නිසා එය සමස්ත මනුෂ්‍යයින් කෙරෙහි පවතින අවිද්‍යාව බවට පත් වනු ඇත. සක්කාය දිට්ඨිගත අවිද්‍යා දැක්ම පාදකව යම්තාක් අඥාන මනුෂ්‍යයෝ තමා විසින් පිලියෙල කර ගන්නා මනෝ විඥානය නම් වු අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත ඵලය එනම් මානසික සංස්කරණයෙහි අන්තර්ගත ධර්මයන්ගේ යථා ස්වභාවය තිරිසන් ලෝකගත මානසික සංස්කරණ ක්‍රියාවලිය හා මුළුමනින්ම සමානතාවක් දක්වන නිසා සියලුම අඥාන මනුෂ්‍යයෝ සමාන මානසික කර්ම ක්‍රියාවට අදාලව තිරිසන් ලෝකගත නැවත උප්පත්තීන්ට අනිවාර්යයෙන්ම යා යුතුව ඇත. එහිදී ක්‍රියාත්මකව පවතින දුක්ඛ ධර්ම සන්තතික විපාක ක්‍රියාවලියෙහි දැඩි දුක්

වේදනාවන්ට මෙම ලෞකික අඥාන මනුෂ්‍යයන්ට එහිදී මුහුණ දීමට සිදුවනු ඇත. කාම තෘෂ්ණාවෙහි දැඩි ඇබ්බැහි වීම හේතුව නිසා තමා යනු මම වශයෙන් දැකීමේ අවිද්‍යා විශ්වාසයට පාදක වන සක්කාය දිට්ඨිය ලොවෙහි ක්‍රියාත්මක වන විද්‍යා ධර්මයන්ගේ අවබෝධය නොමැති අඥානයන් සතු වන දැක්ම වන අතර පුද්ගල මානසිකත්වය නිසා බිහිවන දැඩි අවිද්‍යා අඳුරක් වන එම අඳුර තුලින් බිහිවන දුක්ඛ කර්ම සම්ප්‍රයුක්ත හේතුඵල ධර්මතාවයන්ගේ කායික සංස්-කරණයෙහි විද්‍යාත්මක සම්බන්ධීකරණය නොදන්නා අඥාන මනුෂ්‍යයෝ තමා කෙරෙහි පවත්නා සන්තතික කර්ම ධර්මතාවයෙහි ඇති සැටිය නොදැනීම එනම් අවිද්‍යා පුද්ගලත්වය සක්කාය දිට්ඨිය ලෙස ප්‍රකට කරමින් මානසික පුද්ගල ස්වභාවය තුලින් තමන්ගෙන් පසුව ක්‍රියාත්මක විය යුතු ජාති ජරා ව්‍යාධි මරණ නම් වන ලෝක ධර්මතාවයෙහි කර්ම ක්‍රියාවලියට නැවත නැවත ගොදුරු වනු ඇත.

අඥාන පෘථග්ජන මනුෂ්‍යයන් විසින් අවිද්‍යාපාදකව අනුගමනය කරනු ලබන සක්කාය දිට්ඨිය නිසා වර්ධනය වන මනුෂ්‍යයන්ගේ දුශ්ශීල බවත්, සාහසික ක්‍රියාත්, එලෙසම සමාජගත නීති විරෝධී සාහසිකකම්ද, දූෂණද මනුෂ්‍ය සමාජයට පමණක් නොව සෙසු සත්වයින්ටද ප්‍රබල ලෙස හානිකර ලෙස බලපානු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සක්කාය දිට්ඨියට ගොදුරු වූ සමස්ත අඥාන මනුෂ්‍යයන් සියල්ලෝම දැඩි ලෙසින් දුක් විඳීමට ඔවුන්ට සිය මරණින් පසු නැවත ඉපදීමේ කර්ම චක්‍රය මගින් සතර අපායෙහි තිරිසන් ප්‍රේත සත්වයින් බවට පත්ව ඉපදෙනු ඇත.

මෙම අඥාන සක්කාය දිට්ඨික මනුෂ්‍යයෝ තම තමන්ට සසර දුකින් නිදහස් වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් අනිවාර්යයෙන්ම සක්කාය දිට්ඨියෙන් නිදහස් විය යුතුව ඇති අතර සම්මා දිට්ඨියට පත්විය යුතුව ඇත. එනම් විද්‍යා

අවබොධය සහිත ප්‍රඥාව අත්පත් කර ගත යුතුව ඇත.එයින් ප්‍රඥාවන්තයෙකු බවට පත්වී මතු උපදින භවයන් සුගති භවයන් කර ගැනීමත් අවසානයේ නිර්වාණය අවබෝධ කර නිවන් ලැබීමටත් උත්සාහ ගත යුතුව ඇත.

## 'මෙතෙක් ලොව පහල වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා'

*තථාගත ශ්‍රී සද්ධර්මය විද්‍යාත්මක අවබෝධයෙන් සහ ශ්‍රද්ධාවෙන් හැදෑරිය හැකි ඉගැන්වීමකි. ලෝකයේ කොතැනක හෝ පවතින ආගම් දර්ශන ඇදහිලි මෙහෙයවූ*

*ශාස්තෲවරුන් හා ආගමික නායකයින් අතරින් මෙතරම් ශ්‍රේෂ්ඨ වූ වෙනත් ශාස්තෘවරයෙක් අපට හමුවේද?*

*තාරකාවන් අතර බුදුන් වහන්සේ විශාල වූද ප්‍රභල වූද දීප්තිමත් වූද තාරකාවක් බඳු විය. විද්‍යාඥයෝද දාර්ශනිකයෝද සාහිත්‍යධරයෝද පිලිගැනීමෙන් ප්‍රකාශ කර ඇත්තේ නිසැකවම බුදුන් වහන්සේ මෙතෙක් "ලොව පහල වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා" ලෙසයි. මේ ශ්‍රේෂ්ඨ ගුරුවරයාගේ ප්‍රභාශ්වරභාවය ලොවෙහි ක්‍රියාත්මක වන එහෙත් හඳුනා ගැනීමට නොහැකිවන අවිද්‍යාව බවට පත් වීමෙන් අඳුරු වී ඇති සන්තතික දුක්ඛ ධර්මතාවන්ගේ පැවැත්ම තුලට යොමුවී ඇත්තේ දීප්තිමත් ආලෝකයක් ලෙසින් වන අතර උන්වහන්සේ සමස්ත මානව වර්ගයාට ආලෝකයක් බවට පත්වීමෙන් එම දුක්ඛ ධර්මය හඳුනා ගැනීමට ඔවුනට මග හෙලි කර ඇත.*

(යුරෝපීය ලේඛකයකි)

## 2.3. ආත්ම දෘෂ්ඨිය

**(නිත්‍ය ස්වර්ග - මෝක්ෂ මානසිකත්වය පාදක ආත්ම අවිද්‍යාව)**

**(වෛරය - හිංසනය - ද්වේෂය)**

සාමාන්‍ය අඥාන පෘතග්ජන මනුෂ්‍යයන් පිලිගනු ලබන හා අනුගමනය කරනු ලබන තවත් එක් ප්‍රධාන අකුසල් ධර්ම පාදක දෘෂ්ඨියක් වන ආත්ම දෘෂ්ඨිය යනු තම තමන් විසින් විශ්වාස කරනු ලබන අවසානයේ දී යාමට හැකියයි විශ්වාස කරනු ලබන දිව්‍ය ස්වර්ග මෝක්ෂ සම්පත්තින් ඇතැයි දැකිමේ අවිද්‍යාවයි. අති බහුතරයක් වන ලෝකවාසී අඥාන මනුෂ්‍යයෝ ප්‍රඥාවබෝධයෙන් බැහැරව ලෝකයේ සියල්ලම දේව නිර්මාණ වශයෙන් දැකීමේ අධ්‍යාත්මික අඳුරට යොමු වී ඇත. මෙම අනවබෝධය මගින් එම පෘතග්ජන මනුෂ්‍යයන්ට සන්තතික ජාති ජරා ව්‍යාධි මරණ සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධිගත විද්‍යාත්මක ධර්මතාවයෙහි සතර අපාය උප්පත්තින්ට හිමිකම් ලබා ගත යුතුව ඇත.

සත්ත්ව ජීවිතයක මූලධර්ම හේතුඵල ධර්ම පාදක වූ කර්ම විපාක චක්‍රයක් තුල ක්‍රියාත්මක වන අතර එම ද්‍රව්‍ය සහ ශක්තින්ගේ සංස්කරණ ක්‍රියාවලියෙහි සන්තතික ධර්මයන්හි ඇති සැටිය නොදැනීම නම් වන අවිද්‍යාව මගින් සියලුම අඥාන මනුෂ්‍යයින්ට නොදන්නා දුක්ඛ සහගත භවයක නැවත ඉපදීමට හේතුව පිළියෙල වනු ඇත. මේ සම්බන්ධයෙන් පෘතග්ජන මනුෂ්‍යයන්ට තමා සතු කායික ශරීරයෙහි නිර්මාණයට පාදක වූ ද්‍රව්‍යයන්ගේ ඇති සැටියත් මානසික සංස්කරණයට හේතු වූ විද්‍යුත් සංඥාවන්ගේ සංඥා රූපයන්ගේ ඇති සැටියත් අවබෝධ කර ගැනීමට නොහැකිව ඇත. මෙලෙස අනවබෝධයට පත් අඥාන මනුෂ්‍යයින් විසින් තමන් යනුවෙන් නිර්මාණය වී ඇති ශක්තීන්ගේ හා පදාර්ථයන්ගේ එකතුව හා ඉන් සම්ප්‍රයුක්ත වන මානසික

ශක්තින්ගේ ඇති සැටියෙහි නොදන්නාකම හේතුවෙන් තමා යනු පෙර සහ දැන් සහ මතුවට අඛණ්ඩව පවතින ආත්මය නම් වන පැවතීමක් යැයි යන අවිද්‍යා දැක්මට යොමුව ඇත. මෙම ආත්ම දැක්මට පාදක වන ආත්මය මවන ලද්දකැයි විශ්වාස කිරීමේ දේව බ්‍රහ්ම විශ්වාසයන්ට දැඩි ලෙස අඥාන ව යොමුව ඇත. ආත්ම දෘෂ්ඨිය යනු අධ්‍යාත්මික වූ විද්‍යාත්මක සම්ප්‍රයුක්ත ඵලය වන මානසික ශක්තීන්ගේ ස්ථිතික විද්‍යුත් ක්‍රියාවලියක් වන අතර සැබැවින්ම එය ආත්මීය ක්‍රියාවලියක් නොවන බවත් දෙවියකුගේ බ්‍රහ්මයකුගේ මැවීමක් නොවන බවත් සත්‍යය වශයෙන් ක්‍රියාත්මක නොවන එහෙත් හේතුඵල ධර්මතාවයන්ට අනුව පමණක් සම්ප්‍රයුක්තව නිර්මාණය වන ලෝක ධර්මතාවයක් වන අතර නමුත් අඥාන මනුෂ්‍යයන්ට එය ආත්ම දෘෂ්ඨියකට විකසනය වී ඇත.

යම්තාක් අඥාන මනුෂ්‍යයන් ආත්ම දෘෂ්ඨිගත කායික හා මානසික කර්ම ක්‍රියාවලිය තුල අවිද්‍යා සම්ප්‍රයුක්ත ලෝභ ද්වේශ ක්ලේශ ධර්මයන් ප්‍රගුණ කරන මනුෂ්‍යය ප්‍රජාවකි. සංස්කරණයවී ඇති මෙම ක්ලේශ ධර්මයන්ගේ විවිධ මානසික සම්ප්‍රයුක්ත ධර්ම ස්වභාවයන් වන වෛරය, හිංසනය, අසාධාරණය, අධර්මිශ්ඨ බව, නපුරු බව, සාහසික බව, දූෂණය, දුශ්ශීල බව සහ අකාරුණික බව ආදී ක්ලේෂ ධර්මයන් කර්ම පාදක සම්ප්‍රයුක්ත ක්ලේෂ ධර්මයන් ලෙස හඳුනා ගත හැක. අවිද්‍යා පාදක නිර්මාණයන් වන මෙවැනි අකුසල ධර්මතාවයන් පාදක වීමෙන් ආත්ම දෘෂ්ඨියට පත් මනුෂ්‍යයන් විසින් තමා කෙරෙහි සහ අන්‍යයයන් කෙරෙහි හිංසන ක්‍රියාවන්ට යොමු වීමෙන් තමන් යනු ආත්මයක් වශයෙන් දකිමින් සිය ආත්මය රැක ගැනීම පිණිස යැයි සිතා ක්‍රියා කිරීම නිසා තමන් නොදන්නා හේතුඵල ධර්මතාවයන්ගේ විද්‍යා ක්‍රියාවලියට ගොදුරු වීමෙන් නැවත උපත විපත නම් වන අඛණ්ඩ කර්ම ශක්තිය තුල ජීවත් වනු ඇත.

දුක්ඛ කර්ම සන්තතික ක්‍රියාවලිය තුල තථාගත බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රේෂ්ඨ වූ චතුරාර්ය සත්‍යය ඉගැන්වීමට අනුව සත්ත්වයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ඔවුන්ගේ ජිවත් වීමට පදනම වන කායික හා මානසික සන්තතික ධර්මතාවයන්ට අනුව පංච විධ ස්පර්ශ සංවේදි සංස්කාරක වස්තූන්ගේ රූප ශබ්ද ගන්ධ රස නම් වන විද්‍යුත් සංඥාවන්ට ස්පර්ශ වීමෙන් නිර්මාණය කර ගන්නා මානසික සංස්කරණ ක්‍රියාවලියෙහි සන්තතික අධ්‍යාත්මික විද්‍යුත් ශක්තින් මගින් නැවත ඉපදීමේ කර්ම ධර්මතාවයන්ට හේතුව පිළියෙල වනු ඇත. භෞතික කායික ස්පර්ශ ක්‍රියාවලිය මගින් ආත්ම දෘෂ්ඨිය පාදකව ග්‍රහණය කර ගන්නා රූප ශබ්ද ආදී සංඥාවන්ගේ රූප ධර්මයන්හි තෘෂ්ණාව මානසික ස්පර්ශ ක්‍රියාවලියට විෂය වීමෙන් රූප වේදනා සංවේදී ධර්මතාවය මානසිකව ක්‍රියාත්මක වේ. සාමාන්‍ය පෘතග්ජන ක්‍රියාවලිය වන මෙය සමස්ත මනුෂ්‍යය සහ තිරිසන් සතුන්ට පොදු අධ්‍යාත්මික හා මානසික විද්‍යාත්මක පැවැත්මේ ක්‍රියාවලිය වන අතර ඉන් බිහිවන සම්ප්‍රයුක්ත මානසික ශක්තින්ගේ විද්‍යාත්මක සැලැස්ම එනම් මනෝ විඥ්ඥාණය නැවත උපත සදහා සත්ත්වයාගේ හේතුව වනු ඇත. මෙය විද්‍යාත්මක වුවද ස්ථිතික විද්‍යුත් වූද අධ්‍යාත්මික වූද සත්ත්වයින්ගේ සන්තතික ක්‍රියාවලිය වන අතර සමස්ත අඥාන මනුෂ්‍යයන් දැඩි ලෙසින් මෙම විද්‍යාත්මක ධර්මතාවය නොදැනීමෙන් එනම් අවිද්‍යාවට පත් වීමෙන් ඔවුන් සතු වන මානසික දැක්ම වන තමා යනු ආත්මයක් ලෙස සිතීමට හා විශ්වාස කිරිමට යොමු වනු ඇත.

සෑම අඥාන මනුෂ්‍යයෙක්ම අවිද්‍යාවට ගොදුරු වීමෙන් ඔවුන්ට අසීමාන්තික කාල පරිච්ඡේයක් තුල සසරෙහි සැරිසැරීමට හේතුව වී ඇති එක් ප්‍රධාන කාරණයක් වන්නේ ආත්ම දෘෂ්ඨියයි. ආත්ම දෘෂ්ඨියට ගොදුරුවූ අඥාන මිනිසුන් තමන් ආත්මයක් යැයි සිතීමෙන් හා රැවටීමට පත් වීමෙන් එම රැවටුනු ආත්මය රැක ගැනීමට හා ආරක්ෂාකර ගැනීමටත්

කායික හා මානසික දුක් වේදනාවන් කෙරෙන් ඉවත් වීමටත් අදෘෂ්‍යමාන දේව බ්‍රහ්මාදීන්ට යාඥා කිරීමෙන් සිදු කරගත හැකි යැයි විශ්වාස කරයි. එබැවින් පෘතග්ජන මනුෂ්‍යයන් සිය කාම රාගය කෙරෙහි දැඩිව ඇලීමට යොමු වීමෙන් මිත්‍යා මානසිකත්වයට පත් වන අතර සිය මානසික හැගිම් දැනීම් ආත්මයකට අයිති ලෙස දැකිමටත් අඥානව තීන්දු කිරිම නිසා ඔවුන් නියත වශයෙන්ම මරණයෙන් පසු සතර අපාගත තිරිසන් - ප්‍රේත සත්ත්වයින් බවට උප්පත්තිය ලබනු ඇත. මෙලෙස ආත්ම දෘෂ්ඨික මනුෂ්‍යයන් එම ආත්ම දෘෂ්ඨියෙන් අපිරිසිදු වූ මානසික දෘෂ්ඨියට ගොදුරු වීම නිසා සිතෙහි ක්‍රියාත්මක චිත්ත ධර්මයාගේ ධර්මතාවයන්ට යටත්ව කායික තෘෂ්ණාවට දැඩි ලෙස ඇබ්බැහි වීමෙන් සත්ත්ව ජිවිතයකට උරුම වන පොදු දුක්ඛ වේදනාවන් විඳීමට මෙලොවත් පරලොවත් සඳහා යොමු වනු ඇත. අඥාන මනුෂ්‍යයන් විසින් අනුගමනය කරන ආත්ම දෘෂ්ඨිය සඳහා මූලික සිද්ධාන්තය වන්නේ මානසික ස්පර්ශයන් කෙරෙහි බලපාන මානසික සංස්කරණයන්ට අදාලව ඇලීමත් ඒ සඳහා බාහිර ස්පර්ශයන්ටත් එලෙසම යොමු වීමත්ය. යමෙකු විසින් සංස්කාරක ධර්මයන් කෙරෙහි ඒවායේ ද්‍රව්‍යාත්මක සුඛ සාධනය තුලින් මානසික ඇබ්බැහි වීම් වලට ප්‍රබලව යොමු වීමෙන් හා කායික ස්පර්ශයන්ට බැඳිම තුලින් ලෝභය සහ ද්වේශය පදනම් වූ අවිද්‍යා පාදක මිත්‍යා දැක්ම වන ආත්ම දෘෂ්ඨියට යොමු වී ඇත. මෙවිට අඥාන පෘතග්ජනයින් මානසික ස්පර්ශයන්ට අදාල රාගික ධර්මතාවයන්ගේ පරිහරණයට ගොදුරු වීමෙන් හා කායික ස්පර්ශයන්ට ඇබ්බැහි වීමෙන් සන්තතික දුක්ඛ භවයන්හි ජන්ම ලාභය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

ඉහත සඳහන් විද්‍යාත්මක වූ සත්ත්වයින්ගේ මානසික ක්‍රියාවලිය ගැන අවබෝධයට පත් නොවූ මනුෂ්‍යයන් සම්ප්‍රයුක්ත මානසික සංවේදනයන්ගේ ත්‍රිවිධ අන්තයන්ට අවිද්‍යාත්මකව යොමු වීමෙන් තමා ආත්මයක්ය යන මානසිකත්වයට ගොදුරු වනු ඇත. එහෙත් එවැනි මානසිකත්වයකට හිමිකම් කියන

සත්‍යය වශයෙන්ම ස්වාභාවිකව ජීවත් වන පුද්ගලයකු නොවන බවත් මේ පිලිබඳව ක්‍රියාත්මක වන විද්‍යාත්මක ධර්මයන්හි නොදැනිම ආත්ම දෘෂ්ඨිය සදහා පාදක හේතුව වනු ඇත. ත්‍රිවිධ ක්ලේෂ මූලයන් සදහා ප්‍රබලතම අකුසල් මාර්ගය ආත්ම දෘෂ්ඨිය පාදකව ක්‍රියාත්මක වන අතර එය අඥාන පෘතග්ජනයින්ට අවිද්‍යාවට හේතුව වී ඇත. මෙම ආත්ම දෘෂ්ඨිය පෘතග්ජන අඥාන මනුෂ්‍යයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන එකම විනාශකාරී ප්‍රබලතම දෘෂ්ඨියක් වන අතර මෙම දෘෂ්ඨිගත මනුෂ්‍යයන් විසින් සමස්ත මානව වර්ගයාගේ මෙලොව සහ පරලොව ජීවිත දැඩි ලෙස විනාශයට යොමු කරවනු ඇත. මෙම අකුසල් මාර්ගය තුලින් අශිෂ්ඨ වූ අමානුෂික ක්‍රියා සදහා අඥාන මනුෂ්‍යයන්ට මග හෙලි වී ඇති අතර ප්‍රඥාවන්තයින් මුළුමනින්ම මෙම ආත්ම දෘෂ්ඨිය පාදක විනාශකාරී මානසිකත්වයෙන් බැහැරවී ඇත. ආත්ම දෘෂ්ඨි මනුෂ්‍යයන් ප්‍රබල ලෙස වෛරී සහගත සහ අකුසල් පාදක හිංසන ක්‍රියාවන්ට යොමු වීමට මුලිකත්වය ගැනීම හේතුව වන අතර මෛත්‍රී විරහිත මානසික ක්‍රියාවන් තුලින් ප්‍රධාන ලෙස ආත්මාර්ථකාමී ප්‍රබල ක්ලේෂ ධර්මයන් එම පෘතග්ජනයින් ඔවුනොවුන්ගේ දෛනික ජීවිතය තුලට තමතමන්ගේ ජීවත් වීම සඳහා යොමු කර ගෙන ඇත.

අදෘෂ්‍යමාන දෙවියකුගේ මැවීමකට අනුව බිහිවූ තමන් යනු ආත්මයක් ලෙස දැකීමෙන් දේව සංකල්පයන්ට ඇබ්බැහි වූ සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන් තමා යනුවෙන් සිතීමට හේතුව වන විද්‍යාත්මක කර්ම ක්‍රියාවලියෙහි මානසික හැඟිමට පාදක හේතුඵල ධර්මතාවයන්ගේ විද්‍යා අවබෝධයෙන් දුරස්ව අවිද්‍යාවට පත්වීම මේ සදහා ප්‍රධාන හේතුව වනු ඇත. බහුතරයක් අඥාන මනුෂ්‍යයන් විද්‍යාත්මකව සන්තතිය වන චිත්ත ධර්මතාවයන් ගැනත් කායික ශරීරයෙහි මූලධර්ම ගැනත් ඒවායේ ඇති සැටිය ඇති ලෙසින් නොදකින මනුෂ්‍යයෝය. කායික ඉන්ද්‍රිය ස්පර්ශය මගින් සහ මානසික ස්පර්ශ ක්‍රියාවලිය මගින් සිදුවන සන්තතික මානසික කර්ම

ක්‍රියාවලිය පිළිබඳ අවිද්‍යාවට ගොදුරු වීමෙන් සත්ත්ව ජීවී ක්‍රියාවලිය ගැන වරදවා වටහා ගැනිමෙන් තමා යනුවෙන් විශ්වාස කරන ආත්ම සංකල්පයට ගොදුරු වීමෙන් මෙවැනි මනුෂ්‍යයෝ දැඩි ලෙස කාම රාගය ප්‍රගුණ කරනු ඇත. මෙලෙස මානසික කර්ම ක්‍රියාවලියට ලක්වන අඥාන මනුෂ්‍යයයෝ මෙම මානසික හැඟිම් දැනීම් ආත්මයකට අදාල සිදුවීම් වශයෙන් දකිමින් බාහිර කායික ශරීරයට දැඩි ලෙස ඇලෙමින් දැඩි කාම තෘෂ්ණාවට ගොදුරු වනු ඇත. සාමාන්‍ය ලෞකික අවිද්‍යා ක්‍රියාවලිය වන මෙය කාම තෘෂ්ණාව පාදක වන ආත්ම දෘෂ්ඨික මනුෂ්‍යයෝ කායික සහ මානසික ස්පර්ශ ක්‍රියාවලියෙහි සැප සංවේදී අන්තය තුලින් ලෝභය හා ද්වේශය වඩමින් සංසාරික දුක්ඛ ධර්මයන්ට ගොදුරුවනු ඇත.

ඉහත සදහන් ලෙසින් ආත්ම දෘෂ්ඨියට ගොදුරු වූ පෘතග්ජන මනුෂ්‍යයෝ ප්‍රඥා පාදක නිවැරදි මගකට යොමු කිරිම එතරම් පහසු කාර්යයක් නොවනු ඇත. එනම් විද්‍යාත්මක ස්වභාවගත ධර්මයන්ගේ පැවැත්මේ ඇති සැටිය ඇති ලෙසින් විග්‍රහ කර ගැනීමට හෝ අධ්‍යයනය කර ගැනීමට මෙවැනි මනුෂ්‍යයන්ට මානසික විවේකය නොමැත. නිරතුරුවම සිය මානසිකත්වය තෘෂ්ණාව සදහා යොමු කර ගැනීමේ විපාකය නිසා තමා යනු කවුදැයි ඇති සැටියෙන් හඳුනා ගැනිමට නොහැකිවීමෙන් අවිනිශ්චිත අවදානම් දුක්ඛ සහගත භවයන්හි නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියට ඔවුන්ට යොමු විය යුතුව ඇත. මෙවැනි මනුෂ්‍යයන් ප්‍රබල ලෙස අවිද්‍යාවට ගොදුරුව තමා ආත්මයකට අයිති යැයි සිතමින් ආත්ම දෘෂ්ඨිගත අවිද්‍යා සංකල්පයට අදාලව සතර අපාගත සංසාර මාර්ගයෙහි ජිවත් වනු ඇත. අවාසනාවන්ත ලෙස මෙවැනි මනුෂ්‍යයන් විද්‍යාත්මක ක්‍රියාවලියකින් මනුෂ්‍යයකු වශයෙන් තමා ඉපදීමට හේතුව කෙසේ සිදුවීදැයි නොදන්නවුන් වනු ඇත. අවිද්‍යාවට පත් වීමෙන් ආත්ම දෘෂ්ඨියට ගොදුරු වන මනුෂ්‍යයෝ තමාගේ ආත්මය අන් අයගෙන් රැක ගැනීමට හා ආරක්ෂා කර ගැනීමට නිතර විමසිල්ලෙන් සිටින නිසා ආත්ම

දෘෂ්ඨිකයන් පොදුවේ ප්‍රගුණ කරනු ලබන ප්‍රධාන ක්ලේෂ ධර්මය ද්වේෂය බවට පත් වනු ඇත. මෙලෙස ද්වේෂය පාදක වූ ආත්ම දෘෂ්ඨිගත මනුෂ්‍යයන් තමන්ගේ ආත්මය රැක ගැනීම පිණිස යැයි සිතමින් සෙසු සත්ත්වයන් ප්‍රබල හිංසන ක්‍රියවන්ට යොමු කරවා ඇත. සත්ත්ව ඝාතනයත් ඒ සඳහා අනුග්‍රහය දැක්වීමට යොමු වීමෙනුත් සත්ත්ව හිංසනයන් සඳහා ආත්ම දෘෂ්ඨිකයන් ප්‍රධාන ලෙස යොමු වී ඇත. තමා යනු ආත්මයක් ලෙස දැකිමට හේතුව වන නිර්මාණකාරී අවිද්‍යා මානසිකත්වයකට ගොදුරු වන අඥාන මනුෂ්‍යයෝ අන් මනුෂ්‍යයන් කෙරෙහි පමණක් නොව සෙසු සත්ත්වයින් කෙරෙහිද හිංසාකාරී වෛරී මානසිකත්වය තුලින් සමාජගත දූෂණ ක්‍රියාවන්ටද සාහසික ක්‍රියා සඳහාද ඊහා සමාන ප්‍රවණතාවයකින් හිංසනයන්ටද වෛරී ක්‍රියාවන්ටද ප්‍රබල ලෙස යොමු වන අතර ඊහා සමාන බලයකින් කාම තෘෂ්ණාවටද යොමු වී ඇත. මෙසේ ආත්ම දෘෂ්ඨිය පාදකව දියුණු වන වෛරයත් හිංසනයත් අන්‍ය සත්ත්වයන්ගේ ඝාතනයටත් විනාශය සඳහා සාහසික වීමටත් ආත්ම දෘෂ්ඨිය ප්‍රධාන හේතුවකි. අවිද්‍යා පාදක කාම තෘෂ්ණාව ප්‍රධාන සාධකය ලෙසින් අඥානයින්ට ද්වේෂ මූලගත ආත්ම දෘෂ්ඨියට මග හෙලි කර ඇත. කාම තෘෂ්ණාව මගින් පිලියෙල කර ගන්නා මානසික සංස්කරණ ධර්මතාවය වන ඒනම් මනෝවිඥඥාණය අඥාන මනුෂ්‍යයන්ට තමා ආත්මයක් වශයෙන් දැකීමට හේතුව වනු ඇත. මෙම ආත්ම දෘෂ්ඨිගත පෘතග්ජන මනුෂ්‍යයන් සන්තතික විද්‍යාත්මක කර්ම ධර්මතාවයෙහි ඇති සැටිය හඳුනා නොගැනීමට ලක් වීමෙන් සන්තතික දුක්ඛ කර්ම ධර්ම ක්‍රියාවලියෙහි ජාති ජරා ව්‍යාධි මරණ නම් වන කර්ම චක්‍රයට කොටු වී ඇත.

අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ යම්තාක් ආත්ම දෘෂ්ඨිගත වන්නේද ඔවුන් දැඩි ලෙස දේව මැවීම් සහ දේව නිර්මාණ පිලිබඳ දුර්වල මානසික විශ්වාසයන්ට ලක් වී ඇති අතර තමාගේ යැයි සිතන ආත්මය මතු දිනයකදී ස්වර්ග

මෝක්ෂය සඳහා නියත වශයෙන්ම දිව්‍යමය ස්වර්ග රාජ්‍යයකට යා හැකියැයි විශ්වාස කරමින් අදෘශ්‍යමාන දෙවියන් බ්‍රහ්මයන් සහ සර්වබලධාරී යැයි කියනු ලබන මිත්‍යා දේව සංකල්ප වලට ගොදුරුව දේව යාඥා දේව බිලි පූජා පවත්වනු ඇත. මෙවැනි මනුෂ්‍යයෝ සැබැවින්ම නූගත් සහ අඥාන මනුෂ්‍යය පිරිසක් වන අතර විද්‍යාත්මක වූ සාංසාරික ධර්මයන්ගේ ඇති සැටිය පිලිබඳ අනවබෝධයෙන් ආත්ම දෘෂ්ඨික මානසිකත්වය තුලින් නියත වශයෙන්ම මරනින් පසු තිරිසන් ප්‍රේත භවයන්හි භවගත වනු ඇත. ආත්ම දෘෂ්ඨික මනුෂ්‍යයන් බහුල වශයෙන් විවිධාකාර වූ මානසික සහ කායික පීඩනයන්ටද මානසික අසමතුලිතතාවයන්ටද කායික නිදන්ගත රෝගාබාධ සඳහාද ගොදුරු වනු ඇත. මෙලෙස මානසිකව රෝගීන් වන මනුෂ්‍යයන් අධි රුධිර පීඩනය, දියවැඩියාව, හෘදයාබාධ, අංශභාග, පිලිකා ආදී කායික රෝගාබාධයන්ටද විවිධාකාර මානසික රෝගයන්ටද බහුල ලෙස ගොදුරු වන අතර එම රෝගාබාධ වෛද්‍ය ප්‍රතිකාර මගින් පහසුවෙන් සුවකල නොහැකි වනවා පමණක් නොව ජීවිතාන්තය දක්වා එම ප්‍රතිකාර මත යැපීමටද සිදු වනු ඇත. මානසික අසමතුලිතතාවය මත ක්‍රියාත්මක වන වෛරී හැඟීම් නිසා භෞතික කයෙහි ස්වාභාවික ජීවී පැවැත්ම අක්‍රමවත් වීමෙන් ආත්ම දෘෂ්ඨිගත මනුෂ්‍යයන් කෙරෙහි බලපවත් වනු ලබන ඉහත සඳහන් බරපතල කායික සහ මානසික රෝගාබාධයන්ට එකම ප්‍රතිකාරය වශයෙන් අනුගමනය කලයුතුව ඇති වෛරී මානසිකත්වය බැහැර කරලීම සඳහා සියලු සතුන් කෙරෙහි මෛත්‍රී සහගත මානසිකත්වය වන මෛත්‍රී සංකල්පය ප්‍රගුණ කල යුතුව ඇත.

ස්වභාවයෙහි පවත්නා විද්‍යාත්මක ධර්මතාවයෙහි ඇති සැටියෙහි සම්ප්‍රයුක්තගත පරිවර්තන ක්‍රියාවලිය වන සත්ත්වයින් කෙරෙහි ක්‍රියාත්මක වන මානසික අධ්‍යාත්මික බලය මගින් සියලුම ආත්ම දෘෂ්ඨිකයන් තම තමන්ගේ මරණින්

පසු නැවත ඉපදිය යුතුව ඇති ප්‍රබල දුක්ඛ ධර්මතාවයෙහි කර්ම ක්‍රියාවලියට යොමු වනු ඇත. මෙම අනතුරෙන් නිදහස් වීමට අවශ්‍යතාවය ඇති යම්තාක් සත්පුරුෂයන් මිත්‍යා මානසිකත්වය පාදක ආත්ම දෘෂ්ඨියෙන් තමන් නිදහස් විය යුතුව ඇත. ඒ සඳහා විද්‍යාත්මක ධර්මතාවයෙහි සත්‍යය පැවැත්ම පැහැදිලි ලෙස දේශනා කර ඇති චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත ශ්‍රේෂ්ඨ වූ බුද්ධ ඉගැන්වීම අවබෝධ කර ගත යුතුව ඇත.

සමස්ත මානව වර්ගයාගේ කර්ම සන්තතිය ක්‍රියාත්මක වන ලෝකයෙහි ස්වභාවික පැවැත්ම දිනෙන් දින ප්‍රබල ලෙසින් විනාශයට හා පරිහානියට යොමු වී ඇත. මේ සඳහා මිත්‍යා දෘෂ්ඨිගත ආත්ම දෘෂ්ඨික අඥානයින් ප්‍රබල ලෙස වගකිව යුතුව ඇත. ලොවෙහි ජීවත්වන අඥාන මනුෂ්‍ය ප්‍රජාව ලොවෙහි දැනට සිදුවන සියලුම විනාශකාරී ක්‍රියාවන්ට වගකිව යුතුවන අතර සමස්ත මානව වර්ගයාගේ අධ්‍යාත්මික දියුණුව නැති කිරීම කෙරෙහිද ප්‍රබල ලෙස වගකිව යුතුව ඇත. අඥාන ආත්ම දෘෂ්ඨිගත මනුෂ්‍යයන් නිසා සිදුවන ප්‍රබල විනාශයන්ට අනුව ප්‍රඥාවන්ත මනුෂ්‍යයන්ගේ අධ්‍යාත්මික ගුණධර්මයන් ද ප්‍රබල ලෙස ආක්‍රමණය කර ඇත. සම්ප්‍රයුක්ත මානසික ධර්මතාවයෙහි විද්‍යාත්මක ස්වභාවය ඇති සැටියෙන් නොදැනීමේ අවිද්‍යාවට පත් වන පෘතග්ජන මනුෂ්‍යයන් සිය මානසික අඥාන බවට සහජාතකව නිර්මාණය වන ආත්ම දෘෂ්ඨියට ලක් වීමේ ප්‍රබල විනාශය වන්නේ සමස්ත ලෝකයම භයානක යුධ ගැටුම් ආරවුල් වලින් පිරි භූමියක් බවට පත් වීමෙන් මනුෂ්‍යයන් මනුෂ්‍යයන්ටම එරෙහි වීමට යොමු වීමයි.

අඥාන පෘථග්ජන මනුෂ්‍යයන් විසින් අවිද්‍යාපාදකව අනුගමනය කරනු ලබන ආත්ම දෘෂ්ඨිය නිසා වර්ධනය වන මනුෂ්‍යයන්ගේ දුශ්ශීල බවත්, සාහසික ක්‍රියාත්, එලෙසම සමාජගත නීති විරෝධී සාහසිකකම්ද, දූෂණද මනුෂ්‍ය සමාජයට පමණක් නොව සෙසු සත්වයින්ටද ප්‍රබල ලෙස

හානිකර ලෙස බලපානු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආත්ම දෘෂ්ඨියට ගොදුරු වූ සමස්ත අශ්‍රද්ධාන මනුෂ්‍යයන් සියල්ලෝම දැඩි ලෙසින් දුක් විඳීමට ඔවුන්ට සිය මරණින් පසු නැවත ඉපදීමේ කර්ම චක්‍රය මගින් සතර අපායෙහි තිරිසන් ප්‍රේත සත්වයින් බවට පත්ව ඉපදීමට සිදුවනු ඇත.

මෙම අශ්‍රද්ධාන ආත්ම දෘෂ්ඨික මනුෂ්‍යයෝ තම තමන්ට සසර දුකින් නිදහස් වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් අනිවාර්යයෙන්ම ආත්ම දෘෂ්ඨියෙන් නිදහස් විය යුතුව ඇති අතර චතුරාර්ය සත්‍යය පාදකවන සම්මා දිට්ඨියට පත්විය යුතුව ඇත. එනම් විද්‍යා අවබොධය සහිත ප්‍රශ්‍රද්ධාව අත්පත් කර ගත යුතුව ඇත. එයින් ප්‍රශ්‍රද්ධාවන්තයෙකු බවට පත්වී මතු උපදින භවයන් සුගති භවයන් කර ගැනීමටත් අවසානයේ නිර්වාණය අවබෝධ කර නිවන් ලැබීමටත් උත්සාහ ගත යුතුව ඇත.

## - බුදුන් වහන්සේගේ ප්‍රතිවිරුද්ධ පිලිතුර -

*උදාහරණයක් වශයෙන් අපි විමසන්නේ නම් ඉලෙක්ට්‍රෝනයක පැවැත්ම ඒකාකාරීව පවතින්නේද නැද්ද යන වග අපිට කිව යුතුව ඇත්තේ "නැති" බවයි. අපි විමසනවනම් ඉලෙක්ට්‍රෝනයක පැවැත්ම කාලයත් සමග වෙනස් වීමකට ලක් වෙන්නේද නැද්ද යන බව අපට කිව යුතුව ඇත්තේ "නැති" බවයි. තථාගත බුදුන් වහන්සේගෙන් අසන ලද පැනයකට පිලිතුරු වශයෙන්; මනුෂ්‍යයකුගේ මමත්වයට පාදක වන මානසිකත්වයට ඔහුගේ මරණින් පසු සිදු වන්නේ කුමක්ද යන්න සඳහා දුන් පිලිතුරද මේහා සමාන පිලිතුරක් විය. නමුත් එම පිලිතුරු දාහත්වෙනි සහ දහඅටවෙනි ශත වර්ෂයන්හි ක්‍රියාත්මකව තිබූ විද්‍යා දියුණුවෙහි ප්‍රමාණයට සරිලන තරමේ ගැලපෙන සුදුසු පිලිතුරක් නොවීය.*

- ජේ. රොබට් ඔපෙයින්මර් -

## 2.4. මිත්‍යා දෘෂ්ඨිය -

(කාම තෘෂ්ණාව පිනවීමේ මානසිකත්වය පාදක අවිද්‍යාව)

(තෘෂ්ණාව - කාමරාගය - කාමරතිය - ලෝභය + ද්වේෂය - වෛරය - හිංසනය)

විද්‍යාත්මක ලෝක ධර්මතාවයන්හි කර්ම සන්තතිය පිලිබඳ අනවබෝධයට පත් අඥාන පෘතග්ජන මනුෂ්‍යයන් සන්තතික දුක්ඛ ධර්මතාවයෙහි නැවත ඉපදීම සහ නැවත මරණය නැමති කර්ම චක්‍රයට අවිද්‍යාවෙන් යොමු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් චතුරාර්ය සත්‍යය අන්තර්ගත දුක්ඛ ධර්මතාවයෙහි සත්‍යය පැවැත්ම ගැන දැන නොගැනිමෙන් දුක්ඛ ධර්මතාවයෙන් නිදහස් වීමට ගත යුතු පියවර ගැනීමට ඔවුනට නොහැකි වනු ඇත. මෙලෙසින් සමස්ත අඥාන මනුෂ්‍යය ප්‍රජාව ත්‍රිවිධ දෘෂ්ඨිගත ත්‍රිවිධ ක්ලේෂ පාදක සක්කාය දෘෂ්ඨියත් ආත්ම දෘෂ්ඨියත් එම දෘෂ්ඨීන් දෙකෙහිම ක්‍රියාත්මක වීමෙන් නිර්මාණය වන මිත්‍යා දෘෂ්ඨියට ගොදුරු වීමෙන් නැවත ඉපදිමට යොමුවන කර්ම චක්‍රයෙහි අන්තර්ගතය වන ජාති ජරා ව්‍යාධි මරණය ලෙසින් වන දුක්ඛ ධර්ම සැලැස්මට නැවත නැවත ගොදුරු වනු ඇත.

විද්‍යාත්මක වූ හේතුඵල ධර්මතාවයන්හි සමස්ත ක්‍රියාකාරි කර්ම ශක්තිය ස්ථිතික විද්‍යුත් ශක්තිය වන අතර ඒ හා ක්‍රියාත්මකව පිලියෙල වන පදාර්ථ ගත ද්‍රව්‍යයන් සමග සංයෝජනය වීමෙන් සන්තතික වන මනුෂ්‍ය - තිරිසන් සත්ත්ව හා ශාක වස්තූන් නිර්මාණය වී ඇත. මෙහිදී නූගත් මනුෂ්‍යයන්ට ලෙහෙසියෙන් අවබෝධ කර ගත නොහැකි මෙම විද්‍යාත්මක සන්තතික ලෝක ධර්මතාවය එම මනුෂ්‍යයන්ගේ නූගත්කමට ප්‍රධාන හේතුව වන අතර එමනිසා එම මනුෂ්‍යයන් සියල්ලම පොදුවේ මිත්‍යා විශ්වාස සහිතව ක්‍රියාත්මක වන සත්‍යය ධර්මයන් නොදැනීමේ අවිද්‍යාවට ගොදුරු වීමෙන් සසර සැරිසැරීමේ කර්ම ධර්මතාවයට කොටු වී ඇත.

සමස්ත ලෝක ධර්මතාවයන්හි පැවතෙන මූලධර්මය විද්‍යාත්මක වූ රටාවකට ස්ථිතික විද්‍යුත් ශක්තීන් මගින් යොමුව ඇති නිසා එම විද්‍යා අවබෝධය නොමැති මනුෂ්‍යයන් අවිද්‍යාවට යොමු වීමෙන් බලවත් තෘෂ්ණාව සහ ද්වේශය සහිතව ලොවෙහි සංස්කාරක ද්‍රව්‍යයන් වටිනා සහ ප්‍රයෝජනවත් වස්තූන් ලෙස සිතනු ඇත. දැඩි ලෙස අවිද්‍යාවට ගොදුරු වූ මිත්‍යා දෘෂ්ඨික පෘතග්ජන මනුෂ්‍යයන් චතුරාර්ය සත්‍යය තුලින් බුදුන් වහන්සේ විසින් විග්‍රහ කර ඇති නිර්වාණයට පත්වීමේ විද්‍යාත්මකවූ චතුරාර්ය සත්‍යය ධර්මතාවය ගැන නොදැන සංසාර චක්‍රය තුල ඉපදීම සහ මරණය ලෙසින් වන අඛණ්ඩ භව කර්ම චක්‍රයට ගොදුරු වනු ඇත. මෙවැනි අඥාන මනුෂ්‍යයන් පහත් සහ අශීලාචාර මානසිකත්වයකට පදනම ගොඩනගා ගනිමින් අඥානව අකුසල ක්‍රියාවන්හි නිරත වන අතර මේ වන විට ලෝකය තුල ඉතා සීග්‍රයෙන් සිදුවන සියලුම සාහසික සහ දූෂණ ක්‍රියාවන් සඳහා ඔවුන් වග කිව යුතුව ඇත.

තිරිසන් ප්‍රතිපත්තීන්ට මුළුමනින්ම සමානවන පහත් සහ නොවැදගත් සත්ත්ව ධර්මතාවයන් වන තෘෂ්ණාව සහ ද්වේෂය යනු මුළුමනින්ම අඥානයින් සඳහා විෂය වන විද්‍යාත්මක වූ හේතු ඵල ධර්මතාවයන්ගේ බලපෑමට යොමුව සැලසුම් වී ඇති සන්තතික ලෝක ධර්මතාවය වන අතර ඒ තුලින් තම තමන් කෙසේ මනුෂ්‍යයකු වීමට හේතු වූයේ දැයි නොදන්නවුන් වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත අඥාන මනුෂ්‍යයෝ තිරිසන් සත්ත්වයින්ට සමාන ලෙසින් තම තමන්ගේද කායික ස්පර්ශයන් සහ මානසික ස්පර්ශයන් එක සමාන ලෙසින් ක්‍රියාත්මක කරනු ඇත. නැවත ඉපදීමේ සන්තතික කර්ම - විපාක සැලැස්මට පාදක වන මනෝ විඤ්ඤාණය නම් වන මානසික අධ්‍යාත්මික සැලැස්මට අදාලව ඒ සඳහා උචිතව පිලියෙල වන භෞතික කාය සැලැස්ම ස්ථිතික විද්‍යුත් ක්‍රියාවලියක් මත සිදුවන හේතුඵල ධර්මතාවයෙහි නීතීන්ට අනුව සැලසුම් වී ඇති බව නොදැනීම

අවිද්‍යාව වීමෙන් පෘතග්ජන මනුෂ්‍යයින් අඥාන යින් බවට පත් වී ඇත.

මෙලෙස ස්වභාවගත ක්‍රියාත්මක විද්‍යාත්මක ධර්මතාවයන් නොදන්නා අඥාන මනුෂ්‍යයන්, තිරිසන් හා මනුෂ්‍ය සත්ත්වයන්ගේ සම්ප්‍රයුක්ත ඵලය වන මානසික ක්‍රියාවලිය කෙසේ විද්‍යාත්මකව නිර්මාණය වන්නේ දැයි නොදැනීමෙන් අඛණ්ඩ වූ කර්ම ධර්මතාවය පාදක වූ නැවත ඉපදීමේ හා නැවත මියයාමේ අධ්‍යාත්මික ක්‍රියාවලිය ගැන අනවබෝධයෙන් තමා යනුවෙන් සිතීමේ අවිද්‍යාවට පත්ව ඇත. එම නිසා අධ්‍යාත්මික සන්තතික විද්‍යුත් ශක්තිය මඟින් නිර්මාණය වන මානසික මනෝ විඥද්ඥදාණික සැලැස්මත් එයට අනුරූපව ක්‍රියාත්මක වන භෞතික කාය සංස්කරණයෙහි යථා ස්වභාවය නොදැනීමත් ප්‍රධාන හේතූන් වීම නිසා අකුසල් පාදක ගිහි පෘතග්ජන කර්ම ක්‍රියාවලිය තුල තෘෂ්ණාවත් වෛරයත් නැවත නැවතත් දැඩිවත් ප්‍රගුණ කරනු ඇත. මේ නිසා ලෝකයෙහි සිදුවන සියළුම ව්‍යාකූල මානසික විකෘති සිදුවීම් සහ සාහසික ක්‍රියා සඳහා මෙලෙස අවිද්‍යාවට පත් වූ පෘතග්ජන මනුෂ්‍යයන්ගේ දැඩි තෘෂ්ණාවත් දැඩි ද්වේශයත් හේතුව වනු ඇත.

මුලු මහත් අඥාන මනුෂ්‍යය ප්‍රජාව ලොවෙහි ක්‍රියාත්මක දැඩි කාම තෘෂ්ණා පාදක මිත්‍යා දෘෂ්ඨියට දැඩිව හා සෘජුව යොමු වී ඇති අතර ඒ නිසා එම මනුෂ්‍යයන් බලවත් ලෙස සිය මානසික කර්ම සැලැස්මට යටත්ව අසුභ වූ අසාර නිර්මාණයක් වන සිය කාය සංස්කරණයට දැඩි ලෙස ඇලීමෙන් සන්තතික කර්ම චක්‍රයේ අධ්‍යාත්මික කර්ම සැලැස්මට බැඳී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවිද්‍යාවෙන් අඳුරු වූ නූගත් මනුෂ්‍යයන් ලෝභය සහ ද්වේෂය දැඩිව සහ නොනවත්වා ප්‍රගුණ කිරීමෙන් තමා යන මානසික දැක්ම තුලින් ලෝකයෙහි සන්තතික කර්ම ධර්මතාවයෙහි ද්වේෂයත් හිංසනයත් පාදකවූ එදිරිවාදිකම් මගින් මෛත්‍රී කරුණා ආදී ධර්මතාවයන්ට

විරුද්ධ වීමෙන් මනුෂ්‍ය සමාජයේ විනාශය සඳහා සාහසික ක්‍රියාවන්ට යොමු වී ඇත. අවිද්‍යාව පාදක වන මිත්‍යා දෘෂ්ඨිය එනම් මානසික කර්ම සංස්කරණය හා කායික භෞතික සංස්කරණයන්හි විද්‍යාත්මක න්‍යාය ධර්මයන්ට අනුව පිළියෙල වන ජීවී පැවැත්මේ යථා ස්වභාවය ගැන නොදත් අඥාන මනුෂ්‍යයන් විසින් නිරතුරුවම අනුගමනය කරන සහ පිලිගන්නා මිත්‍යා දෘෂ්ඨිය නිසා ඔවුනොවුන්ගේ ඉපදීම හා මරණය නම් වන කර්ම චක්‍ර ක්‍රියාවලියට ඔවුන් අඛණ්ඩව යොමුවී ඇත.

අඥාන වූ පෘතග්ජනයන් සමස්ත විද්‍යාත්මක ධර්මතාවයන්හි ප්‍රඥා ධර්මය වන චතුරාර්ය සත්‍යය තුලින් බුදුන් වහන්සේ විසින් ලොවට හෙලිකර ඇති දුක නැමැති පරම සත්‍යතාවයට සමස්ත ලෝකවාසී සත්ත්ව ප්‍රජාව අනිවාර්යයෙන්ම මුහුණ දිය යුතුව ඇති ධර්මතාවයකි. එහිදී මෙම ශ්‍රේෂ්ඨ ප්‍රඥා ධර්මතාවය පිලිගන්නා හා ඉන් නිදහස් වීමට ආර්ය මාර්ගය අනුගමනය කරන්නා වූ ප්‍රඥාවන්ත සත්පුරුෂයින් විද්‍යා අවබෝධයට පත් සමස්ත මනුෂ්‍යය ප්‍රජාව තුල සියලුම අඥාන මනුෂ්‍යයන්ට වඩා ශ්‍රේෂ්ඨ වූ පිරිසකි. ඔවුන් තම තමන් කෙරෙහි පවත්නා වූ විද්‍යාත්මක වූද අධ්‍යාත්මික වූද ධර්මයන්හි ඇති සැටිය සත්‍යය වශයෙන්ම දන්නා අතර සන්තතික විද්‍යාත්මක ධර්මතාවය කෙසේ තම තමන් ජීවත්වන ලෝක ධාතුව මත කර්ම වශයෙන් ප්‍රතිසන්ධි ක්‍රියාවලියට යොමු වන්නේද යනවග හොඳින් අවබෝධකරගත් පිරිසකි. මෙම ප්‍රඥාවන්ත සත්පුරුෂයින් යනු ලොවෙහි ජීවත්වන සෙසු අඥාන ප්‍රජාවට වඩා ප්‍රබල වන හා ශ්‍රේෂ්ඨ වන සත්පුරුෂ ප්‍රජාවකි.

ලෞකික පෘතග්ජන මනුෂ්‍යයන් යනු චතුරාර්ය සත්‍යය ලෙස තථාගත බුදුවරයන් වහන්සේලා විසින් දේශනා කරන ලද විද්‍යාත්මක සන්තතික ධර්මයෙහි අවබෝධය නොලද පිරිසකි. ඒනිසා එවැනි අඥාන මනුෂ්‍යයන් ඉතා දැඩි දුක් පීඩාවන්

මෙලොව සහ මරණින් මතු යන දෙලොව දීම දැඩිසේ විඳීමට කර්ම චක්‍රයට ගොදුරු වීමට නියමිතව ඇත. මනුෂ්‍ය සහ තිරිසන් සත්ත්වයින් යන සංස්කාරක වස්තූන්ගේ කර්ම ක්‍රියාවලියට මූලික වන අධ්‍යාත්මික මානසික කර්ම ක්‍රියාවලිය මුළුමනින්ම රඳා පවතින්නේ මනුෂ්‍යයන් විසින් දැඩි ලෙස ඇලීමෙන් හා ගැටීමෙන් ප්‍රගුණ කරන්නාවූ හා පවත්වනු ලබන මම - මගේ යැයි සිතන මානසික හැඟීම පදනම් කරගැනීම මතය.

නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය සඳහා යොමුව ඇති මිත්‍යා දෘෂ්ඨිය යනු ප්‍රබල වූ තෘෂ්ණාවට සහජාතක වන ද්වේෂය පාදක වන හිංසන ධර්මතාවයෙහි සත්ත්ව සන්තතික ධර්මතාවය වන අතර එම ක්‍රියාවලියට ගොදුරු වූ සියලුම පෘතග්ජන මනුෂ්‍යය හා තිරිසන් සත්ත්වයින් කායික සහ මානසික තෘෂ්ණා සහගත කාම රාගයන්හි දැඩි ලෙස ඇබ්බැහි වූ පිරිසකි. යමෙකු මිත්‍යා දෘෂ්ඨියට ගොදුරු වූයේ නම් එනම් අවිද්‍යා පාදක ධර්මතාවයට අනුව සෙසු සත්ත්වයින් සමග ප්‍රබල ලෙස ද්වේෂය සහ වෛරය පාදක හිංසන ධර්මයන්ට දැඩි ලෙස යොමු වී ඇත. මෙම ක්‍රමවේදයට අනුව මනුෂ්‍යයන්ට අවිචාර සහ අකුසල් ක්‍රියාවන් කිරීමේ මාර්ගයට යොමු වීමට සිදුවන අතර මේ නිසා ඔවුනට දුක්ඛ ධර්ම ක්‍රියාවලිය තහවුරු කරන අකුසල් මූලගත අවිද්‍යා දැක්මට යොමු වීමට සිදු වීමෙන් මෙලොව සහ පරලොව දෙකෙහිම ප්‍රබල ලෙස දුක් විඳීමට සිදුවනු ඇත. මෙවැනි ත්‍රිවිධ ක්ලේෂ සහගත අකුසල් ක්‍රියාවන් නිසා මුලුමහත් මනුෂ්‍යය සමාජය තුල සාහසික ක්‍රියා සහ දරුණු ප්‍රචණ්ඩ ක්‍රියාවන් බහුලව සිදු වීමෙන් මනුෂ්‍යය සමාජයේ තිබිය යුතු මනුෂ්‍යය ආචාර ධර්මතාවයන්හි ප්‍රබල විනාශයක් සිදුවනු ඇත.

චිත්ත ශක්තිය සහ ඉන් සම්ප්‍රයුක්තව නිර්මාණය වන මානසික ශක්තිය සඳහා පාදක වන ස්ථිතික විද්‍යුත් ප්‍රභවගත සත්ත්වයින්ගේ නැවත ඉපදීමට පාදක වූ අධ්‍යාත්මික විද්‍යුත්

ශක්තීන්ද ලෝකය තුල ක්‍රියාත්මක වන ස්වභාවගත සන්තතික නිතිය වන හේතුඵල ධර්මතාවයට අනුකූලව සිදුවන විද්‍යාත්මක ක්‍රියාවලියක් වන අතර එම විද්‍යාත්මක සන්තතික ක්‍රියාවලිය හඳුනා ගැනීමටත් අධ්‍යයනය කිරීමටත් හෝ පර්යේෂණ ක්‍රියාවලියකට යොමු කිරීමත් ඉතාමත් දුෂ්කර හා අපහසු කාර්යයකි. මේ සඳහා පලමුව තථාගත බුදුරජාණන් වහන්සේ පිලිබඳව ශ්‍රද්ධා පාදක බුද්ධ ගෞරවයත් එම අධ්‍යාත්මික විද්‍යාත්මක සන්තතික සමස්ත කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීමට උන්වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍යය ධර්මයත් එම මාර්ගයේ ප්‍රතිපත්ති පූර්ණය කරන විනයධර ප්‍රතිපත්තිගරුක සංඝ ශාසනය ගැනත් පිලිගැනීම සහ එම ත්‍රිවිධ රත්නය පිළිබඳව අවබෝධයට පත් විය යුතුය. ඉන්පසු පංච ශීලය පාදක දස ශීලය තුලින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය හැදෑරීමෙන් හා අනුගමනය කිරීමෙන් අධ්‍යාත්මික දියුණුව සදහා පියවර ගත යුතුය. මේ තුලින් පෘතග්ජන මනුෂ්‍යයන් විසින් ප්‍රභලව අනුගමනය කරන කාමබෝගී ජීවිතයද කායික දැඩි අන්තවාදී දුක්ඛ ප්‍රතිපත්ති පුරන අත්තකිලමතානුයෝගයෙන්ද ඉවත් විය යුතුය. ඉන් අනතුරුව මධ්‍යම ප්‍රතිපදාවට යොමු විය යුතුය. මෙම ආර්ය අෂ්ඨාංගික අධ්‍යාත්මික මාර්ගයෙන් බැහැරව කිසිවෙකුට ලෝකයේ ක්‍රියාත්මක වන භෞතික සංස්කරණයන්හි විද්‍යාත්මක ධර්මතාවය හඳුනා ගත නොහැකි වන අතර සත්ත්ව සන්තතික විද්‍යාත්මක ප්‍රභවය වන චිත්ත ශක්තිය සහ එහි සම්ප්‍රයුක්ත මානසික ශක්තිය ගැනද කෙලෙසින්වත් අවබෝධ කරගත නොහැකි වන අතර සත්ත්වයින්ගේ සන්තතික කර්ම ධර්මයේ මූලධර්මද එම කර්ම චක්‍රයෙන් නිදහස් වීමට අනුගමනය කළ යුතු අධ්‍යාත්මික මාර්ගය ගැන නොදැනීමෙන් අවිද්‍යාවට පත්වනු ඇත. විශ්වලෝක ස්වභාවයේ විද්‍යාත්මකව ක්‍රියාත්මකවන ධර්මතාවයෙහි අන්තර්ගතය වන ප්‍රඥාව මගින් චිත්ත ශක්තින්ගේ පදනම් මූලධර්මය මඟින් සිදුවන එහි කර්ම නිර්මාණයවීමේ ක්‍රියාවලිය අකර්මණ්‍ය කිරීම සඳහා එනම් සන්තතික කර්ම ධර්මය නැවැත්වීම තුළින් නිර්වාණය සඳහා මග හෙලි වනු ඇත.

අශ්‍රද්ධාන පෘථග්ජන මනුෂ්‍යයන් විසින් අවිද්‍යාපාදකව අනුගමනය කරනු ලබන මිත්‍යා දෘෂ්ඨිය නිසා වර්ධනය වන මනුෂ්‍යයන්ගේ දුශ්ශීල බවත්, සාහසික ක්‍රියාත්, එලෙසම සමාජගත නීති විරෝධී සාහසිකකම්ද, දූෂණද මනුෂ්‍ය සමාජයට පමණක් නොව සෙසු සත්වයින්ටද ප්‍රබල ලෙස හානිකර ලෙස බලපානු ඇත.මෙහි ප්‍රතිඵලයක් ලෙස මිත්‍යාදෘෂ්ඨියට ගොදුරු වූ සමස්ත අශ්‍රද්ධාන මනුෂ්‍යයන් සියල්ලෝම දැඩි ලෙසින් දුක් විඳීමට ඔවුන්ට සිය මරණින් පසු නැවත ඉපදීමේ කර්ම චක්‍රය මගින් සතර අපායෙහි තිරිසන් ප්‍රේත සත්ත්වයින් බවට පත්ව ඉපදීමට සිදුවනු ඇත.

මෙම අශ්‍රද්ධාන මිත්‍යාදෘෂ්ඨික මනුෂ්‍යයෝ තම තමන්ට සසර දුකින් නිදහස් වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් අනිවාර්යයෙන්ම මිත්‍යා දෘෂ්ඨියෙන් නිදහස් විය යුතුව ඇති අතර චතුරාර්ය සත්‍යය පාදක සම්මා දිට්ඨියට පත්විය යුතුව ඇත. එනම් විද්‍යා අවබොධය සහිත ප්‍රශ්‍රද්ධාව අත්පත් කර ගත යුතුව ඇත. එයින් ප්‍රශ්‍රද්ධාවන්තයෙකු බවට පත්වී මතු උපදින භවයන් සුගති භවයන් කර ගැනීමටත් අවසානයේ නිර්වාණය අවබෝධ කර නිවන් ලැබීමටත් උත්සාහ ගත යුතුව ඇත.

# පාපය ගැන බෞද්ධ මතය

*පාපය ගැන ක්‍රිස්තු ආගමේ මතයට වඩා යම්ලෙසකින්
බෞද්ධ මතයෙහි වෙනසක් පෙන්නුම් කරයි.
බුදු දහමට අනුව පාපය යනු අවිද්‍යාව හා
නූගත්කම වනු ඇත. දුෂ්ට - පාපී මනුෂ්‍යයෙකු
යනු අවිද්‍යාවට පත් මිනිසෙකි. ඔහුට දඬුවම්
අවශ්‍ය නොවේ. එලෙසම මර්ධනයක්ද ඔහුට
අවශ්‍ය නොවේ. එපමණටම ඔහුට අවශ්‍ය වන්නේ
උපදෙස් පමණි. එලෙසම ඔහුව දෙවියන්ගේ
අණසක උල්ලංඝනය කරන ලද අයෙකු සේ
සැලකිය යුතු ද නොවේ. එසේත් නොමැතිනම්
දෙවියන්ගේ සමාව සඳහා දේව යාඥා කළ යුතු
අයෙකුද නොවේ. එයට වඩා අවශ්‍ය වන්නේ
වරදකරුගේ හිතමිත්‍රාදීන් විසින් ඔහුට මනුෂ්‍ය
ධර්මයට අදාල මාර්ගය කියාදීම පමණි.
කරන ලද වරදට හිමි විපාකයෙන් ගැලවීමට
දේව යාඥා කිරීමට වහල්වීමට උත්සාහ ගැනීමෙන්
වරදකරුට එම වරදින් ගැලවීමට හැකියාව ඇති බව
බෞද්ධයා කිසිවිටක විශ්වාස නොකරයි.*

ජෝන් "වෝල්ටර්
("*Mind Unshaken*" - නැමති කෘතියෙනි)



සාරනාත්හි පිහිටි බුද්ධ ප්‍රතිමාව
බුදුන් වහන්සේගේ ධර්ම චක්‍ර පවත්වන මුද්‍රාව - 5 වෙනි සියවස

## බුදුන් වහන්සේ ශල්‍ය වෛද්‍යවරයෙක් හා සමානය

විවිධ වර්ගයේ රෝගාබාධයන්ට හේතුව වන රෝග නිධානයන්ද, එලෙසම එම රෝගයන්ගෙන් වැලකීම සඳහා වන රෝග නිවාරණයද, යම් වෛද්‍යවරයෙක් දැනගත යුතුව ඇත්තේ යම්සේද එලෙසින්ම බුදුන් වහන්සේ දුක් රැස පිළිබඳ නිර්මල සත්‍යය සතර උගන්වා ඇත. එම දුක් රැසෙහි සම්භවයත්, එහි නිරෝධයත්, එලෙසෙම නිරෝධනය සඳහා අනුගමනය කලයුතු මාර්ගයත්ය.

ආචාර්ය එඩ්වඩ් කෝන්ස් (''බුදු දහම'' නැමති කෘතියෙනි)

## මැවුම්කාර දෙවියෙකුගෙන් තොරව විමුක්තියට පත්වීම.

*ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට බුදුන් වහන්සේ විසින් හැම මනුෂ්‍යයෙකුටම තමන් විසින් තමන්ටම තමන්ගේ මේ ජීවිත කාලය තුළදී කිසිම මැවුම්කාර දෙවියෙකුගේ හෝ දෙවිවරුන්ගේ කිසිදු අනුග්‍රහයකින් හෝ උදව්වකින් හෝ තොරව සංසාර දුකින් නිදහස්වීමේ විමුක්තිය අත්පත් කරගන්නා අයුරු අවධාරණයෙන් ලෝකයාට දේශනා කරන ලදී. උන් වහන්සේ විසින් දැඩි අවධාරණයෙන් දේශනා කරන ලද්දේ ආත්ම විශ්වාසයෙහි අන්තර්ගතය පාදක වන සිය ඉගැන්වීම තුලින් යමෙකුගේ පාරිශුද්ධිය ද යමෙකුගේ ආචාරශීලීත්වය ද යමෙකුගේ යථාභූත සර්වඥතාවයෙහි අධ්‍යාත්මික පූර්ණ අවබෝධය ද එලෙසම සාමය සහ විශ්ව ගත පූර්ණ මෛත්‍රී කරුණාවෙහි අන්තර්ගතය සඳහා වන තථාගත ධර්මය වනු ඇත. එලෙසම උන්වහන්සේ තමන් සතු සර්වඥතා ඥාණය තුලින් දැඩි ලෙස ලෝකයේ මනුෂ්‍යයන් දැනුවත් කලේ අධ්‍යාත්මික ප්‍රඥාවබෝධය සඳහා අනුගමනය කලයුතුව ඇති අදාල අධ්‍යාත්මික මාර්ගයට යොමු නොවීමෙන් කිසිවෙකුට තමන්ගේ මේ ජීවිත කාලය තුලදී අධ්‍යාත්මික යථාභූත සර්වඥතාවයෙහි පූර්ණ අවබෝධයට පත්විය නොහැකි බවයි.*

**මහාචාර්ය ඊලියොට්**
**("බුදු දහම හා හින්දු දහම" - නැමති කෘතියෙනි)**

# ප්‍රඥා - 03

## 3.1 සම්මා දිට්ඨි - නිවැරදි දැක්ම

මිත්‍යා දිට්ඨියත්, ආත්ම දිට්ඨියත් හා සක්කාය දිට්ඨියත් යන ත්‍රිවිධ දිට්ඨීන්ගෙන් නිදහස් වීමෙන් අවබෝධ කරගත හැකිවන ප්‍රඥා ධර්මයේ මුලධර්මය වන්නේ තථාගතයන් වහන්සේලාගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීම වන සම්මා දෘෂ්ඨියයි. ද්‍රව්‍යාත්මක හා ස්ථිති විද්‍යුත්මය විශ්වගත ශක්තිය හා පදාර්ථයන්ගෙන් නිර්මාණයවන සත්ත්ව සන්තතික විශ්ව ලෝක ගත විද්‍යා ධර්මයන්හි තථාගත දේශනාවේ අන්තර්ගතය ප්‍රඥාව වන අතර නිර්වාණයට පත්වීමෙන් ශ්‍රේෂ්ඨ ප්‍රඥාවන්තයෙක් වීමට බලාපොරොත්තු වන සත්පුරුෂයෙකුට එම ප්‍රඥා ධර්මය මහඟු සම්පතකි.

සංස්කාරක ශාක හා සත්ත්ව වස්තූන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලියේ ඇති සැටිය පිළිබඳව වන අන්තර්ගතය ප්‍රඥාව නම්වන සන්තතික විද්‍යා ධර්මයේ විෂය, ලොවෙහි ක්‍රියාත්මක සමස්ත විද්‍යා අවබෝධයට වඩා අග්‍රවන හා විශිෂ්ඨ වන ඉහලම විද්‍යා අවබෝධය සහිත විෂය වනු ඇත. ද්‍රව්‍යාත්මක ලෝකය පිළිබඳව ඇති විද්‍යාත්මක අවබෝධයට වඩා විශිෂ්ඨ වන විද්‍යා අවබෝධය ප්‍රඥාවබෝධයයි. ලෝකයේ හා විශ්වගත සත්ත්ව සන්තතික අධ්‍යාත්මික සංවේදී මානසික ශක්තීන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලිය මගින් විද්‍යාත්මක ලෝකයේ ඇති සැටිය ඇති ලෙසින් පැහැදිලි වන විද්‍යා විෂය ප්‍රඥාව වනු ඇත. විද්‍යාත්මක වූ ප්‍රඥාවබෝධය එනම් නිවැරදි දැක්ම අත්පත් කරගත හැකි වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අධි ශීලයත් අධි ප්‍රඥාවත් ගැඹුරෙන් ප්‍රගුණ කිරීමෙන්ය. එසේ අධි ශීල හා අධි චිත්ත කායික මානසික අධ්‍යාත්මික ක්‍රියාවලිය තුළින් අත්පත් කරගත හැකි නිවැරදි දැක්ම සහිත ප්‍රඥාව යනු ප්‍රඥාවන්තයෙකුට සාර්ථකව අත්පත් කරගත හැකි වන මාර්ග

අවබෝධයත් මාර්ග අවබෝධයේ ඵලයත්ය. සම්මා දිට්ඨිය යනු ප්‍රාරම්භක අධ්‍යාත්මික ප්‍රඥාවබෝධය වන සමස්ත සංස්කාරක ධර්මයන්ගේ මුලධර්මයන්හි ඇති සැටිය ඇති ලෙසින් දැකීමට හේතුව වන්නා වූද විශිෂ්ඨ වූද විදර්ශනාමය විද්‍යා අවබෝධතාවයෙහි මානසික සංවේදී දැක්ම වනු ඇත.

පෘතග්ජන ලෞකික කර්ම සන්තතිය මඟින් නිර්මාණය වන ත්‍රිවිධ දෘෂ්ඨිය යනු සම්ප්‍රයුක්ත මමත්වය සඳහා හේතුව වන අවිද්‍යා පාදක මානසික දෘෂ්ඨීන් වනු ඇත. මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයන්ගේ මානසික සංස්කරණ ක්‍රියාවලියත් කායික සංස්කරණ ව්‍යුහයත් යන දෙකෙහිම සම්ප්‍රයුක්ත මානසික සංවේදීතාවය වන සම්ප්‍රයුක්ත මානසිකත්වය මමත්වය කෙරෙහි බලපාන ත්‍රිවිධ දෘෂ්ඨීන්ට හේතුව වනු ඇත. කායික සංස්කරණය මානසික සංස්කරණය මතත්, මානසික සංස්කරණය කායික සංස්කරණය මතත් රඳා පවතී. එහි සම්ප්‍රයුක්ත ඵලය වන මානසික සංස්කරණය සත්ත්වයාගේ සංසාරික කර්ම පැවැත්මට හේතු ප්‍රභවය වේ. ත්‍රිවිධ මිත්‍යා දෘෂ්ඨීන් අනුගමනය කරන මනුෂ්‍යයින් මුලිකවම මමත්වය නැමැති මානසික හැඟීමට පදනම තහවුරු කරගන්නා අතර එම අවිද්‍යා මානසික දෘෂ්ඨීන්ගේ ඵලය වශයෙන් ත්‍රිවිධ දෘෂ්ඨීන්ට ගොදුරු වීමෙන් අඛණ්ඩ වූ දුක්ඛ ධර්මතාවයෙහි යාන්ත්‍රණය සඳහා සතර අපායේ උපත ලබනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළින් ලබන ඵලය හා ඵල අවබෝධය යනු මමත්වය පිළිබඳව ගොඩනැගෙන කායික හා මානසික ධර්මතාවය මුළුමනින්ම අත්හැරීමෙන් ලබන ඵලය සම්මා දිට්ඨියට පත්වීම වනු ඇත.

විශ්ව ලෝක විද්‍යාත්මක ස්වභාවයෙහි ක්‍රියාකාරී ධර්මතාවයේ අධ්‍යාත්මික විද්‍යාව වන ප්‍රඥාව අවබෝධකර ගැනීම යනු හුදෙක් ලොවෙහි ක්‍රියාත්මක පෘතග්ජන විද්‍යාත්මක ක්‍රියාවලියේ පරිණත වීමට වඩා අග්‍රවන හා

විශිෂ්ඨ වන පරිණත බවකි. එම ශ්‍රේෂ්ඨ වූ ප්‍රඥාවබෝධය යනු අධි ශීල, අධි චිත්ත අධ්‍යාත්මික ක්‍රියාවලිය මඟින් ලැබෙන ශ්‍රේෂ්ඨ ඵලයකි. ද්‍රව්‍යාත්මක ලෝකයේ විවිධ විෂයන්හි අවබෝධය තුළින් උගතුන් බවට, විශාරදයින් බවට, විද්‍යාඥයින් බවට, දාර්ශණිකයන් බවට හා පණ්ඩිතයන් බවට පත්වූ මනුෂ්‍යයින් යනු කායික හා මානසික ලෞකික අවබෝධය තුළින් ලබන දියුණුවකි. එහෙත් ප්‍රඥාව යනු එලෙස කායික හා මානසිකවූ පෘතග්ජන අවබෝධයක් නොවන අතර කායික හා මානසික ක්‍රියාවලි දෙකෙන්ම ඉවත් වීම මඟින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළින් අත්පත් වන ශ්‍රේෂ්ඨ අධ්‍යාත්මික විද්‍යා අවබෝධය වනු ඇත. කායික හා මානසික ස්පර්ශ නිරෝධයෙන් අත්පත් වන ප්‍රඥාවබෝධය යනු විශ්වයේ පවතින විශිෂ්ඨතම විද්‍යා අවබෝධය වන අතර සත්ත්වයින්ගේ අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලිය සඳහා හේතුව වන විද්‍යාත්මක ධර්මයන්ගේ අධ්‍යාත්මික වූ විශිෂ්ඨ අවබෝධය වනු ඇත.

ප්‍රඥා ශක්තිය යනු විශ්ව ලෝකගත සන්තතික විද්‍යාත්මක ධර්මතාවයෙහි ඇති සැටිය ඇති ලෙසින් අවබෝධකර ගැනීමෙන් අත්පත් වන අධ්‍යාත්මික විශිෂ්ඨත්වයකි. අධිශීල ප්‍රතිපත්ති මඟින් විද්‍යාත්මක විදසුන් ක්‍රියාවලිය දියුණු කර ගැනීමෙන් ප්‍රහාණය කරගන්නා ත්‍රිවිධ දෘෂ්ඨිගත ක්ලේෂයන් හේතුවෙන් සන්තතික චිත්ත ධර්මයෙහි විද්‍යා අවබෝධය තුළින් ප්‍රඥාවබෝධය අත්පත් කරගත හැක. අති බහුතරයක් වන ලෝකවාසී මනුෂ්‍යයින් අඥාන නූගතුන් බව පැහැදිලි වන අතර කාමයත් බලවත් ලෝභයත් හිංසාකාරී වෛරී ධර්මත් ඔවුන්ගේ අධ්‍යාත්මික පරිහානිය සඳහා හේතුව වී ඇත. ද්‍රව්‍යාත්මක ලෝකයේ ද්‍රව්‍යයන්හි විද්‍යාත්මක සංස්කරණය ගැන නොදත් අඥාන මනුෂ්‍යය ප්‍රජාව එම ද්‍රව්‍යාත්මක ලෝකයේ ද්‍රව්‍යයන්හි විද්‍යාත්මක මූලධර්ම ගැන නොදැනීමෙන් නූගතුන් බවට පත්වන අතර විවිධාකාර මිත්‍යා

විශ්වාස හා ඇදහීම් වලට යටත් වෙමින් ප්‍රභල කාම තෘෂ්ණාවට පත් වීමෙන් හිංසාකාරී ධර්මතාවයන්ට යොමු වෙමින් ඔවුනොවුන්ගේ සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලිය සඳහා සතර අපාගත වනු ඇත. සමස්ත පෘතග්ජනයින් යනු ද්‍රව්‍යාත්මක ලෝකයේ සිරගතවී සිටින සිරකරුවන් වන අතර නිරතුරුව තම තමන්ගේ බලවත් අවශ්‍යතාවයන් හමුවන තුරු හා ලැබෙන තුරු බලා සිටින පිරිසකි. නමුත් අවාසනාවකට ඔවුන් සියල්ලන්ටම ද්‍රව්‍යාත්මක සිරගෙය තුලදීම බලාපොරොත්තු වූ සියල්ලම නොලැබීමෙන් මියදීමට සිදුවනු ඇත. කාම තෘෂ්ණාව යනු මමත්වයෙහි සිරගෙය වන අතර සංස්කාර ලෝකයෙහි ක්‍රියාත්මක වන ද්‍රව්‍යයන්ගේ ඇති සැටිය අවබෝධ කර ගැනීම සඳහා මමත්වය නැමැති සිරගෙය තුළින් ඔවුන් බැහැරව යා යුතුය. මමත්වය නැමති ලෝකයේ පවතින පොදු අවාසනාවන්ත සිද්ධිය වන්නේ මමත්වය පිළිබඳව පවතින වහල්භාවය වන අතර සෙසු ලෝකයන්හිද පවතින අවාසනාවන්ත ධර්මය මෙයම වනු ඇත.

සිද්ධාර්ථ කුමරුන්ද සුද්ධෝදන රජුගේ අණසකට යටත් වීමෙන් රාජකීය සිරකරුවෙකු බවට පත්විය. ඔහුගේ මාළිගය වටා ක්‍රියාත්මක වුනු විශ්වගත දුක්ඛ වේදනා ධර්මයන් පිලිබඳව කිසිදු අවබෝධයකින් තොරව ඔහුට ඔහුගේ රාජකීය ජීවිතය ගත කිරීමට සිදුවුනු අතර තමන්ගේ අනාගත දෛවයට අනුව නියමිතව ඇති අවශ්‍ය දේ ලැබෙන තෙක් සිය ජීවිතය කාලයට සහ දෛවයට භාර දීමට ඔහුට සිදුවිය.

වයසට යෑමත් ලෙඩට දුකට පත්වීමත් මරණයට පත්වීමත් යන ධර්මතාවයන්ගෙන් නිදහස් වීම පිණිස සිද්ධාර්ථ කුමරු රාජකීය මමත්වය නැමැති සිරගෙයින් පලාගියේ මුළු මහත් රාජකීය සැප සම්පත් හා තමාගේ බිරිඳ සහ පුත්‍රයා ඇතුළු ඥාති හිතමිත්‍ර පිරිසද අත්හරිමින්ය. නමුත් ඔහු විසින් දිගු සංසාරගත පුර්වාත්මයන් හිදී නොගිනිය හැකි උත්පත්තීන්ට අදාලව ඒ ඒ භවයන්හිදී දියුණුකලා වූ හා ප්‍රගුණ

කලා වූ කුසල ධර්මයාගේ හේතුවෙන් රාජකීය කුමරා බුද්ධත්වයට පත්වීමට නියමිත විය.

මේ අනුව සිදුහත් කුමරු ඔහුගේ ශ්‍රේෂ්ඨතම හා අද්විතීය අභිනිෂ්ක්‍රමණය සිදු කලේ මනුෂ්‍යය ලෝකයේ මනුෂ්‍යයෙකුට විඳීමට ලැබෙන සියළුම රාජකීය සැප සම්පත් සහමුලින්ම අත්හැරීමෙනි. එනම් තමාගේ නොදියුණු හා යථාවබෝධ ජීවිත අත්දැකීමකින් තොරව ගතකල මමත්වය නැමැති රාජකීය සිරගෙයින් පලායෑම ඔහු විසින් සිදුකලේ සොතැවුල්වලින් පිරි ජාති ජරා ව්‍යාධි මරණ සහිත මනුෂ්‍ය ලෝකය නැමැති සිරගෙය ගොඩ නැගීමට හේතුව වූ මමත්වය සහමුලින්ම අත්හැරීමෙන් වන අතර තමා විසින් පෙර ආත්මයන්හිදී ප්‍රගුන කලාවූ පාරමිතා ශක්තීන්ගේ බලයෙන් අධ්‍යාත්මික අවධියට පත්ව ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුද්ධත්වය අත්පත්කර ගන්නා ලදී.

තමා යන මමත්වය පිළිබඳ මානසික සංවේදී ධර්මතාවය කර්ම චක්‍ර ක්‍රියාවලියේ පදනම වන අතර නැවත ඉපදීම හා නැවත මියදීම යන කර්ම ක්‍රියාවලියෙහි මූල සංසිද්ධිය වනු ඇත. නිර්වාණය සඳහා ක්‍රියාත්මක කලයුතු වන ප්‍රධාන මූලධර්මය වනුයේ තමා යනුවෙන් ක්‍රියාත්මක වන මමත්වයෙහි මානසික සංවේදී ක්‍රියාවලියෙන් ඉවත් වීම වනු ඇත. ප්‍රධාන ත්‍රිවිධ දෘෂ්ඨීන්ටද මෙම මමත්වයෙහි මානසික සංවේදනය පදනම වන අතර එහි ඵලයක් වශයෙන් සම්ප්‍රයුක්ත මානසිකත්වය පුද්ගල මානසික දැක්මට පදනම වනු ඇත. එම නිසා තිරිසන් මනුෂ්‍ය සත්ත්වයන්ගේ කායික හා මානසික සංස්කරණයේ සම්බන්ධීකරණය මත සම්ප්‍රයුක්ත වන අධ්‍යාත්මික මානසිකත්වය නැමැති සංවේදී ධර්මතාවයෙහි ප්‍රධාන ඵලය ''මම'' යන හැගීම නිර්මාණය වීමයි. සත්ත්වයින්ගේ කායික සංස්කරණය වන භෞතික කය මූලිකවම ඝන, ද්‍රව, වායු නැමැති ද්‍රව්‍යාත්මක දේ මගින්

සංස්කරණය වී ඇති අතර මානසික සංස්කරණය එනම් අධ්‍යාත්මික සැකැස්ම මුළුමනින්ම අන්තර්ගත වන්නේ ද්‍රව්‍යාත්මක සංස්කරණයන්ගේ ස්ථිතික විද්‍යුත් රූප, ශබ්ධ, ඝණ්ධ, රස හා ස්පර්ශ සංඥා සටහන් වශයෙන්ය.

ලෝක ධාතූන්හි සන්තතික වන කර්ම චක්‍ර ක්‍රියාවලියෙහි මුළුමනින්ම එහි විද්‍යාත්මක ඇති සැටිය නොදැනීම නිසා ක්‍රියාත්මක වන කායික හා මානසික තෘෂ්ණා ක්‍රියාවලියේ සම්ප්‍රයුක්ත ඵලය වන්නේ තමා යන මානසිකත්වය වනු ඇත. මේ තුළින් අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත ඵලය වන මානසිකත්වය මුළුමනින්ම රඳා පවතින්නේද විද්‍යාත්මක සන්තතික කර්ම ක්‍රියාවලියෙහි අඛණ්ඩ බව තහවුරු කිරීමට හේතුව වන්නේද පෘතග්ජන මනුෂ්‍යයන්ගේ අවිද්‍යාවත් ඒ හා සහජාත වන කාම තෘෂ්ණාවත්ය.

ලෝකයෙහි ක්‍රියාත්මක වන අධ්‍යාත්මික මාර්ගයෙහි අන්තර්ගතය වන චතුරාර්ය සත්‍යය මුළුමනින්ම මමත්වය පාදක සක්කාය දිට්ඨිය අතහැරීම සඳහා සැලසුම් වූවකි. එය නිර්වාණය සඳහා යොමුවන ආර්ය අෂ්ඨාංගික මාර්ගගත මනුෂ්‍යයින්ගේ මානසික මමත්වය අතහැරෙන එකම මාර්ගයයි.

සන්තතික කර්ම පැවැත්මෙහි සිරගෙය ''මමත්වය'' වන අතර එහි මුරකරු ''භය'' වනු ඇත. වෛරය, කාම තෘෂ්ණාව නොසන්සුන් බව, අලස බව හා මානය සිරකරුවන්ට ජීවත් වීමට උදවු වනු ඇත. ඉබි යතුරු දමා සිරගෙය වසා ඇත්තේ සිරකරුවන් සිරගෙයින් පලායෑම වැළැක්වීමට වන අතර යමෙකුට මමත්වය නැමති සිරගෙයින් පලා යාමට හැකිනම් ඒ සිරකරුවන් අතර සිටින ප්‍රඥාවන්තයකු පමණක් වනු ඇත. ඉබි යතුරු කැඩීම යනු අවිද්‍යාවෙන් ඉවත් වීමයි. සිරෙන් පැනයාම යනු මමත්වයෙන් ඉවත් වීමයි. එනම් සම්මා දිට්ඨියට පත්වීමයි.

මුලික වශයෙන් සම්මා දිට්ඨිය අවබෝධ කරගත හැකි වන්නේත් අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලිය අවබෝධ කරගත හැකි වන්නේත් අධ්‍යාත්මික මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරිමෙනි. ප්‍රඥාවන්තයකුට සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීමට නම් තමා යන මානසික සංවේදනයට හේතුව වන ලෝභය හා ද්වේශය ආර්ය ශීල ප්‍රතිපදාව මගින් ශීල සමාධි ප්‍රඥා බවට පත් කිරිමෙන් සිදු කරගත යුතුය. මෙහිදී මමත්වය සඳහා හේතුව වන අවිද්‍යා පාදක මානසික ස්පර්ශයන් මුලිනුපුටා දැමිය යුතුය. මෙහිදී සමස්ත ප්‍රඥාවන්තයින් නිර්වාණ ක්‍රියාවලියේ ප්‍රථම පියවර එනම් සෝවාන් මාර්ග ඵලය සඳහා තම තමන් විසින් පහත සඳහන් පියවරවල් අනිවාර්යයෙන් අනුගමනය කළ යුතුව ඇත.

1. කලයාණ මිත්‍ර ඇසුර
2. චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත නිර්වාණ ධර්මය ශ්‍රවණය කිරීම.
3. යොනිසෝමනසිකාරය (වර්තමාන කාලයෙහි මානසික පැවැත්මෙහි අධ්‍යයනය හා ඉන් ඉවත් වීමෙන් ශුන්‍ය තාවය ප්‍රගුණ කිරීම)
4. ස්ථාවරව ක්‍රියාත්මක කළ යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගගත අධි ශීල, අධි චිත්ත ධර්ම ප්‍රතිපත්තිය අඛණ්ඩව අනුගමනය කිරීම. (ශීල සංවරය සඳහා වූ ආර්ය ප්‍රතිපදාව)

### 3.1.1. කලයාණ මිත්‍ර සේවනය

(ප්‍රඥාවන්ත, ආර්ය ධර්මය අවබෝධය කළ මිතුරන්)

අශ්‍රද්ධානවන්ත දුශ්සීල වූ ද එමෙන්ම තථාගත වූ විද්‍යාත්මක වූ ධර්මාවබෝධය නැති පෘතග්ජන මනුෂ්‍යයින්

ඇසුරු කිරීම තරම්වන භායානක වන යමෙකුගේ කායිකවූද මානසිකවූද විනාශයට හේතුව වන අන් ප්‍රධාන කාරණයක් තවත් නොවනු ඇත. ප්‍රඥාවබෝධය සහිත සත්පුරුෂ මිත්‍රයින් ඇසුරු කිරීම තරම් ශ්‍රේෂ්ඨ වන ජීවිත අත්දැකීමක් වෙන අත්දැකීම් වලට වඩා ශ්‍රේෂ්ඨ වනු ඇත. ප්‍රඥාවන්ත කල්‍යාණ මිත්‍රයෙකුගේ ඇසුර නුගත් අඥාන මිත්‍රයෙකුගේ ඇසුරට වඩා අතිශයින් ප්‍රයෝජනවත් වනු ඇත. එවැනි කල්‍යාණ මිත්‍රයෙකු අන්‍යයන්ට උපදෙස් දෙන්නේ මෙලොව ජීවිතයත් මරණින් පසු උදාවන ජීවිත පැවැත්මත් යන දෙලොවෙහි සුභ සිද්ධිය සඳහා හේතුව වන නිවැරදි චර්යා ධර්ම පැහැදිලි කිරීම සඳහාය.

අවිද්‍යා සහගතව නිර්මාණය වන නැවත ඉපිද මියයෑමේ ප්‍රබල දුක් සහිත කර්ම මාර්ගයට හේතුව වන අකුසල් ක්‍රියාවන්ගෙන් ඉවත් වීමට උපදෙස් දීමට කල්‍යාණ මිත්‍රයන්ට හැකියාව ලැබෙනු ඇත. ප්‍රඥාවන්ත කල්‍යාණ මිත්‍රයන් සාමාන්‍යයෙන් අන්‍යයන්ට උපෙදස් දෙනුයේ කායික හා මානසික කුසල කර්ම පිළියෙල කර ගැනීමෙන් සන්තතික දුක්ඛ ක්‍රියාවලියෙන් ඉවත්වීම සඳහාය. මෙලොව හා පරලොව යන අවස්ථා දෙකෙහි කර්ම ක්‍රියාවලියට මුහුණදීම සඳහා අකුසල් ක්‍රියාවන් කර්ම බවට පත්කර ගැනීමෙන් අඥාන පෘතජනයින් අකුසල් සහගත කර්ම පිලියෙල කර ගැනීමට යොමු වන අතර කල්‍යාණ මිත්‍රයින් එම අකුසල් මාර්ගයෙන් ඔවුන් වලකාලන අතර නිර්වාණය සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගය හැදෑරීමට උපදෙස් දෙනු ඇත.

ප්‍රඥාවන්ත වූ විද්‍යා අවබෝධයට පත් එනම් ආර්ය අෂ්ඨාංගික නිර්වාණ මාර්ගය පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබාගත් පැවිදි උතුමන් සත්ත්වයින්ගේ ජීවී සන්තතික ගත අධ්‍යාත්මික සැලැස්මෙහි එනම් ලෝකයෙහි සත්‍යය විද්‍යාත්මක පැවැත්ම කෙසේ පවතින්නේ දැයි හඳුනාගත් පිරිසකි. එවැනි ප්‍රඥාවන්තයෙකු සත්ත්වයාගේ

නැවත ඉපදීමේ ක්‍රියාවලිය සඳහා හේතුව වන අධ්‍යාත්මික සැලැස්ම කෙසේ පිළියෙල වන්නේ ද හා පවතින්නේ ද යන්න අවබෝධ කරගනු ඇත. එවැනි ප්‍රඥාවන්තයින් සත්ත්ව සන්තතික දුක්ඛ ධර්මයන්ගෙන් සිය අනුගාමිකයන්ට නිදහස් වීම සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමට උපදෙස් දෙනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගය නිවැරදි ලෙසින් අනුගමනය කළා වූ ප්‍රඥාවන්තයින් ඔවුන්ගේ න්‍යායික හා ප්‍රායෝගික මාර්ග හා ඵල අවබෝධය නිර්වාණය සඳහා නිවැරදි ඉලක්කය වෙත යොමු කරගන්නා අතර එම මාර්ගය තුලින් නිවන් දැකීමට බලාපොරොත්තු වන සෙසු මනුෂ්‍යයින්ටද මධ්‍යම ප්‍රතිපදාව හැදැරීමෙන් නිර්වාණයට පත් වීමට අවශ්‍ය උපදෙස් දීමට ඔවුනට හැකියාව ඇත.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීමෙන් ප්‍රඥාවබෝධය ලැබූ ප්‍රඥාවන්තයින්ට ප්‍රඥාවන්තයෙකු වීමට බලාපෙරොත්තු වන සෙසු මනුෂ්‍යයින්ට ද නිර්වාණ මාර්ගය පිළිබඳව උපදෙස් දිය හැක. ඔවුන් එම උපදෙස් පිළිපැදීමට එකඟ විය යුතුව ඇත. නිර්වාණ මාර්ගය හැදැරීමට බලාපොරොත්තු වන යමෙකු ආර්ය අෂ්ඨාංගික මාර්ගය සාර්ථකව හැදැරීම නොකල අඥානයෙකුගේ උපදෙස් පිළි නොගත යුතුය. ලොවෙහි ප්‍රඥාවන්ත කල්‍යාණ මිත්‍රයෝ කිහිප දෙනෙකි. ලොවෙහි ජීවත් වන අන් සියලු කල්‍යාණ මිත්‍රයින්ට වඩා ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රයා වන්නේ බුදුන් වහන්සේය. එලෙස ප්‍රඥාවබෝධය ලත් ප්‍රඥාවන්තයන් ද එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අයත් ප්‍රඥාව සම්පූර්ණ කරන්නාවූ සත්පුරුෂයින්ද ඇසුරු කිරීමට සුදුසු කල්‍යාණ මිත්‍රයන් වනු ඇත.

විදර්ශණා සහිත භාවනා ක්‍රියාවලියත්, ඒ හා සමගාමීව අධිශීල, අධි චිත්ත අධ්‍යාත්මගත අභිවෘද්ධිය සඳහා නිර්වාණ මාර්ගය හැදෑරූ ප්‍රඥාවන්තයින් ඇසුරු කිරීමට ඉතා සුදුසු කළ්‍යාණ මිත්‍රයෝ වනු ඇත. මධ්‍යම ප්‍රතිපදාවත් එහි

අන්තර්ගත ධර්මයත් ඒ අනුව මාර්ගයෙහි ඵලය අවබෝධ කර නොගත් යමෙකු ඇසුරු කිරීමට සුදුසු කළ්‍යාණ මිත්‍රයකු නොවනු ඇත. ආර්ය මාර්ගගත අධ්‍යාත්මික අවබෝධය රහිත යම් පෘතග්ජනයෙකු ප්‍රඥාවන්තයෙකු යැයි සිතීමෙන් යමෙකු ඔහු ඇසුරු කරන්නේ නම් ඔවුන්ට කිසිවිටෙක සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීමට නොහැකි වන අතර ඔවුනොවුන් සතර අපාගත ධර්මතාවයන්ට අනුගතව පිළියෙල කරගත් අධ්‍යාත්මික මානසික කර්ම සැලැස්ම හේතුවෙන් සතර අපායේ ප්‍රතිසන්ධි විය යුතුව ඇත.

බහුතරයක් පෘතග්ජන අඥාන මනුෂ්‍යයන් එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය නොකලා වූ ගිහි හා පැවිදි පිරිස් තමන් ප්‍රඥාවන්තයෙකු ලෙස පෙන්වමින් තමන් නූගත් පුද්ගලයන්ට කුසල ධර්ම, අකුසල ධර්ම වශයෙනුත් අකුසල ධර්ම කුසල ධර්ම වශයෙනුත් කළ යුතු ක්‍රියා නොකළ යුතු ක්‍රියා වශයෙනුත් නොකල යුතු ක්‍රියා කලයුතු ක්‍රියා වශයෙනුත් මිත්‍යා දෘෂ්ඨිගත තර්ක විතර්ක සත්‍යය ධර්ම වශයෙන් පැහැදිලි කරමින්ද තමනුත් ඒවා පිළිගන්නා නූගත් අනුගාමිකයන්ද යන දෙකොසටම සතර අපාගත වීමට නියමිත වනු ඇත. ඒ නිසා අවාසනාවකට අඥාන වූ ඔවුන් සියල්ලෝම බුදුරදුන් දේශනා කරන ලද විශ්ව ලෝකගත විද්‍යාත්මක ධර්මතාවය නොදැනීමෙන් ප්‍රඥාවබෝධය රහිත පිරිසක් බවට පත්වී නිමා නොවන සසර දුකට ගොදුරු වී ඇත.

# අධ්‍යාත්මික විද්‍යාව

*විකල්පයක් ලෙසින් බුදුදහම යනු සිතුවිලි ලෙසත්, ආගමක් ලෙසත්, අධ්‍යාත්මික විද්‍යාවක් ලෙසත් එලෙසම ජීවිතයක් සඳහා වන මාර්ගයක් ලෙසත් සාධාරණ මෙන්ම ප්‍රායෝගිකද වන සෑම අංගයක්ම හාත්පසින්ම ආවරණය වී ඇති දහමයි.වසර 2500 ක සිට බුදුදහම මගින් මනුෂ්‍ය වර්ගයාගෙන් 1/3 කට ආසන්න පිරිසකගේ ආධ්‍යාත්මික අවශ්‍යතාවයන් ඉතා හොඳින් ඉටුකර ඇත.*

*එය බටහිර ලෝකයෙන් ඉල්ලා සිටින්නේද ආත්ම විශ්වාසය පිළිබඳ සැලකිල්ලට පත්වීමට අන්‍යයන්ගේ අදහස් පිළිබඳ ඉවසීම ප්‍රගුණ කර ගැනීමත් ඒ සඳහා විද්‍යාවත් ආගමත් දර්ශනයත් මනෝවිද්‍යාවත් ආචාර ධර්මත් කලාවත් ආදේශ කර ගැනීමත් එලෙසම මිනිසා තමාම තමාගේ කේන්ද්‍රය ලෙසින් වර්තමාන ජීවිතයෙහි නිර්මාණකරු තමා බවත් එලෙසම තමා නිර්මාණය කරගත් පෞද්ගලික කර්ම නිර්මාණකරු තමා ම වන බවද ඒත්තු ගැන්වීමයි.*

**- ක්‍රිස්මස් හම්ප්‍රිස් -**

## 3.1.2 චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත නිර්වාණ ධර්මය ශ්‍රවණය කිරීම.

ජීව විද්‍යාත්මක ලෝකයේ සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන්ගේ සත්‍යය ස්වභාවය පිළිබඳ ද්‍රව්‍යාත්මක සහ ස්ථිතික විද්‍යුත්මය මුලධර්ම මගින් සංස්කරණය වන සත්ත්ව සන්තතික ධර්මයන්හි ප්‍රභවය පිළිබඳ විස්තරාත්මක දේශනා ධර්මය තථාගත ධර්මය ලෙසින් බුදුන් වහන්සේ විසින් දේශනා කර ඇත. ස්ථිතික විද්‍යුත් ශක්තීන් හා ප්‍රතිබද්ධ වූ ද්‍රව්‍යයන්හි භෞතික සැලැස්ම පිළිබඳ මුලික විද්‍යා අවබෝධය යම් ප්‍රඥාවන්තයෙකුට තිබිය යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් දායකත්වයක් මගින් යමෙකුගේ ජීවිත කාලය තුල ආර්ය අෂ්ඨාංගික මාර්ගගත අධ්‍යාත්මික ක්‍රියාවලිය තුළින් නිර්වාණය සඳහා අවශ්‍ය පියවර ගත යුතුව ඇත.

සාමාන්‍ය පෘතග්ජනයින් වන අඥාන මනුෂ්‍යයන් පැහැදිලි කරනු ලබන දේශනා ධර්මයන් ලොවෙහි සනාථන ධර්මයක් ලෙසින් දේශනා කලත් අඥාන අනුගාමිකයින් ද එම දේශනා පිළිගත්තත් එලෙසම ඔවුන්ගේ උපදෙස් අනුව ක්‍රියාකලත් මෙම දෙපිරිසම මරණින් පසු සතර අපායට යායුතුව ඇත.

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් ලොවට දේශනා කර ඇති ලොවෙහි සනාථන ධර්මයෙහි සන්තතික විද්‍යාත්මක ක්‍රමවේදය සියලුදෙනා විසින් අවබෝධ කරගත යුතු සත්‍යය ධර්මය වනු ඇත. මධ්‍යම ප්‍රතිපදාගත ප්‍රතිපත්ති පූර්ණය කරන සත්පුරුෂයින්ට තථාගත ධර්මය එලෙසින් දේශනා කළ හැක. සියළු දෙනා විසින් දේශනා කරන විවිධ දර්ශණයන් ඕනෑම කෙනෙකුට ශ්‍රවනය කල හැකි බවත් එහෙත් තමාගේ නිවැරදි

සිහියෙන් හා අවබෝධයෙන් යුතුව පමණක් එම ධර්මයන්ට එකඟ විය යුතු නමුත් එසේ එකඟ විය නොහැකි නම් එම ධර්මයෝ අනුගමනය නොකල යුතු බවත් බුදුරදුන් දේශනා කර ඇත.

විද්‍යාත්මක ධර්ම සන්තතියේ සම්භවය ස්ථිතික විද්‍යුත් මූලධර්ම මත ක්‍රියාත්මක වන අතර එම විද්‍යුත් ධර්මතාවයෙහි සම්භවයෙහි පැවැත්ම බුදුන්වහන්සේ විසින් තථාගත ධර්ම ලෙසින් දේශනා කර ඇත. විද්‍යාත්මක ධර්මතාවයන්හි ජීවි සත්ත්ව සන්තතියෙහි විද්‍යාත්මක ධර්මතාවය සැබෑ සහ නිවැරදි සන්තතික ධර්මය වන අතර කිසිවෙකුට ලෙහෙසියෙන් විශ්ලේෂණය කිරීමෙන් එම විද්‍යාත්මක සන්තතික ධර්මයන් අවබෝධ කර ගත නොහැකිය. තථාගත බුදුරදුන් පමණක් මෙම සන්තතික විද්‍යාත්මක ධර්මයන්හි විශිෂ්ඨ අවබෝධයට පත්වුයේ භෞතික කායික ඉන්ද්‍රියයන් අභිබවා යෑමෙන් අත්පත් කරගත් අතීන්ද්‍රිය වූ මානසික ස්පර්ශ ක්‍රියාවලියක් තුලිනි. බුදුන් වහන්සේ විසින් දේශිත ප්‍රඥා ධර්මය ලොවෙහි ක්‍රියාත්මක එකම වූද සමස්ත විද්‍යා විෂයන් අතරින් විශිෂ්ඨතම විද්‍යා විෂය වූ ධර්මතාවයකි. චිත්ත ශක්තීන් හා එහි සම්ප්‍රයුක්ත මානසික ශක්තීන් කෙසේ මූලිකව පවත්වන්නේ දැයි හා එය කායික ශරීරයක් හා ප්‍රතිබද්ධව කෙසේ පවතින්නේද යන්නත් ලොවට දේශනා කරමින් ඉතා සුක්ෂ්ම වූ සත්ත්වයින්ගේ කර්ම ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම සඳහා මැදිහත් වූ ලොවෙහි කිසිදු ආගමක් හෝ කිසිදු ආගමික නායකයෙකු හෝ මේ වන තුරුත් බිහිවී නැති අතර එම අධ්‍යාත්මික විද්‍යාව අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කර ගැනීම සඳහා වෙනත් කිසිදු විෂයක් නිර්මාණයවී නොමැත. අඥාන මනුෂ්‍යයන්ට චතුරාර්ය සත්‍යය ධර්මය ඇසීමටත් අවබෝධ

කර ගැනීමටත් නොහැකි වන අතර තමාගේ පැවැත්මට හේතු වූ සන්තතික විද්‍යා මුලධර්මය ගැනත් නොදන්නවුන් වනු ඇත. එම නිසාම එම මනුෂ්‍යයන්ට තථාගත ධර්මය ඇසීමට නොහැකි වනවා මෙන්ම විද්‍යාත්මක සන්තතික කර්ම ධර්මයෙන් නිදහස් වීමට ද නොහැකි වනු ඇත. මනුෂ්‍යය ලෝකයෙහි ඉපිද සිටින ප්‍රඥාවන්ත මනුෂ්‍යයෝ සියල්ලෝම චතුරාර්ය සත්‍යය වශයෙන් බුදුන් වහන්සේ දේශනා කර ඇති තථාගත ධර්මය ඇසීමටත් අවබෝධකර ගැනීමටත් තම තමන්ගේ ප්‍රමාණවත්වූ උත්සාහයක් ගත යුතුව ඇත.

## උන්වහන්සේ වචනයෙන් කාරුණික විය

***බුදුන්වහන්සේ කිසිවිටක තරහින් රෞද්‍රබසින් හා කෝපයෙන් කිසිම අවස්ථාවක් ගත නොකළ අතර මුවින් ආකාරුණික වචනයක් කිසිවිටක පිට නොවුනි.***

**- ආචාර්ය රාධ ක්‍රිෂ්ණන් -**

### 3.1.3 යෝනිසෝමනසිකාරය (එළඹ සිටි සිහිය පිළිබඳ දැඩි අවධානය)

විශ්ව ශක්තිය වන ස්ථිති විද්‍යුත් ශක්තීන් හා පදාර්ථයන්හි මූල ධාතූන්ද එකිනෙක සංයෝජනය වීමෙන් නිර්මාණය වන සමස්ත ඵලය වන්නේ මනුෂ්‍යය - තිරිසන් සත්ත්ව හා ශාක සංස්කාරක වස්තූන්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත ලෝකගත සත්ත්ව හා ශාකගත සංස්කාරක වස්තූන්ගේ සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික ශක්තීන් නිර්මාණය වනු ඇත. ඉහත ක්‍රියාවලිය මනුෂ්‍යය තිරිසන් සත්ත්වයන්ගේ සන්තතික පැවැත්ම සඳහා ස්ථිතික විද්‍යුත්මය වශයෙනුත්

අධ්‍යාත්මික වශයෙනුත් ලෝකය තුල ප්‍රභල ලෙස සක්‍රියව පවතින ධර්මතාවයකි. සංස්කාරක ද්‍රව්‍යන්ගේ ස්ථිතික විද්‍යුත්මය සංඥාවන් වන වර්ණ සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ස්පර්ශ සංඥා යනු ස්ථිතික විද්‍යුත් සම්ප්‍රයුක්ත ශක්තීන්ගේ ඵලයන් ය. සත්ත්ව කායික ශරීරය තුලින් සම්ප්‍රයුක්තව නිර්මාණය වන මානසික ශක්තිය යනු චිත්ත ශක්තිය සතු ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ චිත්තානු පරිවර්තී සම්ප්‍රයුක්ත වූ අධ්‍යාත්මික බලයයි. සමස්ත සත්ත්වයන් කෙරෙහි ක්‍රියාත්මක වන සම්ප්‍රයුක්ත ප්‍රභල ශක්තිය වන මානසික ශක්තීය සංස්කාරක වස්තූන්ගේ ස්ථිතික විද්‍යුත් සංඥාවන්ට ප්‍රතිචාර දැක්වීමට අදාලව ක්‍රියාත්මක වීමෙන් මනුෂ්‍ය තිරිසන් සත්ත්වයින්ගේ සන්තතික කර්ම ක්‍රියාවලියට පදනම සැකසී ඇත. ශූක්ෂ්ම වූද අදෘශ්‍ය වූද ස්ථිති විද්‍යුත් ශක්තීන් පාදකව චිත්තානු පරිවර්තී අධ්‍යාත්මික මානසික ශක්තීන් සමස්ත සත්ත්ව ලෝකයේ විද්‍යාත්මක වූ සන්තතික කර්ම ක්‍රියාවලියට අවශ්‍ය පදනම නිර්මාණය වී ඇත.

මෙම සම්ප්‍රයුක්ත මානසික ශක්තීන් එහි මූල සම්භවගත ශක්තීන්ට අදාලව සංවේදී ගුණාත්මක බවට පත්වී සක්‍රිය වීමෙන් හා ප්‍රතික්‍රියා කිරීමෙන් එම සංවේදී මානසික ශක්තීන් ඒ ඒ සත්ත්වයන් සඳහා මිත්‍යා දෘෂ්ඨිය සහිත මානසික හැඟීම් නිර්මාණය වීම කෙරෙහි යොමුවී ඇති අතර එම මානසික විද්‍යාත්මක ක්‍රියාවලියේ නොදැනීම අවිද්‍යාව නම් වන මිත්‍යා දෘෂ්ඨියට පදනම වනු ඇත. මෙම මානසික ශක්තීන්ගේ අධ්‍යාත්මික විද්‍යුත් ක්‍රියාවලිය සියළුම සත්ත්වයින්ට මානසික සංස්කරණ පිළියෙල කරගැනීමට සුදුසු ශක්තීන් වන අතර එම ශක්තීන් විශ්ව ලෝකගත සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලියෙහි සත්ත්වයාගේ නැවත ඉපදීමට අදාල කර්ම සන්තතියට යොමු වී ඇත. සමස්ත මානසික ක්‍රියාවන් මූලිකව අරමුණුව

පවතින්නේ පංච උපාදානස්කන්ධය නමින් හඳුන්වනු ලබන නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියේ පදනම සඳහාය. සත්ත්වයාගේ භෞතික ශරීරය මානසික ශක්තිය සමඟ එකවිට සක්‍රිය වන විටදී එම සත්ත්වයාගේ සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ශක්තියෙහි සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික ශක්තිය වනුයේ ස්ථිතික විද්‍යුත් ආරෝපිත මනෝ කායික ශක්ති ශරීරය වන අතර එම අධ්‍යාත්මික ජීවී ශරීරයෙහි අධ්‍යාත්මික ස්ථිති විද්‍යුත් සැලැස්ම ක්‍රියාත්මක වන්නේ වෙනත් රූපීය පැවැත්මකට දුක සඳහා හේතුව වන කර්ම ක්‍රියාවලියකට යොමුවන සත්ත්වයෙක් සඳහා නැවත ඉපදීමේ ක්‍රියාවලියට යොමු වීම සඳහාය.

මනුෂ්‍යය - තිරිසන් සත්ත්වයින්ගේ කායික හා ද්‍රව්‍යාත්මක ශරීරය සමග ස්ථිති විද්‍යුත් ශක්ති ප්‍රභවගත මානසික සංස්කරණය එකිනෙකට එක් විටකදී සක්‍රිය වීමේ මුලධර්මය හේතුවවීම තුලින් මනුෂ්‍යය හා තිරිසන් සත්ත්වයන් ජීවී සංස්කාරක ලෙසින් එනම් සවිඤ්ඤාණික වස්තූන් ලෙස හඳුනාගත හැක. මනුෂ්‍යය තිරිසන් හා ශාක ලෙසින් වන සියළුම සංස්කාරක ද්‍රව්‍යයන්ගේ පංචවිධ සම්ප්‍රයුක්ත සමස්ත ස්ථිතික විද්‍යුත් ශක්තීන් වන ස්ථිතික විද්‍යුත් සංඥාවන් සත්ත්වයන්ගේ සම්ප්‍රයුක්ත මානසික ස්ථිතික විද්‍යුත් ශක්තීන්ට පමණක් සංවේදී වනු ඇත. බාහිර පරිසරයේ පවතින සංස්කාරක වස්තූන් මගින් නිකුත්වන වර්ණ,ගන්ධ, රස ආදී වන ස්ථිතික විද්‍යුත් ආරෝපිත සංඥාවන්හි ශක්තීන් සත්ත්වයින්ගේ බාහිර භෞතික කායික ඉන්ද්‍රියන් සමග ස්පර්ශ වීම සිදුවනවාත් සමඟ සත්ත්වයාගේ සම්ප්‍රයුක්ත මානසික ශක්තිය සමග ද ස්පර්ශ වේ.

සත්ත්වයාගේ සංවේදී මානසික ස්පර්ශ ක්‍රියාවලිය සඳහා සංස්කාරක වස්තූන්ගේ වර්ණ සංඥා ද, ශබ්ද සංඥා ද

ගන්ධ සංඥා ද, රස හා ස්පර්ශ සංඥාද හේතුව වන අතර එම සංඥාවන්ගේ මානසික ස්පර්ශයෙහි පූර්ව අත්දැකීමට අදාලව ප්‍රිය යැයි සිතන ස්පර්ශ සංඥාවට පමණක් සත්ත්වයා ප්‍රතිචාර දක්වනු ඇත. මෙම සංස්කාරක වස්තූන්ගේ ස්ථිතික විද්‍යුත් සංඥා ශක්තීන් මානසික දත්ත ලෙස අන්තර්ගත වූයේ භෞතික කාය ශරීරය කාම තෘෂ්ණාවෙන් පිනවීම නිසා රැස්වූ පංචවිධ සංඥාවන්ගෙන් වන අතර එම සංඥාවන්ගේ සංස්කාරක ක්‍රියාවලිය සත්ත්වයාගේ අධ්‍යාත්මික විද්‍යුත් සැලැස්ම වනු ඇත. එම මානසික සංඥාවන්ගේ මානසික ප්‍රතිරූපයන් සංස්කාරක වස්තූන්ගේ ස්ථිතික විද්‍යුත් සංඥා මගින් නිර්මාණය වී ඇති අතර එය සත්ත්වයාගේ සන්තතික අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලියේ නැවත ඉපදීමේ කර්ම චක්‍රය බවට පත්වනු ඇත.

ලෝකයෙහි අවිද්‍යාවට පත් බහුතර අඥාන මනුෂ්‍යයන්ට නැවත ඉපදීමේ කර්ම චක්‍රයට යොමුවීමට සිදුව ඇත්තේ මානසික ස්පර්ශ ක්‍රියාවලියෙහි තෘෂ්ණා සංවේදී ත්‍රිවිධ ක්ලේෂ පාදක අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි මූලික සැලැස්ම නිසා වන අතර එම සැලැස්ම මුළුමනින්ම සන්තතික වන සත්ත්වයාගේ කර්ම පදනම බවට පත්වනු ඇත. විද්‍යාත්මක මූලධර්මයන්ට අනුව චිත්ත ශක්තීන්ගේ සම්ප්‍රයුක්ත මානසික ක්‍රියාවලිය මානසික සැලැස්ම වශයෙන් සත්ත්වයාගේ අධ්‍යාත්මිකවූ ස්ථිතික විද්‍යුත් සැලසුමකට යොමු වීමෙන් ලෞකික විද්‍යාත්මක හේතුඵල ධර්මතාවය අඛණ්ඩව පැවතීම පිණිස යොමුවී ඇත. සමස්ත මානසික කර්ම ශක්ති ධර්මතාවයේ සන්තතික ක්‍රියාවලිය පිළියෙල වීම කාම තෘෂ්ණාව පාදක වීමෙන් තහවුරු වන අවිද්‍යාව (මිත්‍යා දෘෂ්ඨිය) භව තෘෂ්ණාව (ආත්ම දෘෂ්ඨිය) හා පුද්ගල දෘෂ්ඨිය (සක්කාය දිට්ඨිය) හේතුව වීමෙන් සත්ත්වයාගේ කර්ම සන්තතියෙහි අඛණ්ඩ බව සඳහා කාම තෘෂ්ණාවත් එයට සහජාතක ද්වේශයත් සම්ප්‍රයුක්ත මානසික ශක්තිය තුළින්

නිර්මාණයවී ක්‍රියාත්මක වන හේතුඵල ලෙසින් වන විද්‍යාත්මක ලෝකගත නීතියට අනුව සැලසුම් සහගතව කර්ම විපාක ලෙසින් ක්‍රියාත්මක වේ.

මානසික කර්ම සංස්කරණ ස්ථිතික විද්‍යුත් ඒකකයේ අන්තර්ගත සියළුම මානසික දත්තයන් ත්‍රිවිධ දෘෂ්ඨි පාදක මානසික අනුමැතියට යටත්ව අතීත කාලය තුළදී පිළියෙල කරගනු ලැබ ඇත. කාම තෘෂ්ණාව තුලින් මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයෝ ග්‍රහණය කරගන්නා පංචවිධ සංඥාවන් ඔවුන් විසින් වාචිකවත් කායිකවත් මානසිකවත් අවිද්‍යාවට යටත්ව පිළියෙල කරගත් මතකයන් ලෙසින් හඳුන්වනු ලබන මානසික සංස්කරණ ව්‍යුහය වනු ඇත. මානසික සංස්කරණ ඒකකයෙහි ග්‍රහණය කරගත් පංචවිධ සංඥාවන් පංච උපාදානස්කන්දය නමින් යුත් මානසික සැලැස්ම වන අතර එම මානසික සැලැස්ම මානසිකව තහවුරු කරගත් හා අනුමත කරගත් මතකයන් ලෙසත්, සිතුවිලි ලෙසත්, හැඟීම් ලෙසත්, අදහස් ලෙසත්, දෘෂ්ඨීන් ලෙසත්, විශ්වාසයන් ලෙසත්, තර්ක විතර්ක ලෙසත්, මනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකටව පවතී. ඉහත සඳහන් ලෙසින් සත්ත්වයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන මානසික අත්දැකීම් මානසික සංස්කරණ ලෙස අතීත කාලය තුලදී තහවුරු කරගත් මානසික පැවත්මකි. සමස්ත සත්ත්වයෝ මනුෂ්‍ය හා තිරිසන් ලෙසින් සිය අතීතකාලික මානසික අත්දැකීම් වර්තමානයේ දී නැවත වරක් මානසික යොමු වීමකට ඉඩදීමෙන් වාචිකවත්, කායිකවත්, මානසිකවත් යොමු කරමින් දෛනික ජීවිතය පවත්වනු ඇත.

මානසික ශක්තිය නිරතුරුව සක්‍රිය වන්නේ ප්‍රධාන වශයෙන්ම භෞතික කයෙහි ස්පර්ෂ සංවේදන ක්‍රියාවලිය සමගය. චිත්ත ශක්තිය නිරතුරුවම සක්‍රිය භාවයේ පවතිනුයේ එය ශක්ති විශේෂයක් නිසාවන අතර හුදෙක් ද්‍රව්‍යාත්මක නොවන බැවිනි. භෞතික ශරීරය අකර්මණ්‍ය වන අවස්ථාවක

දී එනම් නින්දේ දී හෝ ක්ෂණික කම්පනයක දී හෝ අධික ලෙස මත්පැන් පානය කළ විටදී හෝ නිර්වින්දනයට පත් කළ විටදී අදාල මනුශ්‍යය, තිරිසන් සත්ත්වයින්ගේ මානසික ශක්තිය ක්‍රමානුකූලව අකර්මණ්‍ය අවස්ථාවකට එළඹේ. මානසික සංස්කරණයෙහි අන්තර්ගතය සඳහා තහවුරු කරගත් මානසික අත්දැකීම්වල ශේෂය සත්ත්වයා ත්‍රිවිධ දෘෂ්ඨීන් තුලින් ග්‍රහණය කරගත් අවිද්‍යාව හා කාම තෘෂ්ණාව පාදක සුඛ වේදනාවට පාදක වන අතර එම මානසික සැලැස්ම නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියේ ප්‍රභවය වනු ඇත.

නැවත ඉපදීමේ සන්තතික ක්‍රියාවලියට පදනම මානසික සංස්කරණය හේතුව වීමෙන් චිත්ත ශක්තීන් තුල තහවුරු වන්නේ දැඩි කාම තෘෂ්ණාවෙන් භෞතික කයෙහි ස්පර්ශ ක්‍රියාවලියට දැඩිව යොමු වීම තුලින් සන්තතික වස්තූන්ගෙන් තෘෂ්ණාව තුලින් රැස්කර ගත් හා රඳවාගත් විද්‍යුත් සංඥා රූපයන්ය. සත්ත්වයින්ගේ සම්ප්‍රයුක්ත මානසික ශක්තිය මඟින් සම්බන්ධීකරණය කරගත් සංවේදී සංඥාවන්ගේ වේදනා ශක්තීන් චිත්ත ශක්තිය තුල මානසික සැලැස්මක් ලෙස අන්තර්ගතව ඇත. අඛණ්ඩව ක්‍රියාත්මකව පවතින සත්ත්වයන්ගේ ජීවිත චක්‍රය දෛනික ක්‍රියාවලියක් වශයෙන් සිදුවීමේ දී මෙම මානසික සංස්කරණගත අධ්‍යාත්මික ස්ථිති විද්‍යුත් සංඥාවන්ට අනුගත වීම මගින් සිදුවනු ඇත. මෙම අන්තර්ගත මානසික සැලැස්ම සැලසුම් සහගත වුයේ මානසික ක්‍රියාවලියක් ලෙසින් වන අතර ඒ සඳහා මිත්‍යා දෘෂ්ඨිය, ආත්ම දෘෂ්ඨිය, පුද්ගල දෘෂ්ඨිය, ලෙසින් සත්ත්වයන්ගේ මානසික දෘෂ්ඨීන් පදනම වනු ඇත. විශ්ව ලෝකගත ක්‍රියාත්මක චිත්ත ශක්තිය හා එහි සම්ප්‍රයුක්ත මානසික ශක්තිය යනු සත්ත්වයන්ගේ සීමා රහිත කාලයක සන්තතික කර්ම ක්‍රියාවලිය අඛණ්ඩව රැගෙන යාම සඳහා ප්‍රබල හැකියාවක් සහිත ශක්තියක් වන අතර එම කර්ම ශක්තින් බහුල වශයෙන් හා ප්‍රබල ලෙස සත්ත්වයන් සතර අපාය දෙසට යොමු කරවා ඇත.

සත්ත්ව සංස්කාරක වස්තූන්ගේ සම්ප්‍රයුක්ත ස්ථිති විද්‍යුත් ශක්තිය වන මානසික කර්ම බලය භෞතික ශරීරය පාදක වීමෙන් නිර්මාණය වීමත් සක්‍රිය වීමත්, කායික ක්‍රියා සඳහා හැසිරීමත් ත්‍රිවිධ කාලයන් තුලදී සිදුවේ. එම ක්‍රියාකාරී කර්ම ශක්තීන් අනාගත කාලය තුලත් වර්තමාන කාලය තුලත් අතීත කාලය තුලත් යන ත්‍රිවිධ කාලයන්ට සීමා සහිත වීමෙන් සත්ත්වයින්ගේ ක්‍රියාකාරී මානසික ශක්තීන් තුල ගබඩා වී ඇත. මතකයන් ලෙස ක්‍රියාත්මක වන මෙම මානසික දත්ත පෘතග්ජනයින්ගේ මිත්‍යා මානසික සංකල්ප ලෙස ගොඩනැගීමට හේතුව වී ඇති අතර ඒ සඳහා පදනම තෘෂ්ණාව හා ද්වේශය ලෙසින් නිර්මාණය වන අවිද්‍යාවට අනුව තමන් යනු පුද්ගල මමත්වයක් ලෙසින් දැකීමටත්, ඉන්ද්‍රියන් පිනවීමට නියමිතව තමන් ඉපදී සිටින බව දැකීමටත්, තමන්ගේ ඉපදීම අඛණ්ඩ ආත්මයක් පැවැත්වීමට නියමිතව ඇති බවත් දැකීම සඳහා වන අවිද්‍යාව බවට පත්වනු ඇත. ප්‍රඥාපාදක අවබෝධයට පත්වූ යමෙකු විසින් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව හා උත්සාහය මත යෙදෙමින් තමා විසින් අතීත හා අනාගත කාලයන් තුලදී පිළියෙල කරගත් මානසික අත්දැකීම්වල එකතුව තමාගේ හිමිකම් වශයෙන් නොදැකීමෙන් ඒවා අක්‍රිය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් වීමෙන් වර්තමාන මොහොතට යොමුවන අතර අතීත හා අනාගත මානසික සිතුවිලි සියල්ලම අතහැර දැමීමක් සිදු කරනු ඇත.

මෙහිදී යමෙකු විසින් තමන් සතු අතීත මානසික තොරතුරු අතීතය ලෙසත් අනාගත මානසික තොරතුරු අනාගතය ලෙසත් අත්හරින්නේ නම් එම ක්‍රියාවලිය මානසික ශක්තීන්ගේ වර්තමාන කාලය තුල පැවැත්ම පිළිබඳ යොමු කරවන දැඩි අවධානය වන අතර එම වර්තමාන අවස්ථාවේදී මානසික පැවැත්මෙහි ඇති සැටිය එලෙසින්ම සිතීමටත්, දැකීමටත් යොමුකළ හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම මානසික අත්දැකීම වර්තමානකාල මොහොතෙහි ක්‍රියාකාරී

වන සත්‍යය මානසික පැවැත්ම ගැන නිවැරදි හා පිරිසිදු අවබෝධයට පත්වීමට සුදුසු අවස්ථාව වන අතර අක්‍රිය වූ ද එහෙත් නිශ්චල වූද එම වර්තමානකාල මානසික පැවැත්ම ගැන සිතීමට හා නැවත මතක් කිරීමට තරම් ප්‍රබල අත්දැකීමක් වනු ඇත. යමෙකුගේ ජීවිතය තුල සිය අධ්‍යාත්මික ධර්මතාවයෙහි ප්‍රථම අත්දැකීම මෙය වන අතර මරණයෙන් අනතුරුව නැවත ඉපදීමට නියමිත මානසික කර්ම ශක්තීන්ගේ අතීත අනාගත මානසික සැලැස්ම මේ අවස්ථාව තුලදී සම්පූර්ණයෙන් අතහැරීම සිදු කර ඇත.

මේ සම්බන්ධයේ දී වර්තමාන මොහොත අඛණ්ඩව රඳවා ගැනීම පිණිස එනම් තවදුරටත් අතීත මානසිකත්වයට හා අනාගත මානසිකත්වයට මානසික අවධානය යොමු නොකිරීම පිණිස සැලකිලිමත් වීමෙන් සිදුවනුයේ තවදුරටත් වර්තමාන කාලයේ එම මොහොත වෙත සිය අවධානයෙන් යුතුව රැඳෙමින් එලඹසිටි මොහොතෙහි සිහිය ලෙසින් වන සිතෙහි දමනයත් කීකරු වීමත් වැඩි දියුණු කර ගැනීම සඳහා යොමු වීමයි. මෙම ක්‍රියාවලිය යනු යමෙකුගේ ජීවිතයේ ශ්‍රේෂ්ඨතම මොහොත වන අධ්‍යාත්මික මානසිකත්වය වන සිය මමත්වයෙන් ඉවත් වීමෙන් ලබන අත්දැකීමෙහි අධ්‍යාත්මික නිදහස බවට පත්වීම වනු ඇත. අවසාන වශයෙන් මෙහි ඵලයක් ලෙස ආත්ම සංයමයට පැමිණීමට හැකිවීමත් ඒ තුලින් සමස්ත මමත්වය අතහැරීම සිදුවීමත් එමගින් කර්ම චක්‍ර පාදක අධ්‍යාත්මික ක්‍රියාවලියේ සම්බන්ධතාවයෙන් නිදහස් වීමක් සිදුවනු ඇත. මෙම අධ්‍යාත්මික පදනම් ක්‍රියාවලිය ප්‍රගුණ කරන්නා වූ ප්‍රඥාවන්තයින් තමන් කෙරෙහි පවත්නා ඇතිසැටිය ඇති ලෙසින් දැකීමට එනම් අධ්‍යාත්මික මානසිකත්වයෙන් ඉවත් වීම ලෙසින් වන දුක්ඛ කර්ම සන්තතියෙහි ප්‍රතිසන්ධි ක්‍රියාවලිය සඳහා හේතුව වන දුක්ඛ කර්ම පාදක අතීත හා අනාගත මානසික සැලැස්මෙන් ඉවත්වීම වනු ඇත.

ඉහත ලෙසින් වන ප්‍රාරම්භක අධ්‍යාත්මික පිවිසුමේ සිහියට පත්වීම එනම් වර්තමාන කාලයෙහි ඒ පිළිබඳ දැනුවත් වීමේ අවධිය වර්තමාන කාලයෙහි එළඹ සිටි මොහොතෙහි මානසික සංවේදනයට අවධානය දැඩිව යොමුකර ගැනීමට නම් ඒ සඳහා ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලියට යොමු විය යුතුව ඇත. එවිට වර්තමාන කාලයෙහි ක්‍රියාත්මක වන මානසික අවධියෙහි අඛණ්ඩ බව ඒකාග්‍රතාවය වශයෙන් රඳවා ගැනීම සඳහා එනම් වර්තමාන කාලය වෙතට යොමු කරන මානසික ක්‍රියාවලිය අඛණ්ඩ වීමට මානසික මතකයන් සහිත අතීත අනාගත මානසික තොරතුරු සඳහා යොමු නොකර ගත යුතුව ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මානසිකත්වයෙහි එකග බව එනම් ඒකාග්‍රතාවය දියුණු වීමෙන් ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලිය හරහා එළඹසිටි සිහිය තවදුරටත් යම් ප්‍රමාණයකට තහවුරු කරගත හැක. ප්‍රාථමික වූ අධ්‍යාත්මික අවබෝධයේ පිවිසුම ලෙස ඇරඹෙන මෙම ක්‍රියාවලිය මුළුමනින්ම යොමුකල යුතුව ඇත්තේ ප්‍රායෝගිකම වූ අත්දැකීම සදහා පමණක් වන අතර කිසිසේත්ම න්‍යායික අවබෝධයක් සඳහා පමණක් නොවනු ඇත. මමත්වයෙහි මානසිකත්වය සම්පූර්ණයෙන් මෙලෙස අතහැරීම තුලින් අත්පත් කරගත හැකි අධ්‍යාත්මික මානසික පලපුරුද්ද විඳීමට නියමිතව ඇති අතීත හා අනාගත කාලයන්හි සැලසුම් කරගත් මානසිකත්වයෙන් නිදහස් වීම වන අතර එය මුළුමනින්ම යොමු වී ඇත්තේ වර්තමාන මොහොතෙහි අධ්‍යාත්මික අත්දැකීමේ අභිවෘද්ධිය සඳහා වන සන්තතිකගත මානසික කර්ම ධර්මයෙහි ඇති සැටිය ඇති ලෙසින් දැකීම සඳහා ය. මෙලෙස අධ්‍යාත්මිකව "සිහියට" පත්වීමේ මානසික ක්‍රියාවලියට අනුව එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන කාලයේ දී කිරීමට සිතා සිටින මානසික හා කායික ක්‍රියාවන් ක්‍රමානුකූලවත් නිවැරදිවත් හා ගැඹුරින් ද එම ක්‍රියාවන්ගේ යථාර්තය ඇති ලෙසින් ද දැකීමට විෂය වනු ඇත.

මනුෂ්‍යයකු වශයෙන් මනුෂ්‍යය භවයේදී ප්‍රගුණ කරගත යුතුව ඇති ශ්‍රේෂ්ඨතම අධ්‍යාත්මික ක්‍රියාවලියෙහි ප්‍රාථමික පියවර වන මෙම යොමු වීම තුලින් සිහිනුවණට පැමිණීමෙන් සිතෙහි ප්‍රථම සහ මූලික "ඒකාග්‍ර" බව සඳහා යොමු විය හැක. මෙම අධ්‍යාත්මික මානසික ක්‍රියාවලියට අනුව ප්‍රඥාවන්ත සත්පුරුෂයන්ට ඔවුන්ගේ යෝනිසෝමනසිකාරයත් සිහිනුවණත් දියුණුකර ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් මේ සඳහා ඔවුන් අප්‍රමාදීව යොමු විය යුතුය. අවිද්‍යාව තුළින් කාම තෘෂ්ණාවට යටත්ව අඥානව පිළියෙල කරගත් මානසික කර්ම සංස්කරණයන් යම් පමණකට හෝ අත්හැරීමක් හෝ නොඇලී සිටීමක් හෝ කළ යුතුව ඇත. මෙවිට ප්‍රකෘති මානසික ස්ථාවරයෙහි ක්‍රියාකාරීත්වය ත්‍රිවිධ ක්ලේෂ මූලගත අවිද්‍යා මාර්ගය තුළින් පිළියෙල කරගත් විවිධාකාරයේ මානසික සිතුම් පැතුම් හා තර්ක විතර්ක වලින් නිදහස් කරගත හැක. ප්‍රකෘති මානසික ක්‍රියාකාරීත්වය තුලින් වර්තමාන කාල මොහොතෙහි මානසික ස්ථාවරයෙහි ප්‍රකෘති ස්වභාවය සත්පුරුෂ ප්‍රඥාවන්තයින්ගේ සිය සංවේදී මමත්වයෙහි මානසිකත්වය පාලනය කිරීමකට යොමු කරගත හැකි වූවත් සාමාන්‍ය අඥාන පෘතග්ජනයින්ට එය එසේ කරගත නොහැකි වන අතර ඔවුන් එම මානසිකත්වය මමත්වය ප්‍රගුණ කිරීමට යොමු කලත් එලෙසම ඔවුන් සිය මමත්වයට දැඩි ලෙස ඇලුම් කලත් එසේ ක්‍රියාත්මක වූ මමත්වයට හිමිකරුවෙකු ස්වභාවික ධර්මතාවයෙහි සත්‍යය ලෙසින් ක්‍රියාකාරී නොවනු ඇත. එය මානසික සම්ප්‍රයුක්ත ධර්මයන්හි සම්ප්‍රයුක්ත ඵලයක ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ ක්‍රියාකාරීත්වයක් පමණක්ම වනු ඇත.

අඥානව පිළියෙල කරගන්නා වූ මානසික සංස්කරණ ඒකකය සක්‍රිය වීමත් පැවතීමත් රඳා පවතින්නේ කුසල් හා අකුසල් සහගත මානසික වාචසික හා කායික ක්‍රියාවන් තුලින්

වන අතර මනුෂ්‍යයාගේ දෛනික ජීවි ක්‍රියාවලියෙහි පැවැත්ම සඳහා එය හේතුව වීමෙන් පෘතග්ජන අශ්‍රද්ධාන මනුෂ්‍යයන් සිය මානසික ජීවි ක්‍රියාවලියට අඛණ්ඩව යොමු වී ඇත. පෘතග්ජන අශ්‍රද්ධාන මනුෂ්‍යයන්ට කිසි ලෙසකින්වත් වර්තමානකාල මානසික පැවැත්මෙහි ප්‍රකෘති සිහියට පැමිණීමේ ප්‍රාථමික අධ්‍යාත්මික මානසික කර්ම ක්‍රියාවලියට යොමුවිය නොහැකිවීම ඔවුනට ඔවුන්ගේ සන්තතික කර්ම බන්ධනයෙන් ඉවත් වීමට නොහැකි වීමට හේතුව වනු ඇත.

මෙම අධ්‍යාත්මික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් එළඹ සිටි සිහිය නම් වන වර්තමාන කාලයේ මානසික දැඩි අවධානයට පත්වීමට අනුව එම වර්තමාන කාල මානසික දැනුවත් බව වර්තමාන කාලයෙහි දී කිරීමට නියමිත කායික මානසික ක්‍රියාවන් සඳහාද ප්‍රතිබද්ධ කළ හැකි අතර එම මොහොතට පැමිණිමට නියමිතව ඇති අතීත අනාගත මානසික බලපෑමට ඇතුලත් වීමට අවසර නොදිය යුතුව ඇත. මෙම අධ්‍යාත්මික අත්දැකීම හැදෑරීමට හා ප්‍රගුණ කිරීමට කැමති ප්‍රශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් හට ඒ සඳහා මෙම ක්‍රියාවලිය දිනපතා ප්‍රායෝගිකව කල යුතුව ඇත. සාමාන්‍ය පෘතග්ජන මානසික ක්‍රියාවලියට සමාන නොවන මෙම මානසික යොමුවීම පෘතග්ජනයින් සාමාන්‍යයෙන් යොදාගන්නේ සන්තතික කර්ම චක්‍රය තුලින් විඳීමට නියමිත ජාති, ජරා, ව්‍යාධි, මරණ නම් වන දුක්ඛ ධර්මතාවයන්ට මුහුණදීම සඳහා වන සංසාරගත කර්ම චක්‍රය නිර්මාණය කර ගැනීමටය.

වර්තමාන කාලයේ මානසික සංවේදනය පිළිබඳ අවධානය තුලින් චිත්ත ඒකාග්‍රතාවය සඳහා පුහුණුවන ප්‍රාශ්‍රද්ධාවන්තයකුට තමා සතු අතීත අනාගත කර්ම මානසිකත්වයෙන් බැහැරව වර්තමාන කාලය සඳහා අනුගතවීමෙන් සිය මානසික ශක්තීන් පුහුණු කිරීමටත් දමනය

කිරීමටත් හැකිවනු ඇත. එවිට ඔවුනට වර්තමාන කාලයෙහි මානසික අත්දැකීමෙහි මානසිකත්වයේ ඇතිසැටිය එලෙසින් ම අවබෝධ කරගත හැකිය. එවිට මානසික ශක්තීන් ක්‍රියාත්මක වන්නේ අතීත අනාගත මානසික බලපෑමකින් නොවන අතර එය "යෝනිසෝමනසිකාරය" නම් වන ප්‍රකෘති සිහියට පත්වීමේ අභිවෘද්ධිය පිණිස හේතුව වනු ඇත. අතීත අනාගත මානසික අත්දැකීම් කෙරෙන් ඉවත් වීමත් අත්හැරීමත් ඉවතලීමත් නොඇලී සිටීමත් ලෙසින් ක්‍රියාත්මක වන මෙම අධ්‍යාත්මික ක්‍රියාවලිය වර්තමාන කාලය තුල මානසික ඒකාග්‍රතාවය සඳහා යොමු වීමෙන් ප්‍රබල වූ මානසික විවේකයක් සහිත ''ශූන්‍යතාවය" උදාකර ගත හැක. නිර්වාණයට පත්වීමේ ප්‍රාරම්භක අවධිය ලෙසින් ක්‍රියාත්මක කළ යුතුව ඇති යෝනිසෝමනසිකාරය නම් වන ප්‍රකෘති මානසිකත්වයේ සත්‍යය පැවැත්ම අවබෝධ කර ගැනීමට ප්‍රගුණ කළ යුතු වන එකම හා ප්‍රධාන මාර්ගය මෙය වනු ඇත. යම් ප්‍රඥාවන්තයකු වර්තමාන කාලයේ මානසික ඒක්‍රාග්‍රතාවය තුලින් සන්තතික මානසික ධර්මතාවයෙහි ඇතිසැටිය ඇති ලෙසින් දැකීමෙන් "මානසික අවධිය"ට පත්වීම සිදුකර ගත්තේ නම් ලොවෙහි ජීවත් වන බොහෝ ක්‍රියාකාරී හා බොහෝ බලසම්පන්න මනුෂ්‍යයා බවට ඔහු පත්වනු ඇත. මෙහි ප්‍රතිඵලය වශයෙන් තමන් සතු මානසික බලය පාලනය කිරීමේ හැකියාව හා නඩත්තු කිරීමේ හැකියාව තුලින් මරණින් මතු සුගති ලෝකගත වීමේ ප්‍රබල හැකියාවක් මෙන්ම බොහෝ වීර්යය ගන්නේ නම් ප්‍රඥාවබෝධය තුලින් නිවන් ලැබීමේ හැකියාවද ලැබෙනු ඇත.

ඉහත ලෙසින් අධ්‍යාත්මික අවබෝධයට යොමු වන යමෙකුට ඔහු වටා පවතින ධර්මතාවයන්හි ඇති සැටියෙහි සන්තතික මානසික ධර්මයේ යථා ස්වභාවයේ ප්‍රකෘති සිහියට පත්වනු ඇත. එවිට ඔහුට තමාට නැවත උපතක් ලැබීමට

හේතුව වන කර්ම ධර්මතාවය හා බැඳී පවතින ප්‍රබල දුක් ධර්මතාවයන්හි පැවැත්ම ගැන විමසිලිමත් විය හැකිවනු ඇත. මක්නිසාද යත් වර්තමාන කාලයේ ලබන මානසික අත්දැකීම නිසා පුද්ගලයාට සත්ත්වයකු ලෙස නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවට මුලික වන තමන් සතු මානසික සංස්කරණයේ බලපෑමෙහි සත්‍යතාවය පිළිබඳ අධ්‍යාත්මික අවධානය දියුණු කර ගැනීමට අතිරේක මානසික විවේකයක් ලැබීමයි. එවිට ඔහුට සත්ත්ව සන්තතික කර්ම ධර්මතාවයන්හි අධ්‍යාත්මික විමර්ශනයකට එනම් විද්‍යාත්මක විදර්ශනාමය භාවනා ක්‍රියාවලියට තමා විසින්ම යොමු වීමට අවස්ථාව ලැබීමෙන් කර්ම චක්‍ර ක්‍රියාවලියෙහි ප්‍රධාන අන්තර්ගතය වන දුක්ඛ සංවේදන ධර්මයන්හි ප්‍රභවය හා එහි පැවැත්ම ගැන සම්මා දිට්ඨියට පත් විය හැක.

සාමාන්‍ය පෘතග්ජන අශ්‍රැාන මනුෂ්‍යයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන කර්ම පාදක මානසික සංස්කරණ ක්‍රියාවලිය හා සමාන වන ලෙසින් තිරිසන්ගත සත්ත්වයෝද ඔවුනොවුන්ගේ කායික හා මානසික සමාන හැසිරීම් සහිතව පිළියෙල කරගන්නා සමාන මානසික කර්ම සංස්කරණ ක්‍රියාවලියට යොමු වීම තුලින් අශ්‍රැාන පෘතග්ජන මනුෂ්‍යයෝද තිරිසන්ගත සත්ත්වයෝද එකම වූ අවිද්‍යා මාර්ගයෙහි සතර අපාගත සන්තතික කර්ම චක්‍රය තුලට යොමු වී ඇත. එළඹසිටි සිහිය නම් වන වර්තමාන මෙහොතේ මානසික ඒකාග්‍රතාවය එනම් යෝනිසෝමනසිකාරය නිර්වාණ ක්‍රියාවලියට මූලික පදනම වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රකෘති මානසික අවධානය තුලින් ප්‍රශ්‍රැාවන්තයින්ට තමන්ගේ වර්තමාන කාලයෙහි අවධානයේ සිහි නුවණ වර්තමාන මානසික කායික ක්‍රියාවන් සඳහා ද අනුගත කරගත හැකිය. ඉතාමත් උසස් ශික්ෂාකාමී විනය ප්‍රතිපත්තියක් ලෙසින් වන මෙම වර්තමාන

කාල සිහි නුවණ දියුණු කිරීමේ පියවර ඕනෑම පෘතග්ජනයකුට පහසුවෙන් ප්‍රගුණ කළ හැකි අතර නිර්වාණය වෙනුවෙන් කල යුතුව ඇති එකමවූද මූලිකවූද අධ්‍යාත්මික ක්‍රියාමාර්ගය එය වනු ඇත. තමා විසින් ක්ලේෂ මූල පාදකව පිළියෙල කරගත් අතීත හා අනාගත කාල මානසික සංස්කරණයන්ගේ මෙනෙහි කිරීම, මතක් කිරීම, කල්පනා කිරීම සඳහා සිය වර්තමානකාල මානසික පැවැත්ම යොදා ගන්නේ නම් සැබැවින්ම එම පුද්ගලයා දැඩි ලෙස අවසිහියට, අනවබෝධයට හා සිහිවිකල් වීමටත් එමෙන්ම අවිද්‍යාවට පත් වූවකු ද වනු ඇත. මෙය සාමාන්‍ය පෘතග්ජන ක්‍රියාවලිය වන අතර අඥානයින් විසින් ඔවුන්ගේ සන්තතිකගත දැඩි කර්ම බන්ධනයෙහි පැවැත්ම සඳහා යොමු වී ඇති බැඳීම වන අතර වර්තමානකාල එළඹසිටි මානසික අත්දැකීම රහිත තමන් සතු මානසික ප්‍රකෘති බවෙහි ස්ථාවරය රැකගත නොහැකි පිරිසක් වනු ඇත. මෙලෙස ක්‍රියාකාරී වන සාමාන්‍ය පෘතග්ජන මානසික කර්ම ක්‍රියාවලිය නිසා අති බහුතරයක් ලෝකවාසී මනුෂ්‍යයෝ ඉතා බිහිසුණු මානසික රෝගී තත්ත්වයන්ගෙන් පෙලමින් දැඩි තරහව, වෛරය, හිංසාකාරී බව, ඊර්ෂ්‍යාව, සාහසික බව, කෘෘර බව ලෙසින් වන දැඩි මානසික රෝගී තත්ත්වයන්ටද දැඩි මානසික පීඩාවන්ටද ලක්වීමෙන් මානසික අසමතුලිතතාවයට හා දැඩි මානසික ආතතියටද ලක්වීමෙන් සාමාන්‍ය පෘතග්ජනයින් ලෙසින් අවසිහියෙන් හා අනවබෝධයෙන් මුළුමහත් ලෝකවාසී මනුෂ්‍යය ප්‍රජාව දැඩි ලෙස විනාශයට යොමු කරවා ඇත. ඉහත සඳහන් කල මානසික අසමතුලිතතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයෙකුට ඔහු සතු භෞතික කයෙහිද අසමතුලිතතාවට මුහුණදිය යුතුව ඇත. එනම් හෘදයාබාධ, අංශභාගතත්ත්වය, ගැස්ට්‍රයිටිස්, දියවැඩියාව, කොලස්ට්‍රෝල්, අධික රුධිර පීඩනය, පටක හා රුධිර ආශ්‍රිත පිලිකා ආදී ලෙසින් වන දරුණු රෝගාබාධ වලට ලක්වනු ඇත. මෙම

කායික රෝගී ස්වභාවයන් මුළුමනින්ම පුද්ගලයාගේ මානසික අසමතුලිතතාවය හේතුවෙන් ඇතිවන අතර වෛද්‍ය ප්‍රතිකාර මගින් ස්ථිරව සුව කළ නොහැකි වන අතර නමුත් එළඹ සිටි සිහියට පත්වීමේ ප්‍රකෘති මානසික අවධියට යොමු වීම තුළින් මනුෂ්‍යයන්ට අවශ්‍ය වන එම කායික මානසික රෝගී ස්වභාවයන්ගෙන් නිදහස් වීමට පියවර ගත හැක.

ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලිය පාදක එළඹසිටි සිහියට පත්වීමේ මූලික සහ ආරම්භක භාවනාමය ප්‍රතිපදාවෙහි ඒකාග්‍රතාවය තුලින් යෝනිසෝමනසිකාරයට පත්වීමෙන් සහ සංස්කාරක වස්තූන්ගේ සංස්කරණයන්හි පැවැත්මේ ඇති සැටියෙහි විද්‍යාත්මක වූ ප්‍රඥාව අවබෝධකර ගැනීමෙන් යමෙකුට නිර්වාණය සඳහා අවශ්‍ය වන අධ්‍යාත්මික විසඳීමට මෙලෙස යොමු විය හැක.

## - පක්ෂග්‍රාහීත්වය -

*බොහෝමයක් අන්‍ය ආගම් වල බොහෝ නවක අනුගාමිකයන්*
*ඔවුන්ගේ ගුරුවරයාගේ පාලනයට යටත්වී ඇති අතර*
*ධර්මලේඛන කියවීමත් අන්‍ය ධර්මයන්*

*අධ්‍යයනය කිරීමත් ධර්ම සඟරා පොත් පත් පරිහරණය*
*කිරීමත් සහ අනෙක් ආගම් අනුගමනය කිරීමත් තහනමට*
*ලක්කර ඇත. බුදුදහම තුල මෙය දුර්ලභ සිද්ධියකි.*

**ප්‍රා කන්තිපලෝ - ''ක්ෂාන්තිය''**

### 3.1.4 ශීල සංවරය සඳහා වූ ආර්ය ප්‍රතිපදාව

සත්ත්ව ලෝකයෙහි ජීවත්වන තිරිසන් හා මනුෂ්‍යයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරී සන්තතික බලය වන මානසික ශක්තියෙහි ක්‍රියාකාරී වර්තමාන මොහොතෙහි අවධානය, එනම් යෝනිසෝමනසිකාරය චිත්ත ශක්තිය සතු විය යුතුව ඇති මානසික ඒකාග්‍රතාවයට පදනම වනු ඇත. මනුෂ්‍යය සත්ත්වයන්ගේ දෛනික වාචසික, කායික හා මානසික ක්‍රියාකාරකම් තුල සිදු කිරීමට නියමිත ක්‍රියාවන් සඳහා වර්තමාන කාලය තුලදී දක්වන දැඩි මානසික අවධානය යෝනිසෝමනසිකාරය නම් වේ. වර්තමාන කාල මානසිකත්වයෙහි දැඩි අවධානය එනම් එළඹ සිටි සිහිය වන යෝනිසෝමනසිකාරය එලෙස තවදුරටත් අඛණ්ඩව රඳවා ගැනීමටත්, තවදුරටත් ඉදිරියට පවත්වා ගැනීමටත් ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ශීල ප්‍රතිපදාවන් නොබිඳී හා නොකැඩී ප්‍රායෝගිකව අනුගමනය කල යුතුය. යෝනිසෝමනසිකාරය මගින් වර්තමාන කාලය තුල ප්‍රකෘති මානසික අවධානයට පත්වීමේ අධ්‍යාත්මික ක්‍රියාවලියට සමගාමීව ඉතා දැඩි වීර්යයෙන් නොබිඳීමෙන් ආරක්ෂා කරගත යුතුව ඇති අධි ශීල සංවරය අතීන්ද්‍රිය වූ ප්‍රඥාපාදක සම්මා දිට්ඨිය අවබෝධ වීම සඳහා පාදක වනු ඇත.

සත්ත්වයන්ගේ සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ශක්තිය ඉතා ශූක්ෂ්ම ලෙස සංවේදී වන්නේ සමස්ත ලෝකගත සත්ත්ව හා ශාකයන්හි සම්ප්‍රයුක්ත ස්ථිතික විද්‍යුත් සංඥා ශක්තින් සමඟ වන අතර සමස්ත මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ නැවත ඉපදීම හා මියැදීමේ කර්ම චක්‍ර ක්‍රියාවලියට මුලික පදනමද මෙය වනු ඇත. එනම් චිත්තානු පරිවර්තී සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ශක්තීන්හි විද්‍යාත්මක ක්‍රියාවලිය නැවත ඉපිද මියැදීමේ සන්තතික

විද්‍යාත්මක කර්ම නිර්මාණය වීමේ ස්ථිතික විද්‍යුත් සන්තතික ශක්තිය, සත්ව ලෝකයෙහි සත්ත්වයන්ගේ අඛණ්ඩ භව ගමනට හේතුව වී ඇත. අධ්‍යාත්මික ශීල සංවරයත් මානසික චිත්ත ඒකාග්‍රතාවයත් ඒහා ක්‍රියාත්මක යොනිසෝමනසිකාරය යන ත්‍රිවිධ අංශයන්හි ප්‍රායෝගිකව නොයෙදුනා වූ කිසිවෙකුට නිර්වාණය සඳහා වන අධ්‍යාත්මික නිදහස් වීමේ ප්‍රතිපදාව සඳහා සාර්ථකව යොමුවිය නොහැක. යෝනිසෝමනසිකාරය හා මධ්‍යම ප්‍රතිපදාගත ආර්ය ශීලයත් යන දෙකෙහිම එකිනෙක ප්‍රයෝගිකව යෙදීම තුලින් ප්‍රඥාව සඳහා මග ක්‍රියාත්මක වනු ඇත. පංච ශීලය පාදක වන ශීල සංවරය මගින් ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි පදනම ආරම්භ වන අතර එමගින් සාමාන්‍ය පෘතග්ජන ජීවන රටාවෙහි මනුෂ්‍ය සත්ත්වයින්ගේ මානසික, කායික, වාචසික, කර්ම නිර්මාණ ක්‍රියාවලිය මගින් සතර අපාගත ප්‍රබල දුක් ජීවිතයකට තිරිසන් ආදී සත්ත්වයකු වීමේ අකුසල් කර්ම ධර්ම අතහැරීම මෙයින් සිදුවනු ඇත. ප්‍රාථමික වශයෙන් යමෙකු තමාගේ ආත්ම පාලනය පිණිස එනම් ආත්ම සංවරය පිණිස දැඩි වීර්යයක් හා දැඩි අධිෂ්ඨානයක් ගත යුතු වන්නේ හැකි පමණ අවම ප්‍රමාණයකට භෞතික කායික ඉන්ද්‍රියන් පිනවීම අවම කර ගැනීමෙන් අපාගත කර්ම ශක්තීන්ගේ ක්ලේෂ විනාශ කරගැනීමට වන අතර එය ප්‍රධාන වශයෙන්ම අධ්‍යාත්මික කායික හා මානසික සංවරය සහිත විනයගරුක ජීවිතයක් සඳහාද හේතුව වනු ඇත.

තථාගත බුදුරජාණන් වහන්සේලා විසින් අඥාන පෘතග්ජනයින්ට නිර්වාණය සඳහා පැහැදිලි ලෙස දේශනා කර වදාල මධ්‍යම ප්‍රතිපදාගත නිර්වාණ මාර්ගය යනු අධික ලෙස කාම කර්මයන්ට අබිබැහිවීමේ කාම සැප විහරණය නම් වන කාමසුඛල්ලිකානුයෝග අන්තයෙන් හා අධික ලෙස කායික මානසික දැඩි දුක්පීඩා දීම සඳහා ඇලුනු අත්ථකිලමතානු

.යෝගය මුළුමනින්ම අතහැරීමෙන් පසුව අත්පත් වන මාර්ගය වනු ඇත. එම මධ්‍යම ප්‍රතිපදාව පංච ශීල සංවරය පාදකව මුලිකව ඇරඹෙන අතර ගිහි දස ශීලයත් පැවිදි දස ශීලයත් ත්‍රිවිධ උපසම්පදා ශීලයත් සහ තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ප්‍රතිපදා 13 ත් යන ශික්ෂා ප්‍රතිපත්තීන්ගෙන් යුක්ත වනු ඇත. සෑම පෘතග්ජන මනුෂ්‍යයෙකුම හා තිරිසන් සත්ත්වයෙකුම ඔවුනගේ භෞතික කායික, ඇස, කණ, නාසය, දිව, කායික ස්පර්ශ යන ඉන්ද්‍රිය සීමාවට විෂය වන රූප, ශබ්ද, ගන්ධ, රස හා කායික ස්පර්ශ යන විද්‍යුත් සංඥා පහේ (5) ලෞකික අවබෝධයට පමණක් සීමා වූ සත්ත්වයෝය. එම අඥාන නූගත් පෘතග්ජන මනුෂ්‍යයෝ කායික ඉන්ද්‍රිය පහේ සීමාවට කොටු වීමෙන් තිරිසන් ප්‍රේත ආදී සතර අපායේ දුක්ඛිත සත්ත්වයන් වීමට සන්තතික දුක්ඛ කර්ම ධර්මය අනුගමනය කරන මනුෂ්‍යයන් වන අතර එම පෘතග්ජනයින්ගේ ඉන්ද්‍රිය පහට සංවේදී නොවන එහෙත් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වන ලෝක විශ්වගත අධ්‍යාත්මික වූද විද්‍යාත්මකවූද ස්ථිතික විද්‍යුත්මය වූද තොරතුරු ගැන කිසිම අවබෝධයක් නොමැති අඥාන මනුෂ්‍යයෝය. එවිට එම අඥාන මනුෂ්‍යයින් තමන් උගත් අයෙකු ලෙස මානසිකව සිතීමටත් එමෙන්ම එම ඉන්ද්‍රිය පහේ සීමාවට විෂය නොවන එහෙත් විශ්ව ලෝකගතව ප්‍රබල ලෙස ක්‍රියාකාරීව පවතින විද්‍යා ක්‍රියාවලියෙහි අධ්‍යාත්මික වූද විද්‍යාත්මක වූද ස්ථිතික විද්‍යුත්මය වූද අදෘශ්‍යවූද සම්ප්‍රයුක්ත විද්‍යාත්මක ධර්මයන්හි ඇති සැටිය ඇති ලෙසින් හඳුනා ගැනීම කෙසේ කළයුතු දැයි නොදන්නා පිරිසකි. අඥාන පෘතග්ජනයින්ගේ අවිද්‍යාව ලෙසින් ක්‍රියාත්මක වන මෙය ඔවුන්ගේ විචාර බුද්ධිය නොමැතිවීම සඳහා ඉහත සඳහන් කල සිදුවීම එකම හා ප්‍රධාන සිද්ධාන්තය වීමෙන් පෘතග්ජන ලෝකයේ අඥානයින් බිහිවනු ඇත.

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් ලෝකයාට දේශනා කළ වදාළ සන්තතික විද්‍යාත්මක සත්‍යය ධර්මයන්හි

අවබෝධයට නොපැමිණීම එනම් ප්‍රඥා ධර්මාවබෝධයට නොපැමිණීම පෘතග්ජන අඥාන මනුෂ්‍යයකු වීමට හේතුව වන අතර ඒ සඳහා මූලිකවම විද්‍යාත්මක සන්තතික ධර්මයන්හි ඇති සැටිය හා ඉන් විමුක්තියට පත් වීමේ චතුරාර්ය සත්‍යය ධර්ම අවබෝධය නොමැති වීම වනු ඇත.සන්තතික විද්‍යා ධර්මයන්හි අන්තර්ගතය වන ප්‍රඥාව අනුගමනය නොකරන සාමාන්‍ය පෘතග්ජනයින් එහි ඵලයක් ලෙස එම මනුෂ්‍යයෝ තම තමන්ගේ මතු දුක් භවයන්හි ඉපදීමට හේතුව වන කර්ම චක්‍රය තහවුරු කිරීම සඳහා ඉතා දැඩි ලෙසත් ප්‍රබල ලෙසත් කායික ඉන්ද්‍රියන් සතුටු කිරීමේ මානසික තත්ත්වයට දැඩිව යොමු වී ඇත. නිර්වාණ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රබල කාම රාගයත් කාම රතියත් ස්ථාවර වූ පෘතග්ජන සන්තතික කර්ම මාර්ගය ප්‍රගුණ කිරීම යනු කායික හා මානසික ස්පර්ශ සංවේදී කර්ම මාර්ගය වන අතර ඒ තුලින් සත්ත්වයන් සතර අපායේ ඉපදීමට නියමිත කර්ම පිළියෙල කරගැනීම පිණිස යොමු වනු ඇත. මෙහි ඵලයක් ලෙස පංච උපාදානස්කන්ධය නමින් හඳුන්වන මානසික සංස්කරණගත කර්ම ශක්තීන් පිළියෙල කරගැනීම සිදු කරනුයේ මානසිකවය. මධ්‍යම ප්‍රතිපදාගත ආර්ය ශීල සංවර ප්‍රතිපත්තීන් මූලික අධ්‍යාත්මික සංවරය සඳහා පදනම වන අතර ආර්ය අෂ්ඨාංගික මාර්ගගත අධ්‍යාත්මික පිවිසුමට ඇතුලත් වීම සඳහා මූලික සුදුසුකමද වනු ඇත.

අසීමාන්තික ලෙස කාම තෘෂ්ණාව මගින් මානසික හා කායිකව දැඩිව ඉන්ද්‍රිය පිනවීමට ඇබ්බැහි වූ සෑම තිරිසන් හා මනුෂ්‍යය සත්ත්වයින්ට ඔවුන් වටා පවතින කාම සංවේදනයට විෂය වන පංචවිධ සංඥා රූපයන්හි මානසික සංස්කරණය මඟින් කර්ම නිර්මාණය කරගනු ඇත. එවිට ඔවුන් විසින් තම තමන්ගේ මුළු මහත් දෛනික ජීවිත චක්‍රය සඳහා එම රැස් කරගත් කර්ම ශක්තිය උපයෝගී කරගෙන දෛනික ජීවිතය ගත කරණු ඇත. නැවත ඉපිද මියැදීමේ සන්තතික කර්ම

ක්‍රියාවලිය සඳහා මූලිකවම අවිද්‍යා සහගත ත්‍රිවිධ ක්ලේෂ මූලයන් හේතුව වන අතර සාමාන්‍ය පෘතග්ජනයින්ගේ එදිනෙදා ක්‍රියාකාරී දෛනික ජීවිතය මුළුමනින්ම ඒ මත රඳා පවතිනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රතිපත්ති පූර්ණය නොකිරීමෙන් දැඩි ලෙස කාම තෘෂ්ණාවට ඇබ්බැහි වූ පෘතග්ජනයින්ගේ එම කාමයන්හි ඇලීම සීමා කිරීමට ආර්ය මාර්ගගත ශීල ප්‍රතිපත්තීන් ප්‍රධාන හේතුව වන අතර එමගින් මනුෂ්‍යයන් අධ්‍යාත්මික සංවරය සඳහා යොමු කරවනු ඇත. එමගින් මනුෂ්‍යයන්ගේ ප්‍රබල වන අධ්‍යාත්මික පාලනය ප්‍රභල වූ අධ්‍යාත්මගත බලයක් වීමෙන් නිර්වාණ ක්‍රියාවලිය සඳහා පදනම ගොඩනැගීමෙන් කුසල් ධර්මයන්හි අභිවෘද්ධිය ක්‍රියාත්මක වනු ඇත. යම්තාක් පෘතග්ජන මනුෂ්‍යයන් තම තමන් අනුගමනය කරන කර්ම චක්‍රයට අනුගත වූ ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන් සහිත ලෞකික ජීවන රටාව යනු මධ්‍යම ප්‍රතිපදාගත ආර්ය ශීලයන්ගෙන් ඉවත් වූ මාර්ගයක් වන අතර එමගින් එම පෘතග්ජන මනුෂ්‍යයන්ගේ කායික මානසික කර්ම ක්‍රියාවලිය තිරිසන් සත්ත්වයන් සතු කායික මානසික ක්‍රියාවලියට මුළුමනින්ම සමාන වන අතර එය මූලික හේතුව වීමෙන් එම අඥාන මනුෂ්‍යයන්ට ඔවුන්ගේ මරණින් පසු තිරිසන් ලෝකයෙහි පුනර්භවය සඳහා සෘජුවම යොමු වනු ඇත.

පෘතග්ජන මනුෂ්‍යයන් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන්ට යොමු වීම තුලින් කායික ඉන්ද්‍රියන් පිනවීමට ඇබ්බැහි වීම ප්‍රබල ලෙස දියුණු වන අතර ඒ හා සමාන ප්‍රවනතාවයකින් ඔවුනට වෛරයත්, සතුරු බවත්, ඊර්ෂාවත්, ක්‍රෝධයත්, හිංසනයත් ලෙසින් වන අකුසල් සහගත සම්ප්‍රයුක්ත මානසික ක්ලේෂ ධර්මයන් සෘජුවම ඔවුන් තිරිසන් ප්‍රේත ආදී කොට ඇත්තාවූ සතර අපායේ ඉපදීමට යොමුකරවනු ඇත. ප්‍රබල වූ දැඩි කාම තෘෂ්ණා මාර්ගයට දැඩි ලෙස යොමුවන එම මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ පදනම් ජීවි ක්‍රියාවලියේ මූලධර්මය මානසික දුක්ඛ කර්ම ක්‍රියාවලියට

හේතුව වන්නේ දුක්ඛ ධර්ම මානසිකව පිළියෙල කර ගන්නා කර්ම ධර්මයක් නිසා වන අතර එය මුළුමනින්ම සුදුසු වන්නේ දැඩි දුක් විඳීමට නියමිත සතර අපායේ උප්පත්තිය ලැබීම පිණිසය. දැඩි කාමරාගය ප්‍රගුණ කිරීමට හේතුව වන ලෞකික කර්ම ධර්ම නිර්මාණය වීමේ සන්තතික ක්‍රියාවලිය එම සත්ත්වයන් කෙරෙහි සමාන ලෙසින් වෛරී ධර්මයන්ට යොමු වීම කෙරෙහි ද යොමු වනු ඇත. වෛරී ධර්මයන්හි දියුණු වීම ලෝභී ධර්මයන්හි දියුණු වීම සඳහා ප්‍රතිවිරුද්ධ හේතුව වනු ඇත. මෙම ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය අශ්‍රැතවත් පෘතග්ජනයින්ට නැවත මනුෂ්‍යය ලොවෙහි ජන්මලාබය ලැබීමට නොහැකි වන අතර තිරිසන් ප්‍රේත ආදී දුගති භවයන්හි පමණක් පහසුවෙන් ඉපදිය හැකිවනු ඇත. ආර්ය මාර්ගගත ශිල ප්‍රතිපදාවන්හි නොයෙදෙන සමස්ත අශ්‍රැතවත් පෘතග්ජන මනුෂ්‍යයෝ නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියට අනිවාර්යයෙන්ම මුහුණ දිය යුතු වන අතර දේව මනුෂ්‍යය බ්‍රහ්ම ආදී සුගති ලෝකයන්හි ඉපදීම ඔවුනට ඉතාමත් දුෂ්කර වනු ඇත. නමුත් එය එපමණටම ඔවුනට පහසු වන්නේ තිරිසන් ප්‍රේත ආදී දුගති භවයන්හි සත්ත්වයකු වශයෙන් නැවත ඉපදීමට ඇති හැකියාව සඳහා ය.

අවිද්‍යාව තුලින් තම තමන්ගේ ජීවන රටාව ක්‍රියාත්මක කිරීම නිසා සංසාර කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීමට ඔවුනට අපහසු වන අතර සතර අපාගත ප්‍රබල දුක් සහිත භවයන්හි නියත ලෙසම ඉපදීමට නියමිත වන අතර එබැවින් එම අශ්‍රැතවත් මනුෂ්‍යයන් සැබැවින්ම මෙලොව දැඩි අවදානම් සහගත ජීවිතයක් ගත කරනු ඇත.

නිර්වාණ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු ආර්ය ශීල ප්‍රතිපදාගත අධ්‍යාත්මික වූ ශික්ෂණ මාර්ගයක් වන අතර එමගින් එම ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රධාන අරමුණ වනුයේ භයානක වූ සසරෙහි තිරිසන් ප්‍රේත ආදී වූ දුක්ඛිත

භවයන්හි මනුෂ්‍යයන්ට ඉපදීමට ඇති ප්‍රබල ඉඩකඩ පිළිබඳව ඇති අවධානමෙන් ඔවුන් ගලවා ගැනීමය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආර්ය ශීල සංවර ප්‍රතිපදාව මුළුමණින්ම භව සංඛ්‍යාත දුක්ඛ ධර්මයන්ගේ නිරෝධය පිණිස මූලික අවශ්‍යතාවය වන ආත්ම පාලනය පදනම් වීමේ නිර්වාණය පාදක වන සන්තතික මානසික කර්ම ක්‍රියාවලියෙහි නිරෝධය පිණිස වනු ඇත. සියළු ලෝකවාසී මනුෂ්‍යය තිරිසන් සතුන් තමන්ට ආවේණික ජීවි පදනමක් මත යැපෙමින් විවිධාකාර ලෙසින් ඔවුනොවුන්ගේ පැවැත්මේ චර්යාවන් ගොඩනගා ගෙන ඇත.

ස්වභාවිකව සියළුම සත්ත්වයින් විවිධ වර්ගීකරණයට වෙන්වීමෙන් අතිවිශාල සත්ත්ව වර්ගීකරණයක් බිහිව ඇති අතර ඒ සඳහා ඒ ඒ සත්ත්ව වර්ගීකරණයන්ට ආවේණික ලක්ෂණ පදනම් වන අතර විශ්ව ලෝකගත සත්ත්වයන්ගේ විවිධත්වයට මෙය හේතු වී ඇත. සමස්ත සත්ත්ව ලෝකයට සත්ත්ව වර්ගයාගේ සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලියට පදනම් වන ස්ථිතික විද්‍යුත්මය චිත්ත ශක්තීන්ගේ අධ්‍යාත්මික ධර්ම ක්‍රියාවලිය පාරිසරික ස්ථිතික විද්‍යුත්මය රූප, ශබ්ද, ගන්ධ ආදී ලෙසින් වන සංඥාවන්ට සංවේදී වීමට අනුවර්තනය වී ඇති විද්‍යුත් ආරෝපිත ශක්ති විශේෂයක් වන අතර එමඟින් නිර්මාණය වන සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික සන්තතික කර්ම ක්‍රියාවලිය විශ්ව ලෝකගත 31 ක් තලගත මනුෂ්‍යය තිරිසන් ආදී වන සියළුම සත්ත්වයන් කෙරෙහි ක්‍රියාකාරී වන පොදු විද්‍යාත්මක ධර්මතාවය වනු ඇත. තිරිසන් මනුෂ්‍යය සත්ත්වයන්ගේ ජීවී ක්‍රියාවලිය සඳහා සැලසුම් සහගතවී ඇති ඉන්ද්‍රිය 6 ක් (හයක්) ඇති අතර එම ඉන්ද්‍රියන්ගෙන් 5 ක් කායික ඉන්ද්‍රින් වන අතර "මනස" නම් වන ඉන්ද්‍රිය සම්ප්‍රයුක්ත චිත්තානු පරිවර්තී ස්ථිතික විද්‍යුත්මය "මනින්ද්‍රිය" වන අතර සියළුම සත්ත්වයින්ගේ සන්තතික කර්ම ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය එම ශක්ති ඉන්ද්‍රිය වන අතර සමස්ත සත්ත්ව

ලෝකයේ සත්ත්වයින්ගේ නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය තුල නැවත බිහිවිය යුතුවන නවතම සත්ත්වයාගේ විද්‍යුත් කායික සැලැස්ම එනම් මනෝකාය නම්වන සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික විද්‍යුත් සැලැස්මෙහි කේන්ද්‍රස්ථානයද වනු ඇත. මෙම ජීවිතීන්ද්‍රිය යනු අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත්මය මනින්ද්‍රියෙහි සම්ප්‍රයුක්තගත විද්‍යුත්මයවූ බිහිවිය යුතුව ඇති සත්ත්වයාගේ කායික විද්‍යුත් සැලැස්මෙහි ප්‍රභවය වනු ඇත. මෙම ජීවිතීන්ද්‍රිය සත්ත්වයින්ගේ කර්ම ක්‍රියාවලිය සඳහා තහවුරු වූ මානසික ශක්ති සංස්කරණයට පාදක වීමෙන් සම්ප්‍රයුක්ත වන අධ්‍යාත්මික කර්මජ සත්ත්වයාගේ භෞතික කායික සැලැස්ම පිළියෙල කිරීම සඳහා යොමු වනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රධාන හා මූලික ඇරඹුම වන පංච ශීලය අනුගමනය කිරීමත් ආරක්ෂා කිරීමත් කරන මනුෂ්‍යයින් සුගති ලෝක සඳහාම සුදුසුකම ලබාගන්නා අතරම ඒ නිසා ඔවුන්ගේ කර්ම සංඛ්‍යාත මානසික සංස්කරණය අවිද්‍යාව නිසා පිළියෙල වන තිරිසන් සතුන්ගේ මානසික සංස්කරණයට සමාන නොවීමෙන් ආරක්ෂා වනු ඇත. ආර්ය මාර්ගගත ශික්ෂාවන්හි යෙදෙන යමෙකුට සිය අධ්‍යාත්මය පාලනය කිරීමට හැකියාව ලැබෙන අතර එය තිරිසන් සත්ත්වයන් කෙරෙහි ක්‍රියාත්මක වන මානසික කර්ම සැලැස්මට සමාන නොවීම පිණිස වනු ඇත. ශීල සංවරය සහිත ආර්ය මාර්ගය තුලින් මනුෂ්‍යයන්ගේ මානසික හැසිරීමෙහි පාලනයත් ආරක්ෂාවීමත් මඟින් තිරිසන් සතුන්ගේ මානසික සංස්කරණයට සමාන නොවීම සඳහා යොමුවන අතර එහි ඵලයක් වශයෙන් එවැනි පංචශීල රකිනා ප්‍රඥාවන්තයින්ට දේව, මනුෂ්‍යය, බ්‍රහ්ම ආදී වන සුගතීන්හි ඉපදීමට හේතුව පිළියෙල වනු ඇත.

සත්ත්වයින්ගේ ලෞකික අධ්‍යාත්මික කර්ම ශක්තිය නිර්මාණය වන ප්‍රධාන මානසික ධර්ම ත්‍රිත්වය වන ලෝභ, ද්වේශ, මෝහ පාදක ත්‍රිවිධ දෘෂ්ඨීන්ගේ කර්ම සම්භවය වන මානසික ක්‍රියාවලිය අකර්මණ්‍ය කිරීමට ආර්ය අෂ්ඨාංගික

මාර්ග ශීල සංවර ප්‍රතිපදාව හේතුව වනු ඇත. පංච ශීලය මූලික පදනම වීමෙන් ක්‍රියාත්මක වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය මනුෂ්‍යයන්ට මරණින් මතු සතර අපායෙහි තිරිසන් ප්‍රේත උත්පත්තියකට යෑමේ භයානක ප්‍රතිසන්ධි ක්‍රියාවලියෙන් ඔවුන් ආරක්ෂා වීම පිණිස හේතුව වනු ඇත. පංච ශීලය නොරකින සමස්ත පෘතග්ජන මනුෂ්‍යයෝ සියල්ලෝම නිසැකයෙන්ම මනුෂ්‍යය භවයෙන් ඉවත් වූ වහාම අන්‍ය වන ප්‍රබල දුක් සහිත භවයන්හි තිරිසන් සත්ත්වයන් ලෙසත් ප්‍රේත ලොවෙහි දැඩි දුක් සහිත ප්‍රේතයන් ලෙසත් ඉපදීමට හේතුව වනු ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි අධ්‍යාත්මික ක්‍රියාවලිය අධ්‍යාත්මික හික්මීම සහිත ආත්ම දමනය වීම තුලින් මනුෂ්‍යයන්ගේ චිත්ත හා මානසික ශක්තීන්ගේ ප්‍රබල පිරිසිදු කිරීමකට හේතුව වීමෙන් චිත්ත සන්තතියෙහි කර්ම නිරෝධය එනම් නිවන කෙරෙහි යොමු කර වනු ඇත.

දුක්ඛ භවයන්හි ප්‍රතිසන්ධි වීමට අනිවාර්යෙන්ම හේතුව වන පංචවිධ කාම කර්ම ධර්මතාවයන්ගෙන් නිදහස් වීමට යොමු වීම සඳහා අතහැරිය යුතු පංචවිධ කර්මයන්හි පංච ශීලය සාමාන්‍ය පෘතග්ජන ජීවන රටාවෙහි මූලික පදනම විය යුතු වන අතර මුළුමනින්ම ප්‍රඥාවන්තයින්ගේ අවසාන අධ්‍යාත්මික අත්දැකීම වන ප්‍රඥාව කෙරෙහි යොමු වීමටද නියමිත වන, එමෙන්ම නිර්වාණයට ප්‍රවේශය පිණිසද පවතිනු ඇත. නිර්වාණය කෙරෙහි උත්සාහවන්ත වන සත්පුරුෂ යමෙකුට ප්‍රාථමිකව අවබෝධ කර ගැනීමෙන් අතහැරිය යුතුව පවතින පංචවිධ කාම කර්මයන්ගේ අවබෝධයත් වැලකීමත් ප්‍රායෝගික වශයෙන් අඛණ්ඩව කල යුතුව ඇත. නිර්වාණය හමු වීමට යොමුව පවතින ආර්ය මාර්ගයෙහි ප්‍රාථමික සුදුසුකම මෙය වන අතර එවැනි මනුෂ්‍යයන්ට පංචශීල රැකීමේ කුසල විපාක ඵලයක් ලෙස වටිනා ප්‍රතිසන්ධියක් සහතික වීම වශයෙන් සුගති භූමියක ජන්මලාබයද ලැබිය හැක.

චිත්ත ධර්මයන්හි ස්වභාවික ගුණාත්මක බව වනුයේ සත්ත්වයින්ගේ භෞතික කාය ඉන්ද්‍රියන්හි සංස්කාරක ද්‍රව්‍යයන්ගේ පංචවිධ සංඥා රූප ස්පර්ශය පිළිබඳ සංවේදනයට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වන අතර එහි විද්‍යාත්මක මූලධර්මය සමස්ත මනුෂ්‍යය තිරිසන් සත්ත්වයාගේ පොදු චිත්තජ කර්ම ධර්මය වනු ඇත. මෙම විද්‍යාත්මක චිත්ත ශක්ති ක්‍රියාවලියට අනුව සමස්ත තිරිසන් මනුෂ්‍යය සත්ත්වයෝ සියල්ලෝම ඔවුනොවුන්ගේ මානසික ස්පර්ෂයන්හි දැඩි ලෙස ඇලීමෙන් ඔවුන්ගේ අධ්‍යාත්මික වූද විද්‍යුත්මය වූද විද්‍යාත්මක වූද චිත්ත ධර්ම ක්‍රියාවලියේ විද්‍යාත්මක බවෙහි නොදැනීම අවිද්‍යාව බවට පත්වනු ඇත. මෙහිදී විද්‍යාත්මක වූ චිත්තජ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අධ්‍යාත්මික ක්‍රියාවලිය එහි රූප සංඥාවන්ගේ ස්පර්ශග්‍රාහී මානසික සංයෝජන කර්ම ධර්මයට හේතුව වීමෙන් හේතුඵල ධර්මයට අනුගත වීම තුලින් සමාන වූද ප්‍රතිවිරුද්ධ වූද විද්‍යාත්මක කර්ම ක්‍රියාවලියට යොමුවනු ඇත. මනුෂ්‍යයන් කෙරෙහි පවතින මෙම අනතුර හේතුවෙන් තථාගත බුදුරජාණන් වහන්සේලා විසින් අනුමත කර දේශනා කල වදාල අධ්‍යාත්මිකව නිදහස් වීමේ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය සන්තතික දුක්ඛ කර්ම පාදක මනුෂ්‍යයින්ගේ චිත්ත කර්ම සන්තතියේ නිරෝධනය පිණිස යොමු කරවනු ලැබ ඇත. මේ කාරණයෙහි දී ආර්ය ශීල සංවරය එනම් අධ්‍යාත්මික ශික්ෂණ මාර්ගය මධ්‍යම ප්‍රතිපදාව වන අතර ලොවෙහි ක්‍රියාත්මක වන එකම නිර්වාණ මාර්ගය මෙය පමණක්ම වන අතර ප්‍රඥාවන්තයින්ටම පමණක් අනුගමනය කිරීමට හා අවබෝධකර ගැනීමට හැකිවන ලෝක ස්වභාවයේ ක්‍රියාත්මක හේතුඵල ධර්ම සන්තතිය පිළිබඳව සිහියට පත්වීම සඳහාද යොමුවනු ඇත. පංච ශීලය පාදක අධ්‍යාත්මික ශිල සංවරයෙහි නොයෙදෙන පෘතග්ජන මනුෂ්‍යයන්ට එහි මූලධර්මයන්ගේ පදනම මුළුමනින්ම දුගති භවයන්හි ඉපදීමේ කර්ම ක්‍රියාවලියට විෂය වනු ඇත. ආර්ය ශීල සංවරය ප්‍රාරම්භකව වන පංච ශීලය ආරක්ෂා කරන්නාවූ

සත්පුරුෂයින් කුසල කර්ම ප්‍රභවගත කුසල මානසික කර්ම සංස්කරණ ක්‍රියාවලිය තුලින් නිරය - තිරිසන් - ප්‍රේත ආදී කොට ඇත්තා වූ සතර අපායට සුදුසු කර්ම පිළියෙල නොකරනු ඇත.

ප්‍රධාන අධ්‍යාත්මික ශික්ෂණ ක්‍රියාවලිය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ආරම්භක පියවර වන පංච ශීලගත සංවර ශීලය යමෙකුගේ අධ්‍යාත්ම සංවරයත් පාලනයත් සඳහා විෂය වන ප්‍රතිපදාවකි. අවිද්‍යාව තුලින් පංචවිධ කාම ස්පර්ෂයන්ට යොමුවීමෙන් පිළියෙල වන කර්ම දුක්ඛ ප්‍රභවගත මානසික සංස්කරණයන් වන අතර එම කර්ම සැලැස්ම තිරිසන් සත්ත්වයින්ගේ මානසික කර්ම සංස්කරණයන් හා සමානවීම වැලැක්වීම පිණිස මනුෂ්‍යයෙකු විසින් අනුගමනය කළයුතුව ඇති අධ්‍යාත්මික ධර්ම ක්‍රියාවලිය මෙය වනු ඇත. සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයෙකුගේ කර්ම ප්‍රභවගත මානසික සංස්කරණ ව්‍යුහය පැහැදිලි ලෙස තිරිසන් සත්ත්වයින්ගේ සන්තතික මානසික කර්ම ක්‍රියාවලිය හා සම්පූර්ණයෙන්ම සමාන වන අතර ඔවුන්ගේ පුනර්භවය තිරිසන් ලෝකය මුලික වීමෙන් සිදුවනු ඇත. මෙම අධ්‍යාත්මික සන්තතික කර්ම ක්‍රියාවලිය පිළිබඳ කිසිවෙකුට පහසුවෙන් අවබෝධ කරගත නොහැකි වීම මනුෂ්‍යයන්ගේ නැවත සතර අපාගතව ඉපදීමේ අඛණ්ඩ ක්‍රියාවලියට මුලික පදනම වනු ඇත. තිරිසන් සත්ත්වයින් විසින් පිළියෙළ කරගන්නා සන්තතික මානසික කර්ම ක්‍රියාවලියට මනුෂ්‍යයින් විසින් පිළියෙල කරගන්නා මානසික කර්ම ක්‍රියාවලිය හා සමාන වීම වැලැක්වීම පිණිස ඔවුන් ඉන් මුදාගෙන සුගති ලෝක ප්‍රතිසන්ධිගත මානසික කර්ම ක්‍රියාවලියකට යොමු කර ගැනීමට ප්‍රඥාවන්තයෙකුට පමණක් අවබෝධ කරගත හැකි එකම මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය වනු ඇත.

පංචශීල ශික්ෂණය කෙරෙන් ඉවත් වූ අඥාන පෘතග්ජන මනුෂ්‍යයන් තමා විසින් එසේ පිළියෙල කරගත්

මානසික කර්ම ශක්තීන් තිරිසන් සතුන් විසින් පිළියෙළ කරන තිරිසන් මානසික සංස්කාරයන් සමඟ මුළුමනින්ම සමාන වන අතර නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය තුලින් සමාන මානසික සංස්කරණයට හිමි නියමිත තිරිසන් භවයට යා යුතු වන අතර එම කර්මයන්ගේ දැඩි බවට අදාලව තවදුරටත් දුක් වේදනා ප්‍රබල ලෙස දැරීමට ප්‍රේතලෝක ගත විය යුතුව ඇත. පෘතග්ජන මිනිසුන් ඔවුනගේ මරණින් පසු දිව්‍ය ලෝකයේ හෝ බ්‍රහ්ම ලෝකයේ හෝ නැවත ඉපදීම සිදු වෙතැයි යමෙකු විශ්වාස කරයි නම් එය කිසි දිනක සිදු නොවනු ඇත. එනම් ලෝකයෙහි ජීවත් වන ආර්ය මාර්ගගත ශීල සංවරය නොරකින සියළුම මනුෂ්‍යයෝ නිසැකවම නිරය, තිරිසන්, ප්‍රේත, අසුර වන සතර අපායේ අනිවාර්යෙන් උපත ලබනු ඇත.

ඉහත ලෙසින් සිදුවන විද්‍යාත්මක කර්ම ක්‍රියාවලියට අදාලව විශ්ව ලෝකගත සන්තතික ධර්මයන්ගේ ඇති සැටිය නොදන්නා අඥාන පෘතග්ජනයින් පංච ශීලය නොරකින අතර නියත ලෙසින්ම ඔවුන්ට නැවත මනුෂ්‍යය ලොවෙහි ඉපදීමට පහසු නොවන අතර දිව්‍ය, බ්‍රහ්ම ස්වර්ග රාජ්‍යයන්හිද කිසි ලෙසක පහසුවෙන් ඉපදිය නොහැක. ඔවුන් නිසැකවම මධ්‍යම ප්‍රතිපදාව නොරකින්නන් වශයෙන් නැවත උපතක් නැවත මරණයත් ලෙසින් ක්‍රියාත්මක වන කර්ම චක්‍ර ක්‍රියාවලිය නතර නොකළ පිරිසක් වන අතර දුක්ඛ සන්තතික චිත්ත ධර්මයන්ගේ මානසික කායික දුක්ඛ ධර්මයන්ගෙන් නිදහස් නොවූවා මෙන්ම සන්තතික විද්‍යා ධර්ම ක්‍රියාවලිය මගින් කර්ම චක්‍ර සන්තතියෙහි අඛණ්ඩ බවට අනවබෝධයෙන් යොමුව ඇත. අවසාන වශයෙන් මනුෂ්‍යය ලෝකයෙහි මනුෂ්‍යයන් ප්‍රධාන ලෙසම ඔවුනට ඔවුනගේ මරණින් පසු නැවත මනුෂ්‍යයන් වීමේ අවස්ථාව අහිමි කර ගන්නා අතර තිරිසන් ප්‍රේත අපායේ නියත ප්‍රතිසන්ධිය සඳහා ප්‍රතිසන්ධීකරණය තුලින් නැවත ඉපදීමත් නැවත මියැදීමත් සඳහා යොමු වනු ඇත.

ආර්ය අෂ්ඨාංගික මාර්ගගතව අනුගමනය කල යුතුවන සප්ත විශුද්ධීන් තුලින් නිර්වාණාවබෝධය සාක්ෂාත් කරගත හැකිවන ශීල ප්‍රතිපදාව ගිහි සහ පැවිදි ලෙසින් ක්‍රියාත්මක කර වීමට මනුෂ්‍යයන්ගේ කායික මානසික විශුද්ධිය සඳහා විශේෂයෙන් පිලියෙලවී ඇත. පංච ශීලය පාදක ශික්ෂා ප්‍රතිපදාව ලෙසින් ඇරඹෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තෙලෙස් වැදෑරුම් (13) තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ප්‍රතිපදාව දක්වා සීමා වී ඇත. ඉහත සඳහන් කල ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ප්‍රතිපත්තීන් සියල්ලම ප්‍රායෝගිකව අනුගමනය කර සම්පූර්ණ නොකරන කිසිවෙකුට අධ්‍යාත්මික විශ්ව අවබෝධය වන ප්‍රඥාවබෝධය අත්පත් නොවන අතර සන්තතික කර්ම පැවැත්මෙන්ද ඉවත්විය නොහැක.

ලොවෙහි ක්‍රියාකාරි සත්‍යය වූ පරම විමුක්තිය ශීල සංවරය මතමත් කර්ම සිත මතමත් මතිමතාන්තර මතමත් එලෙසම විවිධ දෘෂ්ඨීන් මතමත් ක්‍රියාත්මක නොවනු ඇත. නමුත් මුළුමනින්ම අත්හරින ලද කායික හා මානසික ක්‍රියාකාරිත්වයෙහි විරාගය ප්‍රහාණය හා නිරෝධය මත පමණක් සත්ත්වයාගේ සන්තතික කර්ම පැවැත්මෙහි පරම සත්‍යාවබෝධය ක්‍රියාත්මක වනු ඇත.

නිර්වාණාවබෝධය සඳහා පදනම් වන හා ක්‍රියාත්මක කල යුතු කායික මානසික විශුද්ධියට පත් වීමේ විශුද්ධි මාර්ගය පියවර 07ක් අනුගමනය කිරීම තුලින් සංසාර දුක්ඛ කර්ම සන්තතියෙන් නිදහස් විමට බලාපොරොත්තු වන ප්‍රඥාවන්ත සත්පුරුෂයකු විසින් සම්පූර්ණ කල යුතුව ඇත.

1. ශීල විශුද්ධිය.
2. චිත්ත විශුද්ධිය, එම අරමුණෙහි සාක්ෂාත්කරණය.
3. දිට්ඨි විශුද්ධිය, එම අරමුණෙහි සාක්ෂාත්කරණය.
4. කංකාවිතරණ විශුද්ධිය, එම අරමුණෙහි සාක්ෂාත් කරණය.

5. මග්ගා මග්ග ඥාණ දර්ශන විශුද්ධිය . එම අරමුණෙහි සාක්ෂාත් කරණය
6. පටිපදා ඥාණ දර්ශන විශුද්ධිය, එම අරමුණෙහි සාක්ෂාත්කරණය (සෝවාන් මාර්ග ඥාණය පහල වීම)
7. ඥාණ දර්ශන විශුද්ධිය, ලෝකෝත්තර ආර්ය මාර්ගය කෙරෙහි පවතින මාර්ගාවබෝධයේ සිහිනුවණ (සෝවාන් ඵල ඥාණය පහල වීම)

භෞතික කාය ශරීරය පරිහරණය කිරීම මගින් සත්ත්වයන් විසින් ත්‍රිවිධ ක්ලේෂයන් පාදක කරගත් මානසික සංස්කරණය වන සන්තතික අධ්‍යාත්මික කර්ම නිර්මාණය කිරීම තහවුරු කරගනු ඇත. එවිට ඔවුන්ගේ අධ්‍යාත්මික බලය එනම් මානසික සංස්කෘත කර්ම ශක්තීන් භෞතික කය සමග ස්පර්ශ වීමෙන් ජීවන ක්‍රියාවලියේ පැවැත්ම සිදුවනු ඇත. කිසිවෙකුට ලෙහෙසියෙන් අවබෝධ කරගත නොහැකි මෙම විද්‍යාත්මක හා අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලිය ලෝක සන්තතික විද්‍යා ක්‍රියාවලියක් වන අතර හේතුඵල නීතියට අනුව යමෙකුට තමන් මනුෂ්‍යයකු වීමට සන්තතික කර්ම ධර්මය කෙසේ පිළියෙල වූයේ දැයි අවබෝධ කරගත නොහැකි වනු ඇත. ආශ්වාස ප්‍රශ්වාස භාවනා ක්‍රියාවලියත් මෛත්‍රී සහගත මානසික ඒකාග්‍රතාවයත් එනම් මෛත්‍රී භාවනාවත් විදර්ශනාමය සම්මා සමාධිය තුලින් දුක්ඛ සංඛ්‍යාත සන්තතික කර්මයන්හි අධ්‍යාත්මික භව නිරෝධනය සිදු කල යුතුව ඇත. භෞතික කාය ශරීරය ආර්ය සංවර ශීලය මගින් පාලනය කිරීමත් එය මෙහෙයවීම සඳහා මධ්‍යම ප්‍රතිපදාවට අනුගතව ඇති සියළුම විනය සංවර ශීලයන්හි ගැඹුරිනුත් අඛණ්ඩවත් යෙදීමත් ප්‍රායෝගිකව කරගත යුතු වන ආර්ය අෂ්ඨාංගික මාර්ග ගත කායික අත්දැකීම වනු ඇත. චිත්ත සන්තතික කර්ම ධර්මයෙන් නිදහස් වීම අරමුණු කර ගැනීමට අවබෝධ කරගත යුතු ධර්මය මුළුමනින්ම රඳා පවතින්නේ ශීල සංවරය මගින් පාලනය කරන ලද කායික අත්දැකීම් මත වන අතර එම අත්දැකීම් දෙකෙහිම ප්‍රායෝගිකව යෙදීමෙන් පමණක්

ප්‍රඥාවන්තයෙකු සිය අධ්‍යාත්මික අභිවෘද්ධිය සම්පූර්ණ කරගත යුතුව ඇත.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුලින් අධ්‍යාත්මික කර්ම මාර්ගයෙන් නිදහස් වීමට බලාපොරොත්තු වන යමෙකු මෙම අධ්‍යාත්මික විමුක්ති මාර්ගයෙහි කායික අත්දැකීම් සහ අධ්‍යාත්මික අත්දැකීම් යන දෙඅංශයෙහිම තුලනාත්මකව ප්‍රායෝගිකව යෙදීම මගින් දුක්ඛ සන්තතික කර්ම ධර්මයෙන් නිදහස් වීම සඳහා වන අවසාන ඵලය ලෙසින් නිර්වාණය අත්පත් කරගත යුතුව ඇත.

## බුදුදහමේ ඉගැන්වෙන මූලධර්මය

*ආත්මාර්ථකාමීත්වය හා තෘෂ්ණාවෙන් ඉවත්වීම*
*තුලින් විමුක්තියට පත්වීමෙන් අත්පත්කරගත යුතුවන*
*මෘදු බව ශාන්ත බව මෛත්‍රී කරුණා බව යනු ශ්‍රේෂ්ඨ*
*වූ පෙරදිග බුදුදහමෙහි මූලධර්ම වනු ඇත.*

ඊ.ඒ.බර්ට්

(**"The Compassionate Buddha"** නැමති කෘතියෙනි)

## 3.1.5 ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ශීල ප්‍රතිපත්තීන්

1. සම්මා දිට්ඨි
2. සම්මා සංකප්ප

} ප්‍රඥා

3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීව

} ශීල → ගිහි / පැවිදි


6. සම්මා වායාම
7. සම්මා සති
8. සම්මා සමාධි

} සමාධි


ගිහි →
- පංච ශීලය
- අෂ්ඨාංගික ශීලය (සතර පෝයට සමාදන් වන)
- ආජීව අෂ්ඨාංග ශීලය
- ගිහි දශ ශීලය

පැවිදි →
- සාමණේර දශ ශීලය
- උපසම්පදා ශීලය
- තෙලෙස් (13) වැදෑරුම් තාපස ශ්‍රමණ යෝගාවචර (ධූතාංග) ප්‍රතිපදාව


| | | | |
|---|---|---|---|
| 1. විසිතුන් වැදෑරුම් ලෙසින් වන පාංශුකූල රෙදි කැබලි වලින් පිලියෙල කරගත් කඩ කැපූ චීවර පරිහරණය කිරීමේ ප්‍රතිපදාව (සුසානභූමි මළමිණි වලින් ගත් පාංශුකූල රෙදි) (පාංශුකූලිකාංගය) | 4. පිණ්ඩාහාර දානය පාත්‍රයේ පමණක් වැලදීම (දානය වැලදිමට පිඟන් පාවිච්චි නොකිරීම) (පත්තපිංඩිකාංගය) | 7. ඒකාසනිකාංගය මගින් එක දාන වේල වැලඳු පසු අමතර කිසිදු ආහාරයක් වැලදීමට නොගැනීම. (ඛලුකපච්චාභත්තිකාංග) | 10. මිනිස් වාසයෙන් දුරස්ව පිහිටි සුසාන භූමියක් ආශ්‍රිතව කුටියක් සාදාගෙන වැඩ සිටීම. (සොසානිකාංගය) |
| 2. එවැනි පාංශුකූල චීවර 3ක් පමක් පරිහරණය කිරීමේ ප්‍රතිපදාව<br>* අඳනය<br>* තනිපට චීවරය<br>* දෙපට චීවරය<br>(තෙච්වරිකාංගය) | 5. ගෙයක් හැර ගෙයක් ලෙසින් පිඬු පිණිස යාම (ගෙවල් අතහැර නොයාම) (සපදානචාරිකාංගය) | 8. මිනිස් වාසයෙන් තොරව වනතගව සිටීම. (ආරණ්‍යයිකාංගය) | 11. කිසිදු සෙවනක් නොමැතිව වැඩ සිටීම (රුක්ෂයන්හි සෙවණ යට හෝ ලෙනක හෝ අවාසයක සෙවණ යට නොසිට අහසට විවෘතව වැඩ සිටීම. (අබ්බෝකාසිකාංගය) |
| 3. පාත්‍රය රැගෙන ගෙන්ගෙට ගොස් පිණ්ඩාහාර ලබා ගැනීමේ ප්‍රතිපදාව (පිණ්ඩපාතිකාංගය) | 6. පිණ්ඩපාත දානය දිනකට එක වරක් පමණක් ගැනීම.(උදෑසන හා රාත්‍රී ආහාර වේල් දෙක අතහැරීම. (ඒකාසනිකාංගය) | 9. වනයක රුකක් මුල කුටියක් සාදාගෙන වැඩ සිටීම (රුක්ඛමූලිකාංගය) | 12. දායකයින් විසින් පිලියෙල කර දුන් ගල්-ලෙනක කුටියක හුද-කලාව වැඩ සිටීම. (යථාසත්තනිකාංගය) |
| | | | 13. සිටගෙන, හිඳගෙන හා සක්මන් කරමින් යන ත්‍රිවිධ ඉරියව් පමණක් භාවිතා කර භාවනා කිරීම නිදා ගැනීමේ ඉරියව්වට කිසි විටෙක නොපැමිනීම. (නෙස්සජ්ජිකාංගය) |


රූප අංක 136
අධිශිල සංවරය සඳහා පුහුණු වීම
මූලික මිනිස් අවශ්‍යතාවයන් පරිහරණය කිරීම සඳහා වන පදනම් ශීලයන්හි මෙනෙහි කිරීම * පිණ්ඩාහාර * නිවාස (ශූන්‍යාගාර) * වස්ත්‍ර (චීවර) * බෙහෙත් (ගිලන්පස) (ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය)
පැවිදි ජීවිකාව පැවැත්වීම උපසම්පදා හා ධූතාංග ශීලය පාදකව සිදු කිරීම අරමුණු වන ශීල හා ප්‍රතිපදාවන් අනුගමනය කිරීම. (ආජීවපාරිශුද්ධ ශීලය)
ලෝභ ද්වේෂ මෝහ ත්‍රිවිධ ක්ලේෂයන් ගෙනුත් කායිකව සිදුවන මානසිකවද සිදුවන එම ත්‍රිවිධ ක්ලේෂයන් ගෙනුත් ආරක්ෂා වීමට පියවර ගැනීමෙන් භික්ෂුත්වයේ පාරිශුද්ධිය රැක ගැනීම. (ඉන්ද්‍රිය සංවර ශීලය)
අධි ශීලගත භික්ෂු සංවර ශීල ප්‍රතිපදාව භික්ෂුවගේ කායික හා මානසික සංවරය සඳහා විශේෂයෙන් පිලියෙල කර ඇති භික්ෂු සංවර ශීල ප්‍රතිපදාවක් වන අතර නිර්වාණය සඳහා අරමුණ වීමට පිලියෙල වී ඇති එම විනය සංවර ප්‍රතිපත්තීන් රක්ෂා කිරීමට ප්‍රතිඥා දුන් භික්ෂුවක් දැන හෝ නොදැන එම විනය ප්‍රතිපත්තීන්ගේ කැඩීම් සිදුවුවා නම් ඒවා නිවැරදි කර ගැනීමට අධිශීලගත විනයධර ස්ථවිර වහන්සේ නමක් ඉදිරියේ පොහොය දිනයන්හිදී රැස්වී සකච්ඡා කර වරද නිවැරදි කර ගැනීමේ ශීලය. (ප්‍රාති මෝක්ෂ සංවර ශීලය)
නැවත උපත හා විපත සිදුවන සත්ත්වයාගේ කර්ම ක්‍රියාවලියට පාදක වු කායික හා මානසික ස්පර්ශයන් කෙරෙන් ඉවත් වීම අරමුණුව ක්‍රියාත්මක කල යුතුව පවතින ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ශීල සංවර ප්‍රතිපදාව ක්ලේෂ ප්‍රහානය කිරීම පිණිස පවතින අතර එයින් මානසික සංස්කරණ කර්ම ක්‍රියාවලිය මධ්‍යම ප්‍රතිපදාවට අනුගත වනු ඇත. අධිශීල සංවරය මඟින් කායික ස්පර්ශ ක්‍රියාවලිය අවම ක්‍රියාකාරි මට්ටමකට පැමිණවීම මගින් මානසික ස්පර්ශ ක්‍රියාවලියද අවම මට්ටමකට ගැනීමට හේතුවන අතර මෙම ශීල සංවර ක්‍රියාවලිය මගින් නිර්වාණලාභියාගේ මානසික ඒකාග්‍රතාවය තහවුරු වන අතර ඒ මගින් ප්‍රගුණ කල යුතුව පවතින විදර්ශණා ප්‍රඥාව දියුණු කිරීමටත් මූලික සුදුසු මානසික පසුබිම ගොඩනැගෙනු ඇත.
නිර්වාණ ක්‍රියාවලියෙහි ක්‍රියාකාරිත්වය තහවුරු වීම අෂ්ඨ ධ්‍යානාංගවල ප්‍රගුණ වීමේ සාර්ථකත්වය මතත් ඒහා සමගාමීව සිදුවන කායික ස්පර්ශ ක්‍රියාවලියෙහි නිරුද්ධ වීම මතත් ඒහා සිදුවන මානසික ස්පර්ශ ක්‍රියාවලියෙහි නිරෝධනය සිදු වීමෙහි අත්දැකීමේ ඵලය මතත් රඳා පවතී. රූපීය හා අරූපීය ධ්‍යානාංග අට මගින් අත්පත් වන අධ්‍යාත්මික අත්දැකීම් මගින්ද මානසික ඒකාග්‍රතාවය මානසික ඒකීයභාවය හා උපේක්ෂාව ප්‍රගුණ වීම තුලින් මානසිකත්වයෙහි අභිවෘද්ධිය සිදුවේ. විදර්ශණාමය ප්‍රඥාව මගින් සංස්කාරක වස්තූන්ගේ විනිවිධභාවය දැකීමේ විද්‍යා අවබෝධය මගින් මානසික හා කායික ස්පර්ශ වස්තූන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ත්‍රිලක්ෂණයට අනුව මෙනෙහි කිරීමත් එ මගින් මානසික හිස්බව - සම්මා සමාධිය - ශූණ්‍යතාවය සඳහාවූ මානසික ක්‍රියාවලිය සිදුවන අතර සන්තතික මානසික කර්ම ක්‍රියාවලියෙන් ඉවත් වීමෙන් ප්‍රඥාවන්තයෙකුට ප්‍රඥාවබෝධය ලැබීම අවසාන ප්‍රතිඵලය වනු ඇත. (සතිපට්ඨානය)
මානසික උපේක්ෂාව පාදක වන ඒකාග්‍රතාව/සිතුවිලි හා හැඟීම් සඳහා වන දැනීම් වලින් ඉවත්ව මනසෙහි එකඟබව දියුණු කිරීමේ අභිවෘද්ධියත් අධි මානසික සංවේදී අධ්‍යාත්මික ලෝක ධාතූන්හි මානසික ස්පර්ශය ලබා ගැනීම පාදක වීම හා මානසික ඒකාග්‍රතාවය තුලින් අධ්‍යාත්මික පිරිසිදු බව වැඩිමට යොමුවීම සඳහා ක්‍රියාත්මක කල යුතුව ඇති චතුර්විධ රූපීය ධ්‍යානයන්.
ප්‍රථම ධ්‍යානාංගය සක්‍රිය කර ගැනීමේදී පෘතග්ජන මානසික සිතුවිලිවල මෙනෙහිවීම් හා ඒවායේ මානසික කර්මවල යෙදීම් සඳහා නිරත වීමේ සිහිය අරමුණු වන අතර එම මානසික ක්‍රියාවලිය යම්කාල සීමාවකදී අකර්මණ්‍යය වන තෙක් ඒ පිලිබඳව මානසික අවධියෙහි රැදී සිටීමත් දෙවනුව ඉන් ඉවත්වීමත් ලෙසින් විතක්ක - විචාර ක්‍රියාවලිය සිදුවේ.
දෙවන ධ්‍යානාංගය ක්‍රියාත්මකව බලගැන්වීම ප්‍රථම ධ්‍යානාංගයෙහි ප්‍රගුණ වීම මත සිදුවන අතර එයින් මානසික ක්‍රියාවන් හා ඒවා මෙනෙහි කිරීමට යාමෙන් ඉවත් වීම සඳහා මානසිකත්වය පිලියෙල වන අතර මානසික සංහිදියාව ඒකාග්‍රතාවය හා මධ්‍යස්ථභාවය ප්‍රගුණ වීමට හේතු වේ. ඉන් මානසික ඒකීයභාවයට පත්වේ ඉන් මානසික කල්පනා කිරීම හා මානසික ක්‍රියාවන්ට යොමු වීමේ ප්‍රවනතාවය අකර්මණ්‍යය වනු ඇත.
දෙවැනි ධ්‍යානාංගයෙහි පරිණත වීම තුලින් අත්පත් කරගත හැකිවන අධ්‍යාත්මික දියුණුව අකුසල මානසික කර්ම ශක්තින්ගේ ප්‍රහාණය දියුණු කිරීම සඳහා අරමුණුව එම අකුසල මානසික ස්පර්ශයන්හි ඇලීමෙන් ඉවත් වීමට පදනම ගොඩනැගෙන අතර එම මානසික ක්‍රියාවලිය තුල රැදෙමින් මනසෙහි උපේක්ෂාව දියුණු කරන අතර අතර ඒ තුලින් අත්පත් වන කායික හා මානසික ප්‍රීතිය ප්‍රමෝදය හා සුඛය ක්‍රියාකාරි වන මානසිකත්වය ධ්‍යානාංගය වීමෙන් ක්‍රියාකාරි මානසිකත්වයෙහි ප්‍රබෝධය ඒකාග්‍රතාවයට යොමුවනු ඇත.
තෙවැනි ධ්‍යානාංගයෙහි ප්‍රගුණ වීමේ අත්දැකීම මත ගොඩනැගෙන හතරවැනි ධ්‍යානයෙහි ස්ථාවරය වන්නේ ලෝභය ද්වේශය හා මෝහය ලෙසින් පිලියෙල වූ අකුසල කායික මානසික කර්ම පාදකව පිලියෙල වු සතුට හා වේදනා ආදී මානසික ක්‍රියාවලියන් දමනය කිරීමයි. මෙම ධ්‍යානාංගය ප්‍රගුණ කිරීමෙන් එම කර්ම පාදක සුඛ දුක් වේදනා ශක්තින්ගේන් මනස නිදහස් වන අතර ඒ තුලින් ධ්‍යානාංගගත මානසික සුවය හා සැපයද ඉක්මවා යන අතර ධ්‍යානාංගගත වීම තුලින් උපේක්ෂාවෙහි ඉදිරි දියුණුවත් කායික සුඛ සංවේදී ඒකාග්‍රතාවයෙහි පදනම ගොඩනැගෙන අතර ප්‍රභල වු මානසික සිහිය පාදක වු අධි මානසික අධ්‍යාත්මික ශක්තින්ගේ ස්ථාවරයත් ඒකාග්‍රතාවය නම්වන සමාධියට පාදක ශක්තින් සඳහා තහවුරු වනු ඇත.
මනුෂ්‍යයින්ගේ මානසික ක්‍රියාකාරිත්වයෙහි සිදුවිය යුතුව ඇති මානසික ඒකාග්‍රතාවය සඳහා පදනම් මූලධර්මය මෙම චතුර්විධ රූපීය ධ්‍යානයන් පාදකව පවතී. මෙම ධ්‍යානයන් දියුණු කිරීමෙන් අඛණ්ඩව ස්ථාවරත්වයට පැමිණවීමෙන් මානසික ඒකාග්‍රතාවය සඳහා පදනම වන අතර ඒ මගින් කායික ස්පර්ශ ක්‍රියාවලිය අවම මට්ටමකට යොමු වන අතර එහි ඵලයක් ලෙස මානසික උපේක්ෂාව සියුම් ලෙස දියුණු කරගත හැකිවන අතර එම සියුම් වු අධි සංවේදි තත්වය මගින් මනුෂ්‍යයින්ගේ පංච ඉන්ද්‍රියට විෂය වන ස්පර්ශග්‍රාහී රූප ධර්මයන්ගේ හැකියාව ඉක්ම වීමෙන් අත්පත් කරගත හැකිවන අතීන්ද්‍රිය මානසික ස්පර්ශ ශක්තිය උදාවන අතර එමගින් දේව, බ්‍රහ්ම, අසුර, නිරය ආදී අදෘශ්‍ය ලෝකගත ජීවි සත්ත්වයින්ගේ ක්‍රියාකාරි පැවැත්ම දැකීමට හැකියාව ලැබෙන අතර එය සාමාන්‍ය පෘතග්ජන ඉන්ද්‍රිය ස්පර්ශ සීමාව ඉක්ම වීමෙන් අත්පත් වන අධි මානසික ශක්තින්ගේ හැකියාව බවට පත් වනු ඇත.
අධි චිත්ත සංවරයෙහි යෙදීමේ ශීල ප්‍රතිපදාව
රූපීය නොවන/ ද්‍රව්‍යාත්මක නොවන අසීමාන්තිකවූ අභ්‍යාවකාශය හා සාමාන ලෙසින් පැතිරෙන සිහිය ප්‍රබල ලෙස දියුණු කිරීම පාදකව සිදු කරන අසීමාන්තිකවූ අභ්‍යාවකාශය ලෙසින් පැතිරෙන අධි චිත්ත මානසික දියුණුව පෘතග්ජන කර්ම මාර්ගය තුලින් රැස්වූ මානසික සංඥා රූපයන්හි මානසික ස්පර්ශ ක්‍රියවන් නිරුද්ධ කිරීම අරමුණුව ක්‍රියාත්මක වන චතුර් ආකාර අරූපීය ධ්‍යාන
වේදනා සංවේදනයට ප්‍රතිචාර දක්වන ද්‍රව්‍යාත්මක වස්තූන්ගේ ස්පර්ශ වේදනා ක්‍රියාවලියෙන් මුලුමනින්ම නිදහස් වීමෙන් ඒවාට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය නිරුද්ධ වන අතරම විවිධාකාර වූ ස්පර්ශ වේදනාවන්ට අවධානය යොමු නොකිරීම පාදක වන මානසික ස්ථාවරය ඇති කිරීමෙන් ඇතුලුවන ධ්‍යානාංගය වන්නේ අභ්‍යාවකාෂය හා සමානව අසීමාන්තික පැතිර ඇති අයුරු හා ඒකාග්‍ර කිරීමෙනි. අසීමාන්තික හිස් අභ්‍යාවකාශය ලෙසින් පැතිරුනු මානසික පරිශ්‍රයක් ගොඩනැගීම තුලින් මානසික දත්තයන්ගෙන් තොර වු එනම් ද්‍රව්‍යාත්මක සංඥා මානසිකත්වයෙන් බැහැරව අසීමාන්තික අභ්‍යාවකාශය හා සමාන වූ මානසිකත්වය තුලට එකඟවීමෙන් ප්‍රගුණ කරනු ලබන ධ්‍යානය තුල විසීම. (ආකාසඤ්ඤායතනය)
අභ්‍යාවකාෂය හා සමානව සක්‍රීය කරන ලද මානසික ව්‍යායාමයෙහි පරිණතබව ඉක්ම වීමෙන් අත්පත් කර ගන්නා මානසිකත්වයද අභ්‍යාවකාෂය හා අසීමාන්තික වන බවට මෙනෙහි කිරීමේ ධ්‍යානාංගගත වීමෙන් කිසිදු පෘතුවි සංඥාවක් නොමැති අභ්‍යාවකාෂය හා සමාන වන ලෙසින් කිසිදු රූපීය මානසික සංඥාවක් නොමැති මානසිකත්වය ප්‍රගුණ කිරීම අරමුණු කිරීම. (විඤ්ඤාණඤ්චායතනය)
දෙවන ධ්‍යානාංගයෙහි පරිණත වීම ඉක්මවා යාමෙන් අත්පත් කරගත යුතුව ඇති තෙවන අරූප ධ්‍යානාංගය වන අසීමාන්තික වූද කිසිදු සංඥාවක් නොමැති වූද අභ්‍යාවකාෂය හා සමාන ලෙසින් පැතිරීම එකග කිරීමෙන් ප්‍රගුණ කලයුතු කිසිදු සංඥාවක් නොමැති මානසික අත්දැකීමෙහි "අධ්‍යාත්මික හිස් බව" තුල රැදීමෙන් එහි අඛණ්ඩව නිරත වීම. (ආකිඤ්චඤ්ඤායතන)
කිසිදු සංඥාවක් ක්‍රියාත්මක නොවන මානසික හිස්බවෙහි ස්ථාවරය පරිනත වීමෙන් අත්පත් වන ධ්‍යානංගය පාදකව ගොඩනැගෙන හතරවන අරූප ධ්‍යානංගය වන්නේ මානසික හිස් බව තුල යම්තාක් සංඥාවන්හි නොමැති බවෙහි ප්‍රායෝගික මානසික අත්දැකීම පාදක වීමෙන් අසීමාන්තිකවූ හිස් බවත් එහිම මානසික අකර්මන්‍යතාවයත් ප්‍රගුණ වීම පාදක වීම මගින් සංඥාවන් නොමැති පැවැත්මේ මානසිකත්වයෙහි අත්දැකීමද මානසික ශක්තීන්ගේ පරිශයෙහි සංඥා ක්‍රියාත්මක වීමේ අවස්ථාව මත සංඥාවන් පැවතීමට ඇති හැකියාවත් එම සංඥාවන්ගේ ඉවත් වීමෙන් සංඥාවන් නොමැතිව පැවතීමේ හැකියාවත් යන අවස්ථා 2ක් ක්‍රියාත්මක වන සංඥාවන්හි ඇති බව හා නැතිබව (නේවසඤ්ඤානාසඤ්ඤායතනය)
ඉහත ලෙස සංඥා විරාග පාදකව අරූපාවචර ධ්‍යානාංග 4 මගින් මානසික සංඥා ස්පර්ශ ක්‍රියාවලියෙහි අකර්මන්‍යතාවය ප්‍රගුණ වන අතර මානසික ස්පර්ශ නිරෝධය අරමුණුව ඇත. ඒ තුලින් කායික ස්පර්ශ ක්‍රියාවලියෙහි විරාගය තහවුරු වනු ඇත.
පිරිසිදු විදර්ශනාමය විද්‍යා අවබෝධය සහිත ප්‍රඥාව මගින් සංස්කාරක වස්තූන් කෙරෙහි ක්‍රියාත්මකව පවත්නා අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලෙසින් වන ත්‍රිලක්ෂණ ස්වභාවය මානසික ක්‍රියාකාරකම් තුලින් විනිවිද දැක්ම සඳහා වන විද්‍යාත්මක යථා ස්වභාවය පිලිබඳ විමර්ශණාත්මක මානසික ගවේෂණය එනම් විදර්ශණා ප්‍රඥාව මගින් මානසික කර්ම ශක්තීන්ගේ විරාගය හා ප්‍රහාණය හා නිරොධනය දක්වා රැගෙන යමින් සිදු කරනු ලබන මානසික වූ අධ්‍යාත්මික ශූන්‍යතාවය ප්‍රගුණ කිරීම.
* නිර්වාණබෝධය * අර්හත්වය *කායික සහ මානසික අධ්‍යාත්මික ස්පර්ශ ක්‍රියාවලියෙහි නිරෝධය මගින් සිදුවන චිත්ත සන්තතියෙහි නිමාව * චිත්ත සන්තතියෙහි මානසික සංස්කරණය මගින් සිදුවන නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියෙහි නිරෝධය "නිර්වාණය"

## 3.1.5 ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ශීල ප්‍රතිපත්තීන්




| | | | |
|---|---|---|---|
| 1. විසිතුන් වැදෑරුම් ලෙසින් වන පාංශුකූල රෙදි කැබලි වලින් පිලියෙල කරගත් කඩ කැපූ චීවර පරිහරණය කිරීමේ ප්‍රතිපදාව (සුසානභූමි මළමිණි වලින් ගත් පාංශුකූල රෙදි) **(පාංශුකූලිකාංගය)** | 4. පිණ්ඩාහාර දානය පාත්‍රයේ පමණක් වැලදීම (දානය වැලදීමට පිඟන් පාවිච්චි නොකිරීම) **(පත්තපිංඩිකාංගය)** | 7. ඒකාසනිකාංගය මගින් එක දාන වේල වැලඳු පසු අමතර කිසිදු ආහාරයක් වැලඳීමට නොගැනීම. **(ඛලුකපච්චාභත්තිකාංග)** | 10. මිනිස් වාසයෙන් දුරස්ව පිහිටි සුසාන භූමියක් ආශ්‍රිතව කුටියක් සාදාගෙන වැඩ සිටීම. **(සොසානිකාංගය)** |
| 2. එවැනි පාංශුකූල චීවර 3ක් පමක් පරිහරණය කිරීමේ ප්‍රතිපදාව<br>* අඳනය<br>* තනිපට චීවරය<br>* දෙපට චීවරය<br>**(තෙචීවරිකාංගය)** | 5. ගෙයක් හැර ගෙයක් ලෙසින් පිඩු පිණිස යාම (ගෙවල් අතහැර නොයාම) **(සපදානචාරිකාංගය)** | 8. මිනිස් වාසයෙන් තොරව වනතගව සිටීම. **(ආරණ්‍යයිකාංගය)** | 11. කිසිදු සෙවනක් නොමැතිව වැඩ සිටීම (රුක්ෂයන්හි සෙවණ යට හෝ ලෙනක හෝ අවාසයක සෙවණ යට නොසිට අහසට විවෘතව වැඩ සිටීම. **(අබ්බෝකාසිකාංගය)** |
| 3. පාත්‍රය රැගෙන ගෙන්ගෙට ගොස් පිණ්ඩාහාර ලබා ගැනීමේ ප්‍රතිපදාව **(පිණ්ඩපාතිකාංගය)** | 6. පිණ්ඩපාත දානය දිනකට එක වරක් පමණක් ගැනීම.(උදෑසන හා රාත්‍රී ආහාර වේල් දෙක අතහැරීම. **(ඒකාසනිකාංගය)** | 9. වනයක රුකක් මුල කුටියක් සාදාගෙන වැඩ සිටීම **(රුක්ඛමූලිකාංගය)** | 12. දායකයින් විසින් පිලියෙල කර දුන් ගල්-ලෙනක කුටියක හුද-කලාව වැඩ සිටීම. **(යථාසත්තනිකාංගය)** |
| | | | 13. සිටගෙන, හිඳගෙන හා සක්මන් කරමින් යන ත්‍රිවිධ ඉරියව් පමණක් භාවිතා කර භාවනා කිරීම නිදා ගැනීමේ ඉරියව්වට කිසි විටෙක නොපැමිණීම. **(නේසජ්ජිකාංගය)** |



**පංච ශීලය**

1. මම සත්ත්වයින්ගේ ජීවිත ඝාතනය කිරීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (මිනිසුන්ගේ රස තෘෂ්ණාව වෙනුවෙන් මරණ ලද සතුන්ගේ මත්ස්‍ය මාංශ මිලදී ගැනීමෙන්ද, විකිණීමෙන්ද, ආහාරයට ගැනීම ආදියෙන්ද ඉවත් විය යුතුය)

2. මම නුදුන් දේ ගැනීමෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. මම කායිකව හා මානසිකව ලිංගික ක්‍රියාවන්හි වැරදි ලෙස හැසිරීම වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි. (කාන්තාවන් හා පුරුෂයින් අතර ඇතිවන සියළුම ආකාරයේ ලිංගික හා ඒ ආශ්‍රිත විකෘති කාමුක ලිංගික ක්‍රියාවන්, බහු ස්ත්‍රී සේවනය, පර ස්ත්‍රී සේවනය, බහු පුරුෂ සේවනය, පර පුරුෂ සේවනය, බාල අපචාර සමලිංගික, බහුලිංගික, විෂම ලිංගික ආදී වන පහත් දුර්වල මානසික විකෘති ලිංගික අපචාර හා අනාචාර හා තිරිසන් සතුන් සමග පවා සිදුකරණ ලිංගික කාම අපචාර ආදී අනාචාර ලිංගික ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.)

4. මම බොරුකීම වැළකීමේ (වාචසික සංවරය රැකීමේ) ශික්ෂා පදය සමාදන් වෙමි.

5. මම සියලුම වර්ගයේ විෂ සහිත මත් ද්‍රාවණ දුම්පානය හා මත්ද්‍රව්‍ය සහ ඇල්කොහොල් අඩංගු වයින් හා බියර් වර්ග ආදී සියළුම මත්පානයන්ගෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**අෂ්ඨාංග ශීලය**

1. මම සත්ත්වයින්ගේ ජීවිත ඝාතනය කිරීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (මිනිසුන්ගේ රස තෘෂ්ණාව වෙනුවෙන් මරණ ලද සතුන්ගේ මත්ස්‍ය මාංශ මිලදී ගැනීමෙන්ද, විකිණීමෙන්ද ආහාරයට ගැනීම ආදියෙන්ද ඉවත් විය යුතුය)

2. මම නුදුන් දේ ගැනීමෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. මම අබ්‍රහ්මචරියාවෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි. (කාන්තාවන් හා පුරුෂයින් අතර ඇතිවන සියළුම ආකාරයේ ලිංගික හා ඒ ආශ්‍රිත විකෘති කාමුක ලිංගික ක්‍රියාවන් - බහු ස්ත්‍රී සේවනය, පර ස්ත්‍රී සේවනය, බහු පුරුෂ සේවනය, පර පුරුෂ සේවනය, බාල අපචාර සමලිංගික, බහුලිංගික, විෂම ලිංගික ආදී වන පහත් දුර්වල මානසික විකෘති ලිංගික අපචාර හා අනාචාර හා තිරිසන් සතුන් සමග පවා සිදුකරණ ලිංගික කාම අපචාර ආදී අනාචාර ලිංගික ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.)

4. මම බොරු කීමෙන් වැළකීමේ (වාචසික සංවරය රැකීමේ) ශික්ෂා පදය සමාදන් වෙමි.

5. මම සියලුම වර්ගයේ විෂ සහිත මත් ද්‍රාවණ දුම්පානය හා මත්ද්‍රව්‍ය සහ ඇල්කොහොල් අඩංගු වයින් හා බියර් වර්ග ආදී සියළුම මත්පානයන්ගෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

6. විකාලයේ භෝජන ගැනිම වැළකිමේ ශික්ෂා පදය සමාදන් වෙමි. (දිවා කාලයේ 12 න් පසු - ඖෂධීය පාන, විවිධ වර්ගයේ

පෝෂදායී දියර වර්ග ආදිය ශරීරය අප්‍රාණිකවූ හා ගිලන්වූ අවස්ථාවන්හිදී භාවිතා කළ හැක.)

7. මම නැටුම්, ගැයුම්, වැයුම් හා විහිළු දර්ශණ ආදිය බැලීම්, විදීම්, ශ්‍රවණය කිරීම් ද මල් මාලා ආදිය පැළඳීම, විලාසිතා ලෙසින් ශරීරය සැරසීම, සුවඳ විලවුන් ගැල්වීම් ආදියෙන් ද වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

8. මම උස් ආසන මහ ආසන ආදිය පරිහරණය කිරීමෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**ආජීව අෂ්ඨමක ශීලය**

1. මම සත්ත්වයන්ගේ ජීවිත ඝාතනය කිරීම වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (මිනිසුන්ගේ රස තෘෂ්ණාව වෙනුවෙන් මරණ ලද සතුන්ගේ මත්ස්‍ය මාංශ මිලදී ගැනීම, විකිණීම, ආහාරයට ගැනීම ආදියෙන්ද ඉවත් විය යුතුය)

2. මම නුදුන් දෙය ගැනීම වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. මම කායිකව හා මානසිකව ලිංගික ක්‍රියාවන්හි වැරදි ලෙස හැසිරීම වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි. (කාන්තාවන් හා පුරුෂයින් අතර ඇතිවන සියළුම ආකාරයේ ලිංගික හා ඒ ආශ්‍රිත විකෘති කාමුක ලිංගික ක්‍රියාවන් . බහු ස්ත්‍රී සේවනය, පර ස්ත්‍රී සේවනය, බහු පුරුෂ සේවනය, පර පුරුෂ සේවනය, බාල අපචාර සමලිංගික, බහුලිංගික, විෂම ලිංගික ආදී වන පහත් දුර්වල මානසික විකෘති ලිංගික අපචාර හා අනාචාර හා තිරිසන් සතුන් සමග පවා සිදුකරණ ලිංගික කාම අපචාර ආදී අනාචාර ලිංගික ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.)

4. මම මුසාබස් කීම වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

5. මම පරුෂ වචන කීම වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

6. මම සම්පප්ප්‍රලාප කීම වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

7. මම හිස්වචන කීම වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

8. මම වැරදි ජීවිකාවෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (පංච ශීලයට හා ගිහි දස ශීලයට යටත්ව ජීවත්වීම)

**ගිහි දස ශීලය**

1. මම සත්ත්වයින්ගේ ජීවිත ඝාතනය කිරීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (මිනිසුන්ගේ රස තෘෂ්ණාව වෙනුවෙන් මරණ ලද සතුන්ගේ මත්ස්‍ය මාංශ මිලදී ගැනීමෙන්ද විකිණීමෙන්ද ආහාරයට ගැනීම ආදියෙන්ද ඉවත් විය යුතුය)

2. මම නුදුන් දේ ගැනීමෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. මම අබ්‍රහ්මචාරීවීම වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි. (කාන්තාවන් හා පුරුෂයින් අතර ඇතිවන සියළුම ආකාරයේ ලිංගික හා ඒ ආශ්‍රිත විකෘති කාමුක ලිංගික ක්‍රියාවන් . බහු ස්ත්‍රී සේවනය, පර ස්ත්‍රී සේවනය, බහු පුරුෂ සේවනය, පර පුරුෂ සේවනය, බාල අපචාර සමලිංගික, බහුලිංගික, විෂම ලිංගික ආදී වන පහත් දුර්වල මානසික විකෘති ලිංගික අපචාර හා අනාචාර හා තිරිසන් සතුන් සමග පවා සිදුකරණ ලිංගික කාම අපචාර ආදී අනාචාර ලිංගික ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.)

4. මම බොරු කීම වැළකීමේ (වාචසික සංවරය රැකීම පිණිස) ශික්ෂා පදය සමාදන් වෙමි.

5. මම සියලුම වර්ගයේ විෂ සහිත මත් ද්‍රාවණ, දුම්පානය හා මත්ද්‍රව්‍ය සහ ඇල්කොහොල් අඩංගු වයින් හා බියර් වර්ග ආදී සියළුම මත්පානයන්ගෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

6. විකාල භෝජනයෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (දිවා කාලයේ 12 න් පසු - ඖෂධීය පාන, චතුමධුර, විවිධ වර්ගයේ පෝෂ්‍යදායි දියර වර්ග ආදිය ශරීරය අප්‍රාණික වූ හා ගිලන් වූ අවස්ථාවන්හිදී භාවිතා කල හැක.)

7. නැටුම්, ගැයුම්, වැයුම් උසුළු-විසුළු කිරීම්, දැකීම්, බැලීම්, විඳීම් ආදියෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

8. මල් මාලා පැලඳීම සුවඳ විලවුන් ආදිය ගැල්වීම දැරීම පැලඳීම අලංකාර කිරීම පරිහරනය කිරීම ආදියෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

9. උස් ආසන මහ ආසන ආදිය පරිහරණය කිරීමෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

10. රන් රිදී මුතු මැණික් මිල මුදල් ආදිය අන්‍යයන්ගෙන් ලබාගැනීමෙන් පරිහරණය කිරීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

(මෙම ගිහි දස ශීලයෙහි ශික්ෂා පද දහය දහයක් ලෙස ගැනේ. යම් ශික්ෂා පදයක් යමෙකු රැකීම අපොහොසත් වූයේ වුවද ඉන් ඉතිරි ශික්ෂා පදයන්ට හානි නොවේ.)

**පැවිදි (සාමණේර) දස ශීල**

1. මම සත්ත්වයින්ගේ ජීවිත ඝාතනය කිරීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (මිනිසුන්ගේ රස තෘෂ්ණාව වෙනුවෙන් මරණ ලද සතුන්ගේ මත්ස්‍ය මාංශ මිලදී ගැනීමෙන්ද, විකිණීමෙන්ද, ආහාරයට ගැනීම ආදියෙන්ද ඉවත් විය යුතුය)

2. මම නුදුන් දේ ගැනීම වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. මම අබ්‍රහ්මචාරී වීම වැලකීමේ ශික්ෂාපදය සමාදන්වෙමි. (කාන්තාවන් හා පුරුෂයින් අතර ඇතිවන සියළුම ආකාරයේ ලිංගික හා ඒ ආශ්‍රිත විකෘති කාමුක ලිංගික ක්‍රියාවන් . බහු ස්ත්‍රී සේවනය, පර ස්ත්‍රී සේවනය, බහු පුරුෂ සේවනය, පර පුරුෂ සේවනය, බාල අපචාර සමලිංගික, බහුලිංගික, විෂම ලිංගික ආදී වන පහත් දුර්වල මානසික විකෘති ලිංගික අපචාර හා අනාචාර හා තිරිසන් සතුන් සමග පවා සිදුකරණ ලිංගික කාම අපචාර ආදී අනාචාර ලිංගික ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.)

4. මම බොරු කීම වැළකීමේ (වාචසික සංවරය රැකීමේ) ශික්ෂා පදය සමාදන් වෙමි.

5. මම සියලුම වර්ගයේ විෂ සහිත මත් ද්‍රාවණ දුම්පානය හා මත්ද්‍රව්‍ය සහ ඇල්කොහොල් අඩංගු වයින් හා බියර් වර්ග ආදී සියළුම මත්පානයන්ගෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

6. විකාල භෝජනයෙන් වැලකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (දිවා කාලයේ 12 න් පසු - ඖෂධීය පාන, චතුමධුර, විවිධ වර්ගයේ පෝෂ්‍යදායි දියර වර්ග ආදිය ශරීරය අප්‍රාණික වූ හා ගිලන් වූ අවස්ථාවන්හිදී භාවිතා කල හැක.)

7. නැටුම් ගැයුම් වැයුම් උසුළු-විසුළු කිරීම් දැකීම් බැලීම් විඳීම් ආදියෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

8. මල් මාලා පැලඳීම සුවඳ විලවුන් ආදිය ගැල්වීම දැරීම පැලඳීම අලංකාර කිරීම පරිහරණය කිරීම ආදියෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

9. උස් ආසන මහ ආසන ආදිය පරිහරණය කිරීමෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

10. රන් රිදී මුතු මැණික් මිල මුදල් ආදිය අන්‍යයන්ගෙන් ලබාගැනීමෙන් පරිහරණය කිරීම වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

(ඉහත සඳහන් ශික්ෂාපද දහය එකතුව එකක් ලෙස සලකන අතර ශික්ෂාපද දහයක් ලෙස නොසැලකේ. යම් භික්ෂුවක් මෙම ශික්ෂා පද දහයෙන් එක් ශික්ෂා පදයක් හෝ රැකීමට අපොහොසත් වූයේනම් එම භික්ෂුව සමස්ත ශික්ෂාපද දහයම ආරක්ෂා නොකල භික්ෂුවක් බවට පත්වේ.)

## බුදුදහම ඇගයීම

*යමෙකුට ප්‍රාරම්භක වශයෙන් බුදුදහමෙන් අනුගමනය කර ගත හැකි වන හුදකලා බව මගින් අත්පත් කරගත හැකිවන බුදුදහමේ නියම වටිනාකම ඇගයීමට ලක්කිරීමට හැකි වන්නේ එදිනෙදා දෛනික ජීවිතයේ තමන් ලද ප්‍රතිඵලය තමා විසින්ම විනිශ්චය කර ගැනීමෙන් පමණි.*

ආචාර්ය එඩ්වඩ් කෝන්ස්
(බටහිර බෞද්ධ වියතෙකි.)

## 3.2 චතුරාර්ය සත්‍යය

1. දුක
2. දුකට හේතුව
3. දුකින් නිදහස් වීම
4. දුකින් නිදහස්වීමේ මාර්ගය (මධ්‍යම ප්‍රතිපදාව)

ලෝකයෙහි ක්‍රියාකාරී විද්‍යාත්මක විෂයන්හි පරිණත අවබෝධයට පත් ප්‍රඥාවන්ත සත්පුරුෂයන්ට පමණක් අවබෝධ කරගත හැකි මුත් පෘතග්ජන අඥාන මනුෂ්‍යයන් කෙරෙහි ඉතා දැඩි ලෙස අනවබෝධයට පත් කරවන සන්තතික ජීව විද්‍යාත්මක ලෝකයෙහි නිර්වාණ ධර්මතාවය වන්නේ චතුරාර්ය සත්‍යය ධර්මයයි. ඉතා ගැඹුරු වූ සහ ඉතා ශූක්ෂ්මවූ සත්ත්වයින්ගේ අධ්‍යාත්මික සන්තතික විද්‍යා කර්ම ධර්මය එනම් විශ්ව ලෝක ගතව සත්‍යය ලෙස ක්‍රියාත්මක වන විද්‍යා ධර්මතාවයන්ගේ අන්තර්ගතය වන ප්‍රඥා විෂය යනු කිසිසේත්ම අඥානයින්ට අවබෝධ කරගත නොහැකි විෂයක් වන අතර ඉතා ගැඹුරු ලෙස බුදුවරයන් වහන්සේලා විසින් ලොවට දේශනා කිරීමෙන් මේ තාක්කල් මානව ඉතිහාසයේ ජීවත්වුනු ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයන් අතර බුදුන් වහන්සේ ලොවෙහි සියල්ලන් අතරින් ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා බවට පත්විය.

ලොවෙහි ක්‍රියාත්මක වන සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන්ගේ ඇති සැටිය සහ ඉන් නිදහස් වීමේ චතුරාර්ය සත්‍යය කිසිලෙසකින්වත් පහසුවෙන් මනුෂ්‍යයන්ට අවබෝධ කරගත නොහැකි වන අතර නැවත ඉපදීමේ කර්ම චක්‍ර ක්‍රියාවලිය තුලින් ඔවුනට සතර අපායන්හි ඉපදිය යුතුව ඇත. එවැනි මනුෂ්‍යයන්ට තිරිසන් ප්‍රේත ආදී භවයන්හි අනිවාර්යෙන්ම උප්පත්තිය සිදුවන අතර ඒ සඳහා මූලිකම හේතුව වනුයේ ප්‍රඥා පාදක චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධකර නොගැනීමයි. චතුරාර්ය සත්‍යය පිළිබඳ

විද්‍යාත්මක අවබෝධය ලබාගත් ප්‍රඥාවන්ත සත්පුරුෂයින් මධ්‍යම ප්‍රතිපදාගත අධ්‍යාත්මික මාර්ගයෙහි නියමිත විනය නීතිරීති වලට අදාලව අධිශීල සංවරයත් අධි චිත්ත සංවරයත් තුලින් සංස්කරණගත ද්‍රව්‍ය ලෝකයෙහි ශක්ති සහ පදාර්ථගත මූල ද්‍රව්‍යයන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලිය පිළිබඳ ප්‍රඥා අවබෝධය ලැබීම හේතුව වීමෙන් එම ප්‍රඥාවන්තයින් ලෝකයෙහි ශ්‍රේෂ්ඨත්වයට පත් වනු ඇත. නිර්වාණ මාර්ගය වන මධ්‍යම ප්‍රතිපදාවෙන් ඉවත්ව ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන් වඩන පෘතග්ජන මනුෂ්‍යයෝ තථාගත විද්‍යාත්මක වූ චතුරාර්ය සත්‍යය ධර්මතාවය අවබෝධ කර නොගත් පෘතග්ජන මනුෂ්‍යයන් වනු ඇත. මෙවැනි මනුෂ්‍යයෝ සියල්ලෝම නිසැකවම තම තමන්ගේ දෛනික ක්‍රියාවන්ට අනුව නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය තුලින් සතර අපාගත වනු ඇත.

ක්‍රියාකාරී ලෝකගත ස්වාභාවික සන්තතික විද්‍යා ධර්මතාවයන්හි අන්තර්ගතය වන ප්‍රඥාව යනු සන්තතික ජීව විද්‍යා ලෝකයෙහි විද්‍යාත්මක න්‍යාය ධර්ම අන්තර්ගත වන ලොවෙහි ඇති එකම විද්‍යා විෂය වනු ඇත. එම විද්‍යා ධර්මතාවයන් සත්ත්වයාගේ කර්ම චක්‍රය සඳහා පිළියෙල වන ආකාරයත් එම කර්ම චක්‍ර ක්‍රියාවලිය නිසා සමස්ත සත්ත්ව වර්ගයාට ප්‍රබල දුක්ඛ කර්මයන්ට මුහුණ දීමට සිදුවන ආකාරයත් ඒනිසා ඉන් නිදහස් වීම පිණිස ආර්ය මාර්ගගත චතුරාර්ය සත්‍යය ධර්මය ශ්‍රේෂ්ඨ වූ බුදුන් වහන්සේ විසින් පෘතග්ජන මනුෂ්‍යයන්ට හෙළිකර ඇත.

විශ්ව ලෝකගත සන්තතික විද්‍යාත්මක කර්ම ධර්මතාවය මුළුමනින්ම ක්‍රියාත්මක වන්නේත් සැලසුම් සහගත වී ඇත්තේත් විශ්ව ලෝක පරිශ්‍රයෙහි අන්තර්ගත ප්‍රධාන හා මූලිකම ශක්තිය වන ස්ථිතික විද්‍යුත් ශක්තිය මගිනි. මෙය ප්‍රධානම හේතුව වීමෙන්ම අඥාන පෘතග්ජන මනුෂ්‍යයන්ට සන්තතික විද්‍යා ධර්මයෙහි අවබෝධය තුලින් නිවන් ලැබීමට නොහැකි වනු ඇත.

මේ නිසාම සමස්ත පෘතග්ජන මනුෂ්‍යයෝ තථාගත චතුරාර්ය සත්‍යය නොදැනීමෙන් ප්‍රබල ලෙස අවිද්‍යාවට ගොදුරු වී ඇත. ප්‍රබල වූ දැඩි වූ කාම තෘෂ්ණාව සමස්ත සත්ත්වයින්ගේ ජීවත් වීමේ මූලික පදනම වන අතර ඒ තුලින් කායික පංචේන්ද්‍රියන් දැඩි ලෙස පිනවීමට රූප දැකීමෙන් ශබ්ද ඇසීමෙන් ගන්ධ ස්පර්ශ රස ස්පර්ශ වේදනා විඳීමෙන් සහ කායික සැප ස්පර්ශ ලැබීමට නොනවත්වා සහ නැවත නැවත අසීමාන්තිකව යොමු වනු ඇත. නිර්වාණබෝධය තුලින් සංසාරගත ධර්මයන්ගෙන් නිදහස් වීමට නම් මෙම ලෞකික කර්ම මාර්ගය මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමෙන් මධ්‍යම ප්‍රතිපදාවට පැමිණිය යුතුව ඇත. යමෙකු මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරගෙන අනුගමන නොකළේ නම් කිසි ලෙසකින්වත් මනුෂ්‍යය ලෝකයට නැවත පැමිණීම පහසු නොවන අතර නිරය, තිරිසන් ප්‍රේත ලෝකයන්හි දැඩි දුක් විඳීමට නැවත නැවත එම අපායන්හි ඉපදිය යුතුව ඇත.

ප්‍රඥාවන්තයින් වශයෙන්ද විද්‍යා අවබෝධයට පත්වූ දාර්ශනිකයින් වශයෙන්ද බහුශ්‍රැතයන් වශයෙන්ද විශාරදයන් වශයෙන්ද ලොවෙහි පරම සත්‍යය ධර්මතාවයන්හි ප්‍රඥාවබෝධයට පත්වූ එනම් නිර්වාණ මාර්ගය අනුගමනය කලා වූ එලෙසම දැඩි කාම තෘෂ්ණාව අතහරින ලද්දාවූ මධ්‍යම ප්‍රතිපදාව තුලින් ප්‍රඥාවන්තවූ සත්පුරුෂයින් නිර්වාණ මාර්ගයෙහි මාර්ගාවබෝධයට සහ ඵල අවබෝධයට පත්වනු ඇත. තථාගත බුද්ධ දේශනාව අනුව මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය නොකිරීමෙන් ස්ථිර ලෙස හා සත්‍යය ලෙසින් ලොවෙහි ක්‍රියාත්මක වන දුක් වේදනා ධර්මතාවයෙන් කිසිවකුට ගැලවිය නොහැක. නමුත් ඉතා පැහැදිලි ලෙස ඔවුන් තිරිසන්, ප්‍රේත ආදී කොට ඇත්තාවූ ප්‍රබල දුක් සහිත භවයන්හි ඉතා පහසුවෙන් ඉපදෙනු ඇත. චතුරාර්ය සත්‍ය ධර්මයෙහි අවබෝධයෙන් තොරවූ අඥාන හා නුගත්වූද ලෞකික කර්ම ධර්ම ප්‍රගුණ කරන මනුෂ්‍යයෝ දෙවියන් පිදීමෙන්, දේව යාඥා

කිරීමෙන්, දේව ස්තෝත්‍ර ගායනා කිරීමෙන් මරණින් මතු ඉපදීමට නියමිතව ඇති තම තමන් විසින් අවිද්‍යාවෙන් හා තෘෂ්ණාවෙන් පිලියෙල කරගත් කර්ම විපාකයන් ගෙන් ගැලවීමට මහන්සි ගන්නා අඥාන ප්‍රජාවකි. එලෙස නූගත් සහ මිත්‍යා විශ්වාස ගත අඥාන මාර්ගයන්හි යෙදෙන නූගත් මනුෂ්‍යයෝ කිසි දිනක නැවත ඉපිද මියයන ප්‍රබල දුක් සහිත සසර ගමනින් නිදහස් නොවනු ඇත. ඔවුන් කොපමණ ප්‍රාර්ථනා කලද, දෙවියන් ඉදිරියේ යාඥා කලද ඔවුන් කිසිවෙකුට මධ්‍යම පතිපදාව අනුගමනය නොකර මරණයෙන් මතු මුහුණ දිය යුතුව ඇති සතර අපාගත ලෝකයන්හි ඉපදීමේ අවධානමින් නිදහස් විය නොහැක. සමස්ත පෘතග්ජන මනුෂ්‍යයන් එනම් තථාගත නිර්වාණ මාර්ගය පිළිනොගත් අඥාන මනුෂ්‍යයන්ට සංසාර කර්ම චක්‍රයෙන් ගැලවීමට නොහැකි වී ඇතත් බුදුන් වහන්සේ දේශනා කළ මධ්‍යම ප්‍රතිපදාගත නිර්වාණ ධර්මය අදටත් පැහැදිලිව ක්‍රියාත්මකව පවතිනු ඇත.

## බුදුන් වහන්සේ කිසිවෙකුට මැඩලිය නොහැක

*"බෞද්ධ හෝ වේවා අබෞද්ධ හෝ වේවා ලෝකයේ පවතින හැම ශ්‍රේෂ්ඨතම ආගම්වල මූලධර්ම මම පරීක්ෂා කලෙමි. බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍යය පාදක වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තරම් ශ්‍රේෂ්ඨ වන නිර්වාණ ඉගැන්වීමක් සහිත ධර්ම මාර්ගයක් ඒ කිසිම ආගමක මට හමුවුනේ නැහැ. මම එම ආර්ය මාර්ගයට අනුගත වීමෙන් ජීවිතය හැඩගස්වා ගත්තෙමි".*

**- මහාචාර්ය රීස් ඩේවිඩ් -**

### 3.2.1 මනුෂ්‍ය - තිරිසන් සත්ත්වයින් කෙරෙහි සන්තතිකවන ප්‍රධාන සත්‍යය ධර්මතාවය - (දුක්ඛ සත්‍යය)

ස්ථිතික විද්‍යුත් සම්භවය සහිත චිත්ත ශක්තීන් ද පදාර්ථගත මූල ද්‍රව්‍යයන්ගෙන් සංස්කරණය වූ භෞතික කාය ශරීරයද විද්‍යාත්මක කර්ම ධර්මය තුලින් ඒකාබද්ධ වීමෙන් පසු සංස්කරණය වන මානසික ශක්තිය යනු සත්ත්වයින්ගේ කාම සංවේදී ස්පර්ශ ක්‍රියාවලියට සංවේදී වීම සඳහා ස්වභාවිකව සුදුසුකම් ලැබී ඇති සම්ප්‍රයුක්ත ශක්ති මාධ්‍යයක් වන අතර එමගින් සත්ත්වයින්ගේ අධ්‍යාත්මික ශක්තීන් සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් ශක්තීන් ලෙස සත්ත්වයින්ගේ කර්ම සන්තතියෙහි කර්ම චක්‍ර ක්‍රියාවලිය සඳහා පදනම වී ඇත. ස්ථිතික විද්‍යුත් ප්‍රභව ගත චිත්ත ශක්තීන් සතු මූලික ස්වභාවය වන්නේ සංස්කාරක ද්‍රව්‍යයන්ගේ සම්ප්‍රයුක්ත සංඥාවන්හි විවිධත්වයට සංවේදී වීමයි. මෙම චිත්ත ශක්තීන්ගේ මූලික ගුණාත්මක සංවේදී ධර්මය හේතුව වීමෙන් සංස්කාරක ද්‍රව්‍යයන්ගේ ස්පර්ශ සංඥාවන් තෘෂ්ණාව නැමැති ක්‍රියාවලිය තුලින් ග්‍රහණය කරගනු ඇත. මෙම ක්‍රියාවලියට අනුව සංස්කාරක ද්‍රව්‍යයන්ගේ සම්ප්‍රයුක්ත ශක්තීන් සමඟ ජීවී සත්ත්වයින්ගේ සම්ප්‍රයුක්ත ශක්තිය වන මානසික ශක්තිය සමග ස්පර්ශ වීමේ ක්‍රියාවලියෙන් ස්ථිතික විද්‍යුත් ලෙසින් සංයෝජනය වේ. මෙම අධ්‍යාත්මික වුද විද්‍යාත්මක වූද ස්තිථික විද්‍යුත්මය කර්ම ක්‍රියාවලියෙහි සම්ප්‍රයුක්ත මානසික ශක්තිය සංස්කාරක වස්තූන්ගේ සම්ප්‍රයුක්ත සංඥා ශක්තීන් සමග ස්පර්ශ පාදකව සිදුවන සන්තතික කර්ම ක්‍රියාවලියෙහි අධ්‍යාත්මිකවූද විද්‍යාධර්මතාවය වනු ඇත. මෙම ඉතාමත් සියුම් වූ විද්‍යාත්මක කර්ම ධර්මය කිසිවෙකුට ලෙහෙසියෙන් අවබෝධ කරගත නොහැකි වන අතර එම නොදැනීම අවිද්‍යාව බවට පත්වී ඇත.

සත්ත්වයින් සතු මානසික ශක්තියෙහි වේදනා සංවේදී ගුණාත්මකභාවය ප්‍රධාන වශයෙන් ප්‍රිය සංවේදී කාම ස්පර්ශයන්හි මානසික ස්පර්ශයන්ට යොමු කිරීම හේතුවෙන් නැවත ඉපදීමේ කර්ම චක්‍ර ක්‍රියාවලියට හේතුව නිර්මාණය වේ. සෑම සංස්කාරක ද්‍රව්‍යයන්හිම ස්ථිතික විද්‍යුත්මය සන්තතික සංඥාවන්හි මානසික ස්පර්ශය සැප ස්පර්ශග්‍රාහී සංවේදනයන්ට විෂය වන්නේ යම්සේද බහුතරයක් සංඥාවන්හි මානසික ස්පර්ශය දුක් වේදනා සංවේදී සංඥාවන්ටද විෂය වනු ඇත. මානසික ස්පර්ශ සංවේදී ක්‍රියාවලියෙහි ස්පර්ශග්‍රාහී සංඥාවන්ගේ දුක් සංවේදී හා සැප සංවේදී වශයෙන් පවත්නා විවිධත්වය මුලුමනින්ම රඳා පවතිනුයේ මානසිකව ග්‍රහණය කරගත් සංඥාවන්හි ගුණාත්මක බව හා ප්‍රිය මනාප බව මත මානසික ත්‍රිවිධ දෘෂ්ඨිගත සංස්කරණයන්ට අනුගතව හා ත්‍රිවිධ ක්ලේෂයන්ට යටත්ව පිළියෙල කර ගැනීමෙන්ය. මෙම චිත්ත ශක්තීන්ගේ ගුණාත්මක ස්වභාවයෙහි විවිධත්වය හේතුව වීමෙන් සත්ත්වයින්ට වේදනා දැරීමේ විවිධත්වයක්ද නිර්මාණයවී ඇත. සමස්ත සත්ත්ව සන්තතියම මනුෂ්‍යය සහ තිරිසන් ලෙසින් නිරතුරුවම මානසික ක්‍රියාවලියට යොමු වන්නේ ප්‍රිය ස්පර්ශ සංවේදී කාම තෘප්තිය සෙවීම සඳහා වන අතර මෙයම මූලික හේතුව වීම මගින් සමස්ත කර්ම ක්‍රියාවලිය පුරාවටම ඉපදීමෙන් හා මියදීමෙන් අඛණ්ඩවූ ප්‍රබල දුක්ඛ ධර්මයන්ට සත්ත්වයින්ට මුහුණ දිය යුතුව ඇත.

සමස්තයක් ලෙසින් චිත්තානු පරිවර්තී සම්ප්‍රයුක්ත මානසික ශක්තියෙහි ස්පර්ශ ක්‍රියාවලිය හරහා ලැබීමට නියමිත වන දුක් වේදනා සහිත මානසික පීඩාවන්ට විෂය වීමෙන් ඒ දරාගත නොහැකි වන වැලපීම්, අසතුටුවීම්, කලකිරීම්, මානසික දුක් වේදනා ලෙසින් වන මානසික අසමතුලිතතාවයට හේතුව වන්නේද මානසික ශක්තීන්ගේ ස්වාභාවික ගුණය වන සැප සංවේදී භාවයටම අනුගත වීමට

ගන්නා උත්සාහය හේතුව වීමෙනි. එනම් කර්ම චක්‍ර ක්‍රියාවලියට මූලික පදනම වන මානසික ප්‍රිය ස්පර්ශ ධර්මයන්හි ආන්තික වීමට සත්ත්වයෝ යොමු වීමෙන් සංඥාවන්හි අප්‍රසන්න සංවේදනයන්ගෙන් වැලකීමට ගන්නා උත්සාහ නිසා මුළු මහත් කර්ම ක්‍රියාවලිය පුරාවටම සත්ත්වයින්ට සංසාරික භවගත සසර දුක උරුම වී ඇත.

චිත්ත ශක්තීන්ගේ මූලික ගුණාත්මක භාවය වන එහි සම්ප්‍රයුක්ත මානසික ස්පර්ශ ක්‍රියාවලිය තුලින් සැප සංවේදී සංඥාවන්ට පමණක් මනුෂ්‍යය සහ තිරිසන් සත්ත්වයෝ දක්වන සැප සංවේදී කාම තෘෂ්ණාව හේතුව වීමෙන් සියළුම සත්ත්වයින්ට ස්වභාවයෙන්ම දැඩි දුක් වේදනා දැරීමට සිදුවනු ඇත. මෙම චිත්ත ධර්මතාවයෙහි ස්වාභාවික ස්පර්ශයන්හි ගුණාත්මකභාවය හේතුව වීමෙන් මනුෂ්‍යයන්ට ස්වභාවගතව ක්‍රියාත්මක විද්‍යාත්මක ධර්මතාවයෙහි කර්ම ශක්තීන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලිය දුක්ඛ ධර්මතාවයකට පදනම වීමෙන් සතර අපායන්හි ප්‍රතිසන්ධියට යොමු වීමට නියමිත වන කර්ම ක්‍රියාවලියෙහි විද්‍යාත්මක, ස්ථිතික විද්‍යුත්මය හා අධ්‍යාත්මික ස්වභාවය ගැන අනවබෝධය අවිද්‍යාව බවට පත්වනු ඇත. මෙම විද්‍යාත්මක ක්‍රියාවලියට අනුව චිත්ත ශක්තීන්ගේ අධ්‍යාත්මික වූ විද්‍යා ක්‍රියාවලියෙහි ඇති සැටිය නොදැනීමෙන් මුලුමහත් මනුෂ්‍යය සන්තතිය නොනවත්වා සහ දැඩි ලෙස කැපවීමෙන් ප්‍රභලවූද බලවත්වූද උත්සාහයෙන් එලෙසම බලවත් අඥානවන්තව කායික මානසික කාම තෘෂ්ණාව උපරිම ලෙස විඳීමට මහන්සි ගැනීම තුලින් තම තමන් සතුවූ එම අවිද්‍යාවට අනුව තමන් යනු පුද්ගලයෙක් වශයෙන් සිතීමේ පුද්ගල දෘෂ්ඨියද තමන් යනු දේව පුත්‍රයින් වශයෙන් දැකීමේ ආත්ම දෘෂ්ඨියද එමෙන්ම - තමන් යනු ස්පර්ශග්‍රාහී කාම ඉන්ද්‍රියන් පිනවීම සඳහාම ඉපදුන මනුෂ්‍ය සත්ත්වයෙකු යැයි සිතන හා දකින මිත්‍යා දෘෂ්ඨියටද ගොදුරු වී ඇත.

මෙලෙස ක්‍රියාකාරීවන චිත්ත ශක්තීන්ගේ අධ්‍යාත්මික වූ විද්‍යාත්මක ක්‍රියාවලියට අනුව ප්‍රියමනාප නොවන කායික සහ මානසික ස්පර්ශය සංඥාවන් ඉදිරියේ මනුෂ්‍ය සත්ත්වයෝ ලොවෙහි ක්‍රියාකාරී ධර්මයන්ට විරුද්ධ සංවේදී ස්වභාවයක් වශයෙන් දැකීමේ දෝෂය එනම් ද්වේශය ලෙසින් වෛරය, තරහව සතුරු බව විරුද්ධ බව ලෙසින් ක්‍රියාත්මක වීමෙන් සංසාරගත කර්ම ක්‍රියාවලියට පාදක වන ප්‍රතිසන්ධි ක්‍රියාවලියෙහි මූලික හේතුව නිර්මාණය කර ගනු ඇත. මෙහිදී සත්ත්වයන් විසින් ප්‍රබල ලෙසින් තහවුරු කර ගන්නා සැප සංවේදී කාම, තෘෂ්ණා පාදක ස්පර්ශ ක්‍රියාවලියට අනුව අධ්‍යාත්මිකව පිළියෙල වන සංඥාවන්හි මානසික සංස්කරණයෙහි ද්විපාර්ශික ධර්මයන් ලෝභ සහ ද්වේශය ලෙසින් හඳුනා ගත හැක. වෛරී ධර්මයෝ කාම තෘෂ්ණාව මතත් කාම තෘෂ්ණා ධර්මයෝ වෛරී ධර්මයෝ මතත් ඇලීමට හා ගැටීමට යොමුවනු ඇත. මෙලෙස එකිනෙක මත සහජාතකව ක්‍රියාත්මක වන ලෝභ, ද්වේෂ නම් වන මානසික යුග්ම ධර්මතාවය එකිනෙකට ක්‍රියාත්මක වීමේ ස්වභාවය නොදැනීම නිසා සත්ත්වයෝ අවිද්‍යාවට ගොදුරු වනු ඇත. එවිට අප්‍රසන්න සහගත මානසික සංවේදී සංඥාවන් සඳහා සත්ත්වයන්ට වෛරය, ද්වේෂය, හිංසාව, ක්‍රෝධය ලෙසින් වන හේතුඵල ධර්ම නියාමයන්ට අනුව පිළියෙල වන දුක්ඛ ධර්මය මූලය වන සංසාරික භව චක්‍රයට යොමු වනු ඇත. මෙලෙස කර්ම චක්‍රයට මූලය වන වෛරී ධර්මයන් වඩන මනුෂ්‍යයෝ ස්වකීය මනුෂ්‍යය වර්ගයාට පමණක් නොව සෙසු සත්ත්වයින්ටද විරුද්ධ වීමෙනුත් සතුරු වීමෙනුත් එදිරි වීමෙනුත් ප්‍රබල හිංසා ධර්මයෝ ප්‍රගුණ කරනු ඇත.

ලෝක ස්වභාවයෙහි මූලික සහ පදනම් ක්‍රියාකාරී සම්ප්‍රයුක්ත කර්ම ධර්මය වන දුක් සංවේදීතාවය පරම සත්‍යය වන අතර සමස්ත මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ට එම මූලික දුක් සංවේදී ධර්මයන්ට අකමැත්තෙන් වුවද මුහුණ දිය යුතුව ඇත. මනුෂ්‍යය ලෝකයේ පෘතග්ජන කිසිවෙකුට තම තමන්

සමග කර්ම චක්‍රය හරහා පැමිණීමෙන් තමන්ට විඳීමට ඇති දුක් සංවේදී කර්මයන් කිසි විටෙක මැඩලිය නොහැක. මනුෂ්‍යය සහ තිරිසන් වන සියළුම සත්ත්වයෝ ඔවුනොවුන් විසින් අවිද්‍යාවෙන් පිළියෙල කරගත්තාවූ මානසික සංස්කරණයන්ට අනුව එනම් පෙර භවයන්හිදී රැස්කරගත් මානසික සංස්කරණයන්ට අනුව එනම් අවිද්‍යාව හේතු වීමෙන් තෘෂ්ණාව වඩන ලද සත්ත්වයෝ ය. මෙලෙස ඒ ඒ භවයන්හිදී අවිද්‍යාවෙන් හා තෘෂ්ණාවෙන් පිළියෙල කරගත් මානසික සංස්කරණයෝ විශ්ව ලෝක ගත ස්තිථික විද්‍යුත් ප්‍රභවය සහිත සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ශක්තීන්ගේ අනවබෝධය මගින් එනම් අවිද්‍යාව තුලින් අනුමත කරගත් මානසික දුක්ඛ ධර්මයෝ ය.

සන්තතික ගත සත්ත්ව ධර්මතාවයන්හි විද්‍යාත්මක හේතුඵල ධර්මයන්හි යථා ස්වභාවය නොදැනීමෙහි අවිද්‍යාව පාදක වීමෙන් අඥාන වූ එමෙන්ම යථාර්තය පිළිබඳ ප්‍රකෘති සිහියට පත් නොවූ පෘතග්ජන මනුෂ්‍යයෝ තම තමන් සතු දුක්ඛ ධර්මය පාදක වූ කර්ම චක්‍රයට බැඳී ඇත. මෙය ප්‍රධාන හේතුව වීමෙන් සමස්ත ලෝකවාසී අඥාන මනුෂ්‍යය ප්‍රජාව නොදන්නා සහ අවිනිශ්චිත මතු උපතකට අවශ්‍ය කර්ම විපාක සංසාර දුක විඳීමට පිළියෙල කරගනු ඇත. අති බහුතරයක් වන පෘතග්ජන මනුෂ්‍යය ප්‍රජාව මෙම ප්‍රබල අවිද්‍යාවෙන් ප්‍රබල අඥානයින් බවට පත් වීමෙන් සංසාර ගත ප්‍රබල කර්ම විපාක චක්‍රයට ගොදුරු වී ඇත. සත්ත්වයන්ගේ කර්ම චක්‍රයන්හි එක් අන්තයක් වන මියදීමේ ධර්මතාවය සෑම සත්ත්වයෙකුටම විඳීමට නියමිතව ඇති ප්‍රබලතම දුක් සංවේදී ධර්මයක් වනු ඇත. මක්නිසාදයත් කිසිම මනුෂ්‍යයෙකුට හෝ තිරිසන් සත්ත්වයෙකුට හෝ තමා සතු මියදීමේ මොහොත තීන්දුකර ගැනීමකට හෝ කල්දමා ගැනීමකට හෝ නොහැකි වන අතර එම මරණය නැමැති දුක්ඛ ධර්මයට මුහුණ දීමෙන් අවිනිශ්චිත භවයකට ඇතුල්වීම සඳහා සියලුම සත්ත්වයන්ට නොදන්නා

දිනයකට සහ නොදන්නා වේලාවකට මුහුණ දිම සඳහා නියමිතව ඇත. සත්ත්වයන් සතු කර්ම චක්‍ර ක්‍රියාවලියේ ප්‍රබල දුක්ඛ ධර්මතාවය වන මරණ ධර්මතාවයට සමස්ත සත්ත්ව වර්ගයාටම මුහුණ දීමට සිදුවී ඇති දුක්ඛ ධර්ම ක්‍රියාවලියෙහි ප්‍රධාන දුක්ඛ ධර්මය වන අතර ඒ සඳහා ගත යුතුව ඇති අවශ්‍ය පියවරක් කිසිවෙකුට ගත නොහැකිවී ඇත. එමෙන්ම ඒ ගැන අවබෝධකර ගැනීමටද පහසු නොවන ඉතා සූක්ෂ්ම වූද ඉතා ගාම්භීර වූද, ඉතාමත් තීක්ෂණ වූද ස්වභාවගත විද්‍යාත්මක හේතුඵල ධර්මයෙහි කර්ම ක්‍රියාවලියෙහි එක් අප්‍රසන්න දුක්ඛ ධර්මයක එක් අන්තයක් වන අතර අවිද්‍යාවෙන් තෘෂ්ණාවෙන් සහ ද්වේශයෙන් කර්ම චක්‍රයට යටත් වූ පෘතග්ජන මනුෂ්‍යයන්ට ඒ ධර්මතාවය අවබෝධකර ගත නොහැකි වීමෙන් අවිද්‍යාවට හසුවූ අඥානයින් බවට පත්වී ඇත.

ලෙහෙසියෙන් අවබෝධ කරගත නොහැකිවූ විද්‍යාත්මකවූ අධ්‍යාත්මික කර්ම චක්‍ර ක්‍රියාවලියෙන් කිසිම පෘතග්ජන සාමාන්‍ය මනුෂ්‍යයෙකුට නිදහස් විය නොහැක. තථාගත බුද්ධ දේශනාවට අනුව ප්‍රඥා සම්ප්‍රයුක්ත චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගන්නා තුරු මුළු මහත් පාතග්ජන අඥාන මනුෂ්‍යය තිරිසන් ප්‍රජාව ජාති, ජරා, ව්‍යාධි, මරණ සහිත දුක් ධර්ම සංගෘහිත අනවරත වන භව ගමනක් යා යුතුව ඇත. කිසිම ලෞකික අඥාන මනුෂ්‍යයෙකු ස්වභාවගතවූ තමාට වැලක්විය නොහැකි මරණ ධර්මය තමා සතු වූයේ ඇයි දැයි විමසීමක් නොකරන අතර මරණින් මතු සිදු විය හැකිව පවත්නා නොදන්නා ජීවිතයකට මුහුණ දීමටද සිදුවන මෙම ධර්මතාවයන්හි විද්‍යාත්මක පසුබිම පිළිබඳ නිවැරදි අවබෝධයකට හෝ ඒ පිළිබඳ සිදුවිය හැකි ධර්මතාවයෙහි යථා ස්වභාවය පිළිබඳව හෝ ඔවුනට පැහැදිලි හා ස්ථිර විශ්වාසයක් ඇති කරගත නොහැකි වනු ඇත. මේ අනුව සෑම සත්ත්වයකුටම තමාගේ මරණින් පසු මුහුණ දිය

යුතුව ඇති ජීවිතය පිළිබඳ අවිනිශ්චිත භාවය සත්ත්වයින් සතුව පවතින ප්‍රබල දුක් ධර්මයන්හි තවත් එක් ප්‍රබලවූ පරම සත්‍යයකි. සමස්ත අශ්‍රද්ධාන පෘතග්ජනයින් ප්‍රශ්‍රද්ධාවබෝධයෙන් දුරස්වීම හේතුවෙන් මෙලොව තමන් සතු කිසිවකින් හා කිසිවකුගෙන් කිසිදු පිළිසරණක් නොමැතිව මරණින් මතු ලෝකයකට යාමට සිදු වන්නේ තම තමන්ට මරණින් පසු සිදුවිය හැකි වන කිසිදු සත්‍යය සිදුවීමක් පිළිබඳ කිසිදු විශ්වාසයකින් හා අවබෝධයකින් තොරවයි.

සමස්ත පෘතග්ජන මනුෂ්‍යයන්ට මුහුණ දීමට සිදුවන ලෞකික ධර්මයන්හි සතුටුදායක විය නොහැකි ස්වභාවයන්ට මුහුණ දීමට සිදු වූවත් ඔවුන්ට ඒවා කෙරෙහිම ඇලීම් ගැටීම් සහිතව ජීවත් වීමට සිදුවී ඇත්තේ නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය තුලින් නොදන්නා භවයකට ඇතුලත් වීමෙන් මරණයෙන් මතු ලෝකය තුලදී වයසට යෑම ලෙඩදුක් වලට මුහුණ දීම ජරාවට පත්වීම හා මරණයට පත්වීම ලෙසින් වන සන්තතික ප්‍රබල දුක් සංවේදී කර්ම ධර්මයන්ට නැවත මුහුණ දීමට දක්වන බලවත් භය හේතුව වීමෙනි.

සමස්ත පෘතග්ජන මනුෂ්‍යයන් තථාගත ධර්මය නොදැනීමෙන් අවිද්‍යාවට පත්ව තමාට තමාගේ මරණින් පසු නැවත ඉපදීමට නියමිතව පවතින භවයකදී කුමක් සිදු වේදැයි නොදන්නා පිරිසකි. සමස්ත අශ්‍රද්ධාන පෘතග්ජනයින් චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් තොරව කිසි ලෙසකින්වත් තම තමන් සිතන පතන හෝ බලාපොරොත්තු වන සුදුසු ලෝකයකට තමන්ට මරණින් පසු යා නොහැක. සත්ත්වයන් විසින් කායිකවත් සහ මානසිකවත් රැස්කරගත් කුසල් ලෙසින් හා අකුසල් ලෙසින් ද්විත්වයකට යොමුව පවතින කර්ම ක්‍රියාවන්ට අනුව විද්‍යාත්මක සන්තතික කර්ම ධර්ම ක්‍රියාවලිය කෙසේ සිදුවේදැයි නොදන්නා කමින් සමස්ථ පෘතග්ජන මනුෂ්‍ය ප්‍රජාව අවිද්‍යාවට යොමු වී ඇත.

එම පෘතග්ජන මනුෂ්‍යයින්ට කිසිලෙසකින්වත් අනුමාන කර ගැනීමකටවත් නොහැකි වන ඔවුන්ගේ මතු භවයකදී සිදුවිය හැකිවන කර්ම පැවැත්ම ඔවුන් විසින් පිළියෙල කරගත් කර්ම විපාකයන්ට අනුව නැවත ඉපදීමෙන් පසුව ඔවුනට මුහුණ දීමට සිදුවන අනාගත ලෝකය දේව ලෝකයක් තුලදී සිදුවිය හැකි දැයි හෝ බ්‍රහ්ම ලෝකයකදී සිදුවිය හැකිදැයි හෝ එසේ නොමැති නම් මනුෂ්‍යය ලෝකයකදී සිදු විය හැකිදැයි හෝ තිරිසන් ලෝකයකදී සිදුවිය හැකිදැයි හෝ ප්‍රේත ලෝකයකදී සිදුවිය හැකිදැයි හෝ අසුර ලෝකයකදී සිදුවිය හැකිදැයි හෝ නිරයකදී සිදුවිය හැකි දැයි හෝ නොදන්නා අඥාන පිරිසක් වනු ඇත.

තථාගත ධර්මය නොදන්නා අඥාන මනුෂ්‍යයන් තම තමන්ගේ අවිද්‍යාවට අනුව පිලියෙල කරගත් භව දුක මූලගත කර්ම ධර්මය සත්ත්වයින්ගේ සන්තතික විද්‍යා පැවැත්ම සඳහා දුක්ඛ ධර්මයක් වෙතට යොමු වීම පිණිස කර්ම චක්‍රයකට කෙසේ යොමු වන්නේ ද යන්න පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති අඥාන පෘතග්ජන මනුෂ්‍ය පිරිසකි. මේ වන තුරුත් ලොවෙහි ක්‍රියාත්මකවන එකම සහ ප්‍රබල සත්‍යය දුක්ඛ සත්‍යය වන අතර එයින් මනුෂ්‍යයන්ට ඉවත්වීමට අවශ්‍ය ස්ථිරවූද විකල්පවූද ප්‍රතිකර්මයක් මේ වන තුරුත් කිසිවෙකුට සොයාගත නොහැකි වී ඇත. මේ සඳහා කුමන පියවරක් ගතයුතු දැයි හෝ ගත යුතු නිවැරදි පියවර හා ඉන් නිදහස් වීම කෙසේ කලයුතු දැයි අති බහුතරයක් වන අඥාන පෘතග්ජන මනුෂ්‍යයින් නොදන්නා අතර මෙම ලෝකයෙහි ක්‍රියාත්මක පරම සත්‍යය පිළිබඳ අද්විතිය අවබෝධයකට පත් ලොවෙහි මෙතෙක් කල් ජීවත් වූ එකම අද්විතීය ශාස්තෘවරයා වන ශ්‍රේෂ්ඨවූ බුදුරජාණන් වහන්සේ විසින් යා යුතු නිර්වාණ මාර්ගය ඉතා නිරවුල්ව ලෝකයාට දේශනා කර ඇත.

# මිථ්‍යාවක් නොවේ

*දැඩි අධ්‍යාත්මික පරිවර්තනයකින් මනුෂ්‍යයකුගේ ආත්ම දමනය සිදු කිරීම මගින් මනුෂ්‍යයකු බිහි කිරීම බුදුදහමෙහි අරමුණ වන අතර එය එසේ තිබියදී පවා බලයෙන් සහ මුදලෙන් හෝ වෙන උපක්‍රමයකින් ඉහත ඵලයක් කෙසේ ලබා ගතහැකිද? බුදුන් වහන්සේ විමුක්තියට අවශ්‍ය මාර්ගය පමණක් කියාදී ඇති අතර ඕනෑම අයෙකුට තමන්ට විමුක්තිය අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මඟ පෙන්වා ඇත.*

මහාචාර්ය ලක්ෂ්මි නරාසු
(*"The Essence of Buddhism"* නැමති ග්‍රන්ථයෙනි)

## 3.2.2 මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයින් කෙරෙහි ක්‍රියාත්මකවන දුක්ඛ සත්‍යය ධර්මයන් සඳහා හේතුවවන විද්‍යාත්මක ධර්මතාවය (සමුදය සත්‍යය)

විද්‍යාත්මකවූ සන්තතිකවූ කර්ම ධර්ම ක්‍රියාවලියට යටත්ව කාම තෘෂ්ණාවට යොමු වූ පෘතග්ජන මනුෂ්‍යයන් එම විද්‍යාත්මක කර්ම ධර්ම ක්‍රියාවලියෙහි විද්‍යාත්මක බව ගැන නොදැනීමේ අවිද්‍යාව තුලින් නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියට යොමු වී ඇත. මානසික කර්ම ධර්ම ක්‍රියාවලියෙහි සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලිය ජීව විද්‍යාත්මක ලෝකය තුල සත්ත්වයන්ට අඛණ්ඩවූ පැවැත්මක් සඳහා යොමු වීමට සිදු වී ඇත. විද්‍යාත්මක සන්තතික කර්ම ක්‍රියාවලිය තුලින් සත්ත්වයින්ගේ නැවත ඉපදීම හා මියදීමේ භව චක්‍රය අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ සම්ප්‍රයුක්ත සැලැස්මකට යටත්ව සිදු වනු ඇත. සාමාන්‍ය අඥාන පෘතග්ජනයින් විසින් අවිද්‍යාව තුලින් ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන්ට

අනුගතව පිළියෙල කරගත් කර්ම ශක්තීන් මානසික අධ්‍යාත්මික විද්‍යුත් සැලැස්මක් ලෙස කර්ම නිර්මාණය වීමේ ක්‍රියාවලියට අනුගත වී ඇත.

සන්තතික ලෝක ධර්මයන්හි සමස්ත මනුෂ්‍ය - තිරිසන් සත්ත්ව හා ශාක සංස්කාරක වස්තූන් ප්‍රධානවම හා සෘජුව ක්‍රියාත්මක වීමත් සහ එහි පැවැත්මත් ලෝක ධර්මතාවයන්හි විද්‍යාත්මක නියාම ධර්මය වන හේතුඵල නීතියට යටත්ව සිදුවනු ඇත. මනුෂ්‍යය තිරිසන් සහ ශාක ලෙසින් මෙලෙස සංස්කරණය වන සන්තතික වස්තූන් යනු ස්ථිතික විද්‍යුත් ශක්තීන් සමග සංයෝජනය වූ ද්‍රව්‍යාත්මක පදාර්ථගත නිර්මාණයන්ය. මෙහිදී දුක්ඛ ධර්මය රඳා පවතිනුයේ මුලුමනින්ම මෙම නිර්මාණය වූ වස්තූන් සතු ප්‍රධාන ගුණාත්මක බවෙහි සම්ප්‍රයුක්ත සංවේදී ශක්තීන් මත වන අතර ඒ පිළිබඳ නොදැනීම අඥානයින්ට අවිද්‍යාව වනු ඇත. මෙම අවිද්‍යාවට පත්වීම මුලුමනින්ම රඳා පවතින්නේ කාම තෘෂ්ණාවත් එයට ප්‍රතිපක්ෂ ධර්මය වන ද්වේෂයත් යන මූලික ක්ලේෂ ධර්ම යුග්මය නිසාය. එවිට අවිද්‍යාව හේතුව වීමෙන් ලබන ඵලය දුක් වේදනාවන්ට මුහුණ දීම වනු ඇත. සමස්ත අඥාන මනුෂ්‍යයන්ගේ අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත ස්තිථික විද්‍යුත් ශක්ති ක්‍රියාවලිය තුලින් සිදුවන චිත්ත සහ මානසික ධර්මයන්ගේ විද්‍යා ක්‍රියාවලියෙහි අනවබෝධය නිසා ඔවුන් අවිද්‍යාවට ලක් වීමට හේතුව වී ඇත.

මනුෂ්‍යය - තිරිසන් සත්ත්ව හා ශාක ලෙසින් වන ද්‍රව්‍යාත්මක වස්තූන් සියල්ලම මානසික සංස්කරණය සඳහා පදනම්වන නාම - රූප නමින් හඳුන්වනු ලබන අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් සංයෝජන බලයකට යටත්වනු ඇත. ස්ථිතික විද්‍යුත් ප්‍රභවගත චිත්ත ශක්තීන් එහි අන්තර්ගත ශක්තීන්ගේ ශක්ති සැලැස්මට අනුව අධ්‍යාත්මික සම්ප්‍රයුක්ත මානසික සංස්කරණයෙහි කර්ම ශක්ති ක්‍රියාවලිය තුලින් කායික

ඉන්ද්‍රියන්හි තෘෂ්ණාව ක්‍රියාත්මක කරවීම සඳහා යොමු වී ඇත. මෙම හේතුව නිසා සාමාන්‍ය පෘතග්ජනයින්ද තිරිසන් සත්ත්වයින් අනුගමනය කරන එම සත්ත්වයින්ගේ කායික මානසික ස්වභාවයට සමානව හා අදාලව තම තමන්ගේ කායික මානසික ක්‍රියාවන්ද කිරීම තුලින් මරණින් පසු එම තිරිසන් කර්ම විපාක ක්‍රියාවලියට අනුකූලව තිරිසන් භවය ප්‍රධාන කොටගත් සතර අපාගත වනු ඇත. අවිද්‍යාවට පත්වීම තුලින් සමස්ත මනුෂ්‍යය තිරිසන් සත්ත්වයෝ තම තමන්ගේ චිත්ත හා මානසික විද්‍යාත්මක කර්ම ධර්මයන්ගේ සන්තතික වන කර්ම ධර්ම පැවැත්මේ කර්ම චක්‍රයට තම තමන් යොමු වන අයුරු නොදැනීමෙන් ලොවෙහි ක්‍රියාත්මක ප්‍රධාන සත්‍යය ධර්මතාවය වන දුක්ඛ ධර්මයට ගොදුරු වීමට හේතුව පිළියෙල කරගනු ඇත.

සියළුම අඥාන මනුෂ්‍යයන්ට තම තමන් විසින් විශ්ව ලෝක ගතව ක්‍රියාත්මක වන විද්‍යාත්මකවූ ප්‍රඥා ධර්මය අවබෝධ කර ගැනීමෙන් ලොවෙහි ක්‍රියාත්මකවූ සත්‍යය ධර්මතාවය වන චතුරාර්ය සත්‍යය ධර්මය පිලිගන්නා තෙක් තම තමන්ට විඳීමට සිදුවන සමස්ත ජාති, ජරා, ව්‍යාධි, මරණ නම්වන දැඩි දුක්ඛ ධර්මතාවයට මුහුණ දීමට සිදුවනු ඇත. එම අඥාන මනුෂ්‍යයන්ට හඳුනා ගැනීමෙන් හා අවබෝධකර ගැනීමෙන් අනුගමනය කල යුතුව ඇති ආර්ය මාර්ගය අනුගමනය නොකරන්නේ නම් ඔවුන් සියල්ලන්ම දුක්ඛ කර්ම ක්‍රියාවලියට අනිවාර්යයෙන්ම යොමු විය යුතුව ඇත. ආර්ය මාර්ගය තුලින් ප්‍රඥා සම්ප්‍රයුක්ත චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන් යමෙකු අවිද්‍යාවෙන් නිදහස් වූයේ නම් එම පුද්ගලයා විසින් සිය ජීවිතයේ තමන් ලබපු එකම ජයග්‍රහණය එය වනු ඇත.

නැවත ඉපදීමේ කර්ම චක්‍රයට පදනම වන සංස්කාරක වස්තූන්ගේ සංඥාවන්හි ස්පර්ශ පාදකවූ මානසික

සංස්කරණය පිළියෙල කර ගැනීමෙන් අවිද්‍යාවටපත් සියලුම අඥාන පෘතග්ජනයෝ නිසැකවම භවගත දුක්ඛ කර්ම සන්තතියට ගොදුරු වනු ඇත. කර්ම සන්තතියෙහි විද්‍යාත්මක මූලධර්මයන් අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් ශක්තීන් ලෙස පිළියෙල වීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය නොදැනීමෙන් අවිද්‍යාවට පත්වන නූගත් පෘතග්ජනයින් තමන් යනු පුද්ගල මමත්වයක් ලෙසින් ද තමන් යනු දේව පුත්‍රයෙකු යයි සිතීමෙන් ද තමන් යනු මනුෂ්‍යය සත්ත්වයකු යැයි සිතීමෙන් ද දැඩි අවිද්‍යාවට පත් වීමෙන් නූගත්කමට ගොදුරු වී ඇත. ද්‍රව්‍යාත්මක ලෝකයෙහි පදාර්ථ ගත මූලද්‍රව්‍යයන් සහ ස්වභාවයෙහි ක්‍රියාකාරී ස්ථිතික විද්‍යුත් බලය විද්‍යුත්මය ලෙසින් සමානව සංයෝජනය වීමෙන් ලොවෙහි පවත්නා ශාක සහ සත්ත්ව සංස්කාරක වස්තූන් සියල්ලම නිර්මාණය වී ඇත. මෙම සමස්ත සංස්කාරක වස්තූන්ගේ විද්‍යාත්මක සංස්කරණ ක්‍රියාවලිය සඳහා ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ සංස්කරණ ශක්තීන් පදනම් වී ඇත. මෙම ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ සංස්කරණ න්‍යායයෙන් බැහැරව කිසිදු සත්ත්ව හා ශාක සංස්කාරක වස්තූන් නිර්මාණය වන්නේ නැත. ලෝකයෙහි ක්‍රියාත්මක මෙම සන්තතික විද්‍යා න්‍යාය ධර්මයට අදාලව සත්ත්ව සහ ශාක වස්තූන්ගේ නිර්මාණයත් ඒවායේ අඛණ්ඩ සන්තතියත් ස්ථිතික විද්‍යුත් මූලධර්මයේ න්‍යාය ධර්මයන්ගේ හේතූන්ට අදාලව ක්‍රියාත්මක වන ලෝක ස්වභාවයේ විද්‍යාත්මක නීතිය වන හේතුඵල ධර්ම නියාමයට අනුගත වී ඇත.

සත්ත්වයන් කෙරෙහි ක්‍රියාත්මක නිත්‍ය සහ ස්ථිර ධර්මතාවය වන දුක්ඛ සංවේදී ධර්මයන්ගෙන් කර්ම චක්‍රය නිර්මාණය වීම සඳහා සත්ත්වයන් කෙරෙහි පවත්නා ආත්මාර්ථකාමී තෘෂ්ණාව ලෞකික පෘතග්ජන මනුෂ්‍යය ජීවිතය කෙරෙහි ත්‍රිවිධාකාරයකින් බලපවත් වනු ඇත.

1. කාම තෘෂ්ණාව - මමත්වය පිනවීම සඳහා අරමුණුව ක්‍රියාත්මක කරනු ලබන කාම සංවේදී කායික හා මානසික

ඉන්ද්‍රිය පරිහරණය තුලින් සතුටුවීම අරමුණු කරගත් අවිද්‍යාවෙහි මානසිකත්වය (මිත්‍යා දෘෂ්ඨිය).

2. භව තෘෂ්ණාව - ආත්මයක් ඇතැයි දැකීමේ මානසිකත්වයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි පවත්නා විශ්වාසය අනුගමනය කිරීමෙන් නැවත ඉපදීමේ ක්‍රියාවලියට යොමු වීම/කාම තෘෂ්ණාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් මතු භවයකදී දිව්‍ය ස්වර්ග මෝක්ෂ සම්පත් ලැබීමෙන් අමරණීයත්වයට පත්වීම විශ්වාස කිරීමේ මැවුම්කාර දේව සංකල්ප පාදකවූ අවිද්‍යා මානසිකත්වය (ආත්ම දෘෂ්ඨිය)

3. විභව තෘෂ්ණාව - අනිවාර්යයෙන් කායික ඉන්ද්‍රියයන් පිනවීම සිදු කිරීම කල යුතු බව සහ ඒ වෙනුවෙන් ඉපදුන බව විශ්වාස කිරීමත් නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය විශ්වාස නොකිරීමෙන් ලෞකික කාම සුඛ විහරණය අධිකව ලබාගැනීමේ පුද්ගල මානසිකත්වයෙහි අවිද්‍යාව (සක්කාය දෘෂ්ඨිය)

ඉහත සඳහන් ත්‍රිවිධ කාම තෘෂ්ණා පාදක දෘෂ්ඨීන්ට යටත්වූ සමස්ත අශ්‍රැතවත් පෘතග්ජනයින් සියල්ලන්ටම අනිවාර්යයෙන්ම දුක්ඛ භූමිගත නිරය, තිරිසන්, ප්‍රේත, අසුර භූමීන්හි ප්‍රතිසන්ධි විය යුතුව ඇත. ප්‍රභල වූ දුක්ඛ ධර්මය ක්‍රියාත්මක වන සතර අපාගත සත්ත්ව වාසයන් සඳහා මනුෂ්‍යයන්ට යොමු වීමට සිදුවන්නේ ප්‍රධාන ලෙසින් කාම තෘෂ්ණාවත්, ද්වේශයත් ප්‍රබල ලෙසින් ක්‍රියාත්මක කරවීම නිසා වන අතර නිර්වාණ ධර්ම අවබෝධය පිණිස උත්සාහය උනන්දුව නොමැති කමත් ධර්මය පිලිබඳ පැහැදිලි නිරවුල් අවබෝධයට පත් නොවීමත් ක්‍රියාත්මක දුක්ඛ ධර්මයන්හි කර්ම ක්‍රියාවලියෙන් ඉවත්වීමට වීර්යය නොගැනීමත් තමන් යනු මතු භවයක ප්‍රතිසන්ධියට නොයන කෙනෙක් ලෙස සිතමින් නිර්වාණ ධර්මය කෙරෙහි සැක කිරීමත් යන දුර්වල පෘතග්ජන

ස්වභාවයන් හේතූන් වන අතර ඒ තුලින් සියල්ලන්ටම දැඩි දුක් ක්‍රියාත්මක වන සතර අපායෙහි ඉපදිය යුතුව ඇත. ඉහත ලෙස ලෞකික කර්ම ක්‍රියාවලියෙහි නිරත පෘතග්ජන මනුෂ්‍යයින් එම කර්ම මාර්ගයෙන් ඉවත් වීමට ඔවුන්ට නොහැකි වන්නේ දුක්ඛ ධර්ම සංඛ්‍යාත කර්ම සන්තතිය මෙහෙය වන සක්කාය දෘෂ්ඨියත්, ආත්ම දෘෂ්ඨියත් මිත්‍යා දෘෂ්ඨියත් වන අතර ඒ සඳහා ඉහත සඳහන් කල ත්‍රිවිධ දෘෂ්ඨීන්ගේ සන්තතික විද්‍යාත්මක ධර්මතාවයන් වන ත්‍රිවිධ තෘෂ්ණා පාදක මානසික ධර්මයන්හි අනවබෝධය අවිද්‍යාව වනු ඇත.

ලෞකික පෘතග්ජන කර්ම ක්‍රියාවලිය සඳහා සත්ත්වයන්ගේ පැවැත්ම කෙරෙහි ක්‍රියාත්මක විද්‍යාත්මක ධර්මයන්හි අනවබෝධය තුලින් අඥාන පෘතග්ජන මනුෂ්‍යයෝ කාම තෘෂ්ණාව ප්‍රගුණ කිරීමත් කෙලෙස් ධර්ම වැඩීමත් අකුසල් ධර්ම ප්‍රගුණ කිරීමත් තමන් යනු පුද්ගලයෙක් ලෙස දැකීමේ මුලාවටත් තමන් යනු දෙවියෙකුගේ නිර්මාණයක් ලෙස දැකීමටත් හේතුව වනු ඇත. මෙම අවිද්‍යාවෙහි ප්‍රතිඵලයක් ලෙස අඥාන මනුෂ්‍යයන්ට ලොවෙහි පවතින සංස්කාරක වස්තූන් අගය කල හැකි වස්තූන් වශයෙන් වටිනාකම් ඇති වස්තූන් වශයෙන් සහ කාම සැපයට ගත හැකි වස්තූන් වශයෙන් සැලකීමෙන් ඉහත සඳහන් ත්‍රිවිධ තෘෂ්ණාවන්ට ගොදුරු වනු ඇත.

සමස්ත සත්ත්ව සහ ශාක සංස්කාරක වස්තූන්ගේ නිර්මාණයන්ගේ අන්තර්ගතය විමර්ශනය කිරීමෙන් සහ විශ්ලේෂනය කිරීමෙන් එනම් විද්‍යාත්මක පදනම විද්‍යාත්මකව අවබෝධකර ගැනීමෙන් අත්පත් කරගත හැකි අවසාන ඵලය වන්නේ ද්‍රව්‍ය සහ ශක්තීන්ගේ එකතුවකින් සියළුම වස්තූන් ගොඩනැගී ඇති බවයි. ලෝක ධර්මතාවයන්හි පවතින ව්‍යවස්ථාවට අනුව සන්තතික ධර්මතාවයෙහි පදනම රඳා පවතින්නේ සංස්කාරක විද්‍යුත් ශක්තීන්ගේ සැලැස්මට අනුව පිළියෙල වූ පදාර්ථගත මූල ද්‍රව්‍යයන් සමග සංස්කරණය වූ

වස්තූන්ගේ ඇතිවීම සහ නැතිවීම පදනම් කරගත් එමෙන්ම අඛණ්ඩ කර්ම සන්තතියකට යොමු වීමට නියමිතවීම තුලිනි. මෙම ඇතිවීම සහ නැතිවීම පදනම්වන සංස්කාරක වස්තූන්ගේ සන්තතික ධර්මතාවය එම සත්ත්වයන්ට ස්ථාවර නොවන එනම් අනිත්‍ය වන තාවකාලික පැවතීමකට නියමිතව ඇති අතර නිරතුරුවම එම සංස්කාරයන් වෙනස්වීම්, ක්ෂය වීම්, කැඩීම්, බිඳීම් ලෙසින් මියදීම තෙක් කෙටි කලකට වලංගුවනු ඇත. සමස්ත සංස්කාරක වස්තූන් බිඳෙන සුලු සහ වෙනස්වන සුළු ස්වාභාවික සැලැස්මකට නිර්මාණය වී ඇති අතර එම ස්වභාවය අඳුනා නොගත් අඥාන මනුෂ්‍යයන්ට සන්තතික කර්ම චක්‍ර ධර්මයට මුහුණ දීමට සිදුව ඇත. විවිධාකාර වූ ස්ථිතික විද්‍යුත් සංස්කාරක නියාම ධර්මයන් හේතුව වීමෙන් මනුෂ්‍යය තිරිසන් සහ ශාක ලෙසින් වන සංස්කාරක වස්තූන් නිර්මාණය වන අතර එම වස්තූන්ගේ ඇති වීම, පැවතීම, ක්ෂය වීම සහ මියදීම ලෙසින් වන කෙටි කාලීන පැවැත්මක් සඳහා භවගත යුතුවන අතර මෙම ධර්මතාවයන්හි යථා ස්වභාවයෙහි පූර්ණත්වයෙන් විද්‍යා අවබෝධයට පත් තථාගත බුදුවරයන් වහන්සේලා විසින් අඥාන පෘතග්ජනයින්ට එම දුක්ඛ ධර්මයෙන් නිදහස් වීම සඳහා යා යුතුවන අධ්‍යාත්මික මාර්ගය ලෙස ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුමත කර දේශනා කර වදාළ සේක.

### 3.2.3. සන්තතික දුක්ඛ කර්ම ක්‍රියාවලියෙන් නිදහස්වීම (නිරෝධ සත්‍යය)

දුක්ඛ සන්තතික කර්ම ධර්ම ක්‍රියාවලියෙහි නැවත උප්පත්තිය සිදුවන කර්ම ධර්මයෙන් නිදහස් වීමට ගත යුතු පියවර නිවැරදි ලෙසින් අවබෝධකර ගැනීම ඉතා සියුම් සහ ඉතා දුෂ්කර වනු ඇත. නිර්වාණය බලාපොරොත්තු වන ප්‍රඥාවන්ත සත්පුරුෂයින් අධ්‍යාත්මික චිත්ත ධර්මතාවයන් කෙසේ පිළියෙල වී ඇතිදැයි සහ එම චිත්ත ධර්මතාවන්ගේ පැවැත්ම පිළිබඳ පලමුව අවබෝධකර ගත යුතුව ඇත.

සන්තතික කර්ම ධර්ම ක්‍රියාවලියට මුළුමනින්ම ප්‍රතිපක්ෂ විය යුතු වන ක්‍රියාවලිය වන්නේ සත්ත්වයාගේ සන්තතිය නැවතීමේ ක්‍රියාවලියෙහි මූලධර්මයයි. සත්ත්ව සන්තතික කර්ම ධර්මතාවය සඳහා හේතුව වන අවිද්‍යාවත් කාම තෘෂ්ණාවත් ඒහා සහජාතක වෛරී ධර්මත් ප්‍රධාන පදනම වනු ඇත. අවිද්‍යාවට ප්‍රතිපක්ෂවූ ප්‍රඥාව යනු කායික මානසික ශීල සංවරය සමග සම්මා සමාධිය තුලින් සත්ත්වයින්ගේ සන්තතික කර්ම ධර්මතාවයෙහි නිරෝධය සිදුවන මාර්ගය වනු ඇත. විද්‍යාත්මක සන්තතික කර්ම ක්‍රියාවලිය පිළිබඳ අනවබෝධය එනම් අවිද්‍යාව අඥාන පෘතග්ජනයින් සඳහා ත්‍රිවිධ ක්ලේෂ මූල පාදක ත්‍රිවිධ දෘෂ්ඨීන්ට හේතුව වීම සම්ප්‍රයුක්ත මානසික කර්ම ධර්ම ක්‍රියාවලිය පාදකව සිදුවනු ඇත. මානසික සංස්කරණය යනු ලෞකික කර්ම ක්‍රියාවලියෙහි මූලධර්ම තුලින් පිළියෙලවන අධ්‍යාත්මික කර්ම සැලැස්ම වන අතර අධ්‍යාත්මික සන්තතික මානසික ශක්ති සැලැස්මෙහි සත්ත්වයින්ගේ නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලියට පදනම වනු ඇත.

කර්ම නිර්මාණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන සන්තතික චිත්ත ධර්මතාවයන්ගේ සත්ත්ව කර්ම පැවැත්මෙහි නිරෝධය ත්‍රිවිධ ක්ලේෂයන්ගෙන් මලුමනින්ම නිදහස් වීමෙන් සිදුවනු ඇත. මෙහිදී යමෙකු අවබෝධ කරගත යුතු වන සන්තතික අධ්‍යාත්මික කර්ම ධර්මයන්හි හේතුඵල ධර්මතාවයන් පිළියෙල වීම හා සංවිධානය වීම සිදුවී ඇත්තේ ඉතා ප්‍රබල සහ ඉතා සියුම්වූ සත්ත්වයින්ගේ පංචේන්ද්‍රියයන්ට සංවේදී නොවන ක්ෂණයක් පාසා බිඳී බිඳී පැවතෙන ස්ථිතික විද්‍යුත් ශක්තීන් මගිනි. ස්ථිතික විද්‍යුත් ප්‍රබව ගත සත්ත්වයින්ගේ ආධ්‍යාත්මික සන්තතියෙහි භවගත වීමට හේතුව වන සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත් මානසික ශක්තීන් මුළුමනින්ම එහි ප්‍රභවයෙහි ආරෝපිත ශක්තීන් ක්ෂණයක් පාසා බිඳී බිඳී පවතින සහ ඇතිවෙමින් නැතිවෙන ස්ථිතික විද්‍යුත් ශක්ති විශේෂයකි. එම නිසා එම සන්තතික සත්ත්ව කර්ම

ක්‍රියාවලියෙහි පදනම්වූ මූලධර්මයම නිත්‍ය නොවන තාවකාලික වන අනිත්‍ය පැවැත්මකින් නිර්මාණය වන සංස්කාරක වස්තූන් වනු ඇත. ස්ථිතික විද්‍යුත් සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික මානසික ධර්මයන්හි සංස්කාරක ශක්තිය භව සන්තතික කර්ම ක්‍රියාවලියෙහි සංස්කාරකයන්හි ප්‍රභවය වන මානසික සංස්කරණය යනු සමස්ත මනුෂ්‍යය හා තිරිසන් සංස්කාර වස්තූන්ගේ බිහිවීමට හේතුව වන අතර එම සත්ත්වයින්ගේ කාය සංස්කරණය ජරාවට පත්විම දිරීමට පත්වීම, කල් ඉකුත් වීමට පත්වීම බහුල රෝගී ස්වභාවයන් ඇතිවීම සඳහා හේතුව වීම වයසට යෑමට හේතුව වීම සහ අවසානයේ මරණයට පත්වීම එනම් නැතිවීම ලෙසින් ක්‍රියාකාරීවීමට නියමිතව ඇත.

ඉහත සඳහන් චිත්ත සන්තතික කර්ම ධර්මයන්ට අදාලව විවිධාකාර වූ මනුෂ්‍යය, තිරිසන් හා ශාකයන්ගේ සන්තතියට හේතුව පිලියෙල වන අතර එම සමස්ත සංස්කාරක වස්තූන්ම ස්ථාවර වූ ගුණාත්මක බවකින් තොර බහුල ලෙසින් ව්‍යවසනයන්ට ගොදුරුවන කොයි මොහොතක හෝ බිඳීමෙන් නැතිවීමට හැකියාව ඇති අනිත්‍ය සංස්කාරක වස්තූන් වනු ඇත. නිර්වාණ ක්‍රියාවලිය යනු කාම තෘෂ්ණාව අතහැරීම මගින් හා අවිද්‍යාවෙන් ඉවත්වීමෙන් සිදුවන කායික හා මානසික සන්තතික විද්‍යාත්මක ක්‍රියාවලියෙහි ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියයි. එය රඳා පවතිනුයේ කායික සහ මානසික තෘෂ්ණා ස්පර්ශයන්හි ප්‍රමාණවත් අතහැරීම මගින් ප්‍රමාණවත්ව ඉවතලීම මගින් එමෙන්ම කායික මානසික ස්පර්ශග්‍රාහී කර්ම ප්‍රභව ක්‍රියාවලියට නොඇලී සිටීමෙනි. එමෙන්ම එම ස්පර්ශ ක්‍රියාවලිය ආර්ය අෂ්ඨාංගික මාර්ගගතව මුලිනුපුටා දැමීමෙන් සහ එම කායික මානසික කර්ම ප්‍රභවගත ස්පර්ශයන්හි කාම තෘෂ්ණාවට ඇබ්බැහි නොවීමෙන් හා සන්තතික කර්ම ධර්මය වන මානසික සංස්කරණයෙන් නිදහස් වීමට එය නියමිත මාර්ගය වන අතර එම ස්පර්ශයන්ට හේතුව වන සත්ත්ව ශාක සංස්කාරක වස්තූන්ගේ අසාර වූ අනිත්‍ය වූ ස්වභාවය ඒවායේ ඇති සැටිය නිවැරදි ලෙසින් හා සත්‍යය ලෙසින්ම මෙනෙහි

කිරීමේ ධර්ම මනසිකාරය එනම් විදර්ශනා භාවනාව ප්‍රගුණ කල යුතුය. නිත්‍ය නොවන සහ වෙනස්වන සුළු ධර්මතාවයට අදාලව පිළියෙල වන්නා වූ කායික සංස්කරණයත් මානසික සංස්කරණයත් යන දෙකම සත්ත්වයින්ට කායිකවත් මානසිකවත් ලෙසින් විඳීමට සිදුවන සාංසාරික දුක්ඛ ධර්මතාවය සඳහා වන භව ගත වීමේ කර්ම ක්‍රියාවලිය වනු ඇත. මේ සම්බන්ධයෙහි දී අධ්‍යාත්මිකව නිදහස් වීම කෙරෙහි යොමු වීමට කැමති සත්පුරුෂයින් මධ්‍යම ප්‍රතිපදාව ප්‍රබල හා අඛණ්ඩව වැඩිය යුතු අතර හා ප්‍රගුණ කල යුතු උපසම්පදාගත අධිශීල, අධි චිත්ත අධි ප්‍රඥා ශීලයන්හිද තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ශීලයන්හි ද ප්‍රභල ලෙස විනය ශික්ෂා අනුගමනය කිරීම සඳහා ආර්ය ප්‍රතිපත්තීන් වඩන භික්ෂුවක් විය යුතුය.

එලෙසින්ම කායික ස්පර්ශග්‍රාහී කර්ම පදනමෙන් යමෙකු කායික මානසික ක්ලේෂයන්ගෙන් නිදහස් වීමට පියවර ගන්නාසේම මානසික ස්පර්ශ කර්ම ක්‍රියාවලියෙන් ඉවත්වීම සඳහා ද්‍රව්‍යාත්මක නොවන අවකාශයෙහි ස්පර්ශ ක්‍රියාවලිය සිදුවන රූපීය ධ්‍යාන ප්‍රගුණ කල යුතුව ඇති අතර මානසික සංඥා ස්පර්ශ ක්‍රියාවලිය නතර කිරීම සඳහා රූපීය නොවන අසීමාන්තික විශ්ව පැතිරීම මූලය වන අරූපීය ධ්‍යාන ප්‍රගුණ කල යුතුව ඇත. මෙම අෂ්ඨ ධ්‍යානාංග ප්‍රගුණ කිරීම තුලින් අධ්‍යාත්මික මානසික ස්පර්ශ ක්‍රියාවලිය නතර වන අතර එයට සමගාමීව කායික ස්පර්ශ ක්‍රියාවලියද එයට සාපේක්ෂව කෙටි කාලයකට අකර්මන්‍යය වනු ඇත.

### 3.2.4 සන්තතික දුක්ඛ කර්ම ධර්මයෙන් නිදහස් වීමේ අධ්‍යාත්මික නිර්වාණ මාර්ගය (මාර්ග සත්‍යය)

සන්තතික සත්ත්වයින් සතු දුක්ඛ ධර්මය මූලගත කර්ම චක්‍ර ක්‍රියාවලියෙහි මානසික සහ කායික සන්තතික ශක්තීන්ගේ නිෂ්ඨාව සඳහා එනම් නැවත ඉපදීමේ කර්ම ධර්මයෙන් නිදහස්

වීමට එනම් සමස්ත දුක්ඛ කර්ම මාර්ගයෙන් ඉවත්වීම සඳහා සියළුම රූපීය රාගී සංඥා ස්පර්ශයන් මුලිනුපුටා දැමීම සඳහා ලොවෙහි ඇති එකම අධ්‍යාත්මික මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කල යුතුය.

ලොවෙහි ක්‍රියාත්මක සන්තතික විද්‍යාත්මක හා අධ්‍යාත්මික කර්ම ධර්මයෙහි ප්‍රඥාබෝධයට පත්වීම සඳහා යමෙකු විසින් පියවර ගත යුතු අතර ඒ සඳහා ජීව විද්‍යාත්මක හා අධ්‍යාත්මික විද්‍යා න්‍යාය ධර්මයන්ගේ නිවැරදි දැකීම එනම් සම්මා දිට්ඨිය තුලින් විද්‍යාත්මක ධර්මයන් මගින් මානසික කර්ම ධර්ම පාදක නැවත ඉපදීමේ කර්ම ක්‍රියාවලිය කෙසේ සන්තතික කර්ම ශක්තීන් බවට පත් වන්නේ දැයි අවබෝධකර ගත යුතුව ඇත. න්‍යායික අවබෝධය තුලින් සන්තතික අධ්‍යාත්මික මාර්ගයන්ගේ මානසික විද්‍යාත්මක ක්‍රියාවලිය විද්‍යාත්මකව සංවිධානය වීමෙන් භව බන්ධන කර්ම සන්තතියෙහි පැවැත්ම මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින් සතු ත්‍රිවිධ දෘෂ්ඨීන්ගේ අධ්‍යාත්මික ක්‍රියාවලිය මත රඳා පවතී. සන්තතික දුක්ඛ ධර්මයන්ගෙන් නිදහස් වීමට කැමති ප්‍රඥාවන්ත සත්පුරුෂයින් සඳහා චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත ලොවෙහි පරම සත්‍යය ධර්මතාවයන්හි විමර්ශනය තුලින් ලද අවබෝධය මුළුමනින්ම ප්‍රඥාවන්තයින් සඳහාම විෂය වන අතර කිසි ලෙසකින්වත් කාමයන්හි ඇලීම් ගැටීම් වල නිරත ලෞකික අඥාන පෘතග්ජනයින්ට කිසිසේත්ම විෂය නොවන අතර එම අධ්‍යාත්මික මාර්ගය අවිද්‍යාවෙන් නිදහස් වීමට යොමු වූ පියවර අටකින් යුක්ත වන අතර එම පියවර අට තනි තනිව අවබෝධකර ගැනීමත් අනුගමනය කර ගැනීමත් කල යුතුව ඇත.

### 1. සම්මා දිට්ඨි

චතුරාර්ය සත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රඥාධර්මයන්හි ධර්ම ශ්‍රවණයට අනුව නිවැරදි දෘෂ්ඨිය සඳහා අවබෝධය අත්පත්

කරගැනීම මගින් අවිද්‍යා පාදකව සිදුවන අසීමාන්තික සන්තතික සත්ත්ව දුක්ඛ ධර්මයන්ගේ සන්තතියෙන් නිදහස් වීම සඳහා ලෝකයෙහි ක්‍රියාත්මක සංස්කාරක වස්තූන්ගේ අන්තර්ගත ත්‍රිවිධ ලාක්ෂණික ගුණාත්මක බව කැඩෙන බිඳෙන බව සහ නැතිවන දුර්වල වීම් මරණයට පත්වීම් ලෙසින්වන අනිත්‍ය ස්වභාවයත් එයට පාදක වන දුක්ඛ වේදනා සංවේදී ධර්මතාවයෙහිද යථා ස්වභාවයට අනුව මතු පැවැත්විය යුතු ආත්මයකට සුදුසු අන්තර්ගත සැලැස්මක් නොවන බව එනම් අනාත්ම බව දැකීම සඳහා යොමු වීමකි. එම නිවැරදි දැකීමට අනුව ප්‍රඥාවන්තයකුට පමණක් සාර්ථකව හැදෑරීමෙන් අනුගමනය කල හැකි එමෙන්ම නිර්වාණයට පත්වීමේ අවසාන අරමුණ මාර්ග අවබෝධයත් එහි ඵලයත් සඳහා විය යුතු බව අවබෝධ කර ගැනීම පියවර අටකින් සමන්විත නිර්වාණ මාර්ග යෙහි ප්‍රථම පියවර වනු ඇත.

## 2. සම්මා සංකප්ප

ඉහත ලෙසින් තමා කෙරෙහි පවත්නා සන්තතික කර්ම ක්‍රියාවලියෙහි යථා දැක්ම හඳුනා ගැනීමෙන් සන්තතික වන අධ්‍යාත්මික සත්ත්ව ජීවී ක්‍රියාවලිය සැලසුම් වීම කෙරෙහි හේතුවවන මූලධර්මය භව සන්තතියෙහි දුක්ඛ කර්ම ධර්මතාවයෙහි ජාති, ජරා, ව්‍යාධි මරණ ලෙසින් යොමු වීමට නියමිත බව තමාගේ අධ්‍යාත්මික අවබෝධයට විෂය කර ගැනීමෙන් දුක්ඛ කර්ම සන්තතිය අත හැරීමට හේතුවවනු ඇත. එලෙස තමා කෙරෙහි පවත්නා දුක්ඛ ධර්ම ක්‍රියාවලියෙහි ඇති සැටිය එලෙසින් හඳුනාගැනීමෙන් ලබා ගන්නා අධ්‍යාත්මික අවබෝධයට අනුව සත්ත්වයින්ගේ ජීවී ක්‍රියාවලිය කෙරෙහි දැක්විය යුතුව ඇති නිවැරදි සංකල්පනාව එනම් සම්මා සංකප්පය වන්නේ අකුසල් කර්ම පාදක ත්‍රිවිධ ක්ලේෂයන් මුලුමනින්ම අත්හැරීම වනු ඇත. සමස්ත ලෝකවාසී සියලුම සත්ත්වයන් කෙරෙහි කරුණාව, මුදිතාව හා උපේක්ෂාව දැක්වීමෙන් ප්‍රගුණ කල යුතුව ඇති අසීමාන්තික වූ

නොබැදුණු මෛත්‍රී කරුණාව මගින් සියළුම සත්ත්වයන් කෙරෙහි ත්‍යාගශීලී වීමෙන් සහ සමානාත්මතාවය පාදක සුචරිත මාර්ගයකට යොමුවීම වනු ඇත. නිර්වාණ මාර්ගයෙහි දෙවන පියවර වන කුසල ධර්මයන්හි බහුලව යෙදීමෙන් සිදුකරගත හැකි වන මෛත්‍රී කරුණා සම්ප්‍රයුක්ත කුසලයන්හි තමන්ටත් අනුන්ටත් දැඩි ලෙස සිදුවිය හැකිව පවතින හිංසාකාරී ධර්මයන්ගෙන් ඉවත්විය යුතුය. මෙහිදී ප්‍රගුණ කල යුතු හා දියුණු කරගත යුතු ත්‍රිවිධ කුසල ක්‍රියාවන් දාන, ශීල සංවරය, භාවනා ලෙසින් වන විට සීමා රහිත වන මෛත්‍රිය සමස්ත විශ්ව ලෝක වාසී සත්ත්වයින් කෙරෙහි නොබැඳුනාවූ මෛත්‍රිය සඳහා වනු ඇත.

## 3. සම්මා වාචා

ඉහත සම්මා සංකප්පය තුලින් විශ්ව මෛත්‍රී කරුණා පාදක අධ්‍යාත්මික අභිවෘද්ධියට පත්වීමෙන් යමෙකු කෙරෙහි පැවතිය යුතු ආත්ම සංවරය සිතීමෙන් කතා කිරීමෙන් සහ කායික ක්‍රියාකිරීමෙන් ඔවුනොවුන්ගේ දෛනික ජීවිතය තුල ක්‍රියාකාරී වනු ඇත. අෂ්ඨාංගික මාර්ගයෙහි 3 වන පියවර ලෙස නිවැරදි දැක්ම තුලින් ප්‍රගුණ වන යථාභූත ඥාණය වාචික ක්‍රියාවන්හි හික්මීමත් සංවරයත් ඇතිවීමෙන් වාචික අකුසල ක්‍රියාවන් වන මුසාවාදය, පරුෂාවාදය, පිසුනාවාචා සම්ප්‍රප්පලාපා ලෙසින් සිදුවන වාචික අකුසල මාර්ගයෙන් බැහැර වීම සම්මා වාචා ලෙසින් වන 3 පියවර වනු ඇත.

## 4. සම්මා කම්මන්ත

කුසල් ක්‍රියාවන්හි අභිවෘද්ධිය මගින් පෘතග්ජන මනුෂ්‍යයන්ගේ නිවැරදි මාර්ගය උදා කරනු ලබන මාර්ගගත පංච සහ දස ශික්ෂාවන් ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි මෙම පියවර තුල අන්තර්ගත වී ඇත. පංච ශීල සංවරය තුලින් ආර්ය මාර්ගය ඇරඹෙන අතර ඉන් ඉදිරියට ආරක්ෂා කිරීමෙන් ප්‍රගුණ කල යුතු අධි ශීලයන් වන සාමණේර දශ ශීලය අධිශීල,

අධිචිත්ත අධි ප්‍රඥා සම්ප්‍රයුක්ත ත්‍රිවිධ උපසම්පදා ශීලයන්හිද ද වීර්යයෙන් සහ අධිෂ්ඨානයෙන් රැකිය යුතු තාපස, ශ්‍රමණ යෝගාවචර තෙලෙස් ධූතාංග ශීල ප්‍රතිපත්තීන් රැකීම සඳහා ද භික්ෂුවක් බවට පත්විය යුතුයි.

## 5. සම්මා ආජීව

ඉහත සඳහන් ශික්ෂාකාමී පියවරවල් මනුෂ්‍යයෙකුට නිවැරදි පැවැත්ම කෙරෙහි වන ජීවිකා වෘත්තිය සඳහා යොමු කරවනු ලබන අතර එමගින් ක්‍රියාත්මක වනු ලබන අඛණ්ඩ පංචවිධ කාම කර්මයන්ගෙන් වෙන්වීම සඳහා පංච විධ වැලකීම් පහ (5) එනම් පංච ශීලය එදිනෙදා දෛනික ජීවිතය සඳහා පදනම් කරගත යුතුය. පැවිදි භික්ෂූන් අනිවාර්යෙන්ම සාමණේර ශීලයන් ද ත්‍රිවිධ උපසම්පදා ශීලයන් ද හැකි උපරිම වීර්යයෙන් ධූතාංග ශීලයන් ද තමන්ගේ දෛනික ජීවිතය තුලදී නොකඩවා ක්‍රියාත්මක කල යුතුව ඇත.

නිර්වාණ මාර්ගය පූර්ණ වශයෙන් ප්‍රඥාවන්තයින් සඳහාම විවෘතව ඇති අධ්‍යාත්මික නිර්වාණ මාර්ගය වන අතර එහි අවසාන ඵලය භව නිරෝධය කෙරෙහි යොමුව පවතී. ඒ සඳහා ඔවුනට අධිෂ්ඨානගත ප්‍රබල වීර්යයක් ගත යුතුව ඇත. කායික සහ මානසිකව නිර්වාණ මාර්ගයෙහි ප්‍රතිපත්තීන් සම්පූර්ණ කර ගැනීම සඳහා දැඩි උත්සාහයක් ගත යුතු අතර ඒ සඳහා මාර්ග ප්‍රතිපදාව තුල අඛණ්ඩව යොමු විය යුතුව ඇත. කායිකව සහ මානසික සිහිනුවණට පත්වීමෙන් එනම් යෝනිසෝමනසිකාරය සියල්ලන් විසින්ම දියුණු කරගත යුතුය. සම්මා දිට්ඨියට අදාලව ලබාගත් ප්‍රඥාවබෝධය ශීල සංවරය මගින් කායික හා මානසික ක්‍රියාවන්ගේ සංවරය හික්මීම ඇතිකර ගත යුතුය. සාමාන්‍ය පෘතග්ජනයින් මෙම මාර්ග අවබෝධය පිළිබඳ සිහියට පත්වීම කලයුතු අතර සන්තතිකවන භව පැවැත්ම කෙරෙන් නිදහස්වීම ප්‍රාර්ථනා කරන්නේ නම් නිවැරදි උත්සාහය එනම් සම්මා වායාම තුලින්

මාර්ග ඵලය පිණිස සාර්ථක ඵලයක් ලැබීම පිණිස නිවන සඳහා යොමුවිය යුතුව ඇත. දැඩි උත්සාහය සහිතව දැඩි කැපවීමෙන් මාර්ග ප්‍රතිපත්තීන්හි යොමු වීම නිර්වාණය සඳහා ඉතා වැදගත් අධ්‍යාත්මික බලයකි. භෞතික කාය සංස්කරණය කෙරෙහි දැඩිව බැඳී පවත්නා මානසික සංස්කරණ බලයෙන් නිදහස් වීමේ අධ්‍යාත්මික ක්‍රියාවලියට අවශ්‍ය මාර්ගය උදාවන අතර එසේ නොවන්නේ නම් සන්තතික භව කර්ම බන්ධනයෙන් සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම නතර කල නොහැක. මෙම අධ්‍යාත්මික කර්ම ක්‍රියාවලියෙහි කායික සහ මානසික සම්බන්ධීකරණයේ අධ්‍යාත්මික වු විද්‍යුත් කර්ම බන්ධනයට පදනම් හේතුව වන්නේ සම්ප්‍රයුක්ත මානසික ශක්තීන් හේතුඵල නියාම ධර්මයට අනුගතව නිර්මාණය වීම තුලින් පසුව මනුෂ්‍ය හා තිරිසන් සත්ත්වයන් ප්‍රගුණ කර ගන්නා අවිද්‍යා පාදක ත්‍රිවිධ ක්ලේෂගත ත්‍රිවිධ දෘෂ්ඨීන්ට ගොදුරුවීමයි.

### 6. සම්මා වායාම

මනුෂ්‍යය හා තිරිසන් ලෙසින් වන සමස්ත කාමාවචර සත්ත්වයෝ සාමාන්‍යයෙන් තම තමන් සතු මානසික කර්ම සංස්කරණය සක්‍රිය කිරීම තුලින් සිය භෞතික කාය සංස්කරණයෙහි ඉන්ද්‍රිය පද්ධතිය කෙරෙහි දැඩිව බැඳෙමින් තමා සතු මානසික කර්ම බලය දැඩි ලෙස තහවුරු කර ගනිමින් ඔවුන්ගේ දෛනික කායික ක්‍රියාවන්ට යොමුව ඇත.

මෙම ජීවී සන්තතික ක්‍රියාවලියට අනුව මනුෂ්‍යය තිරිසන් සත්ත්වයෝ සිය භෞතික කයෙහි පැවැත්ම නඩත්තුව, පාලනය සහ එහි ආරක්ෂාව සඳහා තම තමන් සතු මානසික කර්ම බලය දැඩි ලෙස යොමු කරවනු ඇත. සත්ත්වයින්ගේ ජීවන රටාවෙහි සාමාන්‍ය ක්‍රමවේදය වන මෙම මානසික සහ කායික සම්බන්ධීකරණය තුලින් සියළුම තිරිසන් මනුෂ්‍ය සත්ත්වයෝ තම තමන්ගේ සංසාර භව කර්ම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහි නිරතව ඇත. නිවැරදි උත්සාහය නම් වන සම්මා වායාමය සෘජුවම යොමු කරවිය යුතු වන්නේ සාමාන්‍ය

ලෞකික දුක්ඛ සංඛ්‍යාත භව කර්ම ක්‍රියාවලිය මුලුමනින්ම අත හැරීමෙන් එය ලෝකෝත්තර වූ කර්ම භව චක්‍රය බිඳෙන ආර්ය මාර්ගය වෙතට යොමු කිරිම සඳහාය. සම්මා වායාමය එහිදී මූලිකවම යොමුකල යුතු වන්නේ ලෞකික අධ්‍යාත්මික අභිවෘද්ධිය සිදුවන උසස් වූ මානසික විද්‍යා ධර්මයන්හි ප්‍රගුණ කරවීම සඳහාය. එනම් අෂ්ඨවිධ ධ්‍යාන අංග ප්‍රගුණ කිරීම සඳහාය. මෙහිදී මානසික චිත්ත ඒකාග්‍රතාවය තුලින් අත්පත් කරගත හැකි විශ්ව ලෝක සන්තතික ධර්මයන්හි ක්‍රියාකාරී විවිධ චක්‍රාවාටයන්හි ක්‍රියාත්මක වන සත්ත්ව වාසයන්හි විද්‍යාත්මක පැවැත්මේ ධර්මතාවයන් අධ්‍යයනය කිරීම අවබෝධ කරගත හැකි අතර විශ්වගත පැවැත්මෙහි සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ට සංවේදී නොවන හා අවබෝධ කරගත නොහැකි විවිධාකාර දේව ලෝක, බ්‍රහ්ම ලෝකයන්හි අධ්‍යාත්මික සන්තතික විද්‍යා පැවැත්මත් නිරය. අසුර, ප්‍රේත ආදී ප්‍රබල ලෙස ක්‍රියාත්මක වන සන්තතික ක්‍රියාකාරී භවයන්හි ඇති සැටිය සහ ඒවායේ විද්‍යාත්මක ධර්මතාවයන්ගේ අවබෝධය ප්‍රබල ලෙස දියුණු කරගැනීමට අෂ්ඨවිධ ධ්‍යානාංග ප්‍රගුන කිරීම තුලින් යම් ප්‍රඥා වන්තයකුට විද්‍යාවබෝධයට පැමිණිය හැක. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි 6 වන මාර්ගයෙහි ඉහත ලෙසින් දැඩි කැපවීමෙන් අත්පත් කරගත හැකිවන විද්‍යා අවබෝධය පෘතග්ජන වූ යමෙකුට ලබාගත හැකි ඉහළම ලෞකික අධ්‍යාත්මික දියුණුව වනු ඇත.

### 7. සම්මා සති

මනුෂ්‍යය, තිරිසන් පෘතග්ජන සමස්ත සත්ත්වයන් විසින් පොදුවේ ක්‍රියාත්මක කරනු ලබන ඔවුනොවුන්ගේ දෛනික ජීවන රටාව තුල කායික මානසික විද්‍යාත්මක වූ භව කර්ම පාදක අධ්‍යාත්මික සන්තතික ක්‍රමවේදය නිසා මනුෂ්‍යයෝ ද තිරිසන් සත්ත්වයන්ට කායිකවත් මානසිකවත් සමාන වනු ඇත. මෙම දැඩි අවධානමෙන් ගැලවීම සඳහා ගතයුතු එකම පියවර ඉතාම නිරවුල් ලෙස ආර්ය මාර්ගයේ හත්වන පියවර

තුලින් පැහැදිලි වී ඇත. තිරිසන් හා මනුෂ්‍ය සත්ත්වයෝ භව චක්‍ර ක්‍රියාවලිය සඳහා පොදු මානසික ක්‍රියාවලියක් ඔවුනොවුන්ගේ කායික මානසික සම්බන්ධීකරණය තුලින් ගොඩ නගා ගනු ඇත. මෙම අවදානමෙන් මනුෂ්‍යයෙකුට තිරිසන් සත්වයින්ගේ මානසික හා කායික ක්‍රියාවලියෙන් ඉවත් වීම සඳහා දැඩි ලෙස සහ ප්‍රබල ලෙස ප්‍රගුණ කල යුතු වන එකම අධ්‍යාත්මික බලය වන්නේ යෝනිසෝමනසිකාරය තුලින් එලඹසිටි සිහියට පත්වීම පාදකව තහවුරු කරගත යුතු වන නිවැරදි සිහියයි. එනම් සම්මා සතියයි. මානසික ශක්තීන්ගේ සක්‍රිය වීම කෙරෙහි යොමුකල යුතු වන මානසික අවධිය හා අවධානය පැහැදිලි ලෙසින් හා ගැඹුරු ලෙසින් ලෝකයට සතිපට්ඨාන ධර්මය ලෙසින් තථාගත බුදුවරයන් වහන්සේලා විසින් ප්‍රඥාවන්ත මනුෂ්‍යයන්ගේ සිහි නුවණ දියුණු කරලීම සඳහා දේශනා කර ඇත. මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ මානසික හා කායික සංස්කරණ ධර්මයන්හි විද්‍යාත්මක සහ අධ්‍යාත්මික විශ්ලේෂණය හා විමර්ශනයෙහි ප්‍රතිඵලය වන විදර්ශනාමය විද්‍යාත්මක මානසික ක්‍රියාවලිය මගින් තහවුරු කරගත හැකි වන සන්තතික මනුෂ්‍යය තිරිසන් සංස්කාරගත වස්තූන්ගේ අන්තර්ගතයෙහි ආසාර සහ නිත්‍ය නොවන ස්වභාවය සමස්ත සත්ත්ව ලෝකයෙහිම දුක්ඛ ධර්මයට පදනම වී ඇති සැටිය සහ ආත්මයක් වශයෙන් පිලිගැනීමටත් එලෙස රැක ගැනීමටත් සුදුසු නොවන බව දැන ගැනීමෙන් ලබන ප්‍රඥාවබෝධය මානසික සංස්කරණ ක්‍රියාවලිය තුලින් ප්‍රඥාවන්තයෙකුට මානසික ඒකාග්‍රතාවය සිහියට පත්වීම ලෙසින් ප්‍රගුණ කර ගත හැක. මෙම සම්මා සතිය ලෙසින් පැහැදිලි වී ඇති මානසික ඒකාග්‍රතාවය සංස්කාරක වස්තූන් සතු අනිත්‍ය සහ ආත්මීය නොවන ස්වභාවය ප්‍රඥාවෙන් ඒවායේ ඇති සැටිය නිවැරදි ලෙසින් ඇති ලෙස දැකීමේ සිහිය වනු ඇත. එම සිහිය මානසිකව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රගුණ කල යුතු වන ලොවෙහි ඇති එකම අධ්‍යාත්මික තථාගත ධර්මය වන සතිපට්ඨානය තුලින් කාය, වේදනා, චිත්ත, ධම්ම ලෙසින් වන චතුර්විධ අධ්‍යාත්මික මානසික ධර්මයන් ප්‍රගුණ කල යුතුව ඇත.

**8 සම්මා සමාධි**

ඉහත ලෙසින් සන්තතික මනුෂ්‍යය හා තිරිසන්ගත සංස්කාරක වස්තූන්ගේ ඇති සැටියෙහි යථාර්තගත ධර්මතාවයන්ගේ අසාර සහ දුර්වල නිර්මාණය කෙරෙහි යථාවබෝධය මගින් සිහියට පත් වීම සිදු කර ගන්නා ප්‍රඥාවන්තයෙකු සිය අතීත සහ අනාගත ලෙසින් සන්තතික වන කර්ම ක්‍රියාවලියට අදාලව අවිද්‍යාව තුලින් කායික, මානසික හා වාචසිකව පිළියෙල කරගත් කර්ම සංඛ්‍යාත මානසිකත්වය දැඩි ලෙසින් අතහැරීම කරමින් එම අතීත අනාගත මානසික පැවැත්මෙන් ඉවත් වීමෙන් වර්තමාන කාල මානසික ක්‍රියාකාරීත්වයෙහි සිදුවන එකඟ බව එනම් ශූන්‍යත්වය ප්‍රබල හා දැඩි ලෙස ස්ථාවර කරවීමේ මානසික තත්ත්වය විදර්ශනාමය අවබෝධය පාදකව ක්‍රියාත්මක වන සම්මා සමාධිය බවට යොමුවනු ඇත.මෙය චතුරාර්ය සත්‍යය තුල අන්තර්ගත සතරවෙනි සත්‍යය වන දුකින් නිදහස් විමේ මාර්ග සත්‍යයෙහි අවසාන ඵලය වනු ඇත.

සත්ත්වයින්ගේ මානසික චිත්ත ශක්තීන්ගේ දුක්ඛ ක්‍රියාවලිය නිරුද්ධ වීම කෙරෙහි යොමුව පවතින නිර්වාණ මාර්ගය ප්‍රඥාවන්තයින්ට පමණක් හැදෑරීමෙන් අවබෝධ කරගත හැකිවන සියළු ක්ලේෂ ධර්මයන් මුලිනුපුටා දැමීමෙන් කායිකවත්, වාචසිකවත්, මානසිකවත් අත්පත් කරගත හැකිවන ශ්‍රේෂ්ඨ මානසික ධර්මතාවයන් සඳහා විවර වූ ලොවෙහි ඇති ශ්‍රේෂ්ඨතම නිර්මල මාර්ග ධර්මය වන අතර මෙම ආර්ය අෂ්ඨාංගික මාර්ගය ක්‍රමානුකූලව හා වීර්යයෙන් හා දැඩි කැපවීමෙන් අනුගමනය කිරීමෙන් අවසාන ඵලය නිවන සඳහා ක්‍රියාත්මකව පවතින අයුරු තථාගත බුදුවරයන් වහන්සේලා විසින් ප්‍රඥාවන්ත සත්පුරුෂයින්ට පැහැදිලි ලෙස දේශනා කර ඇත.

අෂ්ඨවිධ නිර්වාණ මාර්ගය සාර්ථකව අනුගමනය කරන ලද ප්‍රඥාවන්තයෙකු අනිත්‍ය ධර්මයට යොමුව පවතින

ආත්මීය වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය නොවන අවසානයේදී ස්ථාවර වූ දුක්ඛ ධර්මය කෙරෙහි ඍජුවම යොමුව පවතින සමස්ත සංස්කාරක මනුෂ්‍යය හා තිරිසන් සත්ත්ව ලෝක ධාතුගත සංස්කාරක වස්තූන්ගේ විද්‍යාත්මක සන්තතික මූලධර්මයන්හි පදනම අවබෝධ කරගනු ඇත.

මනුෂ්‍ය හා තිරිසන් ආදී ලෙසින්වන තිස්එක් තලගත සත්ත්වයින්ගේ සන්තතික විද්‍යාත්මක කර්ම ක්‍රියාවලිය ලෝභ . ද්වේෂ හා මෝහ ලෙසින් වන සම්ප්‍රයුක්ත ධර්මයන්හි අධ්‍යාත්මික ක්‍රියාවලියක් වන අතර එම සම්ප්‍රයුක්ත සන්තතික කර්ම ක්‍රියාවලියට ප්‍රතිවර්ථිත වන විප්‍රයුක්ත ධර්මයන්හි කර්ම නිරෝධන නිර්වාණ ක්‍රියාවලිය වන්නේ ශීල සමාධි හා ප්‍රඥාව ලෙසින් වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.

"ඵස්සානං භික්ඛවේ කම්මානං නිධාන සම්භවෝ" යනුවෙන්ද "චේතනාහං භික්ඛවේ කම්මං වදමි චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" යනුවෙන් විග්‍රහවන තථාගත දේශනා ධර්මයට අනුව කායික මානසික හා වාචසික ස්පර්ශය කර්ම භව චක්‍රය සඳහා මූල හේතුව වන බවත් කායික මානසික හා වාචසික ප්‍රිය සංවේදී ස්පර්ශයන්හි අවිද්‍යාව හා තෘෂ්ණාව පාදකව සිදුවන මානසික ස්පර්ශ ග්‍රහණය තුලින් සුඛ සංවේදී මානසිකත්වය කර්මය සඳහා පාදක වන චේතනාව වන අතර එම මානසික හා කායික ප්‍රිය හා සුඛ ස්පර්ශපාදක ස්පර්ශයන්හි චේතනාව කර්මජ ස්ථිතික විද්‍යුත් අධ්‍යාත්මික ශක්තීන් ලෙස මරණින් මතු නැවත ඉපදෙන කර්මජ සත්ත්වයාට හේතුව පිළියෙල වනු ඇත. මෙම කර්මජ සන්තතියෙන් නිදහස්වීම සඳහා මානසික ප්‍රිය ස්පර්ශයන්හි විරාගය, ප්‍රහාණය හා නිරෝධය සිදුවීම ශීලය හා සමාධිය තුලින් අත්පත්වන ප්‍රඥාධිගමනය වන බවත් ඒ සඳහා එකමවූද ශ්‍රේෂ්ඨවූද ස්පර්ශ නිරෝධ හා කර්ම නිරෝධගාමිණී ප්‍රතිපදාව ආර්ය අෂ්ඨාංගික මාර්ගය වනු ඇත.

යම් ප්‍රඥාවන්තයෙකු සතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගගත ආර්ය ප්‍රතිපදාවෙහි පෞද්ගලික අත්දැකීම වනුයේ ස්වභාවගත ධර්මයන්හි සැබෑ පැවැත්මෙහි ක්‍රියාකාරී ධර්ම මාර්ග අවබෝධය වන අතර එම ස්වභාවය මත යැපෙන හා රැඳෙන සියළුම සංස්කාරක වස්තූන්ගේ සත්‍යයතාවයෙහි ඇති සැටිය නිත්‍ය නොවන පැවැත්මක් සඳහා පදනම්වූ දුක්ඛ ධර්මයක ඵලය පිණිස වන බව අවබෝධ වනු ඇත. සමස්ත සංස්කාරක වස්තූන් සන්තතික දුක්ඛ වේදනා සංඛ්‍යාත කර්ම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමත් නැවත කර්ම පිළියෙල කිරීමෙන් ඒවායේ අඛණ්ඩ සසර පැවැත්මත් තහවුරු කිරීම සඳහා යොමු වූ ස්වභාවයකට නියමිතව ඇත්තේ ස්ථිතික විද්‍යුත් ප්‍රභවගතව විද්‍යාත්මක ක්‍රියාවලිය මත පිළියෙල වී ඇති නිසාය. මේ සඳහා කාම තෘෂ්ණාවත්, ද්වේශයත්, ත්‍රිවිධ දෘෂ්ඨීනුත් එම සත්ත්ව සන්තතික ලෝක ධර්මතාවයෙහි පැවැත්ම තහවුරු කර ඇත. අවිද්‍යාවට ගොදුරුවූ මනුෂ්‍යය තිරිසන් සත්ත්වයෝ තමන් සතු කර්ම ධර්මතාවයෙහි තමා කෙරෙහි ක්‍රියාත්මක වන අධ්‍යාත්මික සන්තතික විද්‍යා ක්‍රියාවලිය අවබෝධ කර නොගැනීමේ හේතුව ලෙස තමන් යනු පුද්ගලයෙකු ලෙස විශ්වාසය කිරීමේ මානසිකත්වයත් ලෝකය නිර්මාණය කල දෙවියකුගේ තමන් දේව පුත්‍රයෙකු ලෙස දැකීමේ මානසිකත්වය තුලින් විද්‍යාත්මක වූ සත්ත්ව කර්ම ධර්ම පාදක අධ්‍යාත්මික බන්ධනයට ගොදුරු වී අඛණ්ඩ සතර අපාගත සංසාර මාර්ගයට බැඳී ඇත. ඉහත ලෙසින් වන මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ තමන් කෙරෙහි පවත්නා අධ්‍යාත්මික සන්තතික මානසික ධර්මයන්ගේ අනවබෝධය එනම් අවිද්‍යාව ප්‍රධානම හේතුව වීමෙන් තමන්ගේ සන්තතික ක්‍රියාවලියෙහි කර්ම පැවැත්ම කෙරෙහි දැඩිව යොමු වීමෙන් කාම තෘෂ්ණාව තුලින් උපාදානස්කන්ධ රැස්කිරීමේ මානසික කර්ම සැලැස්ම අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත.

මානසික කර්ම ක්‍රියාවලියෙන් නිදහස් වීම පිණිස වෑයම් කරන සත්පුරුෂයින් ආර්ය මාර්ගය අවබෝධකර ගැනීමෙන් කායිකව සහ මානසිකව ප්‍රගුණ කලයුතු නිර්වාණ මාර්ගයෙහි පියවර සියල්ලම ප්‍රගුණ කරමින් අවසාන අරමුණ කෙරෙහි ළඟාවීමට යොමුවිය යුතුව ඇත. ත්‍රිවිධ දෘෂ්ඨීන්ගෙන් නිදහස් වීමත් ත්‍රිවිධ ක්ලේෂයන්ගෙන් නිදහස් වීමත් තුලින් අත්පත් කරගත යුතුවන සම්මා දෘෂ්ඨිය ආර්ය මාර්ගයෙහි මාර්ග අවබෝධයෙහි විද්‍යාත්මක ඵලය ප්‍රඥාව වනු ඇත. සන්තතික කර්ම ක්‍රියාවලියෙහි අධ්‍යාත්මික සත්ත්ව කර්ම ධර්මයන්හි සැබෑ ක්‍රියාත්මක ධර්මතාවයෙහි යමෙකුගේ පූර්ණ අවබෝධය සඳහා චතුර්විධ සත්‍යය ධර්මයන්හි යථා ස්වභාවය ගැන නොදැනීම සාමාන්‍ය ලෞකික කර්ම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති අතර එහි ඵලය වන්නේ නැවත ඉපදීමේ භව කර්ම ධර්මයෙහි තමාගේ දුක්ඛ පැවැත්ම තහවුරු කර ගැනීමයි.

මනුෂ්‍යය සත්ත්වයන් කෙරෙහිද තිරිසන් සත්ත්වයන් කෙරෙහිද එක සමාන ලෙසින් ක්‍රියාත්මක සන්තතික කර්ම ධර්මයට අනුව සියළුම සත්ත්වයෝ මානසික සංස්කරණය නම්වන පංච උපාදානස්කන්ධගත අධ්‍යාත්මික කර්ම ධර්මතාවය නිර්මාණය කර ගැනීම සිදුකර ගනු ඇත. තමන් යනු පුද්ගලයෙකු ලෙස දැකීමේ මමත්වය පිලිබඳව පවතින විශ්වාසයෙහි අවිද්‍යාව සක්කාය දිෂ්ඨිය ලෙසත් තමා යනු ආත්මයක් වශයෙන් පවතින දෙවියකුගේ මැදිහත් වීමෙන් පිලියෙලවූ පුද්ගලයෙකු ලෙස දැකීමේ මමත්වය පිලිබඳව පවතින විශ්වාස කරගත් එමෙන්ම එම ඇතැයි සිතන දෙවියන්ගේ ස්වර්ග රාජ්‍යයකදී නියත ස්වර්ග මෝක්ෂ සැප සම්පත් ලැබීමට නියමිතව ඇතිබව විශ්වාස කිරීම නිසා දේව පුත්‍රයෙකු ලෙස දැකීමේ ආත්ම දෘෂ්ඨියත් තමා යනු මනුෂ්‍යය සතෙකු ලෙස දැකීමේ එනම් මානසික හා කායික සැප ස්පර්ශයන්ට යොමුවිය යුතුව ඇති බව දැකීමේ සත්ත්ව දෘෂ්ඨිය වන මිත්‍යා දෘෂ්ඨිය පිණිසත් වනු ඇත. ඉහත ත්‍රිවිධ දෘෂ්ඨීන් ඍජුවම මනුෂ්‍යයා යොමු කරවනු ලබන්නේ මානසික

කර්ම නිර්මාණයෙහි අධ්‍යාත්මික ධර්මයන්හි පංච උපාදානස්කන්ධය ලෙසින් වන මානසික සංස්කරණයෙහි අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත්මය ශක්තීන්ගේ සම්ප්‍රයුක්ත මානසිකත්වය කෙරෙහි අවිද්‍යාවෙන් රැවටීම නිසාය.

සාමාන්‍ය අශ්‍රද්ධාන පෘතග්ජන මනුෂ්‍යයින් අනුගමනය කරනු ලබන හා විශ්වාසයෙන් යුතුව පිලිගන්නා තමන්ගේයැයි සිතන සංස්කාරක වස්තූන්ගේ පරිහරණය කිරීමේ ක්‍රමවේදය අවිද්‍යා මාර්ගය වන අතර එනිසා ඔවුන් සියලු දෙනාටම එම අවිද්‍යාවට අදාල විපාක ප්‍රතිසන්ධිගත නැවත ඉපදීමේ ක්‍රියාවලියෙහි සතර අපාගත ප්‍රබල දුක් සහිත තිරිසන් ප්‍රේත ආදී භව ගත විය යුතුව ඇත.

පෘතග්ජන මනුෂ්‍යයන්ගේ නූගත්කම හේතුවෙන් අනුගමනය කරනු ලබන සන්තතික කර්ම ක්‍රියාවලිය නිසා ඔවුන්ගේ භව කර්ම ක්‍රියාවලියෙහි පදනම සඳහා ස්ථිතික විද්‍යුත් ශක්තිය මාධ්‍ය වීමෙන් පිළියෙල වන ත්‍රිවිධ පදාර්ථගත මූලද්‍රව්‍යයන්ගේ එකතුවෙන් සම්ප්‍රයුක්තව නිර්මාණය වන හේතුඵල ධර්ම නිතිය ගැන නොදන්නාකමින් අවිද්‍යාවට පත්වනු ඇත. මෙම අවිද්‍යාව ප්‍රධාන මූලික හේතුව වීමෙන් පෘතග්ජන අශ්‍රද්ධාන මනුෂ්‍යයන් බිහිවන සන්තතික දුක්ඛ කර්ම ධර්මය ලෝක ධාතුවෙහි පැවැත්ම තහවුරු කර ඇත. මෙම දැඩි අවිද්‍යා ස්වභාවය තුලින් කිසිම පෘතග්ජනයෙකුට නැවත ඉපදීම සහ නැවත මියදීම ලෙසින් වන අඛණ්ඩ සන්තතික දුක්ඛ භව කර්ම ක්‍රියාවලියෙන් නිදහස්විය නොහැක. තථාගතයන් වහන්සේ දේශනා කල විද්‍යාත්මක චතුරාර්ය සත්‍යය ධර්මයෙහි ප්‍රඥාවබෝධයට පත් ප්‍රඥාවන්තයෙකු තමන් සතුව පවතින හා සෙසු සත්ත්වයින් කෙරෙහිද සන්තතිකව පවත්නාවූ ලෝක ධර්මතාවය මූලිකවත් ප්‍රධානවත් දුක්ඛ සංවේදී විපාක ජනනයට යොමුව පවතින දුක්ඛ සත්‍යය බව නිවැරදිව අවබෝධ කරගනු ඇත.

* ලොවෙහි පවතින මාර්ගයන් අතුරින් ප්‍රඥාවන්තයින් පමණක් අනුගමනය කරනු ලබන එහෙත් නූගත්

අශ්‍රද්ධානයින් කිසිදිනක අනුගමනය නොකරන ශ්‍රේෂ්ඨතම අධ්‍යාත්මික මාර්ගය වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.

* ලොවෙහි පවතින ක්‍රියාකාරී සත්‍යය ධර්මයන් අතරින් ශ්‍රේෂ්ඨතම සත්‍යය ධර්මය ප්‍රඥාවන්තයින් පමණක් අවබෝධ කර ගැනීමත් අනුගමනය කිරීමත් කරන අතර අශ්‍රද්ධාන පෘතග්ජනයින් කිසි ලෙසකින්වත් අවබෝධ කරගැනීම හෝ අනුගමනය නොකරන ලොවෙහි එකම සත්‍යය චතුරාර්ය සත්‍යය වනු ඇත.

* ලොවෙහි ක්‍රියාත්මක සහ අනුගමනය කරන විෂයයන්ගෙන් ශ්‍රේෂ්ඨතම අධ්‍යාත්මික ධර්මතාවයන්ගේ සන්තතික විද්‍යා විෂය වන්නේ ප්‍රඥාවන්තයෙකු විසින් ප්‍රායෝගිකව යෙදීමෙන් අවබෝධ කරගත යුතුව ඇති එහෙත් අශ්‍රද්ධාන පෘතග්ජනයෙකුට එලෙස අවබෝධ කරගත නොහැකි වන කායික මානසික කාම සංඥා ස්පර්ශ ක්‍රියාවලිය අත්හැරීම මගින් අත්පත් කරගත හැකිවන සන්තතික ධර්මයන්ගේ විද්‍යාත්මක විෂය වන ප්‍රඥාවයි.

* ලොවෙහි ඇති අවබෝධයන් අතර ශ්‍රේෂ්ඨතම අවබෝධය වන්නේ එනම් ප්‍රඥාවන්තයෙකුට පමණක් අත්පත් කරගත හැකි නමුත් අශ්‍රද්ධාන පෘතග්ජනයින්ට කිසිලෙසකින් වත් අවබෝධකර ගත නොහැකි ශ්‍රේෂ්ඨතම අවබෝධය ලොවෙහි ක්‍රියාත්මක අධ්‍යාත්මික ධර්මතාවයන්ගේ යථාර්තය සියළුම සත්ත්වයින් කෙරෙහි දුක්ඛ ධර්මයක් වන බව අවබෝධකර ගැනීමෙන් අත්පත් වන අධ්‍යාත්මික විමුක්තිය නම් වන නිර්වාණාවබෝධයයි.

පෘතග්ජන මනුෂ්‍යයන් අනුගමනය කරන සහ පිලිගන්නා කර්ම පාදක පෘතග්ජන සන්තතික කර්ම ධර්මය එනම් තථාගත ධර්මය ඇති සැටිය නොදැනීමෙන් ක්‍රියාත්මක වන පෘතග්ජන මාර්ගය වන අතර එයට අනුගතව සංස්කරණයවූ සමස්ථ සංස්කාරක වස්තූන් රඳා පවතින්නේ

ස්ථාවර නොවූ සැලැස්මක් මත වන අතර නැවතත් මරණින් මතු සැලසුම් කර ගැනීමට සුදුසු නොවන බැවින් ආත්ම පදනමකින් බැහැර විය යුතුව ඇති බවත් මෙම හේතූන්ට අනුව සමස්ත ලෝකගත මනුෂ්‍යය තිරිසන් ලෙසින් වන සංස්කාරක වස්තූන් දුක්ඛ ධර්මයක සම්භවය මත පිහිටා ඇත. එම ධර්මතාවය සත්ත්වයින්ගේ අවිද්‍යාව තුලින් කර්ම ක්‍රියාවලියකට යොමු වීමෙන් අඛණ්ඩව සන්තතිය වන සංසාරගත දුක්ඛ ධර්මයක් වනු ඇත. සමස්ත සංස්කාරක වස්තූන්ගේ පදනම්වූ ධර්මතාවය විමර්ශනය සහ විදර්ශනා කිරීමෙන් අවසාන ඵලය ලෙස ලබනුයේ ස්ථිතික විද්‍යුත්මය වූ ශක්තීන්ගේ සංඥ එකතුවක් හා පදාර්ථයන්හි සංයෝ-ජනයන්හි එකතුවකි. එම විශ්ලේෂණය තුලදී ඒවායේ අන්තර්ගතව පැවැති ස්ථාවරවූ ඵලයක් කිසිම ලෙසකින් ජීවී සත්ත්ව රූපයකට හිමිකම් කීමකට පවතින අන්තර්ගතයක් නොමැති අතර ද්‍රව්‍ය සහ ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ සත්‍යය ලෙසින් පවතින විද්‍යාත්මක ක්‍රියාවලියක ඵලයක් වන බව ප්‍රඥාවට විෂය වනු ඇත. මෙම සංස්කාරක වස්තූන්ගේ විශ්ලේෂණ, විමර්ශණ හා විදර්ශනා ක්‍රියාවලිය තුලදී කිසිම ස්ථාවර ජීවී සත්ත්වයෙකුට හේතුවක් විද්‍යාමාන නොවන අතර අධ්‍යාත්මිකවූ සංස්කාරක සංඥා ශක්තීන් ද (පංච උපාදානස්කන්ධ) සංස්කාරක මූල ද්‍රව්‍යයන්ගේද එකතුවක් ඇති බව පමණක් වනු ඇත. මෙම විශ්ලේෂණය තුලින් දේව නිර්මාණයකින් ලැබූ දේව පුත්‍රයකු යන සංකල්පය මිත්‍යාවක් වන බවත් නිත්‍ය නොවන සංස්කාරක ඵලයක් තුල ජීවී බවක පැවැත්මක් නැති බවත් එලෙසම මෙම සංස්කාරක ධර්මයන්ගේ නිත්‍ය ආත්මයක් හෝ සන්තතික ආත්මයක් හෝ නැති බවත් විද්‍යාත්මකව ඔප්පුවනු ඇත. ඉහත ලෙසින් ගොඩනැගෙන සත්ත්ව පුද්ගල ආත්ම ලෙසින් වන අවිද්‍යාපාදක මානසික විශ්වාසයන් සමස්ත සංස්කාරක වස්තූන් හේතුවෙන් නිර්මානය වන සම්ප්‍රයුක්ත මානසික ශක්තියෙහි විද්‍යාත්මක ධර්මයන්හි මානසික නිර්මාණකරනයන් මත ගොඩනැගී ඇත.

අවිද්‍යාව නිසා පෘතග්ජන මනුෂ්‍යයින් තමතමන් සතු සම්ප්‍රයුක්ත මානසික කර්ම ධර්මයන්හි විද්‍යාත්මක ක්‍රියාවලියට අනුගත වීමෙන් නිර්මාණය කර ගන්නා පංච උපාදානස්කන්ධය ලෙසින් වන සන්තතික මානසික කර්ම ධර්මයන්හි යථා ස්වභාවයෙහි විද්‍යා අවබෝධය නොමැති වීමෙන් මානසික රැවටීමට සහ මුලාවීමට පත්ව සන්තතික ධර්මයන්ගේ හේතුඵල නීතියට යටත්ව මානසික සංස්කරණයත් කායික සංස්කරණයත් අතර පවතින විද්‍යාත්මක හා ස්ථිතික විද්‍යුත්මය සම්බන්ධීකරණයෙහි කර්ම බන්ධනය තහවුරු කරගනු ඇත. එහි ඵලය පෘතග්ජන ලෞකික සන්තතික කර්ම මාර්ගය වනු ඇත. සංඥා රූපයන්හි අන්තර්ගතයෙහි මානසික සංස්කරණය ස්ථිතික විද්‍යුත්මය ලෙසින් පිලියෙලවීම වන අතර එයට හිමි ඵලය වන්නේ සත්ත්වයින්ගේ ද්‍රව්‍යාත්මක භෞතික කාය සංස්කරණයයි. එම භෞතික කාම ඉන්ද්‍රියන්හි ස්පර්ශවන වස්තූන්ගේ සංඥා රූපයන්ගේ සිදුවන මානසික සංයෝජනය අවිද්‍යාව හා කාම තෘෂ්ණාව හේතුව වීමෙන් නිර්මාණය වනු ඇත. මෙම අධ්‍යාත්මික මානසික ක්‍රියාවලිය තුලින් සත්ත්වයාට හිමිවන අධ්‍යාත්මික ඵලය තෘෂ්ණාවට විෂය වන අවිද්‍යාවට යටත්වූ මානසික අනුමැතියකි. මෙම මානසිකව අනුමත කරගත් මානසික සංස්කරණය මනෝ විඥාණය ලෙසින් හඳුන්වනු ලබන අතර එම විඥාණ කර්ම ශක්තිය පෘතග්ජන මනුෂ්‍යය තිරිසන් සත්ත්වයින්ගේ සන්තතික දුක්ඛ කර්ම ශක්තීන්ගේ පැවැත්ම සිදු කරන අධ්‍යාත්මිකවූද ස්ථිතික විද්‍යුත්මයවූද විද්‍යා ධර්මයන්හි පංච උපාදනස්කන්ධය නමින් හඳුන්වනු ලබන කර්ම බීජය වනු ඇත.

ඉහත ලෙසින් වන සත්ත්වයින්ගේ සන්තතික භව ක්‍රියාවලියෙහි විද්‍යාත්මක මූලධර්මයට අනුව සියළුම තිරිසන්, මනුෂ්‍යය සත්ත්වයෝ තම තමන් සතු පංච උපාදානස්කන්ධගත අධ්‍යාත්මික මානසික කර්ම ක්‍රියාවලියට යටත් වීමට සිදුවීම නොවැලැක්විය හැකි ප්‍රබල සිද්ධියක් වන අතර ඒ සඳහා මූලික වූ අධ්‍යාත්මික ස්ථිතික විද්‍යුත්

ශක්තීන්ගේ සන්තතික භවකර්ම ක්‍රියාවලිය අවිද්‍යාවත් තෘෂ්ණාවත් මත නිර්මාණය කරගෙන ඇත. මෙහිදී සත්ත්වයින්ගේ හය වැදෑරුම් අධ්‍යාත්මික උපාදාය රූපය හය (ඇස, කන, නාසය, දිව, කාය ශරීරය සහ මනස) සය වැදෑරුම් බාහිර විශය රූප (බාහිර රූප) වන සමස්ත සංස්කාරක වස්තූන්ගේ (වර්ණ රූප, ශබ්ද, ගන්ධ, රස, කායික ස්පර්ශ සහ මානසික ස්පර්ශයන්) දොලොස් අයුරකින් අධ්‍යාත්මික රූප සහ බාහිර රූප ස්පර්ශය මූලධර්මය මත සංයෝජනය වීමෙන් ලැබෙන අධ්‍යාත්මික කර්ම ඵලය සන්තතික කර්ම ධර්මයන්හි සන්තතික විද්‍යුත් ශක්තිය තුලින් නිර්මාණය වූ පංච උපාදානස්කන්ධය වනු ඇත. මෙය සමස්ත තිරිසන්, මනුෂ්‍යය සත්ත්වයින්ගේ සන්තතික භව බන්ධන කර්ම ක්‍රියාවලියෙහි සම්භවය වනු ඇත.

ඉහත ලෙසින් සිදුවන සන්තතික කර්ම ක්‍රියාවලියට පදනම අධ්‍යාත්මික හා බාහිර ස්ථිතික විද්‍යුත්මය ස්පර්ශ ක්‍රියාවලියක සංඥා රූපයන්හි මානසික සංයෝජනය වන අතර එම සංයෝජනය ප්‍රධාන හේතුව වීමෙන් සත්ත්වයාගේ මරණින් පසු නැවත ඉපදීමට හේතුව නිර්මාණය වන අතර එහි ඵලය ලෙස භෞතික කාය සංස්කරණයක් හිමිවන අතර විපාකය ලෙසින් හේතූන්ගේ ඵලය සත්ත්වයින්ගේ භව චක්‍ර ක්‍රියාවලිය සඳහා වන විද්‍යාත්මක වූ විශ්ව ලෝක සන්තතික ධර්මයෙහි හේතු ඵල නියාම ධර්මය වනු ඇත. මෙම හේතුඵල නියාමයට අදාලව කර්ම ක්‍රියාවලිය නිර්මාණය වීමේ අධ්‍යාත්මික සහ විද්‍යාත්මක සන්තතික ක්‍රියාවලිය වන්නේ සත්ත්වයින්ගේ කර්ම ශක්ති ඵලය වන පංච උපාදානස්කන්ධය වනු ඇත.

1. ද්‍රව්‍යයන්ගේ රූපීය ස්වභාවය, රූපීය විෂය වස්තූන්ගේ සමූහනයෙහි එකතුව, සංස්කාරක ද්‍රව්‍යයන්ගේ විද්‍යුත් සංඥා රූප (වර්ණ සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා රස සංඥා, ස්පර්ශ සංඥා ධර්ම සංඥා) (රූප)

2. ඉහත සමූහ ස්කන්ධයන්හි කායික වූ හා මානසික වූ ස්පර්ශය මගින් සිදුවන වේදනාවන්හි ක්‍රියාත්මකවීමේ කලාපය (මානසික ස්පර්ශය සඳහා වන පංචවිධ ස්ථිතික විද්‍යුත් විෂය රූප සංඥා මගින් සිදු කරන සැප වේදනා ස්පර්ශය) (වේදනා)
3. ස්පර්ශ වීමෙන් ක්‍රියාත්මක වීමට නියමිත සුඛ සංවේදී සංඥා රූපයන්හි ස්පර්ශයට අනුගතවූ මානසික ස්පර්ශයට එකඟවූ විෂය රූප (සංඥා)
4. හඳුනා ගැනීමෙන් හා එකඟවීමෙන් පිළියෙල කරගන්නාවූ සංඥා ස්කන්ධයන්හි සංස්කරණ ඒකකය කර්ම පිණිස පිළියෙලවීමට යොමු වූ ප්‍රියමනාප වේදනාවන් (තෘෂ්ණාවට විෂය වූ සංඥා ස්කන්ධය) (සංස්කාර)
5. හඳුනා ගැනීමේ සිහියට යටත් වන සංඥාවන්හි ස්පර්ශය/මානසික සංස්කරණ ඒකකය එනම් මානසික ස්පර්ශග්‍රාහී සංඥාවන්හි ස්ථාවර වූ සංයෝජනය කර්ම ක්‍රියාවලිය සඳහා යොමු වීමෙන් ස්ථාවරවූ මෙම මානසික සංඥාවන්ගේ පිළියෙල වීම සැලසුම් වනුයේ ස්ථිතික විද්‍යුත් ප්‍රභව ගත සම්ප්‍රයුක්ත අධ්‍යාත්මික ඵලය වන මානසික ශක්තිය මගින් වන අතර මෙම ක්‍රියාවලියෙන් ලැබෙන ස්ථිතික විද්‍යුත් සංයෝජන මානසික කර්ම ශක්ති බලය මනෝ විඤ්ඥාණය නමින් හඳුන්වනු ඇත. (විඤ්ඤාණය)

ඉහත ක්‍රියාවලියට අනුව සන්තතික ස්පර්ශ සංවේදී මානසික විද්‍යුත් ප්‍රභවගත මානසික සංස්කරණ ව්‍යුහයෙහි ක්‍රියාකාරී විද්‍යාත්මක සැලැස්ම අඥානවූ විද්‍යා අවබෝධය රහිත එනම් ප්‍රඥාව නොමැති මනුෂ්‍යයන් සඳහා අවිද්‍යාව ලෙසින් ත්‍රිවිධ තෘෂ්ණාවට යටත්ව ත්‍රිවිධ දෘෂ්ඨීන්ට අනුගතව සත්ත්ව, පුද්ගල ආත්ම දැක්මට යොමු වී ඇති අතර එම අවිද්‍යා පාදක ත්‍රිවිධ දෘෂ්ඨීන් විශ්ව ලෝක සන්තතික සත්ත්ව කර්ම ධර්මයෙහි මූලධර්මය වන අතර එහි විද්‍යාත්මක ඇති සැටියෙහි නොදැනීම අවිද්‍යාව වීමෙන් එහි ඵලය සන්තතික දුක්ඛ ධර්මය සඳහාම යොමුව පවතී.

ඉහත සඳහන් සමස්ත විද්‍යාත්මක ක්‍රියාවලියෙහි චිත්ත ශක්තීන්ගේ ගුණාත්මක භාවය සමස්ත සත්ත්ව සන්තතියෙහි හේතුඵල ධර්මය මත ක්‍රියාත්මක වන දුක්ඛ ධර්මය සඳහා යොමුව පවතින අතර ඒ සඳහා වන කර්ම චක්‍රය සත්ත්වයාගේ සන්තතික ක්‍රියාවලියෙහි නැවත ඉපදීමට ඵලය ලෙසින් යොමුව පවතී. ඉහත සඳහන් පංච විධ රූප සංවේදී මානසික වේදනාවන්ගේ අධ්‍යාත්මික වූ විද්‍යාත්මක වූ කර්ම නිර්මාණයවීමේ ක්‍රියාවලිය මනුෂ්‍යය සහ තිරිසන් සත්ත්වයින්ගේ සන්තතික කර්ම ධර්මය වනු ඇත. ඉහත සඳහන් විද්‍යාත්මක කර්ම ධර්මයෙහි විද්‍යා අවබෝධයට පත්වූ යමෙකු සත්‍යය වූ සන්තතික ධර්ම ස්වභාවයේ ඇති සැටිය දුක් වේදනා සඳහා පමණක් පිළියෙල වී ඇති බව අවබෝධකර ගනු ඇත.

ලොවෙහි පරම සත්‍යය විග්‍රහවන චතුරාර්ය සත්‍යය ධර්මය යනු විශ්ව ලෝකගතව සත්‍යය ලෙසින් සිදුවන සත්ත්වයින්ගේ විද්‍යාත්මක කර්ම ධර්මයේ ඇති සැටිය වන අතර ප්‍රඥාවන්තයෙකුට එය තමා සතු සන්තතික දුක් වේදනා කර්මයන්හි නිරෝධය සඳහා යොමුකර ගැනීමට හේතුව වනු ඇත.

තමන් සතු මානසික අත්දැකීම්වල සත්‍යය අසත්‍යතාවය ප්‍රඥාවන්තව විමර්ශණය කිරීමෙන් පිරිසිදු දැක්මට එනම් සම්මා දිට්ඨියට පවත්වන ප්‍රඥාවන්තයෙකුට ලෞකික සත්ත්ව කර්ම ක්‍රියාවලිය දුක්ඛ ඵලයක පැවැත්මකට කේන්ද්‍රගතව ඇති බව පැහැදිලි වන අතර එහි අන්තර්ගතය සතුට හෝ සැප ලෙසින් ස්ථාවර බවක් සඳහා නොපවතින අතර සැප සහ සතුට නැමැති මානසික පැවැත්ම ඒ සඳහා විෂය වන සංස්කාරක වස්තූන්හි පවතින ස්පර්ශ තුලින් සංවේදී වන ධර්මයක් වන බැවින් එම සැප යයි සිතන මානසිකත්වය එම සංස්කාරක වස්තූන්ගේ පැවැත්ම මත හේතුව වීමෙන් ඵලය වන මානසිකත්වයකි. එම සැපයයි සිතන මානසික

හැඟීම් එම ලැබෙතැයි සිතන සැප සඳහා අදාල මානසික උත්සාහය මතත් එම මානසික වෑයමෙහි අඛණ්ඩභාවය මතත් රඳා පවතින අතර එසේ නොවන්නේ නම් මානසික ස්වභාවයෙහි යථා ස්වභාවය සැප හෝ දුක් ලෙසින් ලබන වේදනා සඳහා ප්‍රතිචාර දක්වන හා ප්‍රතිචාර ලබන සත්ත්වයෙකු පුද්ගලයෙකු හෝ ආත්මයක් කිසිවිටෙක නොපවතින බවට සත්‍ය ලෙසින් අවබෝධ වනු ඇත.

## ප්‍රඥාවෙහි හා මෛත්‍රීයෙහි ප්‍රායෝගික වීම

*අධ්‍යාත්මිකත්වයෙහි යෞවනත්වය තුලින් කාරුණිකවූ*
*තාපසයෙකු ලෙසින් ඉතා පැහැදිලිව හඳුනාගතහැකි වන,*
*පාරිශුද්ධියේ සංකේතය වන පද්මාසනයක් මත පලක්*
*බැඳගත් වචන දෙකකින් පමණක් උන්වහන්සේ පිලිතුරු*
*සැපයීමට සිය දකුණු හස්තයෙන් විධානය කරණුයේ 'දුකෙන් සහ*
*භියෙන් පලායාමට නුඹට අවශ්‍ය නම්' විශ්ව ප්‍රඥාවත්*
*අප්‍රමාණවූ විශ්ව මෛත්‍රියත් ප්‍රායෝගික කරගත යුතු බවයි.*

-විද්වත් ඇනටෝල් ප්‍රාන්ස් -

## 3.3 කර්මජ සිතින් නිදහස්වීමේ නිර්වාණ ක්‍රියාවලිය

ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ විද්‍යුත් බලයෙහි විවිධ ආරෝපිත ශක්තීන් පදනම් වන විද්‍යාත්මක ක්‍රියාවලියක් තුලින් නිර්මාණය වී ඇති විශ්ව ලෝකගත සත්ත්ව කර්ම ධර්මතාවයෙහි ශූක්ෂ්ම බව සහ ගැඹුරු බව විමර්ශනය කිරීමෙන් සහ විදර්ශනා කිරීමෙන් ප්‍රඥාබෝධයට පත්වන ප්‍රඥාවන්ත සත්පුරුෂයින් පංච ඉන්ද්‍රියන්ට සංවේදී නොවන එම ක්‍රියාවලිය තුලින් ලබා ගන්නා පූර්ණ අවබෝධය තුලින්

සංසාර කර්ම චක්‍රයෙන් ඉවත්වීමට පියවර ගනුඇත. එය හඳුනා ගැනීමටත් අවබෝධකර ගැනීමටත් අශ්‍රද්ධාන පෘතග්ජන මනුෂ්‍යයින්ට අතිශය දුෂ්කර සහ අසීරු වූවත් ප්‍රඥාවන්තයෙකුට සංසාරගත කර්ම නිර්මාණය සිදුවන අන්ත දෙකෙන් බැහැරව මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම නිවැරදිව සහ වීර්යයෙන් යුක්තව කර ඇත්තේද එහි අවසාන ඵලය නිවන සඳහා යොමුවන අතර ත්‍රිවිධ මිත්‍යා දෘෂ්ඨීන්ගෙන් ඉවත් වීමෙන් පිරිසිදු වූ සම්මා දිට්ඨියට පත් වීමෙන් සාමාන්‍ය පෘතග්ජන ලෝකයාගේ අවබෝධ සීමාව ඉක්මවූ අතීන්ද්‍රිය ලෝකෝත්තර ප්‍රඥාව සඳහා යොමු වනු ඇත. යමෙකු නිර්වාණ මාර්ගයේ ප්‍රථම පියවර වන ආර්ය භාවයට පත්වීමේ එනම් සෝතාපන්න බව සඳහා අවිද්‍යාව විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන ත්‍රිවිධ ක්ලේෂ ධර්මයන් ප්‍රහීන කල යුතුව ඇත. ඒවා නම්,

**1. සක්කාය දිට්ඨිය**

පුද්ගල මානසිකත්වය (පුද්ගලයෙක් යැයි විශ්වාස කිරීම) සක්කාය දෘෂ්ඨිය/ ත්‍රිවිධ ක්ලේෂ මූලගත මානසික සත්ත්ව කර්ම ධර්මයන්හි පදනම් හේතුව පිළිබඳ නොදැනීමේ අවිද්‍යාවට යොමුවන යමෙකු ඒ සඳහා පදනම් හේතුඵල ධර්මය සිය මානසික නිර්මාණයට පදනම් වී ඇතිසැටි සහ එම මානසිකත්වය පුද්ගලයෙකු යැයි දැකීමට හේතුව වන විද්‍යාත්මක සැලැස්මක් සඳහා ද්‍රව්‍ය සහ ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ කර්ම නිර්මාණය වීම ගැන නොදන්නාකම වනු ඇත. තමා යනු පුද්ගලයෙකු යැයි විශ්වාස කිරීමේ මුලාව අවිද්‍යා සහගත පුද්ගලත්වය පිලිබඳ දෘෂ්ඨියක් වන අතර තමා යනුවෙන් සිතීමට පාදකවන ස්වභාවය සඳහා කර්ම ඵලය නිර්මාණය වීමට දායක වූ සන්තතික හේතුඵල විද්‍යාත්මක ලෝක ධර්මතාවය තුලින් විමංසා කිරීමේ විද්‍යාත්මක වූ විදර්ශනාමය ප්‍රඥාවබෝධය නොමැති වීමෙන් තමා ලෙසින් සිතන මානසිකත්වය තමාගේ සත්‍යය පැවැත්මක් යැයි

විශ්වාස කිරීමේ අනවබෝධයට හේතුව වීමෙන් අඥාන නූගත් පෘතග්ජන මනුෂ්‍යයෝ ලෞකික කර්ම මාර්ගයෙහි යථාර්තය නොදත් කමින් භයානක දුක්ඛ ධර්මතාවයට යොමුව ඇත.

## 2. විචිකිච්චා

විද්‍යාත්මක සත්ත්ව ධර්මයන්හි කර්ම ක්‍රියාවලියෙහි අධ්‍යාත්මික ධර්මයන් පිළිබඳව ඇති සැකය.

1) තථාගතයන් වහන්සේ ගැන සැකය.
2) චතුරාර්ය සත්‍යය ගැන සැකය.
3) නිර්වාණ මාර්ගය අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්ති පූරණය කරන සිව්වනක් පිරිස පිළිබඳ සැකය
4) අධ්‍යාත්මික සංවරයට හේතුව වන ශීලසංවර ප්‍රතිපත්තීන් පිළිබඳ සැකය.
5) පූර්ව භවය ගැන සැකය.
6) අනාගත භවය පිළිබඳ සැකය.
7) අතීතය සහ අනාගත යන භව දෙකම පිළිබඳ සැකය.
8) හේතුඵල ධර්ම නියාමය මත සිදුවන විද්‍යාත්මක සත්ත්ව කර්ම ධර්මයන්ගේ අධ්‍යාත්මික ක්‍රියාවලිය වන පටිච්චසමුත්පන්න ධර්මය පිළිබඳ සැකය.

## 3. සීලබ්බත පරාමාස

මිත්‍යා විශ්වාසයන් ඇදහීමත් පිළිගැනීමත් සඳහා ඇබ්බැහි වීමෙන් ඒවායේ වැරදි නීතීන්ට සිරිත් වලට ආගමික බන්ධන වලට සහ සත්ත්ව වද හිංසා සිදු කරන බිලි පූජා ආදියට වහල් වීමෙන් මුලුමනින්ම ඉවත්විය යුතුය.

ඉහත සඳහන් ත්‍රිවිධ අකුසල් සංයෝජන ධර්මයන් සම්පූර්ණයෙන්ම මුලිනුපුටා දැමීමෙන් සම්මා දිට්ඨියට පත්වීම

එනම් මිත්‍යා දැකීම් වලින් නිදහස් වීම ප්‍රඥාව ලෙසින් වන නිර්වාණ මාර්ගයේ ප්‍රථම පිවිසුම වන සෝතාපන්න ආර්ය භාවයට ප්‍රඥාවන්තයෙකුට මග හෙලිවනු ඇත. ඒ සඳහා ආර්ය මාර්ග ගත උපසම්පදාගත අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥා ශීලයන්ටද ධූතාංග ශීල ප්‍රතිපදාවන්ද ඉතා ගැඹුරින් අඛණ්ඩව වැඩීම තුලින් පමණක් ඉහත ත්‍රිවිධ ක්ලේෂයන් ප්‍රහීන කර ගත හැක. ඉන් පසු එම ආර්යයන් වහන්සේ අවසාන නිර්වාණාවබෝධයට නියමිත සුදුසුකම ලැබීමට නියමිත වන අතර සිය භව චක්‍රය උප්පත්තීන් අට නොඉක්මවනු ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උන්වහන්සේගේ අධ්‍යාත්මික අවබෝධය සාමාන්‍ය පෘතග්ජන ලෞකික අවබෝධය ඉක්මවූ ලෝකෝත්තර ප්‍රතිවේදගත යථාභූත ඥාණ දර්ශණය ලෙසින් ලෝකෝත්තර ප්‍රඥා ඥාණ නමයකින් (9) සමන්විත වනු ඇත. එම ලෝකෝත්තර ඥාණ අෂ්ඨාංග මාර්ගගත සම්මා දිට්ඨිගත එහි වූ මාර්ග අවබෝධයත් එම මාර්ග අවබෝධය තුලින් අත්පත් කරගත් ඵලයෙහි අවබෝධයත් වනු ඇත.

එම ලෝකෝත්තර අතීන්ද්‍රිය ප්‍රඥා ඥාණ ශක්තීන් තමන් වහන්සේ විසින් මානසික හා කායිකව ප්‍රගුන කරන ලද සප්ත විශුද්ධීන්ට අනුව අධ්‍යාත්මික අභිවෘද්ධියට පත් තථාගත ධර්මයෙහි ඇති සැටියෙහි විද්‍යාත්මක දියුණුව වනු ඇත. ඉහත ලෙසින් තථාගත ප්‍රඥා අවබෝධය අනුගමනය කලා වූ අෂ්ඨාංග මාර්ගය තුලින් අත්පත් කරගත් මාර්ග යෙහි අවබෝධයත් එම මාර්ගය තුල ක්‍රියාත්මකවූ ධර්මයන්හි තථාගත විද්‍යා ක්‍රියාවලියෙහි සෝවාන් මාර්ගඵලලාභී ආර්ය ස්වභාවය ලෙසින් හඳුනාගත යුතුය. මෙම සෝවාන් නිර්වාණ මාර්ගඵලාවබෝධය යනු අධ්‍යාත්මික වූත් විද්‍යාත්මක වූත් ක්‍රියාකාරීවන කර්ම ධර්මතාවයෙහි විද්‍යාත්මකව ඇති සැටිය අවබෝධ වීමේ ඵලයයි. ඉහත ලෙසින් මාර්ග ඥාණය සහ ඵල ඥාණය ලෙසින් අත්පත් වන්නේ සන්තතික වූ පරමාර්ථ විශ්ව ලෝක ධර්මයාගේ විද්‍යාත්මක කර්ම ක්‍රියාවලියෙහි සෝවාන්

ඥාණ දර්ශන අවබෝධතා ප්‍රඥාශක්තියයි. විශ්ව ලෝකගත ක්‍රියාකාරි සංස්කාරයන්හි ශක්ති හා පදාර්ථගත විද්‍යාත්මක සැලැස්ම විනිවිද දැකිය හැකි ප්‍රඥා අවබෝධතාව ඥාණ දර්ශණ නවයකින් යුක්ත වන අතර සමස්ත නිර්වාණ සම්ප්‍රයුක්ත විමුක්ති ප්‍රඥාව සඳහා පාදක ප්‍රාථමික ප්‍රඥාවබෝධය සෝවාන් ඥාණ දර්ශණය ලෙසින් ආර්ය අෂ්ඨාංග ගත නිර්වාණ ක්‍රියාවලියෙහි ප්‍රථම පිවිසුම වන අතර උන්වහන්සේ අනිවාර්යයෙන්ම නිර්වාණ මාර්ගයට පත් වෙමින් සතර අපායෝත්පත්තීන්ට කිසිවිටෙක යොමු නොවී තව දුරට භව අටක් නොඉක්ම සුගති භූමින්හි පමණක් ඉපදීම් සිදුවනු ඇත. නිර්වාණ මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා අනිවාර්යයෙන්ම ප්‍රායෝගිකව අනුගමනය කලයුතුව ඇති සප්ත ශීල විශුද්ධිය මගින් අත්පත් කරගත් පටිපදා ඥාන දර්ශන විශුද්ධියට අනුව ඉහත ලෙසින් අත්පත් කරගත්තා වූ නිර්වාණ සම්ප්‍රයුක්ත විදර්ශනා විද්‍යා ප්‍රඥාබෝධයෙහි ප්‍රකටව හඳුනාගත හැකි (9) නව වැදෑරුම් ඥාණ දර්ශණ ශක්තීන් වනුයේ, අධ්‍යාත්මික ප්‍රඥාවබෝධයෙහි අන්තර්ගත සන්තතික විද්‍යා ධර්මයෙහි පදනම් හේතුඵල ක්‍රියාවලියෙහි,

1. **ඇතිවීම නැතිවීම පිලිබඳ ඥාණය (උදය-වය/උත්පාද-වය/උපත-විපත/උදයබ්භයානුපස්සනාඤාණය)**

ආර්ය අෂ්ඨාංග මාර්ගයෙහි මාර්ග සහ ඵල අවබෝධයට හේතුව වන ප්‍රථම නිර්වාණ පිවිසුම බවට පත් වීමෙන් පසුව තමන් විසින් ඇතුලත්වුනා වූ නිර්වාණ මාර්ග යෙහි අද්විතීය වූ ප්‍රඥා දැක්ම එනම් විද්‍යා දැක්ම සමස්ත සංස්කාරක වස්තූන් කෙරෙහි නියමිතව පවත්නා ඇතිවීම සහ නැතිවීමේ ස්ථිතික විද්‍යුත් මූල ධර්මයෙහි විද්‍යාත්මක ක්‍රියාවලිය වනු ඇත. සමස්ත සංස්කාරක ධර්මයන් කෙරෙහි එනම් තිරිසන් මනුෂ්‍යය සහ ශාක සන්තතියද ක්ෂණ භංගුර වන සංස්කාරයන් ලෙසින් නිරන්තරයෙන් වෙනස්වීම මත රඳා පවතී. මෙම ක්ෂනයක් පාසා වෙනස්වීමේ ධර්මයට යොමු වූ

සියලුම මනුෂ්‍යය තිරිසන් ආදී සංස්කාරක වස්තූන් කෙරෙහි අධ්‍යාත්මික වූ මානසික දැඩි අවධානයෙන් හා විදර්ශනාවෙන් විනිවිද දැකිය හැකි මූලික වූ ත්‍රිලක්ෂණගතව සන්තතික වන වස්තූන් වනු ඇත. මෙය සත්ත්වයින් කෙරෙහි පවත්නා ස්ථාවර නොවීමක් ලෙසත් පුද්ගලයෙකු හෝ සත්ත්වයෙකු සතු ආත්මයක් හෝ යැයි ලෞකික මානසික රැවටීමෙන් ඉවත්ව දකින සහ සැප හෝ සුඛ රහිත දුක්ඛ ධර්මයක් පමණක් වන බව ඉහත ලෙසින් සඳහන් කලා වූ ත්‍රිවිධ සංස්කාරකයන්ගේ ලාක්ෂණික ගුණ ස්වභාවයේ ඇති සැටිය එලෙසින් අවබෝධ කරගනු ඇත. එහෙත් ප්‍රඥා ශක්තිය රහිත අඥාන පෘතග්ජන මනුෂ්‍යයන්ට එලෙස ලෝකයෙහි සංස්කාරක වස්තූන් නිර්මාණය වූ විද්‍යාත්මක සැලැස්ම ගැන කිසි ලෙසකින් වත් පැහැදිලිව දැකීමටත් අවබෝධ කරගැනීමටත් නොහැක. ලෞකික වූ පෘතග්ජන කර්ම මාර්ගයෙහි යෙදුනා වූ මිත්‍යා දෘෂ්ඨීන්ට ගොදුරු වූ කාමභෝගී අඥාන මනුෂ්‍යයන්ට සිය කර්ම මාර්ගය ඇති ලෙසින් නොපෙනේ. එලෙසම නොදැනේ. එහෙත් එම මාර්ගය තුල සත්‍යය ලෙසින් ක්‍රියාත්මකවන සන්තතික විද්‍යාත්මක ධර්මතාවය තමන්ගේ මරණින් මතු භවගත වීමේ ප්‍රතිසන්ධි ක්‍රියාවලිය නැවත චක්‍රනයට යොමුවන ආකාරය සහ එයින් දුකට පත්වන ධර්මයෙහි ඇති අසම්පූර්ණ බවත් නොවිධිමත් බවත් විශ්වාසය තැබිය නොහැකි බවත් අනුමාන කල නොහැකි බවත් තමාට කැමති ලෙස තීන්දු කරගත නොහැකි බවත් ලෙසින් වන අවධානම් ධර්මතාවයක් වන බව මෙම ඥාණ දර්ශණය තුලින් ඉතා පැහැදිලිවීමෙන් එම ධර්මයන්ගේ විද්‍යාත්මක ඇති සැටියෙහි ස්වභාව ධර්මතාවය ගැන එලෙසින් දැඩි අවධානයට යොමුවනු ඇත.

## 2. සංස්කාරක වස්තූන්ගේ ක්ෂණයකින් සිදුවන ඇතිවීමේ නැතිවීමේ ධර්මය පිළිබඳ ඥාණ දර්ශණය ( භංගානුපස්සනා ඥාණය.)

ඇතිවීමේ සහ නැතිවීමේ අවිනිශ්චිත ස්වභාවයකට යටත්ව නිර්මාණයවන සමස්ත සංස්කාරක වස්තූන් යනු

සන්තතික විද්‍යා ධර්මයන්හි ක්‍රියාකාරීත්වය තුලින් ඉතා අවධානම් ස්වභාවයකට යොමුව ඇති බව එනම් උපත සහ විපත ලෙසින් නියමිතව ඇති ධර්මයන් බව ක්ෂණයකදී ඇති වූ යමක් ක්ෂණයකදී ක්ෂයවීමට හා නැතිවීමට විෂය වී ඇති ස්ථිතික විද්‍යුත් ශක්තීන් පාදකවූ සංස්කාරයන්ගේ එම විද්‍යුත් ශක්තීන්ගේ ලාක්ෂනික ගුණය වන ක්ෂනයකදී ඇතිවීම හා ක්ෂනයකදී බිඳීමේ ස්වභාවය පාදක වීම අන්තර්ගත සන්තතික ස්ථිතික විද්‍යුත් ධර්ම ස්වභාවය ඉතා නිරවුල්ව සහ පැහැදිලිව ප්‍රකට වනු ඇත. මෙම ආර්ය ඥාණ දර්ශණයට අනුව නිරන්තරව ස්ථිරවූ ධර්මයක් යැයි වරදවා විශ්වාස කිරීමේ අවිද්‍යා මානසිකත්වය මුලුමනින්ම අත හැරීමෙන් තමන් සතු කාය සංස්කරණයට නොඇලීමෙන් එහි යථා ස්වභාවයෙහි මානසික ක්‍රියාවලියට නිවැරදි ලෙසින් යොමුවීමෙන් නිවැරදි ජිවිකාවට පත්ව මානසික නොසන්සුන්තාවය සඳහා පාදක වන ත්‍රිවිධ දෘෂ්ඨීන්ගෙන් බැහැරව තමන් කෙරෙහි ඇති භය පිටු දැක ඉවසීමට සහ මෘදු බවට පත් වීමෙන් කාම සන්තුෂ්ටිය පිළිබඳ සතුටුවීම පිළිබඳ තවදුරටත් යොමු නොවනු ඇත. මෙම ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෞකික පෘතග්ජනයින් විසින් තම තමන් සතු සංස්කාරක වස්තූන්, කෙරෙහි ඇති කරගන්නාවූ ආදරය, කැමැත්ත, ආශාව ලෙසින් වන කර්ම බන්ධන ක්‍රියාවලිය දුක් ධර්ම ක්‍රියාවලිය අඛණ්ඩව පැවැත්වීම සඳහාම නියමිත බව දැකීම. මේ නිසා එම ආර්යයන් වහන්සේ සත්ත්ව, පුද්ගල ආත්ම ලෙසින් සම්මුතික ලෝකයේ දකින ත්‍රිවිධ දෘෂ්ඨී පාදක අවිද්‍යා මානසික ක්‍රියාවලියට ගොදුරු නොවීමෙන් සියලුම සංස්කාරක වස්තූන් තමා හා එක්ව සියල්ලම ජාති, ජරා, ව්‍යාධි, විනාශවීම්, වෙනස්වීම්, කල් ඉකුත්වීම් සහ දිරීම් සහ මියදීම් ලෙසින් වන ස්වභාවයේ නීතියට යටත් වීමට නියමිතව ඇති අතර එම ධර්මතාවය මුළුමනින්ම මානසික ධර්මයන්ගේ දුකට කේන්ද්‍රගත වී ඇති බව ඉතා පැහැදිලිව සංවේදී වනු ඇත.

## 3. සන්තතික කර්ම ධර්මයන්ගේ සංස්කාරක වස්තූන් පිළිබඳ තමා කෙරෙහි හා අන්‍යයන් කෙරෙහි ද පවත්නා අනිත්‍ය ස්වභාවය පිළිබඳ භය (භයතූපට්ඨාන ඤාණය)

තමන් හා එක්ව ක්‍රියාත්මකව පවතින මනුෂ්‍යය තිරිසන් ශාක ලෙසින් වන සියළුම සංස්කාරක වස්තූන් විද්‍යාත්මක සන්තතික කර්ම ධර්ම ක්‍රියාවලියට යොමු වී ඇති අතර සියල්ලම අවිනිශ්චිත මොහොතක විනාශයකට නිශ්චිත ලෙසින් යොමුව ඇති බැවින් තමා හා අන් සියලුම වස්තූන් කෙරෙහි ඇතිවන භීතියෙහි (භය) මානසික කර්ම ක්‍රියාවලියට අවිද්‍යාවෙන් යොමු වී ඇති මනුෂ්‍යයන්ට අකල් මානසික පීඩාවන්ට හා මානසික කම්පනයන්ට සහ මානසික අසහනයන්ට හේතුවවන මානසික ආතතියන් ලෙසින් සියල්ලන්ටම මුහුණ දීමට නියමිතව ඇත. නිවැරදි අවබෝධය ලෙසින් අත්පත් කරගත හැකි සමස්ත සංස්කාරක වස්තූන්ගේ යථා පැවැත්ම මෙය වන අතර ඒ පිළිබඳ තමා කෙරෙහි පළමුව දැඩි ලෙසින් යොමු කල යුතු දැඩි මානසික ප්‍රකෘති භාවයට පැමිණීමෙන් ආර්ය ස්වභාවයට පත්වීම වනු ඇත. මෙම දැනීමට අනුව සන්තතික සංස්කාරක වස්තූන්ගේ තමන්ද ඇතුලුව ක්‍රියාත්මක වන සන්තතික විද්‍යාත්මක කර්ම සංවේදනය භය සඳහා වන මානසික අවධානයට පත්වීම වනු ඇත. භෞතික සහ මානසික සංස්කාරක ධර්මයන්හි අන්තර්ගතව පවතින්නා වූ අස්ථාවර වූ අවිනිශ්චිත ස්වභාවය සන්තතික කර්ම ධර්මයට සංවේදීවන්නා වූ භය නැමැති අවිද්‍යා පාදක මානසික දැක්මකට යොමු වන අතර තමන් ද ඇතුලු සමස්ත සංස්කාරක වස්තූන්ගේ ස්වභාවය නැතිවීම එනම් මරණය වෙතට සෘජුවම යොමු වෙමින් පවතින බව මානසිකව පමණක් නොව කායිකවත් සංවේදනය වන අතර අධ්‍යාත්මික සහ බාහිර සන්තතික සත්ත්ව ධර්මයෙහි මූලික අන්තර්ගතය එනම් සත්‍යය දුක වන බව විමර්ශන ඥාණය තුලින් සමස්ත සංස්කාරක වස්තූන් යනු නැති යමක් ඇති බව හුවා දැක්වීමට පිළියෙල වී ඇති විද්‍යාත්මක සන්තතික

ධර්මයක් බව ඉතා ගැඹුරින් පැහැදිලි වීමෙන් සියළුම සංස්කාර වස්තූන්ට පදනම් වන විද්‍යා ධර්මය අවට ලෝක ධාතුව තුල අශ්‍රැදාන පෘතග්ජනයින්ට මිරිඟුවක් නිර්මාණය කර ඇති බව අවබෝධවීම.

## 4. සංස්කාරක වස්තූන්ගේ කර්ම මූල ධර්මයෙන් ඉවත්වීමේ උත්සාහය (මුච්චිතුකම්‍යතා ඥාණ දර්ශනය)

ස්ථිතික විද්‍යුත් ශක්තීන්ගේ විද්‍යාත්මක ක්‍රියාවලියක් මත ක්‍රියාකාරීවන සන්තතික විද්‍යා පැවැත්ම මගින් අසාර සහ අවිධිමත්වූ පදනමක් සඳහා විෂයවූ ලෝකයෙහි සමස්ත සංස්කාරක වස්තූන් සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන්ට කාම තෘෂ්ණාව පැවැත්වීමට හේතුව වී ඇතිබව අධ්‍යාත්මික විශ්ලේෂණ ක්‍රියාවලිය තුලින් එනම් විදර්ශනා භාවනාමය අවබෝධය ප්‍රගුණ කරගත් ප්‍රඥාවන්තයෙකු එම අවිධිමත්වූ අසාරවූ මනුෂ්‍යය හා තිරිසන් ගත සංස්කාරක වස්තූන්හි නිර්මාණාත්මක ක්‍රමවේදය ගැන කලකිරී එම සමස්ත ලෝකගත වස්තූන්ගේ කායික හා මානසික බන්ධනයන්ගෙන් වහ වහා ඉවත් වීමට තීරණය කරනු ඇත. මක්නිසාදයත් සමස්ත ලෝකගත මනුෂ්‍යය තිරිසන් සත්ත්ව සංස්කාර වස්තූන්ගේ පදනම පිලිකුලටත් අප්‍රසාදයටත් කලකිරීමටත් විෂය වී ඇති බැවිනි. මානසික සංස්කරණය ලෙසින් පිළියෙල කරගත් සංස්කාරක වස්තූන්ගෙන් අවිද්‍යාව මගින් ග්‍රහණය කරගත් ස්ථිතික විද්‍යුත් සංඥාවන් ලෝකයෙහි සන්තතික ධර්මතාවය අප්‍රසන්න සහ පිලිකුල් සහගත ධර්මතාවයක පැවැත්මක් සඳහා පමනක් වන බවත් එම පැවැත්ම සත්ත්වයින්ගේ ත්‍රිවිධ ක්ලේෂ ධර්ම මත පවතින බවත් එනිසාම එම සමස්ත සංස්කාරක වස්තූන්ගෙන් ඉවත් වීමට දක්වන බලවත් කැමැත්ත තමා සතු මානසික සුවය සහ සැනසීමට හේතුව වීමෙන් අවිද්‍යා සහ තෘෂ්ණා පාදක කර්ම සන්තතියෙන් පලායාමට ගන්නා උත්සාහය සියළුම සංස්කාරක වස්තූන්ගෙන් ඉවත් වීමට ගන්නා අවශ්‍ය දැඩි පියවර වනු ඇත.

## 5. සන්තතික කර්ම ක්‍රියාවලියට තව දුරටත් යොමු නොවීමට පියවර ගැනීමේ ඥාණය.(නිබ්බිදානු පස්සනා ඥාණය)

සාමාන්‍ය පෘතග්ජන මනුෂ්‍යයන් පිළිගන්නා සහ අනුගමනය කරන්නා වූ කාම තෘෂ්ණාව මත ප්‍රභල ලෙස ක්‍රියාකාරී වෙමින් භව ක්‍රියාවලියට යොමුව පවතින සමස්ත සංස්කාරක වස්තූන්ගේ සන්තතික භව චක්‍රය එම සන්තතික ධර්ම මඟින් නිර්මාණය කරන මූල ධර්මයේ ත්‍රිවිධ ලාක්ෂණික ස්වභාවයන් ඒවායේ ඇති ලෙසින් ඇති සැටියට නොදැනීම හා නොපිළි ගැනිම තිරිසන් සත්ත්වයන්ට හා සමානව අවිද්‍යාවෙනුත් අනවබෝධයෙනුත් ක්‍රියාත්මක කිරීම තුල සමාන ලෙසින් මනුෂ්‍යයින්ටත් තිරිසනුන්ටත් දුක කේන්ද්‍ර කරගත් ධර්මයක සන්තතික පැවැත්මක් වනු ඇත. යථාර්තය පිළිබඳ ඇති සැටිය ඇති ලෙසින් දැකීමේ සිහියට පත් ප්‍රඥාවන්ත සත්පුරුෂයෙකු සිය පිරිසිදු දැක්මට අදාලව කිසි ලෙසකින්වත් ප්‍රාර්ථනා කිරීමෙන් හෝ අගය කිරීමෙන් හෝ මැනවයි පිලිගැනිමෙන් හෝ මුලුමණින්ම අසාර හා අසුභ වූ සමස්ත සංස්කාරයන්ට නොරැවටෙන අතර ඒවා කාම තෘප්තිය සඳහා අගය කිරීමට නුසුදුසු බවත් ක්ෂණයකදී විනාශයට පත් වීමෙන් පිළිකුලට සහ අප්‍රසන්න භාවයටත් යොමුව ඇති බව තහවුරු කරගනු ඇත. එම නිසා එම පිරිසිදු දැක්මට අදාලව සත්ත්ව පුද්ගල ආත්ම මානසික පැවත්මෙන් තොරව සිය යථාභූත ඥාණ දර්ශනයෙහි ප්‍රඥාබෝධයට අදාලව තමන් කෙරෙහිද සමස්ත අන්‍ය සත්ත්ව හා ශාක සංස්කාරක වස්තූන් කෙරෙහිද එක ලෙසින් පවත්නා ඒවා කෙරෙන් ඉවත් වීමත් අතහැරීමත් නොඇලී සිටීමත් සඳහා යොමුවනු ඇත.මෙම යථාභූත දැක්මට විෂය වන මානසික සහ කායික කර්ම ක්‍රියාවලියෙන් ඉවත් වීමට ගන්නා උත්සාහය කලකිරීම වශයෙන් ක්‍රියාත්මක කර්ම ධර්මයෙන් ඉවත්වීමට ගන්නා මානසික වෑයම වනු ඇත.

**6. සංඛාරුපේක්ෂා ඥාණය (සියළු සංස්කාරක වස්තූන් කෙරෙහි ලෝභය හා ද්වේෂයෙන් තොරව දැකීම)**

ලොවෙහි ක්‍රියාකාරී විද්‍යාත්මක ධර්මයන්හි ඇතිසැටිය ඇති ලෙසින් වන කර්ම ධර්මයන්හි අවබෝධය සහිතව නැවත උපත සඳහා හේතුවවන සංස්කාරක වස්තූන් කෙරෙහි ඇලීමටත් ගැටීමටත් තවදුරටත් යොමු නොවන අතර ඒවා මගින් පිළියෙල වන සංසාර කර්ම ක්‍රියාවලියට යොමු නොවීමෙන් දැඩි ලෙසින් සිය ඥාණ දර්ශනයෙහි අවධානයට සමස්ත සංස්කාරක වස්තූන්ගේ පැවැත්මට පදනම ලෝභය හා ද්වේශය වන බව දකිමින් ඉන් ලබන ඵලය කායික හා මානසික දුක් වේදනාවන් බව පසක් කරගනු ඇත.

මෙම ඥාණ දර්ශණ අවබෝධයට අනුව සියළුම සංස්කාරක වස්තූන්ගේ ත්‍රිවිධ ලාක්ෂණික ස්වභාවයෙහි සාපේක්ෂ දැක්මට අනුව එම සියළුම වස්තූන් බියට සහ නොසතුටට යන කාරණා දෙකටම පදනම වන බව දකිමින් එම වස්තූන්ගෙන් ඉවත් වීමටත් අතහැරීමටත් යොමු වීමෙන් සමස්ත රූපගත වස්තූන් ඉදිරියේ මධ්‍යස්ථ වීමටත් එලෙසම උපේක්ෂා වීමටත් යොමු වීමෙන් ඒවා සඳහා තමාගේ නියෝජනය මම වශයෙන්වත් මගේ වශයෙන්වත් මට වශයෙන්වත් හිමිකමකට යොමු නොවීම තහවුරු වීම.

**7. සමස්ත සංස්කාරක වස්තූන්හි අන්තර්ගතයෙහි සත්‍යය නිත්‍ය වූ දුක බව මෙනෙහි කිරීමේ ඥාණය. (ආදීනවානු පස්සනා ඤාණය)**

සමස්ත ක්‍රියාකාරී සන්තතික ධර්මයන්හි ක්‍රියාකාරී විද්‍යා අවබෝධය අත්පත් කර ගත්තා වූ ප්‍රඥාවන්තයෙකු විසින් එසේ නොවන මනුෂ්‍යයන්ගේ පෘතග්ජන මානසික දැක්ම අභිබවා ක්‍රියාත්මකවන්නා වූ අධි ප්‍රඥා අතීන්ද්‍රිය ප්‍රබල විද්‍යා අවබෝධය වන අතර එමගින් විශ්ව හා ලෝක සන්තතික ස්ථිතික විද්‍යුත් ප්‍රබව ගත විද්‍යා ක්‍රියාවලිය පිළිබඳ

විද්‍යාත්මකවූද පර්යේෂණාත්මක වූද විශ්ලේෂනාත්මක වූද අධ්‍යාත්මික අවබෝධය ලබනු ඇත. ඒ අනුව සංස්කාරක වස්තූන්ගේ පදනම් ධර්මයේ අවසාන ඵලය අඛණ්ඩ භව චක්‍රයකට යොමුව ඇති එමෙන්ම මානසික හා කායික දුක සංවේදී වීමේ පදනමට පමණක් යොමුව ඇති බව දැකීමෙන් තමන් ඇතුලු සමස්ත සංස්කාරක වස්තූන්ට නොඇලී සිටීමට අධිෂ්ඨාන කරනුයේ එනම් හැම කායික හා මානසික ධර්මයක්ම දුක් ධර්මයක පදනම මත පිහිටා සන්තතිය වීම සිදුවන බැවිනි. සන්තතික ධර්මයන් පිළිබඳ පදනම් මූලධර්මය දුක බව නොදැනීමෙන් අවිද්‍යාවට පත් අඥාන පෘතග්ජනයින් විසින් එදිනෙදා දෛනික කායික, මානසික, වාචසිකව ත්‍රිවිධ ලෙසින් රැස්කරගත් සහ අන්තර්ගත කරගත් මානසික කර්ම ධර්මය මුලුමනින්ම සතුටට පත්විය නොහැකි එමෙන්ම ප්‍රඥාවෙන් සුභ හෝ සුඛ යැයි පිළිගැනීමට නොහැකි වූද එනිසාම ත්‍රිවිධ ක්ලේෂයන්ගෙන් පිළියෙල කරගත්තාවූ අප්‍රසන්න හා පිලිකුල් සහගත සංස්කාරයන් වන අතර සන්තතියට පමණක් කර්ම වශයෙන් සුදුසුකම් හිමිව ඇති නමුත් දුක්ඛ ධර්මයක් සඳහා පමනක් වන බව මෙම යථාභූත දැක්මට අදාලව එම සමස්ත සංස්කාර ධර්මයන්ගේ අන්තර්ගතය මුළුමනින්ම දෝෂ සහිත බවත් එම කර්ම නිර්මාණය වීමේ අවිද්‍යා ක්‍රියාවලිය තමා කෙරෙන් බිඳලීමෙන් සහ ඉන් පලායාමට උත්සාහ කිරීමට දක්වන බලවත් කැමැත්ත එනම් සංසාරගත කර්මයන්ගෙන් ඉවත් වීමට දක්වන කැමැත්ත බව අවබෝධවීම.

**8. සංස්කාරයන්හි ඇති සැටිය නැවත නැවත මෙනෙහිකිරීමට උපාය ලෙසින් ගන්නා උත්සාහය සියළු සංස්කාරයන් කෙරෙහි කැඩෙන, බිඳෙන, මැරෙණ, දිරන, පීඩාකාරී වන අසාර විපරිනාම විභව ඉපදීම මැරීම ආදී ලෙසින් මෙනෙහි කිරීමේ ඥාණය (පටිසංඛානුපස්සනා ඥාණය)**

නිර්වාණ මාර්ගයෙහි ප්‍රථම පියවරට පත් සෝවාන් ඥාණ දර්ශණයට පැමිණි සෝතාපන්න ආර්යයන් වහන්සේ දැඩි අධිෂ්ඨානයෙන් යුතුව මින් ඉදිරි නිර්වාණ පියවර සඳහා

ආර්ය අෂ්ඨාංගගත ආර්ය ශීල ප්‍රතිපදාවන්ගේ අවබෝධය තවදුරටත් ප්‍රගුණ කරන අතර ඒ සඳහා අධිශීල පාදක තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ප්‍රතිපදා රක්ෂා කරනු ඇත. මේ වනවිට එම ආර්යයන් වහන්සේ මනුෂ්‍යය තිරිසන් සත්ත්වයන් කෙරෙහි පවත්නාවූද සන්තතික වන්නාවූද අනාර්ය කර්ම ධර්මයන්හි ඇති සැටිය ඇති ලෙස පිළියෙලවී ඇති ආකාරය මුළුමනින්ම අනිත්‍ය අසාර දුක් සහිත ජීවිත ප්‍රවෘත්තියකට යොමුව ඇති බවට පූර්ණ සිහියට පත්වනු ඇත. මෙවිට එම ආර්යයන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයන් යොමුව ඇති ඔවුන්ගේ සන්තතික චිත්ත ධර්ම ක්‍රියාවලියෙහි කායික මානසික තෘප්තියට පත්වීම අරමුණු කර ගැනීමට හේතුව එනම් චතුරාර්ය සත්‍යය ඇති ලෙසින් අවබෝධය නොවීම බව ආර්යයන් වහන්සේගේ තමන් සතු සෝවාන් ඥාණ දර්ශණයට ඉතා පැහැදිලි ලෙස සංවේදී වනු ඇත.

සමස්ත ලෝකගත සංස්කාරක වස්තූන්ගේ ඉහත සඳහන් කල ත්‍රිවිධ අසාරභාවය ඉතා පිරිසිදු හා නිවැරදි ලෙසින් ආර්යයන් වහන්සේගේ ආර්ය ඤාණ දර්ශණයට සංවේදී වනු ඇත. තමන් වහන්සේ ලද ආර්ය භාවයට හේතුව වූ ප්‍රගුණ කරනලද ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු කායික හා මානසික ඉන්ද්‍රිය පිනවීමේ සංසාරගත දුක්ඛ කර්ම මාර්ගයක් නොවන බවත් තමාලද මාර්ග ඵල අවබෝධය එම ආර්ය මාර්ගයෙන් තමන් ලද ආර්ය ඵලය වන බවත් එසේ නොවන්නාවූ ආර්ය මාර්ගය වන ලෞකික පෘතග්ජන කර්ම මාර්ගය ලෝභ ද්වේෂ මෝහ වන බවත් විදර්ශනා භාවනාමය ප්‍රඥාවලෝකනය තුලින් උන්වහන්සේට ඉතා පැහැදිලිව දර්ශණය වනු ඇත.

**9. ලොවෙහි ක්‍රියාකාරී විද්‍යාත්මක සන්තතික සත්‍යය ධර්මතාවය කෙරෙහි පවත්නා සම්මාස්සම ඤාණය (සච්චානුලෝමික ඤාණ)**

සියළු සංස්කාර ධර්මයන් කෙරෙහි පවත්නා ඉහත

සඳහන් කල ත්‍රිවිධ ලාක්ෂණික ගුණ ගැන සැලකිල්ලට ගැනීම තුලින් ඒවා දුක සඳහා පමණක්ම විෂය වන බව දැකීම ආර්යයන් වහන්සේ ලබාගත් සිය නිර්වාණ අධිගමය නිර්වාණ මාර්ගයට ප්‍රවේශවීමෙන් ප්‍රථම නිර්වාණ පියවරට යොමුවන අතර ලොවෙහි කිසිදු සංස්කාරක වස්තුවක් ස්ථිර සාරවත් හා ප්‍රිය ජනක නොවන ලෙස දකින අතර තමා කෙරෙහිද එසේ වන බව අවබෝධ කරගනු ඇත.

ලෝකෝත්තර අධිගම ඵලය සඳහා පදනම් මුලධර්මය වන ප්‍රඥාවබෝධය සඳහා තමා හා අන්‍ය සංස්කරණයන් කෙරෙහි ඇති සැටියෙහි යථාර්ථය එලෙසින්ම දැකීමත් ඒ පිලිගැනීමත් මත ගොඩනැගෙන අතර ඒ ආර්ය මාර්ගයෙහි නිවැරදි දිශාව වනු ඇත.

ලබාගත් සෝවාන් ඥාණ දර්ශණයට විෂය වන නිර්වාණ විෂය පථයෙහි ඉදිරි පියවර සඳහා තමන් වහන්සේ ගතයුතු මතු පියවර සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ඇති අතර තමා ලද ආර්ය ඵලයට සරිලන මධ්‍යස්ථවූ උපේක්ෂා පාදක ආර්ය භාවයට පත්වී ඇත. සාමාන්‍ය පෘතග්ජනයෙකුගේ ජීවී කායික මානසික ස්වභාවයට මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ කායික හා මානසික පැවැත්මක් අත්පත් වී ඇති සෝවාන් ඵල ලාභී ආර්යයන් වහන්සේ තමන් වහන්සේ සිය අධිගමයට පත් වීමට පෙර ගිහි ජීවිතයේදී කරන ලද කිසිදු ලෝභ ද්වේෂ මෝහ පාදක කායික හා මානසික ක්‍රියාවන්ට කිසිලෙසකින්වත් අත් වැරදීමකින්වත් හෝ අමතකවීමකින්වත් හෝ නැවත යොමු නොවන අතර නිර්වාණය සඳහා අවශ්‍යවන සෝවාන් ඥාණ දර්ශණය ලෝකෝත්තර ආර්ය ඥාණය ලෙසින් ත්‍රිවිධ දෘෂ්ඨීන්ගෙන් දුරුවීම තුලින් අත්පත් කරගෙන ඇත.

## ප්‍රඥාව කඩුව වන අතර අවිද්‍යාව සතුරෙකු වනු ඇත

*මිත්‍යා දෘෂ්ඨික සාහසික මනුෂ්‍යයන්ගේ ආගමික ගැටුම්*
*වලින් රක්ත වර්ණ වූ අඳුරු දුමෙන් ගැවසීගත් නගරමෙන්*
*ද තැතිගත් මනුෂ්‍යයන්ගේ දැඩි අවධානයට*
*යොමුවුනු ආගමික වෛරී ගැටුම්වලින් ගලා ගිය*
*රක්ත වර්ණ රුධිරයෙන් තෙත්වූ නගරමෙන් ද*
*බුදුදහමෙහි ඉතිහාසයේ කිසිඳු*
*පරිච්ජේදයක මෙවැනි සිදුවීම් කිසිවක් හමු නොවේ.*
*බුදුදහම කඩුවක් පමණක් දරා සිටී. එය ප්‍රඥාව*
*වන අතර හඳුනාගත් එක් සතුරෙකු ඇත.*
*එය අවිද්‍යාවයි. මෙය බුදුදහමේ සත්‍යතාවය ලෙස*
*තහවුරු වී ඇත.*

මහාචාර්ය බැෆට්
("2500 Years of Buddhism" නැමති ග්‍රන්ථයෙනි)

### 3.4. කර්මජ සිතින් නිදහස්වීමේ නිර්වාණ පියවර
#### 1. සෝතාපන්න- (සෝවාන් ආර්යභාවය)

සුගති කාම ලෝකයට හත්වරක් පැමිණීමේ අවස්ථාව නිර්වාණ මාර්ගයෙහි ප්‍රථම ලෝකෝත්තර තත්ත්වය වන ආර්ය මාර්ගයෙහි ප්‍රථම ලාභය අත්පත් වීම යනු සෝතාපන්න ස්වභාවයට පත්වීම බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ අංගයෙහි ප්‍රබල ශ්‍රද්ධාව මත ප්‍රධාන ක්ලේෂ මුල අතහැරීම තුලින් අත්පත් වන ලොවෙහි ඇති උතුම්ම ලාභයයි. සෝතාපන්න ආර්ය ශ්‍රාවකයන් වහන්සේ තථාගතයන් වහන්සේ විසින් පැහැදිලි කර ඇති ආර්ය අෂ්ඨාංග මාර්ග ගත කිසිම ශික්ෂා පදයක් කිසිම ලෙසකින්වත් උල්ලංඝනය කරන්නේ නැත. එමෙන්ම එම

ශික්ෂාපද රැකීම පැහැර හරින්නේද නැත. නිර්වාණ මාර්ගය තුලට යෑම පිණිස රැකිය යුතු වන සම්පූර්ණ විනය ශික්ෂාවන් ආරක්ෂා කිරීමට උන්වහන්සේ බැඳී සිටී. එසේම නිර්වාණය කෙළවර කර ඇත්තා වූ සන්තතික චිත්ත කර්ම ධර්ම ක්‍රියාවලියෙන් නිදහස්වීම සඳහා උන්වහන්සේ ආර්ය අෂ්ඨාංගගත උපසම්පදා ශීලයද තෙලෙස් වැදෑරුම් ධූතාංග ප්‍රතිපත්තීන්ද නොබිඳී නොකැඩී අනුගමනය කරණු ඇත. එම සෝතාපන්න ආර්යයන් වහන්සේ ඉදිරියට ඇති නිර්වාණ පියවර තුලින් අරහත්භාවය ලැබෙනතෙක් තවදුරටත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩි යුතුව ඇත.

## 2. සකෘදාගාමී - ආර්ය ස්වභාවය (සුගති කාම ලෝකයට එක් වරක් පැමිණිය හැකි ස්වභාවය)

මෙහිදී ආර්ය මාර්ග ප්‍රතිපත්තීන් ඉතා වේගවත් ලෙසින් ප්‍රගුණ කිරීම හේතුව වීමෙන් සෝවාන් මාර්ගලාභීන් තවදුරටත් දුරුකල යුතු ත්‍රිවිධ දෘෂ්ඨීන්ගෙන් ඉවත්වන අතර ඒ සඳහා මානසික කායික කාම තෘෂ්ණාවන්ගේ අක්‍රිය කිරීමකටත්, සංස්කාර වස්තූන්ට එදිරිවීම හා දෝෂ දැකීමෙන් ඉවත්වීමත් කළ යුතුය. මෙහි ඵලයක් වශයෙන් ලැබෙන නිර්වාණ මාර්ගයේ දෙවන පියවර සකෘදාගාමී මාර්ය වනු ඇත. සියළුම ආර්යයන් වහන්සේලා ප්‍රථම ආර්ය භාවයේ සිට තාපස ශ්‍රමණ යෝගාවචර ධූතාංග ශීලයන්හි අප්‍රමාදීව යෙදෙන අතර ඒ සඳහා තම තමන් වහන්සේලාගේ උපරිම වීර්යය ජීවිත කාලය අවසාන වනතෙක් අඛණ්ඩව ප්‍රගුණ කරනු ඇත. මේ තුලින් ශේෂව පවතින ප්‍රබල සන්තතික කර්ම ක්ලේෂයන් වන කාම තෘෂ්ණාවත් ද්වේශයත් බල රහිත තත්ත්වයට අක්‍රියකර ගැනීම සිදු කරනු ඇත. සකෘදාගාමී ආර්යයන් වහන්සේට සිය මෙම භව ජීවිත කාලය තුලදී අවසාන නිර්වාණභාවය අත්පත් කරගැනීමට නොහැකි වන්නේ නම් ඒ සඳහා එක්වරක් පමණක් මනුෂ්‍යය කාම ලෝකයේ

ප්‍රතිසන්ධි ගතවිය යුතුව ඇත. එසේ නමුත් නියත ලෙසින්ම ඉතා කෙටි කාලයක දී ඉදිරියට තවදුරටත් ආර්ය අෂ්ඨාංගික මාර්ග ගත ශීල හා ධූතාංග ප්‍රතිපත්තීන් නොකඩවා පූර්ණය කිරීමෙන් අරහත්වය සඳහා නිර්වාණ පියවර දෙකක් සම්පූර්ණ කල යුතුව ඇත.

### 3. අනාගාමී - (කාම භවයන්ට නොපැමිණෙන ස්වභාවය)

නිර්වාණ මාර්ගයෙහි තුන්වන පියවර වන මෙම ආර්යභාවය සම්පූර්ණ ත්‍රිවිධ ක්ලේෂයන් සිය උපරිම වීර්යය තුලින් ආර්ය මාර්ග ගත ධූතාංග ආදී ශ්‍රමණ ශික්ෂණයන්හි පසුබට නොවී ප්‍රගුණ කිරීමෙන් අත්පත් වන ආර්යභාවයයි.

මෙම ආර්යයන් වහන්සේ මෙම මනුෂ්‍යය කාම ලෝකයේ හෝ අන්‍ය කාම ලෝකයන්හි කිසිවිටක ප්‍රතිසන්ධි නොවනු ඇත. එනම් ප්‍රහාණය කළ යුතු වන සමස්ත ලෝභ, ද්වේශ, මෝහ වන කාම ලෝකයන්හි ප්‍රතිසන්ධි වීමට නියමිත කාම ප්‍රතිසන්ධි කර්ම බීජයන් සියල්ල විනාශ කිරීම ප්‍රථම හා දෙවන ආර්ය මාර්ගයෙහි මාර්ග හා ඵල අවබෝධය මත සිදු කර ඇත. උන්වහන්සේ තවදුරටත් කිසිදු කාම ලෝකයක උපතට නොපැමිනෙනු ඇත. මෙම මනුෂ්‍යය භවයේදීම උන්වහන්සේට අරහත්භාවය අත්පත් කර ගැනීමට නොහැකි වන්නේ නම් කළුරිය කිරීමෙන් පසු ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකගත විය යුතුව ඇත. එහිදී බ්‍රහ්මචාරී අධ්‍යාත්මික ජීවිතයෙහි අවසානය සිදුවනතෙක් එම බ්‍රහ්ම ලෝකයන්හි පැවතිය යුතු වනු ඇත.

අනාගාමී ආර්යයන් වහන්සේ ගත කරනු ලබන ආර්ය බ්‍රහ්මචාරී ජීවිතය සඳහා පදනම තෙලෙස් වැදෑරුම් ධූතාංග ශික්ෂා පදයන්හි මාර්ග හා ඵල අවබෝධය වන අතර ඒ තුලින්

උන්වහන්සේ පහත සඳහන් පංචවිධ කාමලෝකගත ක්ලේෂ ධර්මයන් ප්‍රහාණය කිරීමෙන් අරහත්භාවය ලැබීමට නියමිතව ඇත.

1. රූප බ්‍රහ්ම ලෝක පිළිබඳ භව තෘෂ්ණාව
2. අරූප බ්‍රහ්ම ලෝක පිළිබඳ භව තෘෂ්ණාව
3. තමා කෙරෙහි ඇති මානය
4. මානසික ඒකාග්‍රබව නොමැතිකම (උද්දච්ච)
5. අවිද්‍යාව (ලෝක ධර්මතාවයන්ගේ ක්‍රියාකාරී සන්තතික විද්‍යා ධර්ම පිළිබඳ නොදැනීම. එම දැනීමෙන් තොරව කටයුතු කිරීම. එනම් අඥාන, මෝඩ, ලෞකික, පෘතග්ජන, ගිහි, සාමාන්‍ය මනුෂ්‍ය ආදී ස්වභාවයන්)

## 4. අර්හත්භාවය

ඉහත සඳහන් ලෙසින් ඇති පංචවිධ ක්ලේෂ ධර්ම (5) සහ මුලින් සිඳ බිඳ දැමීමෙන් සියළුම භවගත ක්ලේෂ ධර්මයන්ගෙන් නිදහස් වීමෙන් අත්පත් වන භව නිරෝධනයේ ඵලය අරහත්භාවය වනු ඇත.

අනාගාමී ආර්යයන් වහන්සේ විසින් අවසාන වශයෙන් අත්පත් කරගන්නා අරහත්භාවය තමන්වහන්සේගේ සන්තතික භව චක්‍රයෙන් ඉවත්වීම පිණිස යොමුව පවතී. නැවත ඉපදීම සඳහා හේතුව වන කිසිදු කර්ම බීජයක් උන්වහන්සේ ට මානසිකව හා කායිකව ශේෂව නොපවතී. අත්පත්වන අරහත්භාවය යනු සුගති දුගති කාම ලෝකයන්හි සැරිසැරීමේ දී දරන්නට වූ දැඩි කායික මානසික පීඩාවන්ගෙන් නිදහස් වීමෙන් ලැබෙන ශ්‍රේෂ්ඨ වූ අධ්‍යාත්මික මානසික තත්ත්වයකි. සන්තතික කාම කර්මයන්ට සත්ත්ව පුද්ගල ආත්ම ලෙසින් රැවටීමේ අවිද්‍යාවත් කාමයන්හි පුන පුනා ඇලීමේ තෘෂ්ණාවත් එනම් එයින් තෘප්තිමත් නොවීමත් නිසා සිදුවන භව චක්‍ර

ක්‍රියාවලිය අවසන් කිරීම යනු සන්තතික භව කර්ම පාදක දුක් රැසෙහි නිරෝධනයයි. උන්වහන්සේ ලද ප්‍රඥා ශක්තිය රහත්භාවය සඳහා හේතුව වන්නේ යම්සේද අනිත්‍ය ස්වභාවයත් අසාර ස්වභාවයත් අසුභ ස්වභාවයත් පදනම් වීමෙන් මානසිකව පිලියෙල වන සම්ප්‍රයුක්ත දුක්ඛ ධර්මයක හේතුඵල පැවැත්ම තුලින් ඉවත්වීම වනු ඇත.

අරහත් භාවයට පත්වූ රහතන් වහන්සේ පහත සඳහන් මානසික කායික ස්ථාවරයට පත්වනු ඇත.

01. මානසික හා කායික ක්‍රියාවන් විදර්ශනාමය මෙනෙහි කිරීම මත සිදුවෙමින් කායිකව හා මානසිකව හා වාචසිකව ශූන්‍යත්වය තහවුරු කරගැනීම සිදුවේ.

02. පරිහරණය කිරීමට හා ස්පර්ශ වීමට විෂය වන සියළුම සංස්කාරක වස්තූන් කෙරෙහි ඇලීම හා ගැටීමෙන් ඉවත්ව මධ්‍යස්ථව එනම් උපේක්ෂාවෙන් මුහුණ දීම සිදුකරනු ඇත.

03. කායික ස්පර්ශ ක්‍රියාවට ලක්වන සියළුම ස්පර්ශග්‍රාහී තොරතුරු විමර්ශණ හා විදර්ශනා මානසික ක්‍රියාවලිය හරහා සියල්ලෙහිම යථාර්තය ශක්ති හා පදාර්ථ වශයෙන් පමනක් ඇති බව දැකීමෙන් සංඥා නිරෝධනය මගින් චිත්ත ඒකාග්‍රතාවය එනම් ශූන්‍යතාවය තහවුරු කරගැනීම (අතීත වර්තමාන අනාගත ලෙසින් වන අවිද්‍යාවෙන් පිළියෙල කරගන්නා ලද මානසික තොරතුරු වලින් ඉවත්වීම)

04. කායික හා මානසික ක්‍රියාකාරීත්වය නිරතුරුව සන්තතික වස්තූන්ගේ මූලධර්මය වන ත්‍රිලක්ෂණ ධර්මයන් දැකීම මත ස්මර්ණය කිරීමෙන් හා මෙනෙහි කිරීමෙන් සිදුවන ක්‍රියා ගැන එළඹසිටි සිහියට පැමිණීම.

05. මානසික හා කායික පැවැත්ම නිරන්තරුරුවම සිහිනුවණ මත ක්‍රියාත්මක වීම. එනම් සිහිය මත පිහිටීමෙන් සංස්කාරක ද්‍රව්‍යයන්ගේ ඇති සැටිය ඇති ලෙසින් එනම් අනිත්‍ය, දුක්ඛ අනාත්ම ලෙසින් ස්මරණය කිරීමට යොමුවීම.

ඉහත ලෙසින් මානසික හා කායික සංහිඳියාවට පත් රහතන් වහන්සේ යනු තමාට අත්පත් කරගත යුතුව තිබූ අවසාන අරමුණට පැමිණීමෙන් තමන් වහන්සේගේ සසරෙහි සන්තතික දුක්ඛ කර්ම පාදකවූ චිත්ත සන්තතිය නවතා ඇති අතර ඒතාක් කල් පැවැති තමන්ගේ මානසික හා කායික දුක්ඛ දෝමනස්සගත පීඩාවන්ගේ හා සියළු වේදනාවන්ගේ මතු පැවැත්ම අවසන් කර ඇත.

යමෙකු යම් ආගමක් පිළිගැනීමට යොමු වන්නේ නම් ඒ සඳහා අවබෝධයට සුදුසු වන ස්වභාවයෙහි ක්‍රියාකාරිත්වයට අනුගත වූ විද්‍යාත්මක අවබෝධයට ගැලපෙන ලොවෙහි ඇති එකම ආගම වන බුදුදහම හැදෑරිය යුතුව ඇත. කිසිදු ආගමක් නිර්මාණය කරගත් විශ්වාසයන් මත හෝ මිත්‍යා දැකීම් මත හෝ සන්තතික විද්‍යා මූලධර්මයෙන් බැහැරව හෝ ක්‍රියාත්මක නොකළ යුතුව ඇත. ලොවෙහි ඇති සියළුම ආගම් ලොවෙහි ක්‍රියාකාරී සත්‍යය විද්‍යා ධර්මතාවයන් මත පමනක් ක්‍රියාත්මක කරවිය යුතු අතර මිත්‍යා දෘෂ්ඨීන් හා මිත්‍යා ප්‍රබන්ධ පදනම් නොකර ගත යුතුය.

නමුත් පිළිගත යුතුව ඇති විශ්ව හා ලෝක ස්වභාවයේ සත්‍යය ක්‍රියාකාරී විද්‍යා ධර්මතාවයන් ඇති ලෙසින් අවබෝධ කරගැනීම දුර්වල අඥාන පෘතග්ජන මනුෂ්‍යයින්ට ඉතා අපහසු වනු ඇත. එනිසා ප්‍රඥාව වශයෙන් පැහැදිලි කර ඇති සන්තතික විද්‍යා කර්ම ධර්මය හා ඉන් මිදීමේ මාර්ග ධර්මය තථාගතයන් වහන්සේ විසින් ලොවෙහි ප්‍රඥාවන්තයින් සඳහාම දේශනාකර ඇති අධ්‍යාත්මික විද්‍යා විෂය වන අතර

එම ශූක්ෂ්ම වූ අති සියුම් වූ අධ්‍යාත්මික වූ ස්ථිතික විද්‍යුත්මය වූ හා විද්‍යාත්මක වූ ප්‍රඥා විෂය යනු සාමාන්‍ය අඥාන පෘතග්ජනයින්ට පහසුවෙන් අවබෝධකර ගැනීමට සුදුසු විෂයක් නොවනු ඇත.

ඕනෑම ආගමක් සත්‍යය විද්‍යාත්මක පදනමක පිහිටි ක්‍රියාකාරී සත්‍ය ධර්මතාවයන් මත පදනම් විය යුතුව ඇත. බහුතරයක් වන ලොවෙහි ක්‍රියාකාරී ප්‍රබල ආගම් ගොඩනැගී ඇත්තේ අදෘශ්‍ය විශ්වාස, මිත්‍යා විශ්වාස, අවිද්‍යා සංකල්ප හා දේව විශ්වාස ආදී ලෙසින් වන මානසික ප්‍රෝඩාවන් මගින් නිර්මාණය කරන ලද ඇදහීම් මත වන අතර එම ආගම් කිසිවක් විද්‍යාත්මකව ඔප්පු කිරීමකින් සත්‍යය ආගම් ලෙස පිළිගත නොහැකිය. බුදුදහම යනු ලොවෙහි සියළුම ආගම්වලට යටත් නොවන එමෙන්ම කිසිදු මිත්‍යා දැකීම් හා මිත්‍යා විශ්වාසයන්ගෙන් තොරවූ විද්‍යාත්මකවූ සන්තතික ධර්මතාවයෙහි ක්‍රියාකාරී වන විද්‍යාත්මක නීතින්ට අදාල වූද විශ්ව ලෝකගත සියල්ලන්ටම පොදු වූද සමස්ත ලෝකගත මනුෂ්‍ය තිරිසන් හා අනෙක් සියළුම සත්ත්වයින්ගේ ක්‍රියාකාරී පොදු ව්‍යුහයකට අදාලව විශ්වලෝක ගත සන්තතික විද්‍යා ධර්මය පැහැදිලි කර ඇති ලොවෙහි ඇති එකම ආගම වනු ඇත.

**''අදෘශ්‍යමාන විශ්වාස සහිත ආගම් අනුගමනය නොකළ යුතු අතර විද්‍යාත්මක සත්‍යයන්හි ප්‍රඥා ධර්මය අනුගමනය කළ යුතුය.''**

**''විමුක්තිය තුලින් සියළුදෙනා සතුටට පත්වේවා''**

## සමාප්තයි

# ලොවෙහි ක්‍රියාකාරී එකම ආගම බුදු දහමයි

වර්ෂ 2050 වන විට ලොවෙහි ප්‍රධාන ලෙස පිලිගත් හා අඛණ්ඩව ක්‍රියාත්මක වන එකම දහම වන බුදු දහම කිසිදු විද්‍යාඥයෙකුට විනාශ කිරීමට හෝ මැඩලීමට නොහැකි වනු ඇත.

එය වඩාත්ම පැහැදිලිව පෙනෙනුයේ වර්තමානයේදී සිදුවෙමින් පවතින වාතාවරණය වන බුදුදහමට හා සංඝරත්නයට විරුද්ධව සිදුවෙමින් පවතින විවිධ බලපෑම් තිබෙන අතර එය සනාථ වන කියමනකින්ද තහවුරු වේ. එල ඇති රුකට පමණක් ගල් මුල් වදින අතර එල රහිත රුකට ගල් මුල් එල්ල නොවන්නාක් මෙනි. කිසිදු තර්ජන ගර්ජන හා විරුද්ධ ක්‍රියාකාරකමක් මගින් මෙම බුදු දහමෙහි ඉදිරි ගමනෙහි ප්‍රාතිහාර්ය බලය මැඩලිය නොහැක. ලෝක ධර්මනීතියට අනුව වැරදි කරන සියල්ලන්ටම මෙලොවත් පරලොවත් යන දෙතැන්හිදීම පසුතැවීමටත් වැලපීමටත් අනිවාර්යයෙන්ම මුහුණදීමට සිදුවනු ඇත.

අප ජීවත්ව සිටින ලෝකයෙහි දැකිය නොහැකි යම් විද්‍යාත්මක සිද්ධීන් බුදුදහමෙහි පැහැදිලි කරනු ලබන අධ්‍යාත්මිකවූද ලෝකෝත්තර අධිප්‍රඥාවන්ට සංවේදී වන්නේ අධ්‍යාත්මිකව ප්‍රබල දියුණුවකට පත්වීමෙනි. වත්මන් විද්‍යා දියුණුව සමග ඕනෑම පෘතග්ජන මනුෂ්‍යයෙකුට භෞතික ලෝකයෙහි ක්‍රියාකාරීත්වයෙහි යම් පමණක සීමාවක් රූපවාහිනී හා කැමරා තිරය තුලින් දැකිය හැක.

මෙලෙස දැකිය හැකි භෞතික තොරතුරුවලට පරිභාහිරව බුදුදහම මගින් පැහැදිලි කරනු ලබන විවිධාකාර සිදුවීම් අධ්‍යාත්මික දියුණු උසස් මානසික ශක්තීන් මගින් දැකිය හැකිබව පැවසෙන අතර එම දැකීම් පෘතග්ජන මනුෂ්‍ය ඇසට හා කනට සංවේදී නොවන අතර වර්තමානයේ දියුණුව පවතින කැමරා හා රූපවාහිනී ආදී උපක්‍රමවලටද සංවේදී නොවනු ඇත. වර්තමානයෙහි සීඝ්‍රව සිදුවන විද්‍යා දියුණුව සමග පර්යේෂණයන්හිදී නිපදවිය හැකි වන විද්‍යා උපක්‍රම හා කැමරා උපකරණ ආදිය මගින් අප සියළු දෙනාටම යා යුතුව පවතින නොපෙනෙන අධ්‍යාත්මික ලෝකයෙහි පැවැත්ම වන එනම් මරණින් පසු ලෝකයෙහි පවතින සැබෑ විස්තර දැක ගත හැකිවනු ඇත. එවිට එහිදී පැවතිය හැකියයි පවසන අධ්‍යාත්මිකවූ මානසික ලෝකයන්ගේ පැවැත්මත් අනිකුත් දියුණුවූ අධිමානසික ශක්තීන්ගේ ලෝක පැවැත්මත් කුසල හෝ හොඳ ක්‍රියාවන්ගේ කර්ම ශක්තීන්ට අනුව පවතින අධ්‍යාත්මගත ජීවීන්ගේ පැවැත්ම පවතින අයුරුත් එ මෙන්ම මෙලොවදී භාවනාමය ප්‍රතිපදාවන්හි යෙදීමෙන් ප්‍රබල ලෙස අධ්‍යාත්මය දියුණු කරණ ලද පුද්ගලයන්ගේ මරණින් පසු එම අධි මානසික ශක්තීන්ගේ ක්‍රියාකාරී ලෝකයන් පවතින අයුරු හඳුනා ගත හැකි වනු ඇත. එලෙසම එහිදී ක්‍රියාකාරී වන අපාය හා නිරය ලෙසින් හඳුන්වනු ලබන මනුෂ්‍යය ලෝකයේදී විවිධාකාර ලෙසින් දරුණු අකුසල් කර්ම කරන ලද පුද්ගලයින්ගේ ආත්මයන්හි පැවැත්මද ක්‍රියාකාරී වන අයුරුද හඳුනාගත හැකිවනු ඇත.

පෘතග්ජන මනුෂ්‍යයින්ට නොපෙනෙන විවිධ ලෝක ධාතූන්හි ගැඹුරුවූ විද්‍යාත්මකවූ එමෙන්ම ශ්‍රේෂ්ඨවූ ඉහත සඳහන් කරනලද විවිධාකාරවූ නොපෙනෙන ලෝකයන්හි ක්‍රියාත්මක ලෝක ස්වභාව ධර්මයන්ගේ අධ්‍යාත්මික පැවැතීම් වල දර්ශනයන් පෘතග්ජන මනුෂ්‍යයන්ට එලෙසින් රූපවාහිනී තිරයක් මතදී දැකගත හැකිවනවිට බුදුන් වහන්සේ දේශනා කල සත්‍යය යනු ලෝකයේ ඇති සැටිය ඇති ලෙසින් වන බව පෘතග්ජන මනුෂ්‍යයන් එකිනෙකාට පැහැදිලි වනු ඇත. එලෙසින් ඉතා ප්‍රබල ලෙස සිය අද්විතීය වූ ශ්‍රේෂ්ඨත්වය තුලින් මුළුමහත් ලෝකයෙහි ක්‍රියාකාරී සියළුම මිත්‍යා ආගම් ඇදහිලි අභිභවනය කරමින් ලොවෙහි ක්‍රියාකාරී එකම ආගම බුදුදහම බවට පත්වනු ඇත.

- සර් ආතර් සී ක්ලාක් -

(විද්‍යා ලේඛක - අනාගත අනාවැකි ප්‍රකාශක - විද්‍යා ගවේශක හා විද්වත් )

("ද ඩීප් සී - ද ඩීප් රේන්ජ් " - ''ගැඹුරු මුහුද'' යන විද්‍යා කෘතියෙනි)

ISBN 978 - 955 - 38921 - 1 - 9

9 789553 892119

AT Creation - 071 9694986